# පොහොසත් රටක් ලස්සන ජීවිතයක්



ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAWEGAYA (NPP)

# පොහොසත් රටක් ලස්සන ජීවිතයක්

**පොහොසත් රටක්**
**ලස්සන ජීවිතයක්**

© ජාතික ජන බලවේගය

පළමු මුද්‍රණය - 2024 අගෝස්තු

**විමසීම්:**

ජාතික ජන බලවේගය
464/20,
පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

දුරකථනය - 011 2785612
වෙබ් - www.akd.lk
- www.npp.lk
විද්‍යුත් තැපෑල - contact@npp.lk

# පෙළගැස්ම

පූර්විකාව 04

## 01. පරිසමාප්ත ජීවිතයක් - සුවපහසු රටක්

01.1 ශිෂ්ටසම්පන්න පුරවැසියෙක් - දියුණු මානව සම්පතක් 09
01.2 නිරෝගී ජීවිතයක් - සෞඛ්‍ය සම්පන්න ජනතාවක් 19
01.3 සුවපහසු නිවසක් - සනීපාරක්ෂක ජීවිතයක් 27
01.4 ජවසම්පන්න පුරවැසියෙක් - ජයග්‍රාහී ජනතාවක් 31
01.5 උදාර සංස්කෘතික ජීවිතයක් - සහකම්පනීය ජනතාවක් 35
01.6 සංරක්ෂිත ඉතිහාසයක් - උරුම නව්‍යකරණයක් 44
01.7 තිරසර ජෛව ලෝකයක් - සදාහරිත ජීවිතයක් 47
01.8 නිදහස් ජනමාධ්‍ය කර්මාන්තයක් - සමබර තොරතුරු සමාජයක් 56

## 02. ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක්

02.1 ආරක්ෂිත සමාජයක් - සුපෝෂිත ජාතියක් 62
02.2 කාර්යක්ෂම ශ්‍රම සම්පතක් - ගෞරවනීය වෘත්තීය ජීවිතයක් 68
02.3 නිදහස් ස්ත්‍රී - පුරුෂ සමාජභාවයක් - සාධාරණ මිනිස් අනන්‍යතාවක් 72
02.4 සුරක්ෂිත ළමා ලෝකයක් - නිර්මාණශීලී අනාගත පරපුරක් 78
02.5 තෘප්තිමත් තාරුණ්‍යයක් - සංස්කෘතිකවත් නිවහල් චින්තනයක් 83
02.6 ගෞරවනීය ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් - අර්ථවත් විශ්‍රාම දිවියක් 89
02.7 නිරාබාධිත සමාජ ජීවිතයක් - යුක්තිසහගත සම ප්‍රවේශයක් 92

## 03. නවීන ජීවිතයක් - පොහොසත් රටක්


03.1 ප්‍රජාතාන්ත්‍රික ආර්ථිකයක් - පොහොසත් රටක් 98
03.2 ඉහළ ඵලදායිතාවක් - ආහාර සුරක්ෂිත රටක් 109
03.3 ගුණාත්මක පශු නිෂ්පාදනයක් - ව්‍යවසායකත්ව ප්‍රවේශයක් 116
03.4 තිරසර කළමනාකරණයක් - ගුණාත්මක මත්ස්‍ය සම්පතක් 120
03.5 ඩිජිටල් රාජ්‍යකරණයක් - ජාත්‍යන්තර හවුල්කාරිත්වයක් 129
03.6 පර්යේෂණ හා සංවර්ධන ප්‍රවේශයක් - විදුහුරු සමාජයක් 133
03.7 නව්‍ය සංචාරක කර්මාන්තයක් - ආකර්ෂණීය ගමනාන්තයක් 141
03.8 ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයක් - ජීවධරණී ප්‍රවේශයක් 147
03.9 තිරසර සම්පත් භාවිතාවක් - උපරිම ප්‍රතිලාභ ජනනයක් 155
03.10 සුරක්ෂිත බලශක්ති කේන්ද්‍රයක් - තිරසර විනිමය ප්‍රභවයක් 161
03.11 මහජන ප්‍රවාහන සේවාවක් - කාර්යක්ෂම ගමනාන්තයක් 168
03.12 තිරසර සමුද්‍ර සම්පතක් - ගෝලීය සමුද්‍ර ව්‍යාපාරයෙන් පංගුවක් 174
03.13 ආරක්ෂිත දත්ත පද්ධතියක් - සන්නිවේදන තාක්ෂණ විප්ලවයක් 178
03.14 ඵලදායී කළමනාකරණයක් - ඒකාබද්ධ පරිහරණ සැලසුමක් 183
03.15 විද්‍යාත්මක ඉදිකිරීම් ක්ෂේත්‍රයක් - ගුණාත්මක සේවා නියුක්තියක් 187


## 4.0 අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක්


04.1 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් - ශ්‍රී ලාංකේය ජාතික සාමාග්‍රියක් 192
04.2 කාර්යක්ෂම රාජ්‍ය සේවයක් - කුසලතා කේන්ද්‍රීය වෘත්තීයභාවයක් 194
04.3 නීතිය මත පාලනයක් - සම ප්‍රවේශී අධිකරණ පද්ධතියක් 198
04.4 මිත්‍රශීලී පොලිස් සේවාවක් - තෘප්තිමත් වෘත්තීයභාවයක් 202
04.5 මනුෂ්‍යත්ව පාදක බන්ධනාගාරයක් - යුක්තිගරුක රැඳවුම් දිවියක් 206
04.6 මතින් තොර රටක් - නිරෝගී පුරවැසි දිවියක් 209
04.7 උදාර රාජ්‍යතාන්ත්‍රිකත්වයක් - ස්වෛරී රාජ්‍යයක් 212
04.8 උසස් ජාතික ආරක්ෂාවක් - සුරක්ෂිත රාජ්‍යයක් 222
04.9 ශ්‍රී ලාංකේය ජාතියක් - විශ්වීය පුරවැසියෙක් 227

# පූර්විකාව

අද ශ්‍රී ලංකාවට අවශ්‍යව ඇති සමාජ පරිවර්තනය හුදු ආණ්ඩු මාරුවක් හෝ පාලක කණ්ඩායමක් ගෙදර යාම හේතුවෙන් හිස් වන පාලක හා නිලධාරි පුරප්පාඩු වෙනත් කණ්ඩායමක් මගින් පිරවීමක් පමණක් නොවේ. එය දැවැන්ත සමාජ පරිවර්තනයකි. නිදහසෙන් අවුරුදු 76 කට පසු ක්ෂේත්‍ර එකක හෝ කිහිපයක පරිවර්තනයකට එහා ගිය සමස්ත සමාජ පරිවර්තනයකි; පුනරුදයකි. ලංකාව නිදහස ලැබූ කාලය තුළ ඉංජිනේරු, සෞඛ්‍යය, අධ්‍යාපනය, කලාව, සාහිත්‍යය, මානව අයිතිවාසිකම් වැනි විවිධ කලාපයන් තුළ සිටි විශිෂ්ටතමයින් බිහි කිරීමට ප්‍රාර්ථනා කළ, ඒ සඳහා ඒ ඒ ක්ෂේත්‍රය තුළ අත්තිවාරම් දැමීමට උත්සාහ කළ එහෙත් මෙතුවක් කල් ලංකාව පාලනය කළ දූෂිත පාලක ප්‍රභූ කණ්ඩායම් විසින් යටපත් කළ දියුණු ලංකාවක් පිළිබඳ සිහිනය ප්‍රායෝගිකව මල්ඵල ගැන්වීමකි. ජාතික ජන බලවේගය අපේක්ෂා කරන පාලනය පුනරුද යුගයක් වන්නේ එය විසිවන සියවස තුළ ඇති වූ එහෙත් යටපත් කළ දියුණු ලංකාවක් පිළිබඳ සිහිනය විසිඑක්වන සියවස තුළ සැබෑවක් වීමේ හේතුව නිසා මෙන්ම, එය දැවැන්ත සාමූහික ජනතා මැදිහත්වීමක් මගින් සිදුවන රට ගොඩනැගීමේ ක්‍රියාවලියක් වීම හේතුවෙනි.

නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනගා ගැනීම අපගේ තීරණාත්මක හා ප්‍රමුඛතම කාර්යයයි. ඒ නිසාම අපගේ ප්‍රතිපත්ති ක්ෂේත්‍ර ගණනාවක් ස්වභාවික සම්පත් රට තුළින්ම සොයා ගත හැකි, පහසුවෙන් දියුණු කළ හැකි, දැනටමත් අප සතුව ඇති වෘත්තීය හා පුහුණු ශ්‍රම සම්පත් පාවිච්චි කළ හැකි ඛනිජ සම්පත්, තොරතුරු හා මෘදුකාංග තාක්ෂණය, සංචාරක කර්මාන්තය, කෘෂිකර්මය, සාගර සම්පත්, නිර්මාණශීලී කර්මාන්ත (උදා: චිත්‍රකලාව, සිනමාව, සාහිත්‍යය, සංගීතය, රංග කලාව...) වැනි කලාප කෙරේ අවධානය යොමුකොට ඇත. අප විසින් යෝජනා කරන නිෂ්පාදන ආර්ථිකයේ ප්‍රධාන කාර්යයක් ඉටුකරනු ලබන්නේ විද්‍යාව හා තාක්ෂණයයි.

අධ්‍යාපන, සෞඛ්‍ය හා ගමනාගමන ක්ෂේත්‍ර අත්‍යවශ්‍ය මහජන සේවා ලෙස සලකන ජාතික ජන බලවේගය මේ ක්ෂේත්‍ර තුළ රාජ්‍ය ප්‍රතිපාදන ඉහළ නංවමින් එම ක්ෂේත්‍ර ශක්තිමත් කරයි; සංවිධාන කරයි. අධ්‍යාපනය රජයේ මූලික වගකීමක් ලෙස සලකන අපි දෙමාපියන් මත පැටවී ඇති අධ්‍යාපනයේ

බර අඩුකිරීමට කටයුතු කරමු. සම්පත් බෙදීයාමේ අසමානතාව හේතුවෙන් රට පුරා පැතිර ඇති අධ්‍යාපනයේ විෂමතාව ක්‍රම ක්‍රමයෙන් දුරු කිරීමටද කටයුතු කෙරේ. අධ්‍යාපන ප්‍රතිත්ති තුළ අලුතෙන් හඳුන්වාදීමට නියමිත වෘත්තීය අධ්‍යාපන ධාරාව මේ වන විට බිඳ වැටී ඇති අධ්‍යාපනය හා රැකියා වෙළඳපොළ අතර සම්බන්ධය ගොඩනගනු ලබන අතර නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීමේ වැඩපිළිවෙළට අවශ්‍ය වෘත්තිකයින් ගොඩනැගීම වෙනුවෙන් ප්‍රධාන කාර්යයක් ඉටු කරනු ඇත.

රාජ්‍ය සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ මූල්‍ය ප්‍රතිපාදන ඉහළ නංවමින් එම ක්ෂේත්‍රය මහජන සේවාවන් ලෙස වර්ධනය කිරීමට අපගේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය අවධානය යොමු කරන අතර බටහිර වෛද්‍ය ක්‍රමය මෙන්ම රට තුළ දැනට භාවිත වන ආයුර්වේද, යුනානි, සිද්ධ වෛද්‍ය ක්‍රම වැඩි දියුණු කරමින් ඒ සියල්ල සංකලනය වූ වෛද්‍ය සේවාවක් සැපයීමට යෝජනා කරයි. පොදු ප්‍රවාහනයේ රාජ්‍ය පංගුව ශක්තිමත් කිරීම හා ඒ මගින් රට පුරාම දිවා හා රාත්‍රී කාලයන්හි ක්‍රියාත්මක කාර්යක්ෂම පොදු ප්‍රවාහනයන් ඇති කිරීම ගමනාග මන ක්ෂේත්‍රය තුළ ජාතික ජන බලවේගයේ බහුවිධ ක්‍රියාමාර්ග තුළ කේන්ද්‍රීය මැදිහත් වීමයි. 'මිනිසා පොළවේ හිමිකාරයා ය', යන මතයේ පිහිටා සමස්ත ස්වභාව ධර්මය සමග ගැටුමකට යාමේ ප්‍රවේශයේ සිට පරිසරය, ගහකොළ, සතා සීපාවා සමග සහජීවනයෙන් වසන පරිසර පද්ධතීන්හි තුලනය රකින ප්‍රවේශයකට මාරු වීම අපගේ පාලනය තුළ සිදුවෙනු ඇත. ආර්ථිකය චක්‍රීය ආර්ථිකයක් බවට පත්වීමටත්, බලශක්ති ක්ෂේත්‍රය පුනර්ජනීය බලශක්ති ප්‍රභව මත පදනම් වූ කලාපයක් බවට පත්වීමටත්, කෘෂිකර්මය පරිසර පද්ධති බිඳ නොදමන භාවිතයක් බවට පත්වීමටත්, ඉදිකිරීම් කර්මාන්තය හරිත මූලධර්ම මත පදනම් වූ කර්මාන්තයක් බවට පත්වීමටත් අවශ්‍ය ක්‍රමික ගමනකට පවතින යථාර්ථයන්ද සැලකිල්ලට ගනිමින් පදනම වැටෙනු ඇත.

ලෝක කාන්තා ව්‍යාපාරයටම ආදර්ශයක් එක් කරමින් ගොඩ නැගූ "ගැහැනු අපි එක මිටට" ක්‍රියාකාරිත්වය ලංකා ඉතිහාසය තුළ සිදු වූ දැවැන්ත කාන්තා සක්‍රීයකරණ වැඩසටහනක් ලෙස නම් කළ හැකිය. ජාතික ජන බලවේයේ අරමුණ රටේ ජනගහනයෙන් හරි අඩක් නියෝජනය කරන කාන්තාවන්ට කායික, වාචික හා මානසික හිංසනයෙන් තොර සමාන අයිතිවාසිකම් භුක්ති විඳින නිදහස් සමාජයක් බිහිකරලීමයි. මේ යටතේ සිදුකළ යුතු ආකල්පවල පරිවර්තනයන් සිදු කිරීමත්, ආයතනික වෙනස්කම් සිදුකිරීමත්, අප දැනටමත් අත්සන් තබා ඇති අන්තර්ජාතික ප්‍රඥප්තිවලට අනුකූලව දේශීය නීති හඳුන්වාදීම හා ආරක්ෂණ යාන්ත්‍රණ ඇති කිරීමත් අපගේ ප්‍රමුඛත්වය වනු ඇත. පාර්ලිමේන්තුවේ සිට ප්‍රාදේශීය සභා දක්වා සියලු තීන්දු ගන්නා ආයතනයන්හි කාන්තා නියෝජනය ක්‍රමිකව 50% දක්වා ඉහළට ගෙන යාම අපගේ ඉලක්කයයි. මීට අමතරව තවත් වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ සංස්කෘතික මිනිසෙකු බිහි කිරීමේ ජාතික ජන බලවේගයේ ප්‍රයත්නයයි. හිත්පිත් නැති, උණුසුමක් නැති, යාන්ත්‍රික ජීවිත ගත කරන, අනෙකා ගැන නොසිතන රටවැසියා, අනෙකා ගැන සිතන, කලාව, සෞන්දර්යය, දර්ශනය ඇසුරු කරන, මනුෂ්‍යත්වය විශ්වාස කරන, ජීවිතය විඳින කෙනෙක් බවට පත්වීමේ පදනම අපගේ පාලනයක්

යටතේ බිහිවනු ඇත. ජනතාවගේ ජීවිත පවත්වා ගෙන යෑමේ සමස්ත බර ජනතාව මතම පටවා ඇති වත්මන් පාලනයන්ට ප්‍රතිපක්ෂව ජාතික ජන බලවේගය මේ බරින් සැලකිය යුතු කොටසක් රජය වෙත පවරා ගැනීම, දියුණු නිෂ්පාදන ආර්ථිකයක් තුළ ජනතාවට ලැබෙන ජීවන තත්වයේ ඉහළ යාම හා ජීවත් වීමේ පහසුව විසින් මෙම සංස්කෘතික මිනිසෙකු නිර්මාණය කිරීමේ මූලික පදනම සකස් කරනු ඇත.

ජාතික ජන බලවේගයේ පාලනයක් යනු අවුරුදු 76ක කාලයක් තුළ ක්‍රම ක්‍රමයෙන් කුණු වී ඕජස් ගලන අන්ත දූෂිත දේශපාලන සංස්කෘතිය අවසන් කිරීම හා යහපත් දේශපාලන සංස්කෘතියක් ඇති කිරීමත්ය. අප පාලනයක් යටතේ දූෂිත ප්‍රභූ පාලක කල්ලි විසින් ජනතා දේපළ කෝටි ප්‍රකෝටි ගණනින් කොල්ල කෑ ධනය නැවත ජනතාව වෙත අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ වනු ඇත. මේ සඳහා අවශ්‍ය නීති සම්පාදනය කරමින් හා දූෂණ විරෝධී කොමිෂන් සභාවට, පොලීසියට හා නීතිපති දෙපාර්තමේන්තුවට අවැසි මග පෙන්වීම කරමින් ඒවාට ස්වාධීන ආයතන ලෙස ක්‍රියාත්මක වීමේ සම්පූර්ණ ඉඩකඩ අප විසින් සපයනු ඇත.

කාලයක් තිස්සේ නොවිසඳුණු ජනමාධ්‍යවේදීන්ගේ, ක්‍රීඩකයන්ගේ මෙන්ම පාස්කු ඉරු දින ප්‍රහාරය ඇතුළු දේශපාලන බලය වෙනුවෙන් ජන කණ්ඩායම් ඉලක්ක කළ ඝාතනයන්ට අදාළ සියලු තොරතුරු හෙළි කරමින් අපරාධකරුවන්ට දඬුවම් පමුණුවනු ඇත. දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතිවල සිට පාසලකට දරුවෙකු ඇතුළත් කර ගැනීම දක්වා සිදුවන බල පිරමීඩයේ ඉහළ සිට පහළටම වෙළා ගෙන ඇති පගාව, කොමිස් ඇතුළු වංචාව හා දූෂණය නතර කිරීමේ තිර අදිටනින් අප කටයුතු කරනු ඇත.


නිදහසෙන් පසු ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට දූෂිත ප්‍රභූ පවුල් කිහිපයක් අත තිබූ රාජ්‍ය පාලනය සමස්තයක් ලෙස ජනතා පාලනයක් බවට පත්වනු ඇත. ජනාධිපති තනතුරේ සිට සියලු නියෝජිත ආයතනයන් තුළ තනතුරු දක්වාත්, රටේ මෙහෙයුම් යාන්ත්‍රණයන්හි තනතුරුත් පාලක ප්‍රභූ පවුල් සම්බන්ධතාවයන්ගෙන් යුතු වීම හේතු කොට ගෙන නොව, සුදුසුකම් අනුව පොදුවේ රටේ ජනතාවගේ දූ දරුවන්ට හිමිවනු ඇත. ජාතික ජන බලවේග පාලනයක් පුරවැසි ක්‍රියාකාරිත්වයේ, සාමූහික මැදිහත්වීම්වල, සමාජ සාධාරණත්වයේ සහ යහපාලන මූලධර්මයන් භාවිතයේ නව යුගයක් ආරම්භ කරනු ඇත. නිදහසෙන් පසු ක්‍රියාත්මක වූ පාලකයන් හා ජනතාව අතර වූ ප්‍රභූ - යටත්වැසි ආකාරයේ සම්බන්ධතාවය වෙනුවට අභිමානවත් පුරවැසියෙකු හා ඔවුන්ට සේවය කරන ජනතා මිත්‍රයෙකු, හිතවතෙකු වන නව සම්බන්ධතාවයක් ගොඩනගනු ඇත. දේශපාලකයන් පසුපස නොයා තම කටයුතු ජනතාවට ඉටුකර ගත හැකි රාජ්‍ය ආයතන ව්‍යුහයක් හඳුන්වා දීම මෙහි මූලික පියවරකි. රටක් ගලවා ගත හැකි දියසෙන් කුමරෙකු, රජෙකු හෝ විරුවෙකු ගැන ජාතික ජන බලවේගය විශ්වාස නොකරන අතර රාජ්‍ය පාලනය හා සංවර්ධනය සාමූහික ව්‍යායාමයක් ලෙස දකී. ඒ අතරම අඩු සුදුසුකම් සහිත දේශපාලන හෙංචයියන් වෙනුවට සුදුසුකම් සහිත පුද්ගලයන් නිශ්චිත ක්‍රමවේදයකට අනුව

ආයතනයන්ට පත් කරනු ලබන අතර, දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව එම ආයතනයන්ට ක්‍රියාත්මක වීමට ඉඩ සලසා දෙනු ලැබේ. අධිකරණයේ ස්වාධීනත්වය සහමුලින්ම සහතික කරනු ලබන අතර අසාධාරණයන්ට ලක්වන විවිධ ජන කණ්ඩායම් ආරක්ෂා කිරීමේ නීතිරීති මෙන්ම ආරක්ෂණ හා සුබසාධන යාන්ත්‍රණද හඳුන්වා දෙනු ලැබේ.

බාහිර ලෝකය සමග නිසියාකාරව මුසුවීමට ඉඩ නොලැබීම ශ්‍රී ලංකාවේ නොදියුණුභාවයට හා පසුගාමීත්වයට ප්‍රධාන හේතුවක් ලෙස දකින ජාතික ජන බලවේගය විද්‍යා හා තාක්ෂණ, පර්යේෂණ, අධ්‍යාපනය, සංස්කෘතිය, කලාව, සිනමාව, සංගීතය, දර්ශනය, ක්‍රීඩාව යන කලාප ගණනාවක් තුළ ලෝකය සමග කරන ගනුදෙනු රාජ්‍ය, ආයතනික, පුද්ගල මට්ටමින් දිරිමත් කරනු ලැබේ. ජාතික ජන බලවේගයේ තවත් තීරණාත්මක මැදිහත්වීමක් වනුයේ ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීමේ උත්සාහයයි. සිංහල, දෙමළ, මුස්ලිම් හා වතුකර ජනයා ලෙස බෙදී සිටි අප නිදහසෙන් පසු ශ්‍රී ලාංකේය ජාතියක් ලෙස එක ධජයක් යටතට ගෙන ඒමට මෙතෙක් කල් රට පාලනය කළ ප්‍රභූ පාලක පංතියට හැකි වූයේ නැත. ඒ වෙනුවට ඔවුන් සිදු කළේ තම බලය පවත්වාගෙන යාම වෙනුවෙන් ඒ ඒ ජාතිකත්වයන්ට බෙදුණු කණ්ඩායම් ලෙස ඔවුන් අතර ගැටුම් උග්‍ර කරමින් පවත්වා ගෙන යාමයි. අපගේ ප්‍රතිපත්ති මේ වෙනුවෙන් සිදු කළ යුතු සංකල්පීය, ද්‍රව්‍යාත්මක, ව්‍යුහාත්මක හා ක්‍රියාකාරී මැදිහත්වීම් ගණනාවක් හඳුනා ගනී. සියලු ජාතිකත්වයන්ට ශ්‍රී ලාංකේය ජාතිය ලෙස පොදු අනාගතයක් පරිකල්පනය කිරීමේ ඉඩකඩ අප විසින් සකස් කරනු ඇත. නිෂ්පාදන ආර්ථිකයක් සැලසුම් කිරීමේ සිට ප්‍රතිලාභ බෙදීයාම දක්වා වූ ක්‍රියාවලියේ දී සියලු ජාතිකත්වයන් එහි කොටස්කරුවන් කර ගැනීම අපේ අදිටනයි.

අප විසින් යෝජනා කරන ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ සාමූහිකව ක්‍රියාවට නැංවීම සඳහා මහජන ආණ්ඩුවක් ගොඩනැගීමට ජාතික ජන බලවේගය සමග සක්‍රීයව එක්වන ලෙස පොහොසත් රටක් සහ ලස්සන ජීවිතයක් අපේක්ෂා කරන සියලු ශ්‍රී ලාංකිකයන්ට සහෝදරත්වයෙන් යුතුව ආරාධනා කරමු.

# 1 පරිසමාප්ත ජීවිතයක් සුවපහසු රටක්



# ශිෂ්ටසම්පන්න පුරවැසියෙක්

# දියුණු මානව සම්පතක්

අධ්‍යාපනය යනු පැවති හා පවතින සියලු සමාජ අවධීන් විසින් නිර්මාණය කරන ලද දැනුම අත්පත් කර ගනිමින් හා බෙදාහරිමින් නව දැනුම නිෂ්පාදනය කරන සංස්කෘතික ක්‍රියාවලියකි. ශිෂ්ට සම්පන්න හා වගකීම් සහගත පුරවැසි සමාජයක පැවත්ම හා සංවර්ධනය රඳා පවතින්නේ එම සමාජයේ ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලිය මතයි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලිය අර්බුද ගණනාවකින් යුක්ත වූවකි. අවම වශයෙන් වසර 13 අධ්‍යාපනය සම්පූර්ණ නොකර අතරමග පාසලින් ඉවත්වීම ඉන් ප්‍රධාන තැනක් ගනී. උදාහරණයක් ලෙස 2008 දී පළමු වසරට ඇතුළත් වන දරුවන්ගෙන් 11.3%ක් 2018 දී අ.පො.ස.(සා.පෙ.) විභාගයට පෙනී සිටීමටත් පෙර පාසලින් ඉවත් වූ අතර අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත්ව 2020 දී අ.පො.ස.(උ.පෙ.) දක්වා අධ්‍යාපනය ලැබුවේ 64.7%ක් පමණි. එනම් පළමු වසරට ඇතුළත් වන දරුවන්ගෙන් 45.3%ක්, 2020 දී අ.පො.ස.(උ.පෙ.) විභාගයට පෙනී සිටීමට පෙර පාසලින් සමුගෙන ඇත. දළ වශයෙන් පළමු වසරට ඇතුළත් වන දරුවන්ගෙන් අ.පො.ස.(උ.පෙ.) විභාගය සමත් වන ප්‍රතිශතය 35.4%ක් වන අතර විශ්වවිද්‍යාලය සඳහා ඇතුළත් වන්නේ 12.7%ක් පමණි.

**ශිෂ්ට සම්පන්න හා වගකීම් සහගත පුරවැසි සමාජයක පැවත්ම හා සංවර්ධනය රඳා පවතින්නේ එම සමාජයේ ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලිය මතයි.**

පාසල් පද්ධතිය තුළ  මානව හා භෞතික සම්පත් බෙදීයාමේ විෂමතාවය හා ඒ නිසාම පාසල් පද්ධතිය කෙරේ ඇති දෙමාපිය විශ්වාසය බිඳවැටීමද තවත් බරපතළ ගැටලුවකි. 2022 පාසල් සංගණන වාර්තාව අනුව පාසල් 10,126න් සිසුන් සංඛ්‍යාව 50ට වඩා අඩු පාසල් 1473ක් (14.5%) පවතී. පාසල් 5204ක් (51.4%) සිසුන් සංඛ්‍යාව 200ට වඩා අඩු පාසල් වේ. ඒ අනුව අඩකටත් වඩා පාසල් ප්‍රමාණයක් අවම පහසුකම්වත් නැති හා ඌන උපයෝගී පාසල් වේ. ජාතික පාසල් ලෙස වර්ගීකරණය වී ඇත්තේ පාසල් 396 පමණක් වන අතර කුමන හෝ අ.පො.ස.(උ.පෙ.) විෂය ධාරාවක් ඇත්තේ පාසල් 2959 (29%) ක පමණි.

පළමු වසර සිට ප්‍රථම උපාධිය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දෙන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ ද දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමාපියන්ට සිය ආදායමින් දරන්නට සිදුවී ඇති ඉහළ වැයබර අපේ අධ්‍යාපන ක්‍රියාවලියේ තවත් ගැටලුවකි.

ශ්‍රී  ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලිය විසින් ගුණාත්මක පුරවැසියකු බිහිකිරීමට අසමත් බවට ඇති සමාජ විවේචනයද බරපතළය. අධ්‍යාපනයේ පරමාර්ථය හුදෙක් රැකියා වෙළඳපොළ සඳහා පුද්ගලයන් නිර්මාණය කිරීම නොවූවද අධ්‍යාපන ක්‍රියාවලියෙන් බිහිවන පුරවැසියා ජාතික ආර්ථිකයට දායකත්වය දෙමින් සමාජ වගකීම් වෙත සාධනීයව ප්‍රතිචාර දැක්වීමට සමත් අයකු විය යුතුය. නමුත් ආර්ථිකයේ ප්‍රධාන කුලුනු වන කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශයන්හි රැකියා වෙළඳපොළ අවශ්‍යතාවයන් සහ අධ්‍යාපනය අතර පවතින නොගැලපීම මෙහිදී බොහෝ සෙයින් අවධානයට ලක්වී ඇත. ජාතික ජන බලවේගයේ අධ්‍යාපන ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ දියුණු මානවවාදී හා වගකීම් සහගත පුරවැසි සමාජයක් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමයි. එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයට රාජ්‍ය ආයෝජන ඉහළ දමන අතර, දළ ජාතික නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා දැනට වෙන්කරනු ලබන ප්‍රමාණය ක්‍රමයෙන් 6% දක්වා වැඩිකිරීම අපගේ අපේක්ෂාවයි.



# මූලධර්ම

- නිදහස් අධ්‍යාපනය හා සම ප්‍රවේශය
- මානව සංවර්ධනයට සහ සේවා නියුක්තියට අදාළතාව
- සියල්ලන්ටම පිළිගත හැකි බව
- සමාජයට වග වන පුරවැසියන්
- තිරසර බව හා නවෝත්පාදනය
- යාවජීව අධ්‍යාපනය

# ක්‍රියාමාර්ග

## පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය

- අවුරුදු 03 සිට 05 දක්වා වන සියලු දරුවන් සඳහා විධිමත් මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනයක්
- සෑම දරුවෙකුටම සිය නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කි.මී. 02ක් ඇතුළත මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපන මධ්‍යස්ථානයක්
- දරුවන්ගේ කායික හා මානසික තත්වයන්ට ගෝචර වන පරිදි හා සමාජ ජීවිතයට පිවිසීමට අවශ්‍ය වන යහපත් පුරුදු, ආකල්ප හා ආචාරධර්ම වර්ධනය කරන ක්‍රියාකාරකම් ඇතුළත් වන වැඩසටහන්
- මව් භාෂාවට අමතරව කථන සන්නිවේදන භාෂා ලෙස ඉංග්‍රීසි ඇතුළු අනෙක් ජාතික භාෂා වැඩසටහන්
- බහුසංස්කෘතික විවිධත්වයට කටයුතු කිරීමට හුරුකරවන වැඩසටහන්
- දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය වර්ධනය කෙරෙන ක්‍රියාකාරකම්
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීම සඳහා ජාතික මුල් ළමාවිය සංවර්ධන නියාමන ආයතනයක්
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලක පාලිකාවන් සහ ගුරුවර ගුරුවරියන් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම්, අනිවාර්ය වෘත්තීය පුහුණුව සහ ප්‍රමාණවත් අවම වැටුපක්
- මුල් ළමාවිය සංවර්ධන වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා විධිමත් ජාතික ආයතනයක් හා  ශාඛා පද්ධතියක්

## ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය

සාක්ෂරතාව, සංඛ්‍යාත්මක දැනුම, නිර්මාණශීලිත්වය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම ප්‍රාථමික අධ්‍යාපනයේ මූලික අරමුණයි.

පාසල් අධ්‍යාපනය

- පළමු වසර සිට 5 වසර දක්වා ප්‍රාථමික අධ්‍යාපනය
- 6 වසර සිට 9 වසර දක්වා වන කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය
- 10 වසර සිට 11 වසර දක්වා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (පහළ) අධ්‍යාපනය
- 12 වසර සිට 13 වසර දක්වා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (ඉහළ) අධ්‍යාපනය

## ප්‍රාථමික අධ්‍යාපනය

- සිය නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කි.මී. 03 ක් ඇතුළත ප්‍රාථමික අධ්‍යාපනය සඳහා රජයේ පාසල් පද්ධතියක්
- ළමාවියට බාධාවක් නොවන පරිදි බුද්ධිමය කුතුහලය සහ දැනුම වර්ධනය උත්තේජනය කරන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක්
- අවම පහසුකම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය භෞතික සහ මානව සම්පත් පාසල්වලට සැපයීම රජයේ වගකීමක්
- අවශ්‍යතාවන්ට හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පාසල් ප්‍රවාහන පද්ධතියක්

## කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය

- ජනගහනය හා භූගෝලීය පිහිටීම සැලකිල්ලට ගනිමින් ප්‍රාථමික පාසල් 02ක් හෝ 03ක් ආවරණය වන පරිදි කනිෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතියක් හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතියක්
- සිසුන්ගේ හැකියාවන් සහ විශේෂ කුසලතාවන්ට අනුව උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය තෝරාගත හැකි වන පරිදි ප්‍රධාන විෂයයන්
- සිසුන්ගේ වයස් කාණ්ඩ සහ ඊට අදාළ බුද්ධිමය තත්වයන් හා කුසලතාවයන් වර්ධනය වන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක්
- සමාජ සාරධර්ම සහ පුරවැසි වගකීම් සංවර්ධනය කිරීමට අමතර විෂයයන් හා ක්‍රියාකාරකම්
- සිය ආගම පිළිබඳව අධ්‍යාපනයට අමතරව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් පිළිබඳව අධ්‍යාපනික වැඩසටහන්
- ඒ ඒ වයස් කාණ්ඩයන්ට ගැලපෙන පරිදි ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ අධ්‍යාපනයක්
- සංස්කෘතිය, පරිසරහිතකාමිත්වය හා සොබා දහමේ පැවත්ම පිළිබඳ ආකල්ප සංවර්ධනය
- නවෝත්පාදනය පිළිබඳව අත්දැකීම් ලබා දෙන වැඩසටහන්

**"දරුවන්ගේ කායික හා මානසික තත්වයන්ට ගෝචර වන පරිදි හා සමාජ ජීවිතයට පිවිසීමට අවශ්‍ය වන යහපත් පුරුදු, ආකල්ප හා ආචාරධර්ම වර්ධනය කරන ක්‍රියාකාරකම් ඇතුළත් වන වැඩසටහන්"**

## ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය

- නවය වසරේදී පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගයේ ප්‍රතිඵල සහ පාසල් පාදක අඛණ්ඩ ඇගයීම් වාර්තා මත ශිෂ්‍යයාගේ විභවයට සහ රුචිකත්වයට සරිලන පරිදි විද්‍යා, කලා, වාණිජ සහ තාක්ෂණ වැනි සාමාන්‍ය විෂය ධාරා හෝ වෘත්තීය විෂය ධාරාව (vocational education stream) (ඍජුවම කිසියම් වෘත්තියකට අදාළ වන) තෝරා ගැනීමට අවස්ථාව
- ද්විතීයික ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනය (පහළ) කාලය තුළ එක් විෂය ධාරාවකින් තවත් විෂය ධාරාවකට මාරුවිය හැකි පරිදි සුනම්‍ය විෂයමාලා
- අධ්‍යාපන විෂය ධාරාවන්ට විශේෂිත වූ විෂයයන් මෙන්ම පොදු නිපුණතා වර්ධනය වන තාක්ෂණික සාක්ෂරතාව, භාෂා, ජීවන නිපුණතා, සාහිත්‍යය රසවින්දනය, මූලික නීතිය ආදී පොදු විෂයයන්
- සංස්කෘතික විවිධත්වයන්ට අනුගතව එම විවිධත්වය ගරු කරමින් කටයුතු කිරීමට ළමුන් හුරුකරවන ඉගෙනුම් පරිසරයක්
- නවෝත්පාදනය, ජීවන නිපුණතා හා සමාජානුයෝජනයට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය
- ළමුන්ගේ ශාරීරික හා මානසික සමබරතාවන් පවත්වාගෙන යාම සඳහා වැඩසටහන්
- තාරුණ්‍යයට ගැලපෙන පරිදි ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ අධ්‍යාපනය
- අවශ්‍ය විටකදී නීති උපදේශන සේවා හා අනෙකුත් සමාජ ආධාරක පද්ධති වෙත යෑමට ඇති අවබෝධය

## ජාතික මට්ටමේ අගැයීම්

- සියලු තාකෂණික සහ අනෙකුත් භෞතික පහසුකම් සහිත ජාතික විභාග අගැයීම් මධ්‍යස්ථානයක්
- ජාතික විභාග ඇගයීම් කටයුතු මසක් ඇතුළත අවසන් කිරීමට හා දෙමසක් ඇතුළත ප්‍රතිඵල ලබාදිය හැකිවන පරිදි වාර්ෂික පාසල් දින දර්ශනයක්
- විභාග ඇගයීම් ක්‍රියාවලියට දායක වන පරීක්ෂකවරුන්ගේ බුද්ධිමය දායකත්වයට සරිලන ගෙවීම් ක්‍රමයක්
- විෂයමාලා සංවර්ධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපන පර්යේෂණ සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ කටයුතු විධිමත් කිරීම
- ජාතික අධ්‍යාපන ආයතනය තුළ විෂයමාලා සංවර්ධනය කිරීම සඳහා පූර්ණ පහසුකම් සහිත විෂයමාලා සංවර්ධන ඒකකයක්

## මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම

- ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාවය කඩිනමින් ඉවතට
- ගුරු සේවා ව්‍යවස්ථාවක් සහ ගුරු සභාවක්
- ගුරු වෘත්තීය ඉහළම වැටුප් ලබන වෘත්තීන් 10 අතරට
- ගුරු වෘත්තීයට පිවිසීමට පෙර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ වසරක වෘත්තීය පුහුණුවක්
- සියලු අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු අභ්‍යාස විද්‍යාල ඒකාබද්ධ කොට ජාතික අධ්‍යාපන විශ්වවිද්‍යාලයක්
- සෑම වසර තුනකට වරක් පුහුණු වැඩසටහන්
- විෂයමාලා සංවර්ධනය, පෙළ පොත් සම්පාදනය සහ ඇගයීම් ක්‍රියාවලිය එකිනෙක සම්බන්ධ කොට පවත්වා ගෙන යාමට හැකිවන පරිදි ආයතන අතර සම්බන්ධීකරණ ව්‍යුහයක්
- පාසල් පද්ධතිය තුළ සියලු ප්‍රජාව මුහුණ දෙන ලිංගික හෝ වෙනත් හිංසනයන් පිටුදැකීම සඳහා ශක්තිමත් ව්‍යුහයක්

## වෘත්තීය අධ්‍යාපනය

- පෘථුල වෘත්තීය ක්ෂේත්‍රයන්හි ව්‍යවහාරික දැනුම ලබා ගනිමින් කිසියම් නිශ්චිත රැකියා ක්ෂේත්‍රයකට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු වන වෘත්තීය අධ්‍යාපන ක්‍රියාවලියක්
- සාමාන්‍ය අධ්‍යාපන ධාරාවට සමාන්තරව 10 වසරේ සිට 13 වසර දක්වා ඉදිකිරීම් සහ යටිතල පහසුකම්, නිර්මාණාත්මක කර්මාන්ත, ප්‍රාථමික කර්මාන්ත, සේවා කර්මාන්ත, සමාජ සහ ප්‍රජා සේවා සහ නිෂ්පාදන හා තාක්ෂණය යන ක්ෂේත්‍රයන් ඔස්සේ වෘත්තීය විෂය ධාරාවන් සකස් කිරීම
- රැකියා වෙළඳපොළ හා ලෝක ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ඒ ඒ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවිය යුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක වෙනස්කම් පිළිබඳව නිර්දේශ කිරීම සඳහා කර්මාන්ත හා අධ්‍යාපනික ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගෙන් සමන්විත වෘත්තීය අධ්‍යාපනය නියාමන කාර්යංශයක්

## උසස් අධ්‍යාපනය

ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය උසස් න්‍යායික හා පර්යේෂණාත්මක අධ්‍යාපනය ලබාදෙන මධ්‍යස්ථාන බවට පත්කොට ජාත්‍යන්තර මට්ටමේ උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදෙන සමාන්තර විශ්වවිද්‍යාලයීය පද්ධතියක් ඇති කිරීමට කටයුතු කෙරේ.

## රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය

- විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වයට ගරු කරමින් එම විශ්වවිද්‍යාලවල අධ්‍යාපන පාඨමාලා ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කිරීම සඳහා විශ්වවිද්‍යාලයීය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මඟ පෙන්වීම, සමාජීය විවිධත්වය නියෝජනය සහතික කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා සහ අනෙකුත් සාමාජිකයන් පත්කිරීම
- දේශපාලන හා වෙනත් සබඳතා මත උපකුලපතිවරුන් පත්කිරීම වෙනුවට නව ක්‍රමවේදයක්
- විශ්වවිද්‍යාලවල ගෞරවය ආරක්ෂා වන ලෙස විශ්වවිද්‍යාලයීය ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් විශ්වවිද්‍යාල බාහිර පාලක සභා සාමාජිකයින් ලෙස ස්වාධීන පුද්ගලයන් පත්කිරීම
- සෑම පාලක සභාවකම විවිධ වෘත්තීය ක්ෂේත්‍ර සහ ස්ත්‍රී පුරුෂ නියෝජනය සහතික වන පරිදි සාමාජිකයින්
- පාලක සභා සමාජිකයින් පත්කිරීම සඳහා පිළිගත් වෘත්තීය ආයතනවලින් ලබා ගන්නා පොදු නිර්දේශිත නම් ඇතුළත් සංචිතයක්
- කිසියම් විශ්වවිද්‍යාලයකින් විශ්‍රාමලත් තැනැත්තකු එම විශ්වවිද්‍යාලයේ පාලක සභාවට පත්කිරීමේදී අවම වශයෙන් වසර පහකට පෙර විශ්‍රාම ගත් අය පමණක් පත්කිරීම
- සුබසාධනය සහ අනෙකුත් ශිෂ්‍ය කටයුතු සීමිත අවකාශය තුළ කටයුතු කිරීම සඳහා ශිෂ්‍ය නියෝජිතයෙක් අදාළ විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ ඡන්දයෙන් පාලක සභාවට
- පාලක සභා සාමාජිකයකුගේ ධුර කාලය උපරිම අඛණ්ඩ වාර දෙකකට සීමා කිරීම
- අධ්‍යයන අංශයක අංශාධිපති හෝ වසර තුනක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයේ සුදුසුකම් ඇති සියලු පීඨ සාමාජිකයින්ට පීඨාධිපති ධුරය සඳහා පත්වීමට අවස්ථාව
- පීඨාධිපතිවරයකුගේ කාලය උපරිම අඛණ්ඩ වාර දෙකකට සීමා කිරීම
- සෑම විශ්වවිද්‍යාලයකම අධ්‍යයන, අනධ්‍යයන සහ ශිෂ්‍ය ප්‍රජාවගේ දුක්ගැනවිලි සොයා බලා ඒවාට පිළියම් යෙදීමට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පීඨ මට්ටමින් සහ විශ්වවිද්‍යාල මට්ටමින් යාන්ත්‍රණ
- විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ ප්‍රමාදය ඉවත් කිරීම
- ඒ ඒ පාඨමාලාවේ අවම සුදුසුකම් හඳුනාගෙන ඒ සුදුසුකම් සපුරාලන සියලු දෙනාට අවස්ථාව ලැබෙන පරිදි තෘතීයික අධ්‍යාපන පද්ධතිය ක්‍රමිකව පුළුල් කිරීම
- තෘතීයික අධ්‍යාපන ආයතනවල දේශන ශාලා, පර්යේෂණාගාර,

පුස්තකාලය, ආපනශාලා, අන්තර්ජාල පහසුකම් නියමිත ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම

- ශිෂ්‍යාධාර සහ මහපොළ ජීවන වියදමට සරිලන ලෙස ඉහළ දැමීම
- ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉංග්‍රීසි භාෂා ඇතුළු අනෙකුත් මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා සෑම තෘතීයික අධ්‍යාපන ආයතනයකම විශේෂ ඒකක පිහිටුවීම සහ එම ඒකක හරහා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමට අවශ්‍ය සබඳතා පුළුල් කිරීම
- උසස් පෙළ සමතුන්ට ජාත්‍යන්තර ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවල උපාධි හැදෑරීම සඳහා වසරකට ශිෂ්‍යත්ව 200 ක්
- තෘතීයික අධ්‍යාපන ආයතනවල සිදුවන නවක වදය, ලිංගිකත්වය හෝ වෙනත් හිංසනයන් වැළැක්වීම සඳහා ඒකාබද්ධ ව්‍යුහයක්
- ආබාධ සහිත සිසුන් සඳහා පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අධ්‍යාපනය ලැබීම සඳහා අවශ්‍ය පහසුකම්

## පර්යේෂණ සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය

- පශ්චාත් උපාධි පර්යේෂණ හා සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාලයක්
- පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සම්පාදනය
- කර්මාන්ත හා සේවා ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය

## වෘත්තීය අධ්‍යාපන විශ්වවිද්‍යාලය

- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයෙන් පසු තෘතීක අධ්‍යාපන ප්‍රවේශ විභාගය සමත්වන අය සඳහා වෘත්තීය අධ්‍යාපන විශ්වවිද්‍යාලයීය පද්ධතියක්
- හෙද විදුහල් ඒකාබද්ධ කොට ජාතික හෙද විශ්වවිද්‍යාලයක්

## පෞද්ගලික අධ්‍යාපනය

උසස් අධ්‍යාපනයට මූලික සුදුසුකම් ලබන අය රාජ්‍ය අධ්‍යාපන ආයතනවලට ඇතුළත් කර ගැනීමට හැකිවන පරිදි එම පද්ධතිය ප්‍රමාණවත්ව පුළුල් නොවීම නිසා පෞද්ගලික අධ්‍යාපන ආයතන හා විශ්විද්‍යාල, අනෙකුත් පෞද්ගලික තෘතියික අධ්‍යාපන ආයතනවලට විශාල ඉල්ලුමක් පවතී. එහෙත් එම පෞද්ගලික අධ්‍යාපන පද්ධතිවල ගුණාත්මකභාවය හෝ ඒ ඒ පාඨමාලා සඳහා අයකරනු ලබන ගාස්තු නියාමනය කිරීම සිදු නොවේ.

පවතින පෞද්ගලික අධ්‍යාපන ආයතනවල පාඨමාලා නියාමනය කිරීම සඳහා රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන නියාමන ඒකකයක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ඇත.


## වැඩිහිටි අධ්‍යාපනය

■ ප්‍රදේශයේ අධ්‍යාපනික ආයතන, පුස්තකාල, සංස්කෘතික මධ්‍යස්ථාන සමග ඒකාබද්ධව අවිධිමත් අධ්‍යාපනය ලබාදීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක් තුළම ප්‍රජා අධ්‍යාපනික මධ්‍යස්ථාන

■ පුරවැසියන්ට සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා මූලික නීතිය, තොරතුරු තාක්ෂණය හා තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## විවෘත හා දුරස්ථ අධ්‍යාපනය

විවෘත හා දුරස්ථ අධ්‍යාපනය තෘතීයික අධ්‍යාපනයේ කොටසක් බව පිළිගනිමින් විවිධ වෘත්තීන්හි නියැලී සිටින සහ විවිධ අවස්ථාවල තෘතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට පෙර විධිමත් අධ්‍යාපනයෙන් ගිලිහී ගිය අයට තෘතීයික අධ්‍යාපනය ලබා දීමට අවස්ථාව සැලසිය යුතුය. සිය සේවා තත්වය හෝ භූගෝලීය සාධක පදනම් කරගෙන බාධා ඇති නොවන පරිදි උසස් අධ්‍යාපනයට ප්‍රවේශ විය හැකි වන පරිදි විවෘත හා දූරස්ථ අධ්‍යාපනය පුළුල් කෙරේ. මේ සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පහසුකම් පුළුල් කෙරේ.



# නිරෝගී ජීවිතයක්
# සෞඛ්‍ය සම්පන්න ජනතාවක්

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අනුව සෞඛ්‍යය මානව අයිතිවාසිකමක් ලෙස සැලකේ. රෝගීන් සවිබල ගැන්වීම රෝගියා කේන්ද්‍ර කරගත් සෞඛ්‍ය සේවාවක ප්‍රධාන අංගයකි. විශ්ව සෞඛ්‍යය ආවරණය (universal health coverage) සාක්ෂාත් කර ගැනීම තිරසර සංවර්ධන ඉලක්ක (SDG ඉලක්කය 3.8) අනුමනය කිරීම ලෝකයේ ජාතීන් විසින් තබා ඇති එක් ඉලක්කයකි. සෑම පුද්ගලයෙකුටම මූල්‍ය දුෂ්කරතාවකින් තොරව ඔවුන්ට අවශ්‍ය ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් අවශ්‍ය වූ විට සහ අවශ්‍ය ඕනෑම තැනකදී ලබා ගැනීමට හැකියාව තිබිය යුතු වේ. එය සෞඛ්‍ය ප්‍රවර්ධනයේ සිට රෝග වැළැක්වීම, ප්‍රතිකාර කිරීම පුනරුත්ථාපනය කිරීම සහ සහන සත්කාර දක්වා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන්හි පූර්ණ අඛණ්ඩතාව ආවරණය කළ යුතු වේ. එහෙයින් සියලු පුරවැසියන් වෙත ප්‍රමාදයකින් තොරව වඩාත් කාර්යක්ෂම සාක්ෂි මත පදනම් වූ වෛද්‍ය ප්‍රතිකාර සේවාවක් ලබාදීම වගකිව යුතු රජයක යුතුකමකි. රෝගියාගේ ආරක්ෂාව යනු සෞඛ්‍ය ආරක්ෂණය හා අතුරු ප්‍රතිඵල ලෙස

> **සෑම පුද්ගලයෙකුටම මූල්‍ය දුෂ්කරතාවයකින් තොරව ඔවුන්ට අවශ්‍ය ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් අවශ්‍ය වූ වි සහ අවශ්‍ය ඕනෑම තැනකදී ලබා ගැනීමට හැකියාව තිබිය යුතු වේ. එය සෞඛ්‍ය ප්‍රවර්ධනයේ සිට වැළැක්වීම, ප්‍රතිකාර කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ සහන සත්කාර දක්වා අත්‍යාවශ්‍ය ෙ සෟඛ්‍ය සේවාවන්හි පූර්ණ අඛණ්ඩතාව ආවරණය කළ යුතු වේ.**

ඇතිවිය හැකි අනවශ්‍ය හානියේ අවදානම පිළිගත හැකි අවම මට්ටමකට අඩු කිරීමයි. රෝගීන් සඳහා සපයනු ලබන සෞඛ්‍ය සේවාවේ ආරක්ෂාව සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට හැකි වන පරිදි පාලන ක්‍රියාවලීන් සමඟ ආරක්ෂාව සහ තත්ව නියාමන පද්ධති ඒකාබද්ධ කළ යුතු වේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ ලෝක සෞඛ්‍ය පද්ධති ශ්‍රේණිගත කිරීම මඟින් පෙන්නුම් කළේ 2000 වසරේ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය ලෝකයේ අනෙකුත් රටවල් හා සැසඳීමේ දී 76 වන ස්ථානයේ පසු වූ බවයි.  නමුත් CEOWORLD සඟරාවේ Health Care Indexys 2024 සංස්කරණයට අනුව  අද වන විට ශ්‍රී ලංකාව ලෝකයේ 105 වැනි ස්ථානයට පත්ව ඇත. 2021 යුනිසෙෆ් වාර්තා අනුව ශ්‍රී ලංකාව සෞඛ්‍ය සඳහා වැය කරනුයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.5% කි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව පවුලක් සිය සාමාන්‍ය ආදායමෙන් සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් වැයකරන මුදල 20%කට අඩු විය යුතු වුවත් නිදහස් සෞඛ්‍ය සේවයක් පවතින ශ්‍රී ලංකාවේ එය 50%කට ආසන්න වේ.

නිරෝගී හා සෞඛ්‍ය සම්පන්න පුරවැසියෙක් බිහිකිරීම සඳහා රෝග නිවාරණය මෙන්ම රෝග වැළැක්වීම අරමුණ කරගත් කාර්යක්ෂම සෞඛ්‍ය සේවයක් ඇති කිරීමට ජාතික ජන බලවේගය අපේක්ෂා කරයි.



# මූලධර්ම

- ජනතාවට ගෞරවයෙන් සහ අභිමානයෙන් යුතුව සෞඛ්‍ය සේවා රැකවරණ පද්ධතියේ ප්‍රශස්ත ප්‍රතිලාභ භුක්ති විඳීමේ අයිතිය
- කිසිදු බේදයකින් තොරව පුරවැසියාට රෝග නිවාරණ සහ ප්‍රතිකාර සෞඛ්‍ය සේවා ලබාදීමට රාජ්‍යය වගවීම
- සෞඛ්‍ය ප්‍රවර්ධනය, රෝග වැළැක්වීම හා නිවාරණ සෞඛ්‍ය ප්‍රවර්ධනය
- ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව සෞඛ්‍ය සේවාවන්
- රෝගීන්ගේ අයිතීන් සහ ආරක්ෂාව

# ක්‍රියාමාර්ග

## ප්‍රශස්ත සෞඛ්‍ය සේවා කළමනාකරණය

- සෞඛ්‍ය සඳහා වන රජයේ වියදම් කෙටි කාලයක් ඇතුළත අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 3%ක් ඉලක්ක කර ගනිමින් ක්‍රමිකව වැඩිකිරීම
- ඵලදායි ලෙස හා විනිවිදභාවයෙන් යුතුව අරමුදල් භාවිත කිරීම සහ සෞඛ්‍ය සේවාවේ දූෂණ තුරන් කිරීම

## ජාතික සෞඛ්‍ය තොරතුරු පද්ධතියක්

- සෞඛ්‍ය සේවා තොරතුරු පද්ධතිය ඵලදායි හා කාර්යක්ෂම කිරීම සඳහා රෝගීන්ගේ වාර්තා සහ තොරතුරු ඩිජිටල්කරණය
- සෞඛ්‍ය සේවා ආයතනවල සේවා පොරොත්තු කාලය අවම කර ගැනීමට වෛද්‍ය හමුවීම් සඳහා මාර්ගගත ලියාපදිංචිය

## සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග නිවාරණය

- බෝ නොවන රෝගවල සංකූලතා කල්තියා හඳුනාගෙන පාලනය කිරීම හා ප්‍රතිකාර කිරීමට ප්‍රජා පාදක යාන්ත්‍රණ
- අවුරුදු 40ට වැඩි සියලුම වැඩිහිටියන් සඳහා වාර්ෂික සෞඛ්‍ය පරීක්ෂණ
- ව්‍යායාම, ඇවිදීම සහ බයිසිකල් පැදීම ආදී සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන් දිරිමත් කිරීම
- සමාජ විරෝධී ක්‍රියාකාරකම්වලට හා අවදානමට ලක්විය හැකි හැසිරීම් ඇති පාසල් දරුවන් හඳුනාගැනීමේ වැඩසටහන්

**ආහාර සම්බන්ධ වෙළඳ දැන්වීම් නියාමනය කිරීම සඳහා ආයතනයක් සහ පාරිභෝගිකයින්ට නිවැරදි තොරතුරු සහිත වෙළඳ දැන්වීම් සඳහා ආචාර ධර්ම පද්ධතියක්**

- උග්‍ර හා නිදන්ගත මන්දපෝෂණය සහ තරබාරුකම පාලනය කිරීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්

## ආහාර සුරක්ෂිතතාව

- ආහාර සම්බන්ධ වෙළඳ දැන්වීම් නියාමනය කිරීම සඳහා ආයතනයක් සහ පාරිභෝගිකයින්ට නිවැරදි තොරතුරු සහිත වෙළඳ දැන්වීම් සඳහා ආචාර ධර්ම පද්ධතියක්
- ප්‍රමිතීන්ට අනුකූල නොවන ආහාරපාන නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම සහ අලෙවි කිරීම පාලනය කිරීම
- අන්තර්ගතය සඳහන් කොට ආහාර නිසි ලෙස ලේබල් කිරීම අනිවාර්ය කිරීම

## වෘත්තීය සෞඛ්‍යය ආරක්ෂාව සහ යහපැවැත්ම

- හඳුනාගත් වෘත්තීය ආයතන සඳහා කාර්යයේ ස්වභාවය අනුව සේවක සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ පරීක්ෂණයක් සිදුකොට සහතික පිරිනැමීම
- සේවයේ යෙදී සිටියදී හදිසි අනතුරකට මුහුණ දෙන සේවකයකුගේ වෛද්‍ය වියදම් සහ රැකියාවට නැවත පැමිණෙන තෙක් සුදුසු දීමනාවක් සේවා යෝජකයා විසින් සැපයීම

## වැඩිහිටි රැකවරණය

- වැඩිහිටි ප්‍රජාවට කායික හා මානසික සෞඛ්‍යය සමතුලිතතාවක් සහිත නිරෝගී ජීවිතයක් පවත්වා ගැනීම සඳහා ක්‍රියාකාරකම් පැකේජයක්
- සේවාවන්ගෙන් විශ්‍රාම ගැන්වීමට පෙර ක්‍රියාශීලී ජීවන රටාව පවත්වාගෙන යාමට අවශ්‍ය ශාරීරික හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශන වැඩසටහන්
- රෝග නිවාරණ ආයතනවල විශේෂ වැඩිහිටි සායන හඳුන්වා දීම

## ප්‍රාථමික සත්කාර

- ජනගහනය 5000 සිට 10000 දක්වා  ආවරණය වන පරිදි පවුල් වෛද්‍යවරයෙක් සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක්
- රෝගීන් සඳහා ඵලදායී අඛණ්ඩ සත්කාර සැපයීම සඳහා ප්‍රාථමික සත්කාර ආයතන ලෙස මූලික රෝහල්, ද්විතීයික සත්කාර ආයතන ලෙස  මහ රෝහල් සහ තෘතීයික සත්කාර ආයතන ලෙස ශික්ෂණ රෝහල් පොකුරුගත කිරීම
- පවුල් වෛද්‍ය ඒකක ප්‍රදේශයන්හි රෝගීන්ට විශේෂිත සෞඛ්‍ය සේවා සැපයීම සඳහා පර්යන්ත  සායනික සේවා (විශේෂිත උපදේශකයින්ගේ පැමිණීම්) ස්ථාපිත කිරීම (Satellite Clinics)

- මනෝ, කථන, ශ්‍රව්‍ය, වෘත්තීය සහ ප්‍රජා භෞතචිකිත්සා සඳහා පහසුකම් ස්ථාපිත කිරීම

## රෝහල් සත්කාර

- රෝහල්වලට ඇතුළත් කරනු ලබන සෑම නේවාසික රෝගියෙක් සඳහාම ඇඳක් සහ අනෙකුත් පහසුකම්
- සෑම වාට්ටුවකම වාට්ටු කළමනාකරණය සහ හෙද සත්කාර සැලැස්ම යාවත්කාලීන කිරීම සහ සියලුම රෝගීන් සඳහා හෙද සත්කාර වැඩිදියුණු කිරීම
- සෑම රෝහලකම දින ප්‍රතිකාර මධ්‍යස්ථාන ආරම්භ කිරීම
- රජයේ සෞඛ්‍ය ආයතනවල සිදු කරනු ලබන සියලුම රසායනාගාර පරීක්ෂණ සහ ක්‍රියා පටිපාටි සඳහා ISO ප්‍රමිතීන් සහතික කිරීම සහ ප්‍රතිඵල අර්ථකථනය කිරීම සඳහා වෛද්‍යවරයෙකුගේ සහ හෙද නිලධාරියෙකුගේ සේවය පැය 24 පුරා දුරකථන මාර්ගයෙන් ලබා ගත හැකි වන ක්‍රමවේදයක්
- වෘත්තිකයන් ඇතුළු සියලුම ප්‍රජා කණ්ඩායම්වල මැදිහත්වීමෙන් රෝහල් සංවර්ධන කමිටු ප්‍රතිසංවිධානය

## විශේෂිත සත්කාර

සෑම දිස්ත්‍රික්කයකම/පළාතකම පහසුකම් සහිත විස්තීර්ණ හෘද රෝග ඒකකයක්, විස්තීර්ණ පිළිකා සත්කාර ඒකයක්, අක්ෂි සත්කාර ඒකකයක් සහ වකුගඩු සත්කාර ඒකකයක්.

## රෝගීන්ගේ ආරක්ෂාව

- සේවා සැපයීමේදී සෞඛ්‍ය, සේවකයින්ගේ වගකීම තහවුරු කිරීම සහ රෝගීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රෝගී ප්‍රඥප්තියක්
- 'වැළැක්විය හැකි මරණ ශුන්‍ය කිරීම' තේමා පාඨය කර ගනිමින් ගුණාත්මක සෞඛ්‍ය සේවා සහතික කිරීම
- රෝගීන් සහ භාරකරුවන්ගෙන් ලැබෙන පැමිණිලි ස්වාධීනව විමර්ශනය කිරීමට සේවා ප්‍රතිචාර ඒකක

## හදිසි ප්‍රතිකාර

- සුවසැරිය ඇතුළු අනෙකුත් ගිලන්රථ සේවා සඳහා පුහුණු හදිසි සෞඛ්‍ය ප්‍රතිකාර කණ්ඩායම් අනුයුක්ත කිරීම - අත්‍යවශ්‍යම ඖෂධ හිඟයකින් තොරව ලබාදීම
- ඖෂධවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කාර්යක්ෂම ඖෂධ පරීක්ෂණ රසායනාගාරයක්
- දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය පුළුල් කිරීම

- ඖෂධ ආනයනයේදී හා බෙදාහැරීමේදී සිදුවන දූෂණ හා වංචා මුළුමනින්ම ඉවත් කිරීම
- රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම
- ඖෂධවල ගුණාත්මකභාවය සහ සාධාරණ මිල සහතික කිරීම
- නිසි තොග පවත්වා ගනිමින් ඖෂධ හිඟය වළක්වා ගැනීම
- සෑම නගරයකම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අලෙවිසැල් ස්ථාපිත කිරීම

## මානසික සෞඛ්‍යය රැකවරණය

- මානසික සෞඛ්‍ය ආබාධ කල්තියා හඳුනාගැනීමේ සහ විශේෂ සත්කාර සඳහා යොමු කිරීමේ යාන්ත්‍රණයක්
- ප්‍රාථමික මානසික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන (Primary Mental Health Care Centres) සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) ප්‍රදේශයකම පිහිටුවීම
- ළමා හා නව යොවුන් වියේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය, මත්ද්‍රව්‍ය භාවිතය සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වැඩසටහන්
- මානසික ආබාධ සහිත රෝගීන් සඳහා ප්‍රතිකාර පිළිපැදීම, පසු විපරම් කිරීම සහ පවුල් ප්‍රතිකාර දිරිමත් කිරීම සඳහා ප්‍රජාපාදක වැඩසටහන්

## පුනරුත්ථාපනය

- සෑම දිස්ත්‍රික්කයකම විස්තීරණ පුනරුත්ථාපන මධ්‍යස්ථාන
- ඔවුන්ගේම පරිසරයක හෝ විශේෂ මධ්‍යස්ථානයක පුනරුත්ථාපනය සඳහා ප්‍රජාපාදක පුනරුත්ථාපන සත්කාර

## සහන සත්කාර සේවය

- පිළිකා සහ ආඝාතය ඇතුළු සුව කළ නොහැකි රෝගීන් සඳහා නිවෙස් පදනම් කරගත් සහ ආයතන පදනම් කරගත් සහන සත්කාර සේවා

## මුඛ සෞඛ්‍ය සේවා

- පෙර පාසල් දරුවන් සඳහා මුල් ළමාවියේ දත් දිරාපත් වීම (ECC) අවම කිරීම අරමුණු කර ගෙන විශේෂ මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්

## වතු අංශයේ සෞඛ්‍ය සේවා

- පෝෂණ තත්වය, මුඛ සෞඛ්‍ය, ක්ෂය රෝග පාලනය, මූල්‍ය සාක්ෂරතාව, මධ්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය වැළැක්වීම සහ තරුණ ප්‍රජාවේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා විශේෂ වැඩසටහන්

## දේශීය වෛද්‍ය සේවා


- ආයුර්වේද රෝහල් පරිපාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම මගින් ආයුර්වේද, සිද්ධායුර්වේද සහ යුනානි අංශයේ වෛද්‍ය ප්‍රතිකාර පුළුල් කෙරේ
- හිඟයකින් තොරව ඖෂධ නිෂ්පාදනය කිරීමට ආයුර්වේද/යුනානි/සිද්ධ රසායනාගාර වැඩිදියුණු කිරීම
- ආයුර්වේද රෝහල්වල ඇඳන් ඇතුළු ප්‍රතිකාර සැපයීමේ ධාරිතාවය ඉහළට
- ආයුර්වේද රෝහල්වලට අනුබද්ධ ශික්ෂණ පද්ධතිය පුළුල් කෙරේ
- දේශීය ඖෂධ නිෂ්පාදනය සඳහා වගා කිරීම් සහ පර්යේෂණ දිරිමත් කෙරේ
- පාරම්පරික ප්‍රතිකාර ක්‍රම සහ ඖෂධ පිළිබඳ නව පර්යේෂණ සඳහා රාජ්‍ය අනුග්‍රහය

## වෛද්‍ය සංචාරක ව්‍යාපාරය

- තෝරාගත් රෝහල්වල අති නවීන පහසුකම් සහ හොඳින් පුහුණු වූ වෛද්‍ය විශේෂඥයින් සමඟ බටහිර සහ ආයුර්වේද සංචාරක සෞඛ්‍ය සේවා සැපයීම

## පෞද්ගලික වෛද්‍ය සේවය

- රෝගීන්ට ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ලබාදීම සඳහා පෞද්ගලික වෛද්‍ය සේවාවන් ඇතුළු සියලු සෞඛ්‍ය සේවාවන් නියාමනය



## සුවපහසු නිවසක්

# සනීපාරක්ෂක ජීවිතයක්

නාගරීකරණයත් සමග ලංකාවේ සෑම ප්‍රධාන නගරයකම පාහේ විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ප්‍රශ්නය ඉතා උග්‍රව පවතී. කොළඹ නගරය තුළ පමණක් පැල්පත් හා මුඩුක්කු නිවාස 65,000 ක ප්‍රමාණයක් අක්කර 1000 වපසරියක පිහිටා ඇත.

මේවායේ පදිංචි ජනතාව පැවති රජයන් විසින් නොසලකා හරින ලද අතර, අඩු ආදායම්ලාභී ප්‍රජාව ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම් සහ පිරිසිදු වාතාශ්‍රය නොමැති කමින් පීඩා විඳී. නගරයේ පදිංචි අනෙකුත් පදිංචිකරුවන් තමන්ගේ නිවාස සාදවා ගැනීම, මිලදී ගැනීම, කුලියට පදිංචි වීම දැකිය හැක. එහෙත් මිනිසුන්ගේ ආදායම් තත්වය අනුව නිවසක් ඉදි කිරීම, මිලදී ගැනීම හෝ කුලියට පදිංචි වීම ගැටලුවක්ව පවතී. විශේෂයෙන් සමහර රජයේ නිලධාරීන් කුලී පදනම මත පදිංචි වී සිටියද එම කුලිය ගෙවීමට තරම් ආදායමක් නොමැති වීම විශාල ගැටලුවකි. ග්‍රාමීය නිවාස පිළිබඳව වැඩි අවධානයක් රජය විසින්

**බොහොමයක් වතු කම්කරු ප්‍රජාව ඉතා කුඩා ප්‍රමාණයේ අඩු පහසුකම් සහිත පේළි නිවාසවල දිවි ගෙවයි. මෙම පවුල්වල අනු පවුල් වැඩි වීමත් සමග විශාල සමාජ ප්‍රශ්නද පැන නැගී ඇත. තවද ඉඩමක් ලබා දුන්නද නිවසක් තනා ගැනීමට තරම් ආදායම් මට්ටමක ඔවුන් නොමැති බැවින් ඉතා අඩු පහසුකම් යටතේ ජීවිත පවත්වාගෙන යයි.**

යොමු කරනු නොලැබුවද, ග්‍රාමීය ප්‍රදේශවලද නිවාස ප්‍රශ්නය දක්නට ඇත. සමහර පවුල්වලට ඉඩමක් තිබුණද එම ඉඩම්වල අයිතිය පිළිබඳ ප්‍රශ්න, ස්ථානීය පිහිටීම, මාර්ග පහසුකම් නොමැතිවීම, ගොඩනැගිලි ද්‍රව්‍යවල අධික මිල, ස්ථිර ආදායමක් නොමැති වීම හා ආදායම් ප්‍රමාණවත් නොවීම නිවසක් ඉදිකිරීමේදී ග්‍රාමීය ප්‍රදේශවල ජනයා මුහුණ දෙන ප්‍රධාන ගැටලුය.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනගහනයෙන් 2%ක් පමණ වතු නිවාසවල පදිංචිව සිටියි. මෙය මධ්‍යම, ඌව සබරගමුව හා දකුණු පළාත්වල බහුලව දැකිය හැකි අතර, බොහොමයක් වතු කම්කරු ප්‍රජාව ඉතා කුඩා ප්‍රමාණයේ අඩු පහසුකම් සහිත පේළි නිවාසවල දිවි ගෙවයි. මෙම පවුල්වල අනු පවුල් වැඩි වීමත් සමග විශාල සමාජ ප්‍රශ්නද පැන නැගී ඇත. තවද ඉඩමක් ලබා දුන්නද නිවසක් තනා ගැනීමට තරම් ආදායම් මට්ටමක ඔවුන් නොමැති බැවින් ඉතා අඩු පහසුකම් යටතේ ජීවිත පවත්වාගෙන යයි.

සීමිත ඉඩම් ප්‍රමාණය මනාව කළමනාකරණය කරමින් හා ජනතා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් හැකි සෑම විටම මහල් නිවාස සංකීර්ණ ඉදිකිරීම අපගේ අරමුණයි.



# මූලධර්ම

- සෑම පුද්ගලයෙකුටම සෞඛ්‍යාරක්ෂිත නිවසක්
- ප්‍රශස්ත ඉඩම් කළමනාකරණය
- සාකල්‍ය නිවාස සංකීර්ණ

# ක්‍රියාමාර්ග

## නාගරික නිවාස

- තරුණ විවාහක පිරිස් සඳහා නව නිවසක් මිලදී ගැනීමට හෝ නිවසක් ඉදිකර ගැනීමට මූල්‍ය පහසුකම්
- නාගරික ප්‍රදේශවල මහල් නිවාස ඉදිකිරීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම හා ඒ සඳහා අවශ්‍ය ඉඩම් රජයෙන් ලබා දීම
- නාගරික මහල් නිවාස ව්‍යාපෘති සඳහා විදෙස් ගත ශ්‍රී ලාංකිකයින්ගේ ආයෝජන දිරි ගැන්වීම
- රාජ්‍ය නිලධාරීන් සඳහා සේවා ස්ථාන සමීපයේ නිල නිවාස ලබාදීමේ වැඩසටහන්
- කොළඹ නගරයේ මුඩුක්කු සහ පැල්පත් නිවාසවල ජීවත්වන ජනතාවට රාජ්‍ය මැදිහත්වීමෙන් සුදුසු නිවාස
- නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල, සෞඛ්‍ය, අධ්‍යාපන, ක්‍රීඩා, ප්‍රවාහන, උද්‍යාන ආදී පහසුකම් සහිත අංග සම්පූර්ණ නිවාස ව්‍යාපෘති

## ග්‍රාමීය නිවාස

- නිවෙස් ඉදිකිරීම සඳහා වන ඉඩම් අයිතිය පිළිබඳ ගැටලු විසඳීම සඳහා ඉඩම් පනත සංශෝධනය
- පදිංචි ප්‍රදේශ වෙත ප්‍රවේශ මාර්ග පහසුකම් පුළුල් කිරීම
- නිවාස ඉදිකිරීම සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක්

## වතු නිවාස

- කඳුකර ප්‍රජාවගේ නිවාස හා ජලය ඇතුළු සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට මූල්‍ය හා යටිතල පහසුකම්.
- කඳුකර ප්‍රජාවට ස්ථිර නිවසක් තනා ගැනීම සඳහා ඉඩම් ලබාදීම
- වතු ආශ්‍රිත ප්‍රදේශවල නිවාස යෝජනා ක්‍රම



## ජවසම්පන්න පුරවැසියෙක්

# ජයග්‍රාහී ජනතාවක්

කරග සහභාගිත්වය සහ ජයග්‍රහණය සඳහා පමණක් නොව නිරෝගීමත් , විනයගරුක සහ බුද්ධිමත් ජන සමාජයක් නිර්මාණය කර ගැනීමේ ක්‍රියාවලියේදී ද ක්‍රීඩාවේ කාර්යභාරය අතිශය වැදගත්වේ. ජයග්‍රහණය විසින් රටට කීර්තිය සහ අභිමානය ගෙන එයි. සහභාගීත්වය විසින් නිරෝගී ජාතියක් බිහි කරන අතර විනය ගරුක, ශක්තිමත් පෞරුෂයක් සහ උසස් මනෝභාවයක් ඇති පුද්ගලයින් නිර්මාණය කරයි.

අකාර්යක්ෂම කළමනාකරණය සහ දේශපාලන මැදිහත්වීම් ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනයට ප්‍රබල බාධාවකි. පවත්නා අසංවිධානාත්මක ක්‍රමය මගින් සමහර ක්‍රීඩා ක්ෂේත්‍ර හා ක්‍රීඩකයින් පෞද්ගලික හිමිකරුවන්ගේ ග්‍රහණයට නතුකර ඇත. බොහොමයක් සම්පත් සහ සේවාවන් නාගරිකව සංකේන්ද්‍රණය වී ඇති අතර ග්‍රාමීය සහ වතු අංශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොසලකා හරිනු ලැබ ඇත.

ශ්‍රී ලංකාව වැනි සිහින බිඳවැටුන රටක ක්‍රීඩාවෙන් ලබා ගත හැකි බොහෝ දේ පැවතියත් ජාත්‍යන්තර, ක්‍රීඩා ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාව සිටින්නේ ඉතා පසුපසිනි. අතීතයේ අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව  සැලකිය යුතුමට්ටමක පැවතිය ද මෑත කාලයේ එයද පසුබෑමකට ලක්වී ඇත. ජාතියට කීර්තියක් හා අභිමානයක් ගෙන ඒමට සමත් එමෙන්ම නිරෝගී හා විනයගරුක පුරවැසි ප්‍රජාවක් නිර්මාණය කිරීමට සමත් ක්‍රීඩා හා ශාරීරික සුවතාව ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම ජාතික ජන බලවේගයේ අරමුණයි.



# මූලධර්ම

- සහභාගීත්වය, විනයගරුක බව, විශ්වාසය සහ තරගකාරිත්වය
- ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීයභාවය සහ ධාරිතාව
- ප්‍රමාණවත් යටිතල පහසුකම්
- සාධාරණ ප්‍රවේශය
- ජාත්‍යන්තර සහයෝගිතාව
- රාජ්‍ය, පෞද්ගලික අංශය සහ රාජ්‍යය නොවන සංවිධාන දායකත්වය

# ක්‍රියාමාර්ග

- ක්‍රීඩා පනත සංශෝධනය කිරීම
- ක්‍රීඩාවේ ප්‍රමිතිය සහ සාධාරණය ඉටු කිරීමට අවශ්‍ය ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට බලතල සහිත ක්‍රීඩා යුක්ති ජාතික කොමිෂමක්
- යෝජිත ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාව කඩිනමින් බලාත්මක කිරීම
- ශ්‍රී ලංකා ක්‍රිකට් ඇතුළු අනෙකුත් ක්‍රීඩා පරිපාලන ආයතනවල සිදුවී ඇති වංචා හා දූෂණ විමර්ශණය කිරීම
- ක්‍රීඩාව සහ ව්‍යායාම මහජන සෞඛ්‍ය න්‍යාය පත්‍රය සමග ඒකාබද්ධ කිරීම
- පාසල් වයසේ සිටින සෑම දරුවෙකුටම අවම වශයෙන් එක් ක්‍රීඩාවක නිරත වීමට පහසුකම්
- සෑම පාසලකටම ක්‍රීඩා ගුරුවරුන් හා පුහුණු කරුවන්
- පාසල් මට්ටමේදීම දක්ෂතා ඇති දරුවන් හඳුනාගෙන ඔවුන් ජාතික තලයට ගෙන ඒම සඳහා වැඩපිළිවෙළක්
- සෑම පාසලකටම අවශ්‍ය ක්‍රීඩා උපකරණ සහ පහසුකම් විෂමතාවයකින් තොරව රජය මැදිහත්වී ලබාදීම
- ක්‍රීඩා සඳහා විශේෂ දක්ෂතා ඇති ක්‍රීඩකයින් හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ආර්ථික මට්ටම, පෝෂණය සහ පුහුණුවට අදාළ උපකරණ ලබාදීම සඳහා පාසැල් සහ දිස්ත්‍රික්ක මට්ටමින් විශේෂ වැඩසටහන්
- ජාතික ක්‍රීඩා පුහුණු පාසලක් කේන්ද්‍රකොට ගනිමින් පළාත් 09 සඳහාම නවීන ක්‍රීඩා පාසල් ජාලයක්

- අන්තර්ජාතික මට්ටමේ දැනුම හා කුසලතාවය පිරි ශාරීරික අධ්‍යාපන වෘත්තිකයන් බිහිකිරීම සඳහා විශ්වවිද්‍යාල උපාධි අවස්ථා පුළුල් කිරීම
- ක්‍රීඩා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර විශිෂ්ටතා මධ්‍යස්ථානයක්
- පුහුණුකරු සහ කළමනාකරණ කාර්යමණ්ඩලය සඳහා නියමිත වේතන හඳුනාගැනීමට සහ පහසුකම් සැලසීමට ජාතික පුහුණු සහ කළමනාකරණ සහතික සහ බලපත්‍ර වැඩසටහනක්
- ක්‍රීඩාවට දක්ෂකම් ඇති ආබාධ සහිත පුද්ගලයින්ට පළපුරුදු පුහුණුකරුවන් යොදා පුහුණු කර ජාත්‍යන්තර තරග සඳහා යොමු කිරීම
- ක්‍රීඩාවේ හා ශාරීරික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආයෝජකයින්ට සහ දේශීය ක්‍රීඩා උපකරණ නිෂ්පාදකයින්ට විශේෂ බදු සහන
- ක්‍රීඩා, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය
- ක්‍රීඩා මාධ්‍යවේදීන් පුහුණු කිරීම සඳහා  වන විධිමත් අධ්‍යාපනික වැඩසටහන්
- නීති විරෝධී ඖෂධ භාවිතය, තරග පාවාදීම් සහ වෙනත් වංචා ඇතුළු සියලු වංචා හා දූෂණ තුරන් කිරීමට යාන්ත්‍රණයක්
- රටපුරා පවතින ව්‍යායාම මධ්‍යස්ථානවලට නිසි රෙගුලාසි සහිතව සහාය දෙමින් රට පුරා නව ක්‍රීඩා සහ විනෝදාස්වාද පහසුකම් දියුණු කිරීම සඳහා උපායමාර්ගික ආයෝජන සැලැස්මක්
- ක්‍රීඩා පහසුකම් පිළිබඳ ජාතික දත්ත ගබඩාවක්
- දේශපාලනීකරණය වූ සියලු ක්‍රීඩා ආයතන සහ ක්‍රීඩාවන් එයින් මුදා ක්‍රීඩාවේ අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වන ස්වාධීන සහ දියුණු ආයතන බවට පත්කිරීම
- ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා දිවෙන ඒකාබද්ධ ක්‍රීඩා පුහුණු සැලැස්මක්
- සෑම පළාතකටම නේවාසික පහසුකම් හා ආබාධ සහිත ප්‍රජාවට ප්‍රවේශය සහිත නවීන ක්‍රීඩා සංකීර්ණයක්
- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම අංග සම්පූර්ණ ක්‍රීඩාංගණයක්
- ප්‍රජා ශාරීරික සුවතා මධ්‍යස්ථාන 1000ක්
- ජාතික ක්‍රීඩා සංගම් නියාමන අධිකාරියක්
- ක්‍රීඩා ආචාරධර්ම පද්ධතියක් හා පවත්නා ක්‍රීඩා නීති යාවත්කාලීන කිරීම
- ජාතික ක්‍රීඩා සංචිතයට ඇතුළත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා තාක්ෂණ නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හා රක්ෂණ ක්‍රමයක්
- ක්‍රීඩාව කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීමට රාජ්‍ය සහ පෞද්ගලික අංශ ඒකාබද්ධ වූ යාන්ත්‍රණයක්



# උදාර සංස්කෘතික ජීවිතයක්
# සහකම්පනීය ජනතාවක්

කලා සංස්කෘතික අවකාශය යනු සමාජයක අතිසංවේදී කලාපයකි. එම අඩවිය මානව සමාජය වෙත කෙරෙන බලපෑම සන්නිවේදනය වන්නේ කල්ගත වී වුවද වර්තමාන ලාංකේය සමාජ පරිහානියේ විශාල පදාසයක් මතු වන්නේ මේ කලාපයේ දුබල බව නිසාය.
පසුගිය ආණ්ඩු රැසක් මගින් සංස්කෘතික ක්ෂේත්‍රය ප්‍රසිද්ධ ලෙසම නොසැලකිල්ලට බඳුන් කෙරිණ. දරුවෙකුගේ මුල් ළමාවියේ සිට තියුණු අවධානයකින් ගොඩනැගිය යුතු සාකල්‍ය අධ්‍යාපන සිතියම කලින් කලට සිදු වූ දේශපාලන බලහුවමාරුවේ ගොදුරක්ව ඇත. පෙර පාසල, පාසල, කාර්මික විද්‍යාලය, විශ්වවිද්‍යාලය ආදී අවධි පසුකර එන පුද්ගලයා පරිපූර්ණ පුරවැසියෙකු නොවීමට හේතුවී  ඇත්තේ දියුණු සංස්කෘතික ජීවිතයක් උරුම කිරීමට අර්බුදයට ගිය සමාජය අපොහොසත් වීම නිසාය. එනිසාම සංස්කෘතිය නම් අඩවිය මානව දිවියේ මුදුන් මුලක් බවට වන විශ්වාසයද පලුදු වී ඇත.

**මෙය කළ හැක්කේ ජාතික පුනරුදයක් ඉලක්ක කරගත් කලා සංස්කෘතික ක්ෂේත්‍රයේ කෙරෙන ප්‍රබල පරිවර්තනයක් මගිනි. "බහුවිධ සංස්කෘති පිළිගන්නා නිවහල්, විචාරශීලී, මානව ගරුත්වයෙන් යුතු නව සංස්කෘතික මිනිසෙකු නිර්මාණය කර ගැනීම" ජාතික ජන බලවේගයේ අපේක්ෂාවයි.**

මේ ක්ෂේත්‍රය; අධ්‍යාපනය, කලාව, ජනමාධ්‍ය හා ආගමික විශ්වාස ආදී එකිනෙක හා බැඳුණු අඩවි රැසක මිශ්‍රණයේ ප්‍රතිඵලයකි. අද වන විට මේ සමස්ත අඩවියේ දිගුකාලීන බිඳවැටුම; තෘෂ්ණාධික තරගය, අවිවේකය, ආතතිය, දිවිනසා ගැනුම්, අතෘප්තිය, ප්‍රචණ්ඩත්වය, පරිසරය නොතැකීම හා  කෙලෙසුණු මානව ගරුත්වය ආදී කම්පනීය සමාජ විපාක සමුදායක් ජනිත කර ඇත. මෙතැනින් මිදී, සමාජය වහා සුවපත් කරලිය යුතු වෙනස්කම් කළ හැකි අලුත් පරිකල්පනයක් සමස්ත සමාජය ඉල්ලා සිටියි. මෙය කළ හැක්කේ ජාතික පුනරුදයක් ඉලක්ක කරගත් කලා සංස්කෘතික ක්ෂේත්‍රයේ කෙරෙන ප්‍රබල පරිවර්තනයක් මගිනි. "බහුවිධ සංස්කෘති පිළිගන්නා නිවහල්, විචාරශීලී, මානව ගරුත්වයෙන් යුතු නව සංස්කෘතික මිනිසෙකු නිර්මාණය කර ගැනීම" ජාතික ජන බලවේගයේ අපේක්ෂාවයි.



## මූලධර්ම

- සෑම ප්‍රජාවකගේම සංස්කෘතික අනන්‍යතාව සංරක්ෂණයේද පරිණාමනයේද අයිතිය
- සංස්කෘතියේ වර්ධනය උදෙසා සෑම ප්‍රජාවකටම සහ පුද්ගලයාට මැදිහත් වීමට ඇති අයිතිය
- අන්තර් සංස්කෘතික පෝෂණය සහ පරිණාමය
- දේශීය හා විදේශීය සංස්කෘතික ඥානය අත්පත් කර ගත් සබුද්ධික, භාවමය ධාරිතාවෙන්, වින්දන ශක්තියෙන් යුතු සහකම්පනීය මිනිසෙක්
- සංස්කෘතික විවිධත්වය හා සංස්කෘතික විචාරය  පිළිගැනීම
- දේශපාලන අතපෙවීමෙන් නිදහස් සංස්කෘතික නිෂ්පාදිතයන්
- සංස්කෘතිකවත් පුරවැසියකු නිර්මාණය කිරීම සඳහා රජයේ සවිඥානික මැදිහත් වීම

**සංස්කෘතිය යන්න පුළුල් ජීවන පදාසයක් නිරූපණය කෙරෙන විචිත්‍ර අඩවියක් බව පෙන්වා දෙන අධ්‍යාපන ප්‍රපත්තියක් ක්‍රියාත්මක කිරීම**

## ක්‍රියාමාර්ග

- සංස්කෘතිය යන්න පුළුල් ජීවන පදාසයක් නිරූපණය කෙරෙන විචිත්‍ර අඩවියක් බව පෙන්වා දෙන අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- ජාතික හා විශ්ව සාහිත්‍ය, ශ්‍රව්‍ය  දෘශ්‍ය මාධ්‍ය, නාට්‍ය, නර්තනය, දෘශ්‍ය, මූර්ති හා ඡායාරූප කලා සහ ගීත සාහිත්‍ය ආදියේ පාසල් විෂය නිර්දේශ නවීනත්වයට ගැලපෙන ලෙස යාවත්කාලීන කිරීම
- අධ්‍යාපන ක්ෂේත්‍රය යනු සංස්කෘතික පුරවැසියා ගොඩනැගීමේ පදනම ලෙස සලකා විධිමත් අධ්‍යාපන පද්ධතිය තුළ කලා - සංස්කෘතික විෂයන් ඉගැන්වීම ආකර්ෂණීයවූ ද බුද්ධි ප්‍රබෝධනයට තුඩු දෙන්නාවූ ද ආකාරයට ඉගැන්වීම පිළිබඳ ක්‍රමවත් පුහුණුවක් ගුරුවරුන්ට ලබා දීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය සමග ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය සහ  පුද්ගලික අංශයේ අඛණ්ඩ දායකත්වය සහිතව සාහිත්‍යය, සිනමාව හෝ නාට්‍යය ආදී කලා ප්‍රවර්ගවලට අදාළව 'ජාතික අරමුදලක්' ගොඩනැගීම

- ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය ජාලා භාවිත කර පොත පත කියවීම, කලා රසවින්දනය පිළිබඳ මහජන අවකාශයෙහි කතිකාව තීව්‍ර කරමින් විසි එක්වෙනි සියවසෙහි සංස්කෘතිකවත් පුරවැසියා නිර්මාණය කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සංස්කෘතිය, යෞවනයා වෙත සමීප වන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම
- සෑම කලා ක්ෂේත්‍රයකම නව දැනුම හා පුහුණුව ලබා ගැනීම සඳහා තෝරා ගත් සුදුස්සන් ජාත්‍යන්තර ආයතන වෙත යොමු කිරීමට ශිෂ්‍යත්ව පිරිනැමීම
- සෑම ප්‍රධාන නගරයකම කලා - සංස්කෘතික කටයුතු පිණිස, ආයතන පිහිටි කලාපයක් ගොඩනගා එම කලාපය වෙත පුරවැසියන් නිරන්තරයෙන් ආකර්ෂණය කර ගන්නා වැඩසටහන් දියත් කිරීම
- ශක්තිමත් බුද්ධිමය දේපළ පනතක් ඇති කොට කලාකරුවාගේ නිර්මාණ අයිතිය තහවුරු කිරීම සහ ලෝක බුද්ධිමය හිමිකම් සංවිධානයේ සාමාජිකත්වය (World Intelleectual Property Organization) ලබා ඒ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම
- විශ්ව සාහිත්‍යමය, නාට්‍යයක පිටපත් ජාතික භාෂාවලට පරිවර්තනය කිරීම දිරිමත් කිරීම හා ජාත්‍යන්තර පරිවර්තන හිමිකම් ලබා ගැනීම විධිමත් කිරීම
- දැනට ක්‍රියාත්මක රාජ්‍ය සම්මාන උළෙළවල දුර්වලතා සමාලෝචනය කර, සියලු කලා ක්ෂේත්‍ර අළලා දියුණු ජාතික සම්මාන උළෙළක් සංවිධානය කිරීම
- විවිධ කලා ක්ෂේත්‍රවලට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ, කඩදාසි ඇතුළු තෝරාගත් භාණ්ඩ වෙත බදු සහන ලබා දීම
- කලා ක්ෂේත්‍රවල විශ්‍රාමිකයන්ගේ සුබසාධනය පිණිස වන සමාජ ආරක්ෂණ ක්‍රමයක්, කලා සංස්කෘතික ක්ෂේත්‍රයට සම්බන්ධ සම්මන්ත්‍රණ ශාලා, රඟහල, එළිමහන් රංග පීඨ ආදී භෞතික සම්පත් සංගණනයක් කොට දත්ත පද්ධතියක් සැකසීම සහ ඒවා ක්ෂේත්‍ර වෙත ලබා දීමේ සංයුක්ත වැඩපිළිවෙළක් සැකසීම
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සංස්කෘතික මධ්‍යස්ථාන, බහුකාර්ය සංස්කෘතික කේන්ද්‍ර බවට පරිවර්තනය කොට වේදිකා, පුහුණුවීම්, ආලෝකකරණ, ශබ්ද ආදී පහසුකම් සහිතව, පොත් දොරට වැඩුම්, වැඩමුළු, සංවාද, ප්‍රදර්ශන ආදී සංස්කෘතික අත්දැකීම් මෙම මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගෙන පවත්වා ගෙන යාම

- **සාහිත්‍ය ක්ෂේත්‍රය**
- වාර්ෂිකව පළ වන සාහිත්‍ය කෘතිවලින් කලාත්මක වශයෙන් උසස් කෘති හා ජාතික මට්ටමින් ඇගයීමට ලක් වන නව ප්‍රකාශන පාසැල් පුස්තකාල සහ මහජන පුස්තකාල වෙත බෙදා හැරීම
- සෑම නගරයකම හා උප නගරයකම පාහේ දියුණු පුස්තකාල ඇති කොට සක්‍රීය පාඨක සමාජ පිහිටුවීම
- සාහිත්‍ය විචාරය සහ රස වින්දනය සඳහාම වෙන් වූ සඟරා සංස්කෘතියක් යළි ඇති කිරීම
- ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ පොත් ප්‍රදර්ශන හා ප්‍රකට විදේශීය පොත් ප්‍රදර්ශන සංවිධානය කිරීම සඳහා ලේඛකයන් හා ප්‍රකාශකයන් දිරිමත් කිරීම
- පාසැල් ගුරුවරුන් සහ ශිෂ්‍යයන් ඉලක්ක කරගත් සාහිත්‍ය රසවින්දන වැඩසහටහන් සංවිධානය මගින් අලුත් රසික පිරිසක් ගොඩනැගීම
- විශිෂ්ට විශ්ව සාහිත්‍ය කෘති සිංහල සහ දෙමළ භාෂාවලට නගා පළ කිරීමේ වැඩසටහන් ඇති කිරීම සහ එවන් පරිවර්තනවල යෙදෙන අය දිරිමත් කිරීම
- රාජ්‍ය ලේඛනාගාරය නවීන තාක්ෂණික පහසුකම් සහිත ව ප්‍රතිසංවිධානය කිරීම
- විද්‍යුත් ප්‍රකාශනවලට, අධ්‍යාපන සහ පර්යේෂණ කේන්ද්‍රවලට අනුබද්ධ ඩිජිටල් ඥාන කෝෂ්ඨාගාර පවත්වාගෙන යාම දිරිමත් කිරීම
- සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ පර්යේෂණ අරමුදලක් පිහිටුවා විධිමත් ලෙස පර්යේෂණ සඳහා අරමුදල් සම්පාදනය හා ජාත්‍යතර පර්යේෂණ සැසි වාර්ෂිකව සංවිධානය කිරීම

**සිනමා සහ ටෙලි නාට්‍ය**

- ජාතික චිත්‍රපට සංස්ථාව ප්‍රතිසංවිධානයකට යොමු කර ජාතික චිත්‍රපට ආයතනයක් බිහිකිරීම
- චිත්‍රපට ශාලා සංවිධිත වැඩපිළිවෙළක් සහිතව නවීකරණය කිරීම හා සෑම දිස්ත්‍රික්කයකටම ශාලා 3 බැගින් ඇති කිරීම
- චිත්‍රපට හා ටෙලි නාට්‍ය නිෂ්පාදනයට ණය සහ වෙනත් සහන ආදිය ලබා දීම ප්‍රමිතිගත කිරීම
- සෑම සිනමා කෘතියක්ම බෙදා හැරීමේදී සාධාරණ අනුපිළිවෙළ අනුගමනය කිරීම හා සංවිධිත ලෙස ප්‍රමුඛතාකරණය කිරීම
- ටෙලි හා සිනමා කෘති වර්ගීකරණ මණ්ඩලයක් මඟින් ප්‍රමිතිගත කිරීම

- වාර්ෂික ජාත්‍යන්තර සිනමා උළෙලක් පැවැත්වීම හා ජාත්‍යන්තර සිනමා උලෙළ සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමට අනුග්‍රහය ලබාදීම
- බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන උපයෝගී කරගනිමින් විශිෂ්ට සිනමා කෘති ප්‍රදර්ශනය කිරීම හා ඒ ඇසුරින් සිනමා - කලා සංවාද සංවිධානය කිරීම
- ආධුනික සිනමාකරුවන් වෙනුවෙන් ජාතික ටෙලි - සිනමා අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරීම සහ ජාතික සිනමා සංරක්ෂණාගාරයක් පිහිටුවීම
- දැනට පුද්ගලික මට්ටමින් පවත්වා ගෙන යනු ලබන සිනමා සංරක්ෂණාගාර සඳහා පහසුකම් සැලසීම, ප්‍රතිසංවිධානය මෙන් ම ජාතික සංරක්ෂණාගාර ජාලයකට යොමු කිරීම
- රූපවාහිනී - සිනමා සමාජ පාසැල් මට්ටමින් ආරම්භ කිරීම
- ටෙලි - සිනමා නිර්මාණවල බුද්ධිමය දේපළ සම්බන්ධ නෛතික රාමුව ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලව යාවත්කාලීන කිරීම
- කෙටි චිත්‍රපට හා ජංගම දුරකථන සිනමා උලෙළ විධිමත් ලෙස වාර්ෂිකව පැවැත්වීම හා ජාත්‍යන්තර උලෙළවල අත්දැකීම් හා දැනුම ලැබෙන වැඩසටහන් සැකසීම

**වේදිකා නාට්‍ය**

- සමකාලීන නාට්‍ය  කලාව පිළිබඳ ජාතික පර්යේෂණ හා පුහුණු ආයතනයක් ආරම්භ කිරීම
- පැරණි හා නව නාට්‍ය නිෂ්පාදන හා සම්බන්ධ පිටපත්, රංග භාණ්ඩ, සිහිවටන හා පටිගත කිරීම් හැකිතාක් රැස්කර විධිමත් ලෙස සංරක්ෂණය කෙරෙන ජාතික නාට්‍ය සංරක්ෂණාගාරයක් පවත්වාගෙන යාම
- නාට්‍ය නිෂ්පාදනය හා ප්‍රදර්ශනය සඳහා සංවිධිත ලෙස මූල්‍යාධාර ලබා දීම සහ බදු සහන ලබා දීම
- ග්‍රාමීය මට්ටමේ සිට නාට්‍ය කලාව ප්‍රවර්ධනයට බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය හරහා ජාතික තලය දක්වා විධිමත් වැඩපිළිවෙළක් සැකසීම
- සෑම ප්‍රධාන නගරයක ම පූර්ණ පහසුකම් සහිත නවීන රංග ශාලා පද්ධතියක්  බිහි කිරීම හා පවතින ශාලා ප්‍රවර්ධනය කොට එම ජාලයට ඇතුළත් කිරීම
- නාට්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව ප්‍රවර්ධනය හා ප්‍රාදේශික හා ජාතික මට්ටමින් ඒවා පිරිනැමීම විධිමත් කිරීම
- නාට්‍ය  කලා රසිකත්වය දියුණු කිරීමේ වැඩසටහන් හා  එළිමහන් රංග පීඨ සංකල්පය ප්‍රවර්ධනය කිරීම
- විකල්ප රංග කලා අවකාශ සඳහා පහසුකම් සැලසීම

### නර්තන

- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවස්ථාවලදී නර්තන අධ්‍යාපනය සම්බන්ධ ආයතන, ගුරුකුල හා ප්‍රවීණයන් සම්බන්ධ කරගැනීම
- නර්තනය සුරැකීම හා ප්‍රවර්ධනය මූලික කරගත් ජාතික ආයතනයක් බිහි කිරීම හා බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථානවල අනුයාත සම්බන්ධය ඒ සමග බද්ධ කිරීම
- ලාංකේය ජන නර්තන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ජාත්‍යන්තර අධ්‍යයනවලට පර්යේෂණ යොමු කිරීම
- ජාතිකත්ව අනන්‍යතාවන් සහිත නර්තන සම්ප්‍රදායන් ප්‍රවර්ධනය කිරීම
- රජයේ ලියාපදිංචි නර්තන කලායතන ජාලයක් ගොඩනැගීම
- නර්තනය පිළිබඳ ජාත්‍යන්තර අධ්‍යයන අවකාශ සලසා දීම හා ශිෂ්‍යත්ව පිරිනැමීම විධිමත් කිරීම
- නර්තන කුසලතා පූර්ණ දරුවන් ග්‍රාමීය මට්ටමින් හඳුනා ගෙන ජාත්‍යන්තර තලය තෙක් ප්‍රවර්ධනය කිරීම
- නර්තන විෂය පිළිබඳ ත්‍රෛභාෂා ශාස්ත්‍රීය ග්‍රන්ථ මුද්‍රණය හා ජාත්‍යන්තර ඥානය සිංහල හා දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම දිරිමත් කිරීම
- සමකාලීන හා සාම්ප්‍රදායික නර්තන කලා අධ්‍යයන පර්යේෂණය හා සංරක්ෂණය සඳහා පහසුකම් සැලසීම

### දෘශ්‍ය, මූර්ති සහ ඡායාරූප කලා

- චිත්‍ර, දෘශ්‍ය හා ඡායාරූප කලාවේ අතීත හා වර්තමාන නිර්මාණ සංරක්ෂණය අධ්‍යයනය හා ජාත්‍යන්තර තලයේ පර්යේෂණ මෙහෙයවීම සඳහා ජාතික ආයතනයක් ස්ථාපිත කිරීම
- ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන සඳහා නිර්මාණකරුවන් යොමු කිරීම
- පළාත් කේන්ද්‍රීය පුහුණු ආයතන ස්ථාපිත කිරීම හා එම අවකාශය වෘත්තීය අවස්ථා වෙත යොමු කිරීම
- දෘශ්‍ය කලා නිර්මාණ අලෙවිය සඳහා ජාතික හා ජාත්‍යන්තර නිර්මාණ වෙළඳපොළ ප්‍රවර්ධනය කොට සංචාරක කර්මාන්තය සමග සම්බන්ධ කිරීම මේ නිර්මාණ ප්‍රවර්ග සමග බැඳුණු 'නිර්මාණ සමාජ' පාසැල් මට්ටමේ සිට පවත්වාගෙන ඒම, තරග සංවිධානය


### සංගීත සහ ගීත නිර්මාණ ක්ෂේත්‍රය

- සංගීත සම්ප්‍රදායන් සුරැකීම හා ප්‍රවර්ධනය සඳහා ජාතික ආයතනයක් ස්ථාපිත කිරීම
- ලාංකේය ජනසංගීත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ සංරක්ෂණය කිරීම

- පැරණි සංරක්ෂිත ඥානය නිසි ලෙස පර්යේෂණයට, අධ්‍යයනයට අවස්ථාව සැලසීම
- ලියාපදිංචි සංගීත කලායතන ජාලය ගොඩනැගීම
- ගීත හා සංගීතය පිළිබඳ බුද්ධිමය දේපළ නීතිරීති නැවත සලකා බැලීම හා සංශෝධනය කිරීම
- ජාතන්තර සංගීත අධ්‍යයනය හා පර්යේෂණය සඳහා අවකාශය සලසා දීම, ශිෂ්‍යත්ව ප්‍රදානය විධිමත් කිරීම
- පටිගත කෙරෙන සෑම ගීත සහ සංගීත නිර්මාණයකම මුල් පිටපත් සංරක්ෂණය කෙරෙන ඩිජිටල් තාක්ෂණික ඒකකයක් පවත්වාගෙන යාම" සංගීත ක්ෂේත්‍රයේ තාක්ෂණික මෙවලම් බදුවලින් නිදහස් කිරීම
- කර්තෘවරුන් හා සංරචකයන්ගේ සංගම් සාමූහිකයේ (International Confederation of Societies of Authors and Composers) සාමාජිකත්වය ලබාගෙන සංගීත ක්ෂේත්‍රයේ බුද්ධිමය හිමිකම් ආරක්ෂා කිරීම

## අස්පර්ශනීය සංස්කෘතික උරුමය හා සම්ප්‍රදායික කලා

- අස්පර්ශනීය උරුමය හා සම්ප්‍රදායික කලා සම්බන්ධ ජාතික පර්යේෂණායතනයක් බිහි කිරීම, දැනට පවතින උරුමය හඳුනා ගැනීම හා සංරක්ෂණය
- ප්‍රාදේශීය මට්ටමින් මෙම අඩවියේ ඥානය, මෙවලම්, ගුරුකුල හා සම්ප්‍රදායන් මෙන්ම මානව සම්පත හඳුනා ගැනීම හා ජාතික - ජාත්‍යන්තර තලය තෙක් අඛණ්ඩ ලෙස ප්‍රවර්ධනය කිරීම
- මෙම අවකාශය සමග සංචාරක කර්මාන්තය බද්ධ කිරීමට අවශ්‍ය වැඩසටහන් සැකසීම
- අස්පර්ශනීය උරුමය හා බැඳුණු වෙදකම, පරිසර හිතකාමී භාණ්ඩ නිෂ්පාදනය, විනෝදාස්වාද කර්මාන්තය, මානසික සුවතාව ප්‍රවර්ධනය ආදී උප ක්ෂේත්‍ර දියුණුවට දිරි දීම
- මෙම විෂය කලාපය හා සම්බන්ධ විදේශීය සරසවි, පර්යේෂණ ආයතන සමග සබඳතා දියුණු කිරීම හා පශ්චාත් උපාධි මට්ටමින් අධ්‍යයනයට මග සැලසීම
- සම්ප්‍රදායික කලාකරුවන්, ගුරුකුල, ශිල්ප ආයතන හඳුනාගෙන ජාලගත කිරීම හා යාවත්කාලීන කිරීම



## සංරක්ෂිත ඉතිහාසයක්

# උරුම නව්‍ය ජනනයක්

ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය යන දැ සමාජ දැනුම, සමාජයේ යහපැවැත්ම සහ ප්‍රජා ඒකාබද්ධතාවේ මූලිකාංගයි. සියල්ල ඇතුළත් වූ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන ආර්ථික කටයුතුවලට සහ රැකීරක්ෂා උත්පාදනයටද ඒවා මූලික සම්පත් ලෙස උපයෝගී වෙයි.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය පිළිබඳ දැනට තිබෙන ආකල්පය පශ්චාත් යටත්විජිත අදහසක් වන අතර එම , ආකල්පයේ පවතින සීමිත බව නිසා ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය මෙරට ජාතික සංවර්ධනයට තිරසාර ලෙස යොදා ගැනීම මග හැරී තිබේ. එහෙයින් ඒ ක්ෂේත්‍රයට සාධනීය ලෙස යොදා ගැනීමට නව්‍ය ජනනාත්මක දැක්මකින් යුත් නව ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කර ගැනීම අත්‍යවශ්‍යය. පර්යේෂණ සහ සංවර්ධනය මත පදනම් වූ නවමු ප්‍රතිපත්ති මුලපිරීමකට එළැඹීම යනු ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය ප්‍රතිඵලදායී ලෙස රටේ ජාතික සංවර්ධන උපායමාර්ගවලට ඒකාබද්ධ කිරීම සඳහා අදාළ වන ඉහළ ප්‍රමුඛතාවකි. ශ්‍රී ලංකාවට තිරසර වූත්, සියල්ල ඇතුළත් වූත් සංවර්ධනයක් සඳහා එහි පොහොසත් උරුමය සාධනීය ලෙස උපයෝගී කර ගැනීම මෙම වැඩපිළිවෙලේ අරමුණයි.



ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය ජාතික සංවර්ධන සැලසුම්වලට ඒකාබද්ධ කර තිබෙන වඩාත් සාර්ථක ජාත්‍යන්තර භාවිතයන් විශ්ලේෂණය

## මූලධර්ම

- සංස්කෘතික සම්පත්හි ආරක්ෂාව
- සංස්කෘතික උරුමය සහ ඉතිහාසයේ වටිනාකම්
- සමාජ නවෝත්පාදනය

## ක්‍රියාමාර්ග

### පර්යේෂණ සහ විශ්ලේෂණ

- සමාජ සහ ආර්ථික අංශ මත ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය මගින් ඇති කර තිබෙන බලපෑම පිළිබඳ පර්යේෂණ
- ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය ජාතික සංවර්ධන සැලසුම්වලට ඒකාබද්ධ කර තිබෙන වඩාත් සාර්ථක ජාත්‍යන්තර භාවිතයන් විශ්ලේෂණය
- සමාජ නවෝත්පාදනය, ව්‍යවසායකත්වය, රැකියා උත්පාදනය, අධ්‍යාපනය සහ අන්තර්ජාතික සබඳතා වර්ධනය කිරීමට සිය රටේ උරුම වටිනාකම් ආයෝජනය කිරීමේ අගය තක්සේරු කිරීම

### පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

- ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය ක්ෂේත්‍රවලට අදාළව රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ශාස්ත්‍රාලයීය ප්‍රජාව සහ ප්‍රාදේශීය ජනතාව අතර හවුල්කාරීත්වය වර්ධනය කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම
- රටේ ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමයට අදාළ පාර්ශ්වකරුවන් විසින් දැනට නියුක්තව සිටින සංස්කෘතික සම්පත් ආරක්ෂා කිරීමේ සහ කළමනාකරණයට අදාළ කාර්යයන්ගෙන් ඔබ්බට ගොස් සංස්කෘතික උරුමය සහ ඉතිහාසයේ වටිනාකම් පිළිබඳ ඔවුන් තුළ තිබෙන අවබෝධය වැඩිදියුණු කිරීම

### අධ්‍යාපනය සහ දැනුවත් කිරීම

- ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමයේ වටිනාකම පිළිබඳ දැනුවත් කිරීම සඳහා අධ්‍යාපනික වැඩසටහන් සහ ඉගැනුම් ද්‍රව්‍ය සංවිධානය කිරීම
- පාසැල් විෂයමාලාවට සහ ප්‍රජා අධ්‍යාපන වැඩසටහන්වලට ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය පිළිබඳ මාතෘකා ඇතුළත් කිරීම



# තිරසර ජෛව ලෝකයක්

# සදාහරිත ජීවිතයක්

ශ්‍රී ලංකාවේ සමස්ත ගොඩබිම වර්ග කිලෝමීටර් 65,610 කි. ඊට අමතරව වර්ග කිලෝමීටර් 18,060ක සාගර කලාපයක්, වර්ග කිලෝමීටර් 19,020 යාබද සාගරික කලාපයක්, හා වර්ග කිලෝමීටර 517,000ක අනන්‍ය ආර්ථික සාගර කලාපයක්ද නියෝජනය කරයි.

භූ විෂමතාව අනුව අඩි 300 දක්වා ප්‍රදේශය වෙරළබඩ කලාපය ලෙසත්, අඩි 300 - 1000 සහ අඩි 1000ට වැඩි ප්‍රදේශ කඳුකර ප්‍රදේශ ලෙසත් පවතී. වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 900 සිට. මි. මී. 5000ට වැඩි අගයක් දක්වා වෙනස් වේ. ප්‍රධාන ගංගා ද්‍රෝණි 103කින්ද කුඩා ගංගා හා ද්‍රෝණි 94කින්ද පෝෂිතය. පරිසර පද්ධති අතර අන්තර් සම්බන්ධතා හේතුවෙන් ශ්‍රී ලංකාවට අයත් මුළු භූමි ප්‍රමාණයම තනි පරිසර පද්ධතියක් ලෙස සැලකිය හැකිය. ගුණාත්මක පාංශු ස්ථරය, හඳුනාගත් සුපුෂ්පික ශාක හා සත්ව විශේෂ අතරින් 25%-30% ත් අතර ප්‍රමාණයක් ආවේණික විශේෂ ලෙස පවතී.

**මෙය කළ හැක්කේ ජාතික පුනරුදයක් ඉලක්ක කරගත් කලා සංස්කෘතික ක්ෂේත්‍රයේ කෙරෙන ප්‍රබල පරිවර්තනයක් මගිනි. "බහුවිධ සංස්කෘති පිළිගන්නා නිවහල්, විචාරශීලී, මානව ගරුත්වයෙන් යුතු නව සංස්කෘතික මිනිසෙකු නිර්මාණය කර ගැනීම" ජාතික ජන බලවේගයේ අපේක්ෂාවයි.**

ඒසේ වුවද මේ දක්වා ආර්ථික සංවර්ධනයක් සහිත පරිසර හිතකාමී මානව සමාජයක් නිර්මාණය කිරිමට අපොහොසත් වී ඇත. පාරිසරිකව බලපාන මහාද්වීපික තටාකයේ දළ වශයෙන් ශ්‍රී ලංකාව මෙන් විසිගුණයකට වඩා වැඩි සාගරයේ භූමි ප්‍රමාණය නිරවුල්කර ගැනීම වසර 20කට වැඩි කාලයක් තුළ නොහැකි වී ඇත. ජාත්‍යන්තර ප්‍රඥප්තීන් සැලකිය යුතු ප්‍රමාණයකට අපගේ එකඟතාව පළ කර තිබීම හා රටේ පරිසරයට අදාළ නීති 100කට වැඩි සංඛ්‍යාවක් තිබියෙදී පවා පාරිසරික හිතකාමී ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට අපොහොසත් වී ඇත. නිවැරදි භූමි පරිහරණ සැලසුම් ක්‍රියාවට නොනැගීම හේතුවෙන් මතුපිට පස් ස්තරය බාදනයට මෙන්ම නායයාම හේතුවෙන් නිසරු පොළවක් බවට පත් වෙමින් පවතී. නිසි ජල කළමනාකරණයක් නොමැති විටක උග්‍ර ජල හිඟයකටත්, තවත් විටක අතිරික්ත ජලයෙන් පීඩාවට ලක්වීමටත් සිදුව ඇත. වසර 30ක කෙටි කාලයකදී වාෂ්පීකරණය දෙගුණවීමත්, ජල ධර විනාශවීම හා එහි පැවැත්මට ඍජුව බලපාන වෙනත් පාරිසරික සාධකයන් විනාශ වීම ප්‍රධාන ගැටලු ලෙස පවතී.

සියලු ජීවීන්ගේ පැවැත්ම තහවුරු කෙරෙන තිරසර පරිසරයක් දැක්ම කොටගත් ජාතික ජන බලවේගයේ පරිසර ප්‍රතිපත්තිය සමාජ ආර්ථික සංවර්ධනය සහ පරිසරය අතර සමතුලිතතාව රැකෙන පරිදි ස්වාභාවික සම්පත් භාවිතය, තිරසර කළමනාකරණයේදී සහභාගීත්ව ප්‍රවේශය, දේශගුණික විපර්යාසවලින් ඇතිවන පීඩාවන් අවම කිරීම, දැනුම, කුසලතා, ආකල්ප හා මනෝභාවයන් මගින් ගොඩනැගෙන නිරෝගී ජන සමාජයක් සහ තුළිත පරිසරයක් උදෙසා ප්‍රමුඛතාව ලබාදේ.



# මූලධර්ම

- පාරිසරික යුක්තිය සහ සාධාරණත්වය
- පරිසරය සහ සංවර්ධනය අතර සමබරතාව
- තිරසර සම්පත් භාවිතය සහ පූර්වාරක්ෂක ක්‍රමවේදය
- පරිසර පද්ධතික ප්‍රවේශය
- ආයතනික සම්බන්ධීකරණය සහ මහජන සහභාගිත්වය
- දූෂකයා ප්‍රතිපූර්ණය (Polluter Pays Principle)
- පාරිසරික යහපාලනය
- ප්‍රජාව සවිබල ගැන්වීම
- පාරිසරික ආරක්ෂාව
- පිවිතුරු නිෂ්පාදන (Cleaner Production)

# ක්‍රියාමාර්ග

## නිවැරදි භූමි භාවිතාව

- සංවේදී පරිසර කලාප ප්‍රකාශයට පත්කර සුරක්ෂිතව තහවුරු කිරීම
- ස්වභාවික ආපදා අවදානම් භූමී හඳුනාගැනීම, කළමනාකරණය හා ආපදා අවම කිරීම
- තිරසර භූමි (ඉඩම්) පරිහරණ සැලැස්මක් විද්‍යානුකූලව සකසා ක්‍රියාවට නැංවීම
- ඛණිජ සම්පත් පිහිටි ප්‍රදේශ තිරසර ආර්ථික මෙහෙයුම් සඳහා සංරක්ෂණය
- පාංශු සංරක්ෂණය පිළිබඳව පවතින නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍යතා අනුව නව නිර්දේශ

## සුරක්ෂිත ජල පරිභෝජනය

- ශ්‍රී ලංකාවේ සියලුම ජල මූලාශ්‍ර අධ්‍යයනය කර, සංවේදී මූලාශ්‍ර මැණුම් කටයුතු සිදු කිරීම සහ ගැසට් කර සංරක්ෂණය කිරීම
- ජල මූලාශ්‍රයන් දූෂණයට ලක්වන හේතු කාරක සොයා ගනිමින් ජල දූෂණය අවම කිරීමට පියවර
- සියලුම ජල මූලාශ්‍රවල රසායනික හා භෞතික පරාමිතීන්වල දත්ත

**ශ්‍රී ලංකාවේ සියලුම ජල මූලාශ්‍ර අධ්‍යයනය කර, සංවේදී මූලාශ්‍ර මැණුම් කටයුතු සිදු කිරීම සහ ගැසට් කර සංරක්ෂණය කිරීම**

පදනම්ව මූලික ජල සිතියමක්

- එල්ලංගා පද්ධති නැවත පණ ගැන්විය හැකි ගංගා ද්‍රෝණි සක්‍රීය කිරීම සහ පුරාණ වාරි ශිෂ්ටාචාරය විදහා දැක්වෙන වාරි කෞතුකාගාරයක්
- ගංගා ද්‍රෝණි හා මධ්‍යම කඳුකරයේ වැසි ජලය ගබඩා කර ගත යුතු අවම ජලධර ප්‍රමාණය ගණනය කර, මතුපිට ඇති ජල ධරයන් හා පාෂාණ තුළ ඇති ජලධරයන් ප්‍රතිපූර්ණ කිරීම උදෙසා ක්‍රමවේද
- ගෘහස්ථ, වාරිමාර්ග සහ කාර්මික කටයුතු සඳහා ජලය නිදහස් කිරීමේදී ගංගාවල පාරිසරික වශයෙන් තිබිය යුතු අවම ප්‍රවාහය (Environmental Flow) පවත්වා ගැනීම
- කෘෂිකාර්මික, කාර්මික, ගෘහස්ථ හා සේවා ස්ථානවල අප ජලය විද්‍යානුකූලව පරිසරයට බැහැර කිරීමට සුදුසු ක්‍රම හඳුන්වාදීම සහ නියාමනය විධිමත් කිරීම

## සාගර සහ වෙරළ කලාපයේ තිරසාර පැවැත්ම

- වෙරළට සහ සාගරයට ඍජුව හෝ වක්‍රාකාරව අපද්‍රව්‍ය බැහැර කිරීම පූර්ණ ලෙස නතර කිරීම
- වෙරළ කලාපයේ සංවේදී පරිසර පද්ධති හඳුනාගෙන එම පරිසර පද්ධති සුරක්ෂිත කිරීම
- වෙරළ හා කලපුවල සංරක්ෂණ සීමාව විද්‍යානුකූලව තීරණය කර සංරක්ෂණය කිරීම
- සමුද්‍රයේදී සිදුවන පාරිසරික හානි අවමකර ගැනීම සඳහා අදාළ ආයතනවල මූලිකත්වයෙන් සහ ප්‍රජා සහභාගිත්වයෙන් හදිසි සූදානම් සැලැස්මක් (Emergency Preparedness Plan)
- සාගර දූෂණය නිසා ඇතිවන පාරිසරික බලපෑම තක්සේරු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සහ සිදුවන හානි ප්‍රතිපූරණයට අවශ්‍ය වන්දි ලබා ගැනීමේ නිවැරදි නීති හා ක්‍රමවේද
- සාගරයට අදාළව මත්ස්‍ය හා අනෙකුත් ස්වාභාවික සම්පත් භාවිතයට ගැනීම හා එම සම්පත් සුරක්ෂිතව පරිහරණය කිරීමට හා පරිසර දූෂණය අවම වන ලෙස ජාත්‍යන්තර නීති සහ සම්මුතීන්ට අනුකූලව පරිසර නීති පද්ධතියක්
- ජනතාව සංස්කෘතිකව බැඳී ඇති මුහුදු වෙරළ කලාප හා සංචාරක ආකර්ෂණයට ලක්ව ඇති කලාප හඳුනාගෙන සියලු පහසුකම් සහිත සුන්දර පාරිසරික තීරයන් බවට පත් කිරීම
- මුහුදු ජීවීන් ස්වභාවිකව අභිජනනය බහුලව සිදුවන ප්‍රදේශ නිශ්චය කොට සංරක්ෂණය කර එහි ජල පරාමිතීන් සුරක්ෂිත කිරීම

### පිරිසිදු වායුගෝලයක පැවැත්ම

- වායුගෝලයේ සමතුලිතතාව පවත්වා ගැනීම සඳහා ක්ෂණික වර්ධනයක් සහිත හා වගාවට යෝග්‍ය දැව වර්ග හඳුන්වා දීම
- කාබන් තිර කිරීමට දායකවීම සඳහා දැව  වගා කිරීම, පරිභෝජනය හා නැවත වගා කිරීම
- ස්ථාවර හා ජංගම මූලාශ්‍රවලින් සිදුවන වායු දූෂණය අවම කිරිම සඳහා කර්මාන්ත හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ විකල්ප බලශක්ති භාවිතය ප්‍රවර්ධනය හා විධිමත් නියාමනය
- අසල්වැසි රාජ්‍යයන්ගේ වායුගෝලීය දූෂණය හේතුවෙන් රටට සිදුවන වායු දූෂණය අවම කිරීම සඳහා රාජ්‍යතාන්ත්‍රික මැදිහත් වීම
- වායු දූෂණය අවම කිරීමට සමාජයේ අවබෝධය වැඩි කිරීමට සහ ආකල්ප සංවර්ධනයට  වැඩසටහන්

### පරිසර සුරක්ෂිතතාව සඳහා නීතිය හා සමාජ සම්මුතීන්

- පරිසර සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා දැනට පනවා ඇති අණපනත්වල දුර්වලකම්, අඩුපාඩු, ඌනතාවන් ඉවත් කිරීම, ජාත්‍යන්තරය සමග එළඹි ගිවිසුම් හා ප්‍රඥප්තීන් හා දේශීය පාරිසරික නීති සමාලෝචනය, මහජන අදහස් හා යෝජනා සඳහා සහභාගිත්ව ප්‍රවේශ ක්‍රියාමාර්ග ගැනීම සහ අවශ්‍යතාව මත නව පනත් සම්පාදනය සඳහා  ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත කොමිසමක් ස්ථාපිත කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයනයේදි මහජන මත විමසීම් අනිවාර්ය කිරීම
- ව්‍යාපෘති සඳහා පරිසර ඇගයීම් ඇතුළු වෙනත් වාර්තා සැකසිමේ නිර්ණායක යාවත්කාලීන කිරීම හා එම වාර්තාවල ස්වාධිනත්වය සහ විනිවිදභාවය  සහතික වීම
- උපාය මාර්ගික පාරිසරික තක්සේරුව (Strategic Environmental Assessment) බලාත්මක කිරීම
- මුද්‍රිත, විද්‍යුත් හා සමාජ මාධ්‍යය භාවිත කරමින් පරිසර ප්‍රතිපත්ති හා පරිසර නීති පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

### කඳුකර බිම්

- ආර්ථික හා සමාජීය කටයුතු සඳහා කඳුකර වනාන්තර භාවිතයට ගැනීම නියාමනය
- කඳුකර පරිසර පද්ධති සමාලෝචනය කර ඒකාබද්ධ දත්ත පද්ධතියක් සැකසීම සහ ඒවායේ පාරිසරික හා ආර්ථික වැදගත්කම හඳුනා ගැනීම හා අවධාරණය කිරීම

- විවිධ හේතු මත පාඩු ලබන කඳුකර වතු වගාවල වියදම් හා ප්‍රතිලාභ විශ්ලේෂණයක් (Cost Benefit Analysis) හා පාරිසරික විගණනයක් මගින් වගාව තවදුරටත් පවත්වාගෙන යන්නේද වෙනත් ආදේශක වගා සිදු කරන්නේද නැත හොත් ස්වාභාවික වනාන්තර වර්ධනය කරන්නේ ද යන්න තීරණය කිරිම

## පහත් බිම්

- ඉඩම් භාවිත කිරීමේ ප්‍රතිපත්ති හා මූලධර්මවලට අනුකූලව සියලු ඉඩම් කළමනාකරණය හා සංරක්ෂණය
- ස්වාභාවික විපත් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේද හඳුන්වාදීම, මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීම , වන්දි හා රක්ෂණ ක්‍රම හඳුන්වා දීම
- ප්‍රජා වන වගා, වැවිලි වන වගා හා කෘෂි වන වගා ප්‍රවර්ධනය

## තෙත් බිම්

- ශ්‍රී ලංකාවේ ඇති තෙත් බිම් හඳුනාගෙන, ලේඛන ගත කොට ඒවා සුරක්ෂිත කිරිමට අවශ්‍ය පියවර
- රම්සා තෙත් බිම් සංරක්ෂණය කිරීමට කටයුතු කිරීම සහ ඒ මගින් සංචාරක ආකර්ෂණය ලබා ගැනීම
- බහුපාර්ශ්වීය හවුල්කරුවන් හා ප්‍රජා සහභාගිත්වය සහිතව හායනයට ලක් වූ තෙත් බිම් ප්‍රතිෂ්ඨාපනය
- ඒකාබද්ධ තෙත් බිම් කළමනාකරණ කටයුතු සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම
- කඩොලාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කර ක්‍රියාවට නැංවීම
- කඩොලාන පරිසර පද්ධතිවල පාරිසරික වශයෙන් පවතින වැදගත්කම අනුව ඒවායේ රැකවරණය සඳහා නීතිමය පියවර ගැනීම

## වනාන්තර හා වනජීවී

- ඒකාබද්ධ කළ හැකි වන ජීවී හා වන සංරක්ෂණ කලාප හඳුනාගෙන වනජීවී කලාප තුළ නව මංකඩවල් ස්ථාපිත කිරිම
- අලි ඇතුන්ගේ ඇත් දළ, ගජ මුතු, කෙඳි හා වෙනත් සත්ව කොටස් සම්බන්ධව මිථ්‍යා විශ්වාස හා අනවශ්‍ය මූල්‍ය වටිනාකම් අහෝසි කිරීම සඳහා ජන අවබෝධය ලබාදීම
- සියලු වනසතුන්ගේ ආහාර හා ජල අවශ්‍යතා සැපිරීමට අදාළ පාරිසරික පද්ධති සුපෝෂණය කිරීම
- මහජන සහභාගිත්ව ප්‍රවේශ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මගින් වැව්වල පෝෂක ප්‍රදේශ වනාන්තර ලෙස පවත්වාගෙන යාම හා ආක්‍රමණික ශාක ඉවත් කිරීම

- අලි මිනිස් ගැටුම පාලනය කිරීමට වන අලි ගහනය, සංචරණ රටා හා වාසස්ථාන පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදුකර, ජීවවිද්‍යාත්මක හා නව තාක්ෂණික ක්‍රමවේද භාවිත කරමින් ජන සහභාගිත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මොනරුන්, රිලවුන්, දඬුලේනුන් වැනි වගාවන්ට හානි පමුණුවන වනසතුන්ගේ වර්ධනය පිළිබඳව නිවැරදි අධ්‍යයනයක් සිදුකර, ජීවවිද්‍යාත්මක ක්‍රමවේදයන් මගින් ගහනය පාලනය කිරීමට පියවර
- ජෛව විවිධත්වයේ විතැන් සංරක්ෂණ (Ex-situConservation) පහසුකම් වැඩි දියුණු කිරීම මගින් මහජනතාවට විනෝදාස්වාදය හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය හා අධ්‍යාපනික පර්යේෂණ කටයුතුවලට අවශ්‍ය පහසුකම් සැලසීම
- සත්ව හා ශාක විශේෂවල ස්ථානීය සංරක්ෂණ (In-situConservation) පහසුකම් වැඩි දියුණු කිරීම
- ස්වාභාවික වනාන්තර ආවරණය පරිසර සේවා පවත්වා ගෙන යැමට හැකිවන පරිදි කළමනාකරණය කිරීම හා සංරක්ෂණය
- ආක්‍රමණකාරී ආගන්තුක ජීවී විශේෂ රට තුළට ඇතුළුවීම පාලනය කිරීමට හා දැනට ව්‍යාප්තව පවතින ආක්‍රමණකාරී ආගන්තුක ජීවී විශේෂ තවදුරටත් පැතිරීම වැළැක්වීමට පියවර

## තිරසර ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

- ගෘහස්ථ, සේවා සම්පාදන, කෘෂිකාර්මික හා කාර්මික වැනි සියලු අංශයන්හි ජනනය වන කසළ උචිත පරිදි ශූන්‍ය  අපද්‍රව්‍ය සංකල්පය, 3R (ජනනය අවම කිරීම, නැවත භාවිතාව, ප්‍රතිචක්‍රීයකරණය) සහ චක්‍රීය ආර්ථික කළමනාකරණ සංකල්ප මත පදනම්ව ප්‍රජාව සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව ප්‍රවේශයකින් කළමනාකරණයට අවැසි ලෙස නෛතික රාමුව යාවත්කාලීන කිරීම සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- පවත්නා ඝන අපද්‍රව්‍ය  කළමනාකරණය සහ ඊට ඍජුව අදාළ වන අනෙකුත් ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කර ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම
- නිවස්න කලාප, මහල් නිවාස, සේවා, කාර්මික ඉදිකිරීම් ආශ්‍රිතව කසළ කළමනාකරණ වැඩසටහන්
- නව නීති, ආදේශන හඳුන්වාදීම්, මූල්‍ය හා වෙනත් දිරිගැන්වීම් හා ඒකාබද්ධ නිෂ්පාදක වගකීම් (Extended Producer Responsibilities) ක්‍රමවේද මගින් ප්ලාස්ටික් හා පොලිතින් භාවිතය අවම කිරීම

- සායනික හා අන්තරායකාරී අපද්‍රව්‍ය නිසි කළමනාකරණය හා සුරක්ෂිත අවසන් බැහැර කිරීම සහ විද්‍යුත් අපද්‍රව්‍ය මගින් සම්පත් නිස්සාරණය හා අපනයනය සැලසුම් සහගතව සිදු කිරීම
- නවීන තාක්ෂණික ක්‍රම සහිත අවසන් කසළ බැහැර කිරීම, කසළ මගින් බලශක්ති උත්පාදනය සහ කසළ මගින් සම්පත් නිස්සාරණය කිරීමට යටිතල පහසුකම් සම්පාදනය
- ශූන්‍ය අපද්‍රව්‍ය ක්‍රමවේදය යටතේ කර්මාන්ත ඉදිකිරීම සඳහා අනුග්‍රහය ලබා දීම හා සෑම කර්මාන්තයක්ම හැකි සෑමවිටම කර්මාන්ත කලාප තුළ ස්ථානගත කිරීම

## ගෙවතු ආශ්‍රිත සම්පත් කළමනාකරණය

- ගෙවතු ආශ්‍රිතව ඇති පස්, නිවසක් ඉදිකිරීම සඳහා භූමිය සකස් කිරීමේදී අතිරේක පස් ඉවත් කිරීම, නිවසක අත්තිවාරම් පිරවීම සඳහා පස් ලබා ගැනීම වැනි වාණිජමය නොවන ක්‍රියාකාරකම් සඳහා ලිහිල් නීතිය යටතේ අවසර ලබා දීම
- ගෙවත්තක දැව අපේක්ෂාවෙන්ම වගා කළ ගසක් සංරක්ෂණ ක්‍රියාමාර්ගවලට යටත්ව ඉවත් කිරීම සහ ප්‍රවාහනය සඳහා ලිහිල් නීතිය යටතේ අවසර ලබා දීම
- ගෘහ ආශ්‍රිත සත්ව පාලනය සඳහා පරිසර අලංකරණ නිර්ණායක හඳුන්වා දීම

## පරිසර පද්ධති අතර සම්බන්ධකම් හා වටිනාකම්

- පරිසර පද්ධති අතර අනුලෝම හා ප්‍රතිලෝම සම්බන්ධතා මෙන්ම මානව සම්බන්ධතා අනාවරණය කිරීමට අවශ්‍ය පර්යේෂණ හා අධ්‍යාපනයන් සිදුකිරීම
- විධිමත් හා අවිධිමත් පරිසර අධ්‍යාපන ක්‍රමවේදයන් ක්‍රියාවට නැංවීම
- පරිසර පද්ධති පිළිබඳ පර්යේෂණ සිදුකිරීම, පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම හා පේටන්ට් අයිතිය ලබා ගැනීම සහ පරිසර පද්ධතිවල ජාන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා ජාන මංකොල්ලය නතර කිරීමට ක්‍රියා කිරීම
- සංචාරක කර්මාන්තය සඳහා ආකර්ෂණීය පරිසර පද්ධති සුරක්ෂිත කිරීම



# නිදහස් ජනමාධ්‍ය කර්මාන්තයක්
# සමබර තොරතුරු සමාජයක්

සන්නිවේදනය හා මානවයා අතර පවත්නා සම්බන්ධතාව ඓන්ද්‍රීය වෙයි. අතිශය දීර්ඝ කාලපරිච්ඡේදයක විකාශනයකින් අනතුරුව එය නූතන තාක්ෂණය හා තදනුබද්ධ, ප්‍රමුඛ සමාජ ක්‍රියාවලියක් බවට පත්ව ඇත. ජනමාධ්‍යය යන්නෙන් සරල ලෙස අර්ථ නිරූපණය වනුයේ එකී දිගු ක්‍රියාවලියෙහි නූතන අවස්ථාවයි. 'මාධ්‍ය' යනු, ජනතාව වෙත විවිධ පණිවිඩ සම්ප්‍රේෂණය කරනු ලබන තාක්ෂණික ක්‍රමවේදයන්, උපකරණ, ආයතන, ශිල්පීය ක්‍රමවේද, සංවිධාන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් ආදියයි. තොරතුරු සම්පාදනය, අධ්‍යාපනය, පෙළඹවීම, විනෝදාස්වාද සම්පාදනය, සමාජානුයෝජනය, සංස්කෘතික ප්‍රවර්ධනය, අන්‍යෝන්‍ය සහජීවනය හා සමාජ ඒකාබද්ධතාව ආදී පුළුල් අරමුණු සාධනය වෙනුවෙන් උපයුක්ත ක්‍රමවේදය ඉන් අර්ථවත් කෙරේ. මේ සියල්ලෙහි යහපත් බව, සාර්ථක ජනමාධ්‍ය ක්‍රියාවලියක කාර්යසාධනයෙහිලා බෙහෙවින් පිටිවහල් වෙයි.

යම් කිසි රටක, සමාජයක හෝ සමාජ කොට්ඨාසයක් තුළ ජනමාධ්‍ය ක්‍රියාවලියෙහි ලා නිශ්චිත යෝග්‍යතාවක් තිබිය යුතුය. එබවින්, ඒ සඳහා පදනම් සැකැසෙන ප්‍රතිපත්ති මෙන්ම වැඩපිළිවෙළක් ද අත්‍යවශ්‍ය වෙයි.



ජනමාධ්‍ය ජනමතය හසුරුවන ප්‍රමුඛතම මෙවලමක් වන හෙයින් බටහිර පාලකයින්ද 1948 න් මෙපිට ලංකාව පාලනය කළ ස්වදේශික පාලකයන්ද මෙරට ප්‍රබලව තිබූ, මුද්‍රිත හා විද්‍යුත් සියලු මාධ්‍ය, ස්වකීය බල යාන්ත්‍රණය පවත්වාගෙන යාමේ ක්‍රමවේදය බවට පත් කරගෙන ඇත. එබැවින්, සත්‍ය හා නිවැරදි මෙන්ම පැහැදිලි හා නිරවුල් ප්‍රවෘත්ති වෙනුවට ආණ්ඩු හිතෛෂී, පුද්ගලාභිවාදන, ප්‍රශස්තිවලින් යුක්ත මාධ්‍යද භාවිතයකට අවතීර්ණ විය. මෙහි වඩාත් ප්‍රබල අභියෝගය වන්නේ, අසත්‍ය , මිථ්‍යාව හා ජනවර්ග අතර අවිශ්වාසයට, සැකයට හා ගැටුමට තුඩුදෙන ආකාරයේ ආකල්පමය දූර්ලක්ෂණ, ප්‍රවෘත්ති ඇතුළු වෙනත් විශේෂාංගමය නිර්මාණශීලී වැඩසටහන්කරණයකට යොමු වීමයි. මාධ්‍යකරුවා දේශපාලකයින්ට ගැතිකම් කරන, හුදු ලාභය හා ප්‍රචාරණය අපේක්ෂා කරන්නෙක් බවට පත්වීම කරණකොට ගෙන ජනතාව තුළ මාධ්‍ය පිළිබඳ පැවැති විශ්වාසය බිඳ වැටෙන්නට විය.

ඓතිහාසික වශයෙන් හිතාමතා සැලසුම් සහගතව සිදු කළ මෙකී ජනමාධ්‍ය අවභාවිතය වළක්වමින් සුභාවිත ජනමාධ්‍යක් මගින් සමාජ, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික පුනරුදයේ ගාමක බලවේගයක් ලෙස ජනමාධ්‍යයන්ද, එහි නිරත මාධ්‍යකරුවාද, එහි බලපෑමට ලක්වන ග්‍රාහක සමාජයද මෙහෙයවමින්, වඩාත් ප්‍රශස්ත ජනමාධ්‍ය භාවිතයකට අවශ්‍ය තාක්ෂණික පහසුකම්, පුහුණුව, මෙන්ම වෘත්තීය අභිමානය සුරක්ෂිත කරලීම සඳහා ජාතික ජන බලවේගය කැපවී සිටී.

# මූලධර්ම

- ජනතාවට සත්‍ය හා නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය
- මානවවාදී වගකීම් සහගත මාධ්‍ය කර්මාන්තයක්
- ජනමාධ්‍ය නිදහස සහ ස්වාධීනත්වය
- ජනමාධ්‍ය අවකාශය පොදු මහජන දේපළක්

# ක්‍රියාමාර්ග

- ජනමාධ්‍ය ආයතන ඒවායේ ප්‍රවෘත්ති සහ අනෙකුත් වැඩසටහන්වල ගුණාත්මක බව සහ ජනප්‍රිත්වය අනුව ශ්‍රේණිගත කිරීම (Rating) වඩාත් ක්‍රමවත් කිරීමට විශ්වවිද්‍යාලවල ජනමාධ්‍ය අංශ සහ අනෙකුත් ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට පහසුකම් සැපයීම
- ප්‍රකාශනයේ නිදහසට බාධාවන වගන්තීන් ඉවත්කොට 2024 අංක 09 දරන මාර්ග ගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත සංශෝධනය කිරීම
- ශ්‍රේණිගත කිරීම සඳහා භාෂාව භාවිතය, සංස්කෘතීන්, ජාතීන් අතර සමගිය හා සංහිඳියාව ප්‍රවර්ධනය, අධ්‍යාපනය හා විද්‍යා ප්‍රවර්ධනය වැනි නව නිර්ණායක හඳුන්වාදීම සහ එම ශ්‍රේණිගත කිරීම් ප්‍රසිද්ධ කිරීම
- මාධ්‍ය නිදහස පිළිගනිමින්, දැනට පවත්නා මාධ්‍ය නීති, අණපනත්, සම්මුතීන්, ආචාරධර්ම සමාලෝචනය කර ප්‍රශස්ත මාධ්‍ය ප්‍රතිපත්තියක් සඳහා අවශ්‍ය සංශෝධන
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සහ ලාංකේය සමාජයට ගැලපෙන නිර්ණායකයන්ට අනුව මාධ්‍ය ආයතනවලට සහ මාධ්‍යවේදීන්ට ආචාරධර්ම පද්ධතියක්
- ජනමාධ්‍යය අතර නිදහස් තරගකාරීත්වය ප්‍රවර්ධනය කරමින් පුවත්පත්, ගුවන්විදුලි සහ රූපවාහිනී නාලිකා, මාධ්‍යවේදීන්, වැඩසටහන්, ලිපි, ජයාරූප වැනි අංග ඇගයීමට ලක්කෙරෙන වැඩසටහන්
- සියලු ක්ෂේත්‍රයන්හි මාධ්‍යකරුවන් ඇගයීමට හා ජන සම්භාවනයට පාත්‍ර කිරීම සඳහා විධිමත් සම්මාන උළෙලක්

- මාධ්‍යවේදීන්ට අවශ්‍ය කැමරා වැනි උපකරණ මිලදී ගැනීම සඳහා අඩු පොලී ණය පහසුකම්
- රාජ්‍ය මාධ්‍ය ආයතන උසස් මාධ්‍ය සදාචාරයේ සහ ප්‍රමිතියේ ආදර්ශයන් ලෙස මෙහෙයවීම
- ජනමාධ්‍යයේ සංවර්ධන සන්නිවේදන සහ අධ්‍යාපන වැඩසටහන් ජනතාව වෙත රැගෙනයාම සඳහා දිරිගැන්වීම
- සිනමාව, ටෙලිනාට්‍ය, සංගීතය වැනි ක්ෂේත්‍රවලට ජාත්‍යන්තර ඇගයීමක් හා වෙළෙඳපොළක් ලබා ගැනීම සඳහා කලාකරුවන් සහ නිෂ්පාදකයින් දිරිගැන්වීම
- උසස් තත්වයේ වෙළෙඳ දැන්වීම් සහ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය සහ එම ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර වෙළෙඳපොළට පිවිසීම සඳහා දේශීය සමාගම් සහ නිෂ්පාදකයින් දිරිගැන්වීම
- ජනමාධ්‍යයේ නිර්මාණකරුවාගේ මෙන්ම නිර්මාණවල සුරක්ෂිතභාවය ඇති කිරීම සඳහා විධිමත් සංරක්ෂණ වැඩපිළිවෙළක්
- ප්‍රශස්ත ග්‍රාහක සමාජයක් ඇති කිරීම සඳහා මාධ්‍ය සාක්ෂරතා ප්‍රවර්ධන වැඩසටහන්
- සමස්ත ජනමාධ්‍ය ක්‍රියාවලිය ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම සඳහා ස්වාධීන ජනමාධ්‍ය කොමිෂන් සභාවක්

# 2

# ගෞරවනීය ජීවිතයක් සුරක්ෂිත රටක්



# ආරක්ෂිත සමාජයක්

# සුපෝෂිත ජාතියක්

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව ශ්‍රී ලංකාවේ මිලියන 5.7ක පමණ ජනතාවක් ජාතික දරිද්‍රතා රේඛාවෙන් (2024 මැයි මස වන විට මාසයකට රු.16,326) පහළ ආදායමක් ලබයි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ප්‍රකාශයට පත්කළ ශ්‍රී ලංකාවේ බහුමාන අවදානම පිළිබඳ වාර්තාවට අනුව මෙරට ජනගහනයෙන් අඩකට වැඩි පිරිසක් (55.7%) එනම් මිලියන 12.34ක් බහුමාන අවදානමකට ලක්ව සිටී. ඒ අනුව පෙනීයන්නේ නිදහසින් පසු මෙරට පාලනය කළ දේශපාලන පක්ෂ ජනතාවට උරුමකර දී ඇති දායාදය වන්නේ ජනගහනයෙන් අඩකට වැඩි පිරිසක් දරිද්‍රතාවට සහ බහුමාන අවදානමට ලක්කිරීම බවයි.

නිදහසින් පසුව ඉතිහාසයේ බලයට පත් සියලු රජයන් දිළිඳු ජනතාව වෙනුවෙන් වූ විවිධ සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නගා ඇත. මෙම සමාජ සුභසාධන වැඩසටහන් මගින් ලබාදෙන මූල්‍ය සහ/හෝ ජීවනෝපාය ආධාර දුප්පත් සහ ආන්තික ජනතාවට යම් සහනයක් ලබාදෙන නමුත් ඒවායේ පොදු දුර්වලතා ගණනාවක් පවතී. අකාර්යක්ෂමතාවය, කළමනාකරණ පිරිවැය අධික වීම, විනිවිදභාවයෙන් තොර ප්‍රතිලාභීන් තෝරන ක්‍රමය, ආධාර ලැබිය යුතු පුද්ගලයින්ට ඒවා නොලැබීම, දේශපාලන බලපෑම්, ගෙවීම් ප්‍රමාදවීම වැනි පරිපාලනමය අකාර්යක්ෂමතාව, අඛණ්ඩව යාවත්කාලීන කිරීම සඳහා යාන්ත්‍රණයක් නොමැතිවීම, ජනතාව දිළිඳුකමින් මුදා ගැනීමේ ක්‍රමවත් හා ඵලදායී වැඩපිළිවෙළක් නොමැතිවීම ඒ අතර වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අවශ්‍ය පුද්ගලයන්ට සහ පවුල්වලට ප්‍රමාණවත් සමාජ ආරක්ෂාවක් සැපයීමට මෙතෙක් බලයට පත්වූ ආණ්ඩු අසමත් වී ඇත.

ජාතික ජන බලවේගය සමාජ ආරක්ෂණය සහ සුභසාධනය ප්‍රමුඛ රාජ්‍ය වගකීමක් ලෙස සලකනු ලැබේ. විශේෂයෙන්ම වත්මන් ආර්ථික තත්වය තුළ ජනගහනයෙන් විශාල පිරිසක් රැකියා, ව්‍යාපාර සහ ආර්ථික අවස්ථා අහිමිව සිටින බැවින් ආර්ථිකය සහ සමාජය යළි ගොඩනැගීම සඳහා පුළුල් සමාජ ආරක්ෂණ වැඩසටහනක අවශ්‍යතාවය පවතී. ජාතික ජන බලවේගයේ සමාජ ආරක්ෂණ සහ සමාජ සුභසාධන වැඩපිළිවෙලේ අරමුණ වන්නේ සමාජ සුභසාධන ප්‍රතිලාභ ලැබිය යුතු පිරිස්වල ජීවන තත්වය උසස් කිරීමත්, ඔවුන් ආර්ථික වශයෙන් සවිබල ගන්වා හැකි ඉක්මනින් දිළිඳු බැවින් මුදවා ආර්ථිකයේ සක්‍රීය කොටස්කරුවන් බවට පත්කිරීමයි. ඒ අනුව "සියලු ශ්‍රී ලාංකිකයින්ට ජීවන චක්‍රය මත පදනම් වූ විශ්වීය සමාජ ආරක්ෂණයක්" සැපයීම අපගේ අපේක්ෂාවයි.

# මූලධර්ම

- සමාජ සහයෝගීතාව
- සමාජ සවිබල ගැන්වීම
- අවශ්‍යතා ඇති සියලු පුද්ගලයින්ට සහනාධාර
- සැමට ජීවන චක්‍රය පදනම් කරගත් සමාජ ආරක්ෂාව
- සමාජ සාධාරණත්වය සහතික කිරීම සහ කිසිවෙකු අත්නොහැරීම

# ක්‍රියාමාර්ග

## ප්‍රජා ශක්තිː දිළිඳුකම තුරන් කිරීම සහනාධාර

- ජාතික සමාජ ආරක්ෂණ අරමුදලක්
- දැනට අස්වැසුම ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට අවම වටිනාකම රු10,000ක සහනාධාර මුදලක්
- ඩිජිටල් වේදිකාවක් ඔස්සේ ප්‍රතිලාභ ලැබිය යුතු සියලුම ප්‍රතිලාභීන් නව නිර්ණායක භාවිත කරමින් වසරක් ඇතුළත හඳුනා ගෙන සුදුසුකම් ලබන සියල්ලටම මූල්‍ය සහනාධාර

## සවිබල ගැන්වීම

- අඩු ආදායම්ලාභී පවුල්වල දිළිඳුකමට හේතු, පවුලේ සාමාජිකයින්ගේ විභවතාවයන් ආදිය පිළිබඳ පූර්ණ සහභාගීත්ව අධ්‍යයනයක්
- සමාජ සජීවීකරණය ඔස්සේ පවුල් සහ කුඩා කණ්ඩායම් මට්ටමින් ගැටලු හඳුනා ගැනීම, විශ්ලේෂණය සහ විසඳුම් සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික සහ සමුපකාර අංශ සහභාගිත්වයෙන් පහසුකම් සැපයීම
- ජීවනෝපාය සහ ආදායම් උත්පාදන වැඩසටහන් ආරම්භ කිරීම සඳහා පුහුණුව, තාක්ෂණික සහාය සහ මූල්‍ය ආධාර
- දිළිඳු පවුල් සවිබල ගැන්වීම සඳහා සමෘද්ධි බැංකු පද්ධතිය සහ කාර්ය මණ්ඩලය කාර්යක්ෂමව භාවිත කිරීම

**සමාජ සජීවීකරණය ඔස්සේ පවුල් සහ කුඩා කණ්ඩායම් මට්ටමින් ගැටලු හඳුනා ගැනීම, විශ්ලේෂණය සහ විසඳුම් සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම**

- පවුල් 100කට ක්ෂේත්‍ර නිලධාරියෙකු බැගින් යොදවා නිරන්තර පසුවිපරම සහ ප්‍රතිපෝෂණය

## ප්‍රණාමඃ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සෞඛ්‍ය සම්පන්න සහ ප්‍රීතිමත් විශ්‍රාම දිවියක්

- සහනාධාර අවශ්‍ය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රුපියල් 5000ක මාසික දීමනාවක්
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නව වැඩිහිටි සත්කාර මධ්‍යස්ථාන
- පෞද්ගලික සත්කාරක මධ්‍යස්ථාන උනන්දු කරමින් රජය මගින් ඒවා නියාමනය
- වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා වෘත්තීය පුහුණුව, සුළු සහ මධ්‍යපරිමාණ ව්‍යවසායන් සඳහා රජය මගින් දිරි ගැන්වීම්
- සේවක අර්ථසාධක අරමුදල් වැනි අරමුදල් වඩා ඉහළ ප්‍රතිලාභ සහිත සහ ආරක්ෂිත ආයෝජනය
- විශ්‍රාම වැටුප් අරමුදල් සුරක්ෂිතව ආයෝජනය කර අඛණ්ඩ ප්‍රතිලාභ ලබාදීමට මූල්‍ය සහ රක්ෂණ සේවා දිරි ගැන්වීම
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට වඩා 5%ක වැඩි පොලී ප්‍රතිශතයක්

## ආරක්ෂාඃ ආබාධ සහිත පුද්ගලයින්ට අර්ථවත් සහ තෘප්තිමත් ජීවිතයක්

- විෂය විශේෂඥයින් විසින් සකසන රට තුළ සිටින ආබාධ සහිත පුද්ගලයින්ගේ සවිස්තරාත්මක දත්ත පද්ධතියක්
- අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත පුද්ගලයින් සඳහා මසකට රුපියල් 10,000ක මූල්‍යාධාරයක්
- ආබාධ සහිත පුද්ගලයින්ට අධ්‍යාපනය, පුහුණුව, රැකියා සහ ජීවනෝපාය අවස්ථා සඳහා පහසුකම්
- කාන්තා මූලික පවුල්, තනි මාපිය පවුල් සහ ගෘහස්ථ හිංසනයෙන් පීඩාවට පත්වූ කාන්තාවන් සඳහා සමාජ ආරක්ෂණය
- අවශ්‍යතා ඇති පුද්ගලයින්ට ඔවුන්ගේ ආදායම් මට්ටම් මත පදනම්ව මූල්‍ය ආධාර
- අවශ්‍යතා සහ ඉල්ලීම් මත පදනම්ව නීති ආධාර සහ උපදේශන සේවා
- අවශ්‍ය අවස්ථාවන්හිදී විකල්ප නවාතැන් පහසුකම්, රැකියා සහ වෙනත් ආධාර
- වැන්දඹුභාවය, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය ආදිය නිසා පීඩාවට

පත් කාන්තාවන්ට සමාජීය සහ චිත්තවේගීය සහය සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක්

**සුවයඃ නිදන්ගත රෝගී තත්වයන් සහිත පුරවැසියන්ට සමාජ ආරක්ෂණය**

- පිළිකා, වකුගඩු වැනි රෝග තත්වයන් සහිත සියලුම පුද්ගලයින්ගේ ඩිජිටල් දත්ත ගබඩාවක්
- අවශ්‍යතා ඇති නිදන්ගත රෝගී පුද්ගලයින්ට අවම වශයෙන් මසකට රුපියල් 10,000 ක මූල්‍යාධාර
- වෘත්තීය සහාය සහ සමාජ සවිබල ගැන්වීම සඳහා පහසුකම්

**පෝෂණයෙන් පිරුණු ළමා පරපුරක්**

- මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් හඳුනා ගැනීම
- මන්දපෝෂණය පිටුදැකීමේ ක්‍රියාමාර්ග පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම
- ක්ෂණික අවශ්‍යතා ඇති පවුල් සඳහා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් හරහා පෝෂ්‍යදායී ආහාර සලාක ලබාගැනීම සඳහා මූල්‍යාධාර

**ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන**

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් ඇතුළු ප්‍රජා සෞඛ්‍ය සේවා හරහා අමතර පෝෂණය අවශ්‍ය ගර්භණී මව්වරුන් හඳුනා ගැනීම
- අඩු ආදායම්ලාභී පවුල්වල ගැබිණි මව්වරුන්ට තම ගර්භණී සමයේදී සහ දරු ප්‍රසූතියේ පළමු වසර තුළ පෝෂණ ආහාර පැකේජයක් සඳහා මූල්‍යාධාර
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරින් විසින් අඛණ්ඩව දැනුවත් කිරීම සහ නිරන්තර අධීක්ෂණය

**සුරක්ෂාඃ දැයේ දරුවන්ට ප්‍රමාණවත් රැකවරණ**

- රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම දායකත්වයෙන් අවශ්‍යතා සහ ඉල්ලීම් මත පදනම්ව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන
- ළමා රැකවරණය සඳහා දැනට තිබෙන සුදුසුකම් සහිත ආයතන ලියාපදිංචිකර පහසුකම් ලබාදීම
- ආයතන ඵලදායී කළමනාකරණය සඳහා අදාළ කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබාදීම සහ ඒවා අධීක්ෂණය
- මෙම ආයතන සඳහා වෘත්තීය සේවා සැපයීම සඳහා සමාජ සේවා/ සංවර්ධන නිලධාරීන් පත් කිරීම සහ සුළු හා මධ්‍යපරිමාණ ව්‍යවසායන් ලෙස එවැනි සේවා සපයන පෞද්ගලික ආයතන දිරිමත් කිරීම

## සියලුම පුරවැසියන්ට විශ්‍රාම වැටුපක්

- රටේ සියලුම අංශවල ශ්‍රමිකයින්ට අදාළ වන පරිදි විශ්‍රාම වැටුප් පිළිබඳ පුළුල් ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සහ මහ බැංකුවේ අධීක්ෂණය යටතේ විශ්‍රාම වැටුප් අරමුදලක්
- දැනට රාජ්‍ය අංශයේ හෝ විධිමත් ආයතනික අංශයේ රැකියාවක් නොකරන ගොවීන්, ධීවරයින් ඇතුළු සෑම පුරවැසියෙකුම විශ්‍රාම වැටුප් ක්‍රමයට සම්බන්ධ වීමට දිරිමත් කිරීම
- හදිසි ආපදා/ආබාධ අවස්ථාවකදී හෝ විශ්‍රාම ලැබීමෙන් පසු මෙම විශ්‍රාම වැටුප් අරමුදල රක්ෂණ අරමුදලක් ලෙසද ක්‍රියාත්මක කරවීම



## කාර්යක්ෂම ශ්‍රම සම්පතක්

# ගෞරවනීය වෘත්තීය ජීවිතයක්

සමාජ සංවර්ධනයේ ගාමක බලවේගය මෙන්ම නිෂ්පාදන සාධක අතර ප්‍රමුඛ වනුයේ ද මානව ශ්‍රමයයි. එහෙත් වත්මන් සමාජයේ ශ්‍රමිකයාට හිමිවිය යුතු ස්ථානය හා වැදගත්කම අවතක්සේරු කර තිබේ. පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින් නිෂ්පාදන ක්‍රියාවලියේ අතිශය තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරනු ලැබුවද බොහෝ ශ්‍රමිකයින්ට  අවම වශයෙන් ජීවත්වීමට සුදුසු වැටුපක් වත් හිමි නොවන තත්වයක් උදාවී තිබේ. එබැවින් බහුතරයක්  ශ්‍රමික ජනයාට  ඔවුන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික ජීවිතය පිළිබඳ පවතින්නේ කයෝර අත්දැකීම්ය. ශ්‍රමයට නිසි ගෞරවය හා පිළිගැනීම ලැබෙන ලෙසත් සියලුම ශ්‍රේණීන්ගේ ශ්‍රමිකයන්ට සමානාත්මතා මූලධර්මය මත සැලකීමටත් හැකිවන ආකාරයේ සේව්‍ය  - සේවක සම්බන්ධතා ජාලය මානුෂීයකරණයට ලක්කොට ශ්‍රමයේ ගෞරවය සහ නිසි වටිනාකම ලැබෙන ක්‍රමයක් ස්ථාපනය කිරීම මෙම වැඩපිළිවෙලේ අරමුණයි.



# මූලධර්ම

- ශ්‍රමයේ ගෞරවය හා වටිනාකමෙහි ආරක්ෂාව
- ශ්‍රමයේ විවිධත්වය පිළිගනිමින් සමානව සැළකීම
- වෙනස්කම්වලට භාජනය නොවන සමාන අවස්ථා

**ක්‍රියාකාරකම්**

# ක්‍රියාමාර්ග


- කම්කරු ප්‍රඥප්තියක් සකස්කොට ක්‍රියාත්මක කිරීම
- සේවා ව්‍යවස්ථාවන්හි ඇති ගැටලු නිරාකරණය කරමින් ඒවා සංශෝධනය කිරීම
- කාර්යක්ෂම ශ්‍රම සම්පතක් සඳහා අදාළ නීතිරීති හා අණපනත් යාවත්කාලීන කිරීම හා නව නීති
- උපාධි මට්ටම දක්වා දිවෙන වෘත්තීය අධ්‍යාපනය පාසල් විෂය මාලාවට
- වැටුප් විෂමතා අවම කරන හා සේවකයා දිරිගන්වන ජාතික වැටුප් ව්‍යුහයක්
- රැකියා අවස්ථා සඳහා තෝරා ගැනීමේදී වෙනස්කොට නොසැලකීම හා සැමට සම අවස්ථා
- පෞද්ගලික අංශයේ සියලු ස්ථරවල ශ්‍රමිකයන් ආවරණය වන පරිදි සෞඛ්‍යය/ ජීවිත රක්ෂණ ක්‍රමයක්
- දැනට පවතින විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල ඇති විෂමතාවන් ඉවත් කෙරේ
- සියලු ශ්‍රමිකයන් අවරණය වන පරිදි සමාජ ආරක්ෂණ අරමුදලක්
- කාන්තාවන්ට විධායක හා කළමනාකරණ ක්ෂේත්‍රවල ඵලදායී ලෙස රැකියාවේ නියැලීමට ඇති බාධා ඉවතට

- රැකියා වෙළඳපොළට ප්‍රවේශ වීමට අපහසුතා ඇති හෝ ඒ සඳහා රුචිකත්වයක් නොදක්වන කාන්තාවන්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ අභිමතය මත නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වීමට ඉඩ ප්‍රස්ථා
- නවීන තාක්ෂණය භාවිතයෙන් වැඩ කරන කාලය ක්‍රමිකව අඩුකිරීම හා නිවසේ සිට වැඩ කිරීමට ඇති අවස්ථා
- රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්, උසස්වීම් සහ මාරුවීම් දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සුදුසුකම් සහ නිපුණතා මත
- නුපුහුණු ශ්‍රමිකයන් වෙනුවට කුසලතා පිරි පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියාවලට යැවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග
- විශේෂ හේතූන් මත ශ්‍රම බලකායට ඇතුළත්වීමට නොහැකි වූ අයට මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අන්තර්කාලීන දීමනාවක්
- වයස අවුරුදු 5ට අඩු දරුවන් හෝ වයස අවුරුදු 80 ට වැඩි රෝගී දෙමාපියන් රැකබලා ගැනීම සඳහා මූලික වැටුපෙන් 25% ක් සමග උපරිම වසරක කාලයක් සඳහා නිවාඩු
- කලත්‍රයා මියගිය අවස්ථාවේදී සති දෙකක විශේෂ නිවාඩුවක්
- අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ශක්තිමත් කිරීම
- උපයනවිට බද්ද වෘත්තිකයන්ට අසාධාරණයක් නොවන පරිදි සංශෝධනය
- Manpower සේවකයින්ගේ රැකියා සුරක්ෂිතතාව සහ සාධාරණ වැටුප් සහතික කිරීම

## රැකියා විරහිත උපාධිධාරීන්

විධිමත් ක්‍රමවේදයක් යටතේ පහත පරිදි කඩිනමින් රැකියා ලබාදීමට පියවර ගැනෙනු ඇත.

- 20 000ක් ගුරු වෘත්තියට
- විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ගණිත (STEM) උපාධිධාරීන් 3000ක් සහ STEM නොවන උපාධිධාරීන් 9000ක් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, රේගු දෙපාර්තමේන්තුවට, විදේශ සේවාවට, සංචාරක කර්මාන්තයට තවත් 3000ක්



# නිදහස් ස්ත්‍රී පුරුෂ සමාජභාවයක්

# සාධාරණ මිනිස් අනන්‍යතාවක්

ස්ත්‍රීන් යනු සමස්ත සමාජ ව්‍යුහයේ බැහැර කළ නොහැකි ප්‍රධාන කොටසක් වුවද ප්‍රධාන සමාජ - ආර්ථික, සංස්කෘතික, සහ දේශපාලනික ක්‍රියාවලිය තුළ ආන්තිකකරණය වීම හේතු කොට ගෙන සමාජය තුළ ඔවුන්ට නිරතුරුව හිමිවන්නේ අසමාන ස්ථානයකි. නිවස, ප්‍රජාව, වැඩබිම, දේශපාලනය, ආදී සෑම සමාජ ක්ෂේත්‍රයක් තුළම මෙය සිදුවේ. විශේෂයෙන්  පසුගිය දශක කිහිපය තුළ ඉස්මතු වූ නව ලිබරල්වාදී ආර්ථික ක්‍රියාවලිය තුළ මේ තත්වය වඩාත් උග්‍ර වී තිබේ. ප්‍රධානතම විදේශ විනිමය උපයන්නන් බවට ස්ත්‍රී ශ්‍රමය පත් වී ස්ත්‍රීන්ගේ භූමිකා පුළුල් වී ඇති බවක් මතුපිටින් පෙනී ගියද, සමානාත්මතාව සහ සාධාරණත්වය සඳහා අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක සහ දෘෂ්ටිවාදාත්මක වෙනස්කම් තවමත් සිදු වී නොමැත. ඒ වෙනුවට ස්ත්‍රී අනන්‍යතාව වෙළඳපොළකරණය කිරීම සහ ශ්‍රම වෙළඳපොළ තුළ වෙනස්කොට සැලකීම වඩාත් ඉහළ ගොස් තිබේ.

සමස්තයක් ලෙස ස්ත්‍රීන් හා පුරුෂයින් අවදානමට ලක් වූ ශ්‍රමිකයන් බවට පත් වීම, අධ්‍යාපනය, සෞඛ්‍යය ආදී සමාජ ආරක්ෂණ සේවා දුර්වල වීමෙහි බලපෑමට සෘජුවම



ස්ත්‍රීන් ලක්වීම, මිලිටරීකරණය හා වාර්ගික - ආගමික (ethno-religious) අන්තවාදය තුළ ස්ත්‍රීන්ගේ ශරීරය සහ හැසිරීම පාලනය කිරීම පිළිබඳ නීති සම්පාදනය වීම වැනි කරුණු නිසා ස්ත්‍රීන්ගේ ගැටලු පොදු සමාජ අර්බුදය තේරුම් ගැනීම සඳහා කේන්ද්‍රීය රාමුවක් සපයයි. එබැවින් මේ මොහොතේ ශ්‍රී ලංකාව තුළ පවතින ස්ත්‍රීන්ගේ ගැටලු තේරුම් ගැනීමේදී අන්තර්ඡේදිත (intersectional) දෘෂ්ටිකෝණයකින් එය සිදු විය යුතුය.

ජාතික ජන බලවේගය යෝජනා කරන්නේ සියලු අයිතීන් දිනා ගනිමින්, සාධාරණ සමාජයක්, නිවහල් රටක් සහ නිදහස් ස්ත්‍රියක් යන අභිලාශය සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන්, ආන්තිකකරණය වූ සියලු සමාජ කොටස් නියෝජනය කරන දේශපාලනික න්‍යාය - භාවිතාවකි. එබැවින් ස්ත්‍රීන් පිළිබඳ එහි ප්‍රතිපත්තිය, අනෙක් ප්‍රතිපත්ති හා අත්‍යන්තයෙන් බැඳී පවතී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා සහ ලිංගික දිශානතීන් යනු විවිධ ජීව විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක හේතූන් නිසා ඇතිවන වෙනස්කම් වේ. එහෙත් ශ්‍රී ලංකාවේ එම කණ්ඩායම් සමාජයේ බොහෝ තැන්හිදී හිංසනයට, වෙනස් කොට සැලකීමට සහ ආන්තිකරණයට ලක්වෙති. එමෙන්ම ඇතැම් යටත්විජිත නීති, සමහර ආයතනික රාමු, ඇතැම් සමාජ සංස්ථාවන්හි අගතිගාමී මතවාද, පසුගාමී සංස්කෘතික අදහස් නිසා සමරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී ජන කොටස්වලට යුක්තියේ ප්‍රවේශය අහිමි කරනු ලැබ තිබේ. සියල්ලන්ටම එකසේ සමානාත්මතාවයෙන් යුතුව සලකන සාධාරණ සමාජයක් තුළ කිසිදු ජන කණ්ඩායමක් ඔවුන්ගේ අනන්‍යතාව හෝ ලිංගික දිශානතිය හේතුවෙන් ආන්තිකකරණයට ලක් නොවිය යුතුය.

# මූලධර්ම

- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවය උදෙසා ආර්ථික සාධාරණත්වය
- වැටුප් නොලබන ස්ත්‍රී ශ්‍රමය ආර්ථිකයට සිදුකරන දායකත්වය අගයන රාජ්‍ය ප්‍රතිපත්ති
- ආන්තික සමාජ කණ්ඩායම්වලට සාධාරණ සහ සමාන ලෙස සලකන නීති
- ස්ත්‍රීන්ගේ දේශපාලනික නියෝජනය, සහභාගීත්වය හා භූමිකාව මූලප්‍රවාහකරණය (Mainstreaming)
- ආයතනගත හිංසන ව්‍යුහයන් ඇතුළුව සෑම ස්ථානයකම, සියලුම ආකාරයේ හිංසනයන්ට එරෙහි වීම
- ස්ත්‍රීන් මුහුණ දෙන පීඩනය අවම කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී විශ්වීය පොදු සේවාවලට ප්‍රමුඛත්වය
- තිරසර පරිසර සංරක්ෂණ ප්‍රතිපත්ති සංවර්ධනයේදී ස්ත්‍රී සහභාගීත්වය
- සමාජ ආයතන සහ ක්‍රියාවලීන් විසින් ප්‍රතිනිෂ්පාදනය කොට පවත්වා ගෙනයනු ලබන අගතිගාමී ඒකාකෘතීන්ගෙන් තොර සමාජයක්
- ස්ත්‍රීන් ඇතුළු සියලු අනන්‍යතා කණ්ඩායම්වලට රාජ්‍ය සේවා, අයිතිවාසිකම් සහ යුක්තිය සඳහා ප්‍රවේශ වීමේ සමාන හිමිකම්
- කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ අන්තර්ජාතික සම්මුතියේ (CEDAW) සහ අන්තර් ජාතික ළමා අයිතිවාසිකම් සම්මුතියේ (CRC) සඳහන් ප්‍රමිතීන්ට අනුකූල දේශීය නීති


# ක්‍රියාමාර්ග

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ඉපැයුම් අතර පරතරය (gender wage gap) ඇතිවන අවස්ථා හඳුනා ගනිමින් එය අවසන් කිරීමට පියවර ගැනීම
- ස්ත්‍රීන්ට ඉඩම් සඳහා ඇති අයිතියට අවාසිදායක ලෙස බලපාන නීතිමය හා ප්‍රායෝගික ගැටලු නිරාකරණය කිරීම

- වැඩ කරන ස්ත්‍රීන් මුහුණ දෙන විශේෂිත සාධක හඳුනාගනිමින්, ඔවුන්ගේ සේවා සුරක්ෂිත බව තහවුරු වන පරිදි පවතින කම්කරු නීති හා ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සහ අවශ්‍ය නව නීති හඳුන්වාදීම
- ස්ත්‍රීන් පීඩාවට පත්කරන අධික පොලී අයකර ගන්නා අයුක්ති සහගත ක්ෂුද්‍ර මූල්‍ය ණය බරින් ඔවුන් නිදහස් කිරීම සඳහා පියවර
- ස්ත්‍රීන්ගේ ව්‍යවසායකත්ව අවස්ථා ඉහළ නැංවීම සඳහා ඔවුන්ට අවශ්‍ය බැංකු හා මූල්‍ය පහසුකම්
- ජාතික ශ්‍රම බලකා සමීක්ෂණ විධිමත් කරමින් දරුවන්, වැඩිහිටියන්, ආබාධ සහිත තැනැත්තන් රැක බලා ගැනීම ඇතුළුව ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමය (unpaid care work) ජාතික ආර්ථිකයේ කොටසක් ලෙස පිළිගැනීම
- ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමයේ බර අඩුකිරීම
- දේශපාලනය තුළ ස්ත්‍රී සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා ස්ත්‍රීන්ට දේශපාලන අධ්‍යාපනය ලබාදීම, ඔවුන් සංවිධාන ගත කිරීම
- දේශපාලන ව්‍යුහයන් තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය අවම වශයෙන් 50% දක්වා ගෙන ඒමට අවශ්‍ය නීති සහ ප්‍රතිපත්ති ක්‍රමිකව හඳුන්වා දීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී අවශ්‍යතාවලට සංවේදී ලෙස අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය ආදී පොදු සේවා ශක්තිමත් කිරීම තුළින් ස්ත්‍රීන් මුහුණ දෙන දුෂ්කරතා අවම කිරීම
- ආරක්ෂිතව ගර්භණීභාවය අවසන් කිරීම සම්බන්ධයෙන් 2012 නීති කොමිසම මගින් ඉදිරිපත් කළ යෝජනා ක්‍රියාත්මක කිරීම
- ඒ ඒ වයස් කාණ්ඩවලට ගැළපෙන පරිදි සියලුම පුද්ගලයන්ට ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ දැනුම හා ඒ හා සම්බන්ධ සේවාවන් ලබාදීම
- ආර්ථව දරිද්‍රතාව (period poverty) අවසන් කිරීම වෙනුවෙන් අවශ්‍ය බදු සහන, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබාදීම
- සේවා ස්ථානයේ, පොදු ප්‍රවාහනයේ ඇතුළු සියලු තැන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පදනමෙන් සිදුවන ප්‍රචණ්ඩත්වයෙන් හා හිංසනයෙන් තොරව ජීවත් වීමට ඇති අයිතිය තහවුරු කරන ආකාරයට නීති සහ කාර්ය පරිපාටීන් සංශෝධනය කිරීම
- ස්ත්‍රීන්ට සහ දරුවන්ට වෙනස් කොට සලකන සහ පීඩාවට ලක්කරන විශේෂ නීති සංශෝධනය කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමානාත්මතාව පිළිබඳ අයිතිවාසිකම පුළුල් කරමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව සහ ලිංගික

දිශානතිය මත වෙනස් කොට නොසලකන බවට තහවුරු කිරීම

- සමරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවට විශේෂිත වන සෞඛ්‍ය සේවා, නෛතික සේවා, සමාජ ආරක්ෂණය වැනි රාජ්‍ය සේවා සහ යුක්තිය සඳහා වන ප්‍රවේශය ඉහළ නැංවීම
- මානව හිමිකම් කොමිෂන් සභාව, නීති ආධාර කොමිෂන් සභාව ඇතුළු අදාළ ආයතනවල, විවිධ අනන්‍යතා සහිත කණ්ඩායම්වල අයිතිවාසිකම් තහවුරු කෙරෙන නීති හා කාර්යපටිපාටි සහ ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
- නීතිය ක්‍රියාත්මක කරන ආයතන ඇතුළු රාජ්‍ය සේවයේ සියලු නිලධාරීන්ට, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා සහිත කණ්ඩායම් සමඟ ගනුදෙනු කිරීම සම්බන්ධ ප්‍රමිතීන් සහ ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම
- ආන්තිකකරණයට ලක් වූ කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට විශේෂිත ලේකම් කාර්යාලයක් ස්ථාපනය කිරීම



# සුරක්ෂිත ළමා ලෝකයක්
# නිර්මාණශීලී අනාගත පරපුරක්

2023 වසර වන විට ශ්‍රී ලංකාවේ ජනගහනය 22,037,000ක් වූ අතර, එම සමස්ත ජනගහනයෙන් 6,642,331ක් හෙවත් 30.14%ක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හැඳින්වීමට අනුව වයස අවුරුදු 18ට අඩු ළමා ජනගහනයට අයත්වේ. දුර්වල ළමා යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය, දුර්වල ආරක්ෂණ සේවා, අධ්‍යාපන දුෂ්කරතා සහ මන්දපෝෂණය වැනි බරපතළ ගැටලුවලට ළමයි මුහුණ පා සිටිති. අපරාධවලට ගොදුරු වූ ළමුන් සඳහා දැනට පවතින අධිකරණ ක්‍රියාවලිය අධික කාලයක් දිග්ගැස්සෙන අතර, බොහෝ විට එය වසර 6 සිට 10 දක්වා ඇදී යයි.

දැනට, බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් ළමයින් උසාවියේ සහ පිටතට ප්‍රවාහනය කරනු ලබන්නේ වැඩිහිටි වැරදිකරුවන් සමඟ ඔවුන්ගේ ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය අනතුරේ හෙළමිනි. යටත්විජිත යුගයේ සිට ක්‍රියාත්මක වන අයාල ආඥාපනත වැනි දශක ගණනක් පැරණි නීති, පුද්ගලයන්ගේ සංචලනය සහ නිදහස උල්ලංඝනය කරන අතර, ඒවා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම දරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල



අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි. පසුගිය දශක ගණනාව තුළ සුළු සංශෝධන පමණක් සිදු වූ ළමා හා තරුණ පුද්ගලයන් පිළිබඳ ආඥාපනත පිළිබඳව පුළුල් සමාලෝචනයක්ද අවශ්‍යව තිබේ.

වේගයෙන් වෙනස් වන ලෝකයක සාර්ථකත්වය සඳහා අවශ්‍ය කුසලතා සහ මානසිකත්වයෙන් යුත් දරුවන් බිහිකිරීමට අධ්‍යාපනය වැදගත්වන නමුත් ශ්‍රී ලංකාවේ වත්මන් අධ්‍යාපනය එයට අසමත් වී ඇත. රට තුළ විවිධ අංශ හරහා පැතිරී ඇති අල්ලස සහ දූෂණය නිසා ඇති වන කලකිරීම් සහ අනාගතය පිළිබඳ විශ්වාසයක් නොමැතිකම බොහෝ තරුණ තරුණියන් විදේශයන්හි අවස්ථා සොයා යාමට පොළඹවා ඇත.

ශ්‍රී ලංකාව තුළ මනාව සංවිධානය වූ සහ ප්‍රමාණවත් තරම් මානව සහ භෞතික සම්පත් සහිත සමාජ සේවා පද්ධතියක් නොමැති නිසා ළමුන් පිළිබඳ සුබසාධනය විශාල ගැටලුවක් වී ඇත. සමාජ ආරක්ෂාව සහ ඒ ආශ්‍රිත රාජකාරි සඳහා යොදවා ඇති ක්ෂේත්‍ර නිලධාරීන් සිටියද, අවදානමට ලක්විය හැකි දරුවන් සහ පවුල් හඳුනා ගැනීමේ සහ ඔවුන්ට උපකාර කිරීමේ අඩුපාඩු නිසා එම සේවාවන් දුර්වල  වී ඇත.

ජාතික ජන බලවේගයේ ළමා ආරක්ෂාව සහ සුභසාධනය පිළිබඳ ප්‍රතිපත්තිය මගින් අයවැය ප්‍රතිපාදන වැඩි කිරීම, සෞඛ්‍ය සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අධ්‍යාපනික ප්‍රගතිය හරහා ශ්‍රී ලංකාවේ දරුවන්ගේ අවශ්‍යතාවන් හා රැකවරණය සපුරාලීම සඳහා පුළුල් ප්‍රවේශයක් ගෙනහැර දක්වයි.

# මූලධර්ම


- ළමුන් සඳහා නිදහස සහ ආරක්ෂාව සපයන UNCRC වැනි ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූල නීති පද්ධතියක්.
- දරුවන් රැකබලා ගැනීම සහ පෝෂණය.
- සියලුම දරුවන්ගේ යහපැවැත්ම සහ සංවර්ධනය.
- දරුවන්ට එරෙහි අපයෝජන සහ සියලු ආකාරයේ හිංසනයන්ගෙන් ආරක්ෂාව.

# ක්‍රියාමාර්ග

- ළමා හා තරුණ පුද්ගලයින්ගේ ආඥාපනත, ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත, අයාල ආඥාපනත, අනාථ නිවාස ආඥාපනත වැනි යල් පැන ගිය නීති සමාලෝචනය කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම
- යුක්තිය පසිඳලීම කඩිනම් කිරීම සඳහා ළමුන් සම්බන්ධ නඩු විභාග කිරීමට පමණක් කැප වූ විශේෂිත මහාධිකරණ පිහිටුවීම
- ළමා වින්දිතයින්ගේ සාක්ෂි විමසීම සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා දැනට පවතින විමර්ශන ක්‍රමය වැඩිදියුණු කිරීම මගින් ඔවුන් නැවත වින්දිතයන් වීම අවම කිරීම
- සුළු වැරදි සඳහා චූදිත දරුවන් අධිකරණ පද්ධතියට යොමු කිරීම වෙනුවට මැදිහත්වීම් සහ ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් වෙත යොමු කිරීම
- අවදානමට ලක්ව සිටින දරුවන් හඳුනා ගැනීම සහ පවුල්වලින් අනවශ්‍ය ලෙස වෙන්වීම වැළැක්වීම සඳහා පවුල පදනම් කරගත් රැකවරණය සහ සහාය ලබා දීම
- නීතිමය කටයුතු සඳහා දරුවන් ප්‍රවාහනයේදී ආරක්ෂිත සහ ගෞරවනීය ප්‍රවාහනය සහතික කිරීම සඳහා ළමා හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමා ආරක්ෂක සේවා වැනි ආයතන අතර සම්බන්ධීකරණය විධිමත් කිරීම සහ එම ආයතනවල ධාරිතා වර්ධනය
- ළමා අපචාර සිද්ධීන් වාර්තා කිරීම සහ නිසි පසු විපරමක්

සහතික කිරීම සඳහා කාර්යක්ෂම සහ ප්‍රතිචාරාත්මක සේවාවක් ස්ථාපිත කිරීම

- ආන්තික සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යාපනය, සෞඛ්‍ය සමාජ සේවා සහ ළමා සුබසාධනයේ අනෙකුත් අත්‍යවශ්‍ය අංශ ඇතුළු තීරණාත්මක ක්ෂේත්‍ර සඳහා අයවැය ප්‍රතිපාදන වැඩි කිරීම
- පෝෂ්‍යදායී ආහාර සැපයීම ඇතුළු සමස්ත ළමා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් ජාත්‍යන්තර සහ දේශීය ආයතනවල සහාය ඇතිව ප්‍රජාව, පවුල සහ පාසල් පදනම් කරගත් සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා කටයුතු සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණුකර දරුවන් අවදානමට ලක්ව ඇති පවුල් වෙත සෘජු සේවා සැපයීම සඳහා යොමු කිරීම
- ආබාධ සහිත ළමයින්, වීදි දරුවන් සහ පාසල් නොයන ළමයින් ඇතුළු අවදානම් සහිත දරුවන් කල්තියා හඳුනා ගැනීමට සහ ඔවුන් වෙනුවෙන් මැදිහත්වී කටයුතු කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
- ළමා හිතකාමී අධ්‍යාපනික පරිසරයක් තුළ ජීවන කුසලතා සහ දැනුම පෝෂණය කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ
- විකල්ප රැකවරණයක් අවශ්‍ය සෑම දරුවෙකුටම පවුල පදනම් වූ පරිසරයන් තුළ රැකවරණය සහ ස්ථාවරත්වය ලැබෙන බව සහතික කිරීම සඳහා කැපකරු සත්කාර ක්‍රමයේ පුළුල් ප්‍රතිසංස්කරණ
- ළමුන්ගේ මනෝ සමාජීය සහ මානසික සෞඛ්‍ය ගැටලු කල්තියා හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා පාසල් සහ ප්‍රජා මූලික වැඩසටහන්



# තෘප්තිමත් තාරුණ්‍යයක්

# සංස්කෘතිකවත් නිවහල් චින්තනයක්

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහණයෙන් 38%ක ප්‍රමාණයක් එනම් ලක්ෂ 85ක් ලාංකේය තරුණ ප්‍රජාවට අයත් වේ. නිදහසෙන් පසු කාලය තුළම ලංකාවේ තරුණ ප්‍රජාවට තිබුණේ අතෘප්තිමත් ජීවන පැවැත්මකි. විශේෂයෙන්ම දශක හතකට වඩා වැඩි කලක් තිස්සේ පැවති දේශපාලන ක්‍රමය සහ දේශපාලන සංස්කෘතිය මගිනුත් ලාංකීය තරුණ ප්‍රජාව දේශපාලනයෙන් පිටමන් කරන ලදී. පහුගිය දශක කිහිපයේ උතුරේ සහ දකුණේ ජනතා නැගිටීම් තුනක් සිදුවන්නේත්, ඒවායේදී තරුණ තරුණියන් ලක්ෂ ගණනකට තමන්ගේ ජීවිත අහිමි වන්නේත් මෙතෙක් පැවති දේශපාලන අධිකාරිය විසින් සන්තර්පණය කිරීමට අපොහොසත් වුණු, ඒ ඉටුනොවුණු තරුණ සිහින හේතුවෙනි. අධ්‍යාපනයේ අවස්ථා අඩුකම, ආර්ථිකයට සහභාගී වීමේ අවස්ථා අඩුකම, තාක්ෂණික හා සන්නිවේදන දියුණුවේ කොටස්කරුවන් වීමට තරුණයන්ට ප්‍රමාණවත් අවස්ථාවක් නොමැතිවීම, වෙනස්කම්වලට සහ කොන්වීමට බඳුන් නොවී සමානයන් ලෙස ජීවත්වීමේ අවස්ථාව අහිමි වීම මෙන්ම ගෞරවනීය ලෙස ජීවත්වීමට නොහැකි වීමත් මීට හේතු විය. ඊට එරෙහිව තරුණ තරුණියන්ගේ මූලිකත්වයෙන් පැන නැගුනු 2022 දැවැන්ත ජනතා අරගලය ආර්ථික පීඩනයට එරෙහි ඉල්ලීම්වලින් ඔබ්බට ගොස් රට තුළ ක්‍රම වෙනසක් ඉල්ලා සිටියේය. එහෙත් අරගලයේ මූලික අභිමතාර්ථය ඉටු කර ගැනීමට නොහැකි විය. මේ සියල්ල මගින් ප්‍රකාශයට පත් වන්නේ ඉතිහාසයේ මෙන්ම තවදුරටත් රටේ අනාගත සංවර්ධනයට දායක කරගත හැකි දියුණුම සහ බලසම්පන්නම බලවේගය වන තරුණ ප්‍රජාව අවවරප්‍රසාදිත, නොසලකා හරින ලද කණ්ඩායමක් බවට පත්ව තිබෙන බවයි.

**මෙය කළ හැක්කේ ජාතික පුනරුදයක් ඉලක්ක කරගත් කලා සංස්කෘතික ක්ෂේත්‍රයේ කෙරෙන ප්‍රබල පරිවර්තනයක් මගිනි. "බහුවිධ සංස්කෘති පිළිගන්නා නිවහල්, විචාරශීලී, මානව ගරුත්වයෙන් යුතු නව සංස්කෘතික මිනිසෙකු නිර්මාණය කර ගැනීම" ජාතික ජන බලවේගයේ අපේක්ෂාවයි.**

# මූලධර්ම

- තරුණ ප්‍රජාව ආර්ථික ක්‍රියාවලියේ සක්‍රීය පංගුකරුවන්
- පීඩනයන්, සූරා කෑම් සහ වෙනස් කොට සැලකීම්වලින් තොරවීම
- සමාජ අභිවෘද්ධියට දායකත්වය
- විද්‍යාව හා නවීන තාක්ෂණයේ දියුණුව, සමාජ අභියෝග ජය ගැනීමේ අභිලාෂය
- දේශපාලන, සමාජ සහ ආර්ථික ක්‍රියාවලියට නායකත්වය සැපයිය හැකි තරුණ ප්‍රජාවක්
- සංස්කෘතික ජීවිතය සහ නිදහස් චින්තනය
- ජාතික හා ජාත්‍යන්තර නායකත්වය දැරීමට සමත් හසුරු කුසලතා සහිත තරුණ ප්‍රජාවක්
- සමාජ අසාධාරණත්වය පිටුදකින තරුණ ප්‍රජාවක්

# ක්‍රියාමාර්ග

## පොහොසත් තෘප්තිමත් තාරුණ්‍යයක්

- තරුණ තරුණියන්ට සුදුසු රැකියාවක් කිරීමට ඇති අයිතිවාසිකම රජය මගින් සුරක්ෂිත කිරීම
- රැකියා විරහිත තරුණ තරුණියන්ගේ තොරතුරු ලබා ගැනීමට තොරතුරු කාර්යාංශයක් ස්ථාපිත කිරීම, ඔවුන්ව රැකියා පුරප්පාඩු සඳහා යොමු කිරීමට රැකියා බැංකුවක් පිහිටුවීම සහ අන්තර්ජාල වේදිකාවක් මගින් එය කළමණාකරණය කරමින් රැකියා විරහිතභාවය ක්‍රමානුකූලව තුරන් කිරීම
- රජයේ රැකියා සඳහා බඳවා ගැනීමේදී දැනට ඇති තරග විභාග ක්‍රමය නවීකරණය කර තෝරා ගැනීමේ පටිපාටිය යාවත්කාලීන කිරීම
- උසස් පෙළ සමත් නමුත් රජයේ විශ්වවිද්‍යාවලට ඇතුළත් විය නොහැකි වූ තරුණ ප්‍රජාව ඉලක්ක කර වෘත්තීය නිපුණතාවක් සහිත තාක්ෂණික අධ්‍යාපනය
- යෝජිත සංවර්ධන බැංකු (Development Banks) හරහා ව්‍යසායකත්ව සංවර්ධනය ඉලක්ක කර ගනිමින් තරුණ තරුණියන්ට මූල්‍ය පහසුකම්
- ශිල්පීය දක්ෂතාව සහිත රැකියා විරහිත හා වෙනස් වූ හැකියාවන් ඇති තරුණයින් ව්‍යවසායකත්වය වෙත යොමු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණුව සහ මූලික ප්‍රාග්ධනය ලබා දෙමින් ඔවුන්ට අවශ්‍ය වෙළඳපළ සොයා ගැනීම සඳහා පහසුකම්
- තරුණ නවෝත්පාදකයින් දිරිගැන්වීම උදෙසා නව සංකල්ප වෙළඳපොළ අත්පත් කරගැනීමට හැකි නිෂ්පාදනයක් බවට පරිවර්තනය කිරීම දක්වා වූ

ක්‍රියාවලියට පහසුකම් සැලසීමට (V4R digital platform) යොදා ගැනීම

- ගෝලීය අන්තර්ජාල රැකියා වෙළඳපොලේ සැලකිය යුතු පංගුවක් අත්පත් කර ගැනීම සඳහා තරුණ තරුණියන්ට අවශ්‍ය තාක්ෂණික සහ අනෙකුත් පහසුකම් ලබා දීම
- දැනටත් මාර්ග ගත ක්‍රමය ඔස්සේ විදේශ විනිමය උපයන නිදහස් වෘත්තික (Freelance) තරුණ තරුණියන්ට ඒ සඳහා ඇති බාධාවන් ඉවත් කිරීම
- විදේශගතව සිට ලංකාවට පැමිණෙන තරුණ තරුණියන්ට ඵලදායි ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම සඳහා උපදේශනය සහ මග පෙන්වීම

## අනාගතයට හැකියාවක්
## (අධ්‍යාපනය, විද්‍යා හා තාක්ෂණ කටයුතු සහ නවෝත්පාදන)

- බිඳ වැටී ඇති රජයේ කාර්මික, තාක්ෂණ හා උසස් තාක්ෂණික පාඨමාලා නවීකරණය කර, ඒවා උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා දක්වා ක්‍රමිකව උසස් කිරීම
- තරුණ තරුණියන් විසින් ස්වාධීනව ආරම්භ කරන නව අධ්‍යාපන හා සංවර්ධන ව්‍යාපෘති යෝජනා පුනරුදය සඳහා අපි (We for the Renaissance- V4R Digital platform) ඩිජිටල් වේදිකාව හරහා සෘජුවම රජයට ඉදිරිපත් කිරීමට අවස්ථාව
- පරිගණක සාක්ෂරතාව කෙටි කාලයක් තුළ වර්ධනය කර ගැනීමට මෙන්ම පරිගණක හා තොරතුරු තාක්ෂණ ජාත්‍යන්තර වෙළෙඳපොලේ පංගුවක් අත්කරගැනීමේ ඉලක්කය වෙනුවෙන් IT English and Soft Skills for Youth තේමාවෙන් හවසට ITES වැඩසටහන දීප ව්‍යාප්තව ඇති කිරීම
- ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජා සහභාගීත්ව Multi Model Centrs ඇති කිරීම හරහා එම ප්‍රදේශයේ තරුණ තරුණියන්ට හා වැඩිහිටියන්ට විශේෂ වැඩසටහන් හා උපදේශන සේවා
- විවිධ ජාතිකත්ව සහ ආගම් නියෝජනය කරන තරුණ පිරිස් අතර එකිනෙකා තේරුම් ගැනීම අරමුණු කරගනිමින් තරුණ හුවමාරු වැඩසටහන්

## අනෙකා දැනෙන කෙනෙක්
## (කලා සංස්කෘතික රසවින්දනය සහ විනෝදාස්වාදය)

- පාසල් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ක්‍රමානුකූලව තරුණ නිර්මාණකරුවන්ගේ කලා - සංස්කෘතික හැකියාවන් ඇගයීමේ විධිමත් ක්‍රමවේදයක්
- නිපුණතා සහිත තරුණ නිර්මාණකරුවන්ගේ නිර්මාණ නිෂ්පාදනයට සහ ප්‍රචාරණයට අවශ්‍ය මූල්‍ය පහසුකම්
- තරුණ නිර්මාණකරුවන් ඇගයීමට සහ දිරි ගැන්වීමට වාර්ෂිකව තරුණ සම්මාන උළෙලක්

## සෞඛ්‍ය සම්පන්න තාරුණ්‍යයක්
## (කායික - මානසික යහපැවැත්ම, විෂ මත්ද්‍රව්‍ය ලිංගික අධ්‍යාපනය)

- විෂ මත්ද්‍රව්‍යයන්හි අහිතකර බලපෑම පිළිබඳ පුළුල් අවබෝධයක් පාසැල් වියේ සිටම තරුණයින්ට ලබා දීම
- පුනරුත්ථාපනය සඳහා දැනට ක්‍රියාත්මක ක්‍රියාපටිපාටිය වෙනස් කොට එය වෛද්‍යමය පදනමක් සහිතව සැකසීම
- තරුණ ප්‍රජාවෙහි සියදිවි නසා ගැනීමේ නැඹුරුතාවන් තුරන් කිරීම සඳහා පැය විසි හතර පුරාම ක්‍රියාත්මක වන රහස්‍යභාවය සුරකින උපදේශන සේවාවක් ආරම්භ කිරීම සහ ඒ සඳහා ප්‍රවේශ වීමට hot line අංකයක් සහ Youth App

## ලෝකයට සම්බන්ධ වූ නූතන තාරුණ්‍යයක්
## (සයිබර් අවකාශය, තොරතුරු තාක්ෂණය)

- Data freedom සහ Data privacy තහවුරු කිරීම
- විශ්වවිද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතන, කාර්මික විද්‍යාල, පාසල් සහ පුස්තකාල සඳහා නොමිලේ අන්තර්ජාල පහසුකම්
- ප්‍රාදේශීය මට්ටමෙන් පවතින සියලුම පුස්තකාල සඳහා ඊ පුස්තකාල ක්‍රමය හඳුන්වා දීම සහ ඒ හරහා ඊ පුස්තකාලවලට සම්බන්ධවීමට අවස්ථාව සැලසීම
- රටේ ආර්ථිකයට අධ්‍යාපනයට හා ජන ජීවිතයට වැදගත් වන පරිගණක මෘදුකාංග හා දුරකථන යෙදවුම් නිපදවීම සඳහා තරුණයින් දිරිගැන්වීම සහ ඒවා වසරක් පාසා ඇගයීමට ලක් කිරීම මෙන්ම ආර්ථික සංවර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම

## රටේ නායකත්වයේ අනාගතය

- දේශපාලන ආයතනවල තරුණ නියෝජනය වැඩි කිරීම සඳහා කෝටාවක්
- ජාතික තරුණ සේවා සභාව සහ එහි ශාඛා, ජාතික යොවුන් සේනාංකය, යෞවන සමාජ ව්‍යාපාරය වැනි රජයේ ආයතන දැනුම, නිපුණතාවය, විනය සහිත ක්‍රියාශීලී නවීන තරුණ නායක නායිකාවන් ගොඩනැගීම අරමුණු කොට ප්‍රතිසංවිධානය කිරීම
- ප්‍රාදේශීය මට්ටමින් Youth Circles ගොඩනැගීම
- අමාත්‍යාංශ උපදේශක සභාවල තරුණ නියෝජනය
- තරුණ තරුණියන්ට ජාතික හා ජාත්‍යන්තර දේශපාලන නායකත්වය ප්‍රගුණ කිරීම සඳහා ජාතික දේශපාලන අධ්‍යාපන ඇකඩමියක්
- 2022 අරගලයට අදාළව දේශපාලන විරුද්ධවාදීන් මර්දනය සඳහා ගොනු කරන ලද මූලික විමර්ශන කටයුතු අවසන් නොකරන ලද සහ චෝදනා ගොනු නොකරන ලද චූදිතයින් නිදහස් කිරීම සහ නඩු කටයුතු නිසි කාර්යපටිපාටි අනුගමනය කර කඩිනමින් අවසන් කිරීම

## සොබාදහම සමග එක්ව සිතමු

- පරිසර සංවිධාන, පරිසර ක්‍රියාකාරීන් හා පරිසරවේදීන් එකාබද්ධ කරමින් තරුණ පරිසරවේදීන්ගේ ජාතික පරිසර ක්‍රියාකාරී මධ්‍යස්ථානයක්
- විනාශ වී ඇති පරිසර පද්ධතීන් විද්‍යාත්මක ලෙස ප්‍රතිස්ථාපනය කිරීමට පුහුණුව ලත් ස්වෙච්ඡා තරුණ බලකායක්
- තෝරාගත් පරිපාලන ඒකක මට්ටමින් තරුණ ක්‍රියාකාරී පරිසර කමිටු
- පරිසරය පිළිබඳ දැනුම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමට ජාත්‍යන්තර පරිසර සංවිධාන සමග ඒකාබද්ධව වැඩසටහන්
- අලි මිනිස් ගැටුම කළමනාකරණය කිරීමට ඒ සඳහා උනන්දුවක් දක්වන තරුණ පරිසර ක්‍රියාකාරීන් සක්‍රීයව දායක කර ගැනීම

## වෙනස් නමුත් සමානයි
### (ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගික දිශානතිය)

- ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා ලිංගික දිශානතිය සම්බන්ධව පවත්නා හානිකර සහ වැරදි ආකල්ප තුරන් කිරීම සඳහා කටයුතු කිරීම



## ගෞරවනීය ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක්

# අර්ථවත් විශ්‍රාම දිවියක්

අපේ ජන සමාජයේ සංස්කෘතික වටිනාකමක් ලෙස වැඩිහිටියන් රැකබලා ගැනීම පවුලේ දූදරුවන් හා නෑදෑයින්ගේ කාර්යක් වුවද සිය ජීවිතයේ වැඩි කාලයක් සිය පවුල ඇතුළු සමාජ ආර්ථික සංවර්ධනයට දායකවූ වැඩිහිටියන් ඔවුන්ගේ සැඳෑසමය තුළ රැකබලා ගැනීම සමාජ වගකීමකි. 2023 දී ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය (වයස 60ටවැඩි) මිලියන 3.7කි. එය සමස්ත ජනගහනයෙන් 17.2%කි. 2045 දී මෙම ප්‍රතිශතය 21% ක් විය හැකි බව පුරෝකථන වී ඇත. සමහර ප්‍රතිපත්ති සම්පාදකයින් සමස්ත ජනගහනය තුළ වැඩිහිටි ජන ගහනය වැඩිවීම ගැටලුවක් ලෙස හඳුනා ගත්ත ද වගකීම් සහගතව එම තත්වය අවබෝධය කරගනිමින් වැඩිහිටියන් වෙනුවෙන් විශේෂ අවධානයකින් කටයුතු කිරීම ජාතික ජන බලවේගයේ අරමුණයි.



# ක්‍රියාමාර්ග

- නිවෙස් තුළ වැඩිහිටියන් රැකබලාගැනීමේ කටයුතු කරන අවස්ථාවල ඊට අවශ්‍ය මූලික පහසුකම් සැපයීම
- වැඩිහිටියන්ගේ සෞඛ්‍ය කටයුතු සොයා බැලීම සඳහා සෞඛ්‍ය කණ්ඩායම් යෙදවීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූළ වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන පද්ධතියක් ඇති කිරීම
- යහපත් මානසික තත්වයක් පවත්වාගෙන යාම සහ සමාජ සම්භාෂණය ඇති කිරීම සඳහා වැඩිහිටි අය නිර්මාණාත්මක ආර්ථික කටයුතුවලට සම්බන්ධ කරන වැඩසටහනක් සකස් කිරීම
- පෞද්ගලික අංශයේ හා අවිධිමත් රැකියා අංශවල නියුතු අය සඳහා සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක් කියාවට නැංවීම
- සියලු වැඩිහිටියන්ට රැකවරණය ලැබෙන රක්ෂණාවරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදලක් ස්ථාපිත කිරීම
- වැඩිහිටියන්ගේ එදිනෙදා ජීවිතය නිදහස් පරිසරයක් තුළ සතුටින් ගත කිරීම සඳහා ඇවිදින මංතීරු, ආගමික සිද්ධස්ථාන අසළ නිවාඩු නිකේතන ඇති කිරීම දිරිගැන්වීම
- පොදු සේවා සපයන ස්ථානවල වැඩිහිටි අය වෙනුවෙන් ප්‍රමුඛතා වැඩසටහන්
- මූල්‍ය දුෂ්කරතා ඇති වැඩිහිටි අය සඳහා මූල්‍ය දීමනාවක්
- වැඩිහිටි හා ආබාධිත පුද්ගලයන් රැකබලා ගැනීම පිළිබඳ වෘත්තීය පාඨමාලා

# නිර්බාධිත සමාජ ජීවිතයක්
# යුක්තිසහගත සම ප්‍රවේශයක්

සෑම පුද්ගලයෙකුම තම ජීවිතයේ යම් අවස්ථාවක, විශේෂයෙන් වයස්ගත වීමේදී සාමාන්‍ය ලෙස ක්‍රියා කිරීමේ දුෂ්කරතා අත්විඳීමට ඉඩ ඇත. පවුලේ සාමාජිකයකු ආබාධයක් සහිතව උපත ලබන විට, නැත හොත් ළමා වියේදී, නව යොවුන් වියේදී හෝ වැඩිහිටි වියේදී අබාධ සහිත තත්වයට පත්වන විට වේදනාත්මක අවස්ථාවන් අත්විඳින්නට සිදුවේ. එබැවින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ජීවිත බලගැන්වීම සහ ඔවුන්ට සමාජයට පූර්ණ ලෙස සහභාගී විය හැකි පරිසරයක් සහතික කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍යම වේ. විශේෂයෙන්ම දිළිඳු සමාජ ආර්ථික ස්ථර අතර සහ ග්‍රාමීය ප්‍රදේශවල ආබාධ සහිත පුද්ගලයන් ප්‍රමාණයෙන් වැඩි වන අතර නිසි පහසුකම් ද ඔවුනට නොලැබේ. ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 8.7% ක් පමණ ආබාධ සහිත පුද්ගලයන් වේ.

ජාතික ජන බලවේගය ආබාධ සහිත ප්‍රජාවට රටේ අනෙකුත් පුරවැසියන් හා සමානව ජීවත්වීමට ඇති අයිතිවාසිකම, අධ්‍යාපනයට සහ වෘත්තීය අධ්‍යාපනයට ඇති අයිතිවාසිකම, රැකියාවක යෙදීමට ඇති අයිතිවාසිකම, ගමනා ගමනයෙහි යෙදීමට ඇති අයිතිවාසිකම, රාජ්‍ය සේවාවන් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම ආදී වශයෙන් වූ සියලු අයිතිවාසිකම් පිළිගන්නා අතර එම අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ග මෙම ප්‍රතිපත්තිය මගින් ඉදිරිපත් කෙරේ. ඒ අනුව අපගේ අපේක්ෂාව වනුයේ ආබාධ සහිත පුද්ගලයින් ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් හා ඔවුන්ට සමානව සලකන අන්තර්කරණය වූ සමාජයක් නිර්මාණය කිරීමයි.



# මූලධර්ම

- ප්‍රශස්ත සේවා සම්පාදනය
- අන්තර්කරණ අධ්‍යාපනය
- ආර්ථික ස්වාධීනත්වය
- ආරක්ෂාව සහ අයිතිවාසිකම්
- සෞඛ්‍යය සහ යහපැවැත්ම
- අන්තර්ග්‍රාහී පොදු සේවාවන් සහ සම ප්‍රවේශ්‍යතාව

# ක්‍රියාමාර්ග

## ප්‍රශස්ත සේවා කළමනාකරණය සහ පාලනය

- ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධ පනත් අවශ්‍ය පරිදි සංශෝධනය කිරීම, අවශ්‍ය නව නීති සම්පාදනය හා ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (CRDP) ඇතුළු සම්මුතීන් බලාත්මක කිරීම
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා ජාතික සැලැස්මක්
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා සේවාවන්හි ඵලදායිතාවය මැනීම සඳහා ඇගයීම් රාමුවක්
- ආබාධ සහිත සාමාජිකයින් සිටින පවුල්වලට රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සම්පත් සහ තොරතුරු ලබා ගැනීම සඳහා මාර්ග ගත (online) තොරතුරු මධ්‍යස්ථානයක්
- ආබාධ සහිත පුද්ගලයින්ට නවීණ තාක්ෂණය භාවිත කිරීම සඳහා වඩාත් ඵලදායී දැනුවත් කිරීම, පුහුණු කිරීම සහ සහය සහතික කිරීම

## අධ්‍යාපනය

- උසස් තත්වයේ, දැරිය හැකි, අන්තර්කරණීය සහ පහසු ප්‍රවේශ්‍යතාව සහිත මුල් ළමාවිය අධ්‍යාපනයක්
- ආබාධ සහිත පාසල් සිසුන් සඳහා අන්තර්කරණීය අධ්‍යාපනය
- පාසල් ගුරුවරුන්, රාජ්‍ය නොවන සංවිධානවල ගුරුවරුන් සහ විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන්ගේ සංගෘහිත අධ්‍යාපනය පිළිබඳ දැනුම සහ අවබෝධය පුළුල් කිරීම

- සංඥා භාෂා පුහුණුව ලද ගුරුවරු පාසල් අධ්‍යාපනයට ඇතුළත් කිරීම සඳහා පහසුකම්
- සංඥා භාෂා පරිවර්තකයන් රාජ්‍ය හා පුද්ගලික ආයතන සඳහා යොමු කිරීමට පහසුකම්
- සෑම අධ්‍යාපන කොට්ඨාසයකම විශේෂ අධ්‍යාපන ළමා සංවර්ධන සම්පත් මධ්‍යස්ථානයක්
- ආබාධ සහිත ළමුන් සඳහා ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් පහසුකම්
- ආබාධ සහිත සිසුන් සඳහා පළාත් සහ ජාතික මට්ටමින් ක්‍රීඩා සහ විශේෂ විෂය බාහිර ක්‍රියාකාරකම්
- ලාභ නොලබන, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන සත්කාර ආයතන සඳහා බදු සහන
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෘත්තීය උපදේශන සහ මාර්ගෝපදේශ සේවා

## ආර්ථික ස්වාධීනත්වය

- රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවල රැකියාවලින් ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් අනුමත 3%ක් ලබාදීම බලාත්මක කර, එම කෝටාව ක්‍රමානුකූලව 5% දක්වා ඉහළ දැමීම
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා රැකියා අවස්ථා, ව්‍යාපාර හිමිකාරිත්වය සහ සංවර්ධනය, ස්වයං රැකියා සහ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම
- ආබාධ සහිත වූවන්ට ආවේණික ගැටලු ගැන සන්නිවේදනය කිරීමට, තමන් පිළිබඳ සංජානනය වෙනස් කර ගැනීමට හා අන්තර්කරණය දිරිමත් කිරීමට සේවා ස්ථානවල ආබාධ සහිත වූවන්ගේ ජාල ශක්තිමත් කිරීම
- අඩු ආදායම්ලාභී ආබාධ සහිත පවුල් සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා මූල්‍ය ආධාර පුළුල් කිරීම

### සෞඛ්‍යය සහ යහපැවැත්ම

ආබාධ සහිත පුද්ගලයින්ගේ

- සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා අදාළ සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ වෘත්තීය නිපුණතා හා ආකල්ප ප්‍රවර්ධනය
- පොදු ස්ථාන හා සේවාවන්වල ප්‍රවේශ පහසුකම් පුළුල් කිරීම
- ඔටිසම් සහ අනෙකුත් ආබාධ කල්තියා හඳුනා ගැනීම සහ වර්ධනය අවම කිරීමට මැදිහත්වීම සඳහා සෞඛ්‍ය සේවා පහසුකම්
- ආබාධ සහිත පුද්ගලයින් හඳුනා ගැනීමට මෙන්ම, සේවා ආයතනවලට ප්‍රවේශවීමේ පහසුකම සපයන ප්‍රමුඛතා කාඩ්පතක්
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) ප්‍රාදේශ මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් පුනරුත්ථාපන රෝහල් ඔස්සේ ප්‍රජා මූලික පුනරුත්ථාපන සේවා ප්‍රවර්ධනය

## ආරක්ෂාව, අයිතිවාසිකම් සහ යුක්තිය

- ආබාධ සහිත පුද්ගලයින්ට රජයේ පත්වීම් සඳහා අයදුම් කිරීමට සහයවීම
- පොදු ප්‍රවාහනයේදී ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ප්‍රවාහන කාර්ය මණ්ඩලය ඇතුළු මහජනතාවගේ සාධනීය ආකල්ප ප්‍රවර්ධනය
- නීති තොරතුරු සැපයීම මගින් අධිකරණයේ හා නීතියේ සහය සඳහා වන ප්‍රවේශ්‍යතාව

## පොදු සේවා සහ ප්‍රජා සහය

- පොදු ගොඩනැගිලි සැලසුම්කරණයේදී ආබාධ සහිත පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ ප්‍රවේශය සහතික කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට සමාජීය, විනෝදාත්මක, ක්‍රීඩා, ආගමික සහ සංස්කෘතික ජීවිතයට සහභාගී වීම ඇතුළු කටයුතුවලට සම්බන්ධ වීමට ඇති අවස්ථා පුළුල් කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට පොදු සහ පෞද්ගලික ප්‍රවාහනය භාවිත කිරීම පහසු කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක හඳුන්වා දීම හා විශේෂිත ප්‍රවාහන සේවා සැපයීම
- ආබාධවලට සරිලන මාර්ග සහ රථ ගාල්වල ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය සඳහා පහසුකම්
- මාර්ගගත පොදු සේවාවන්හි ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන්
- ආබාධ සහිත පුද්ගලයින්ට අදාළ නවෝත්පාදන දිරිමත් කිරීම
- ආබාධ සහිත පුද්ගලයින් භාවිත කරන ආධාරක උපාංග ආනයනයේදී බදු සහන
- ශ්‍රවණ ආබාධිතතා සහිත පුද්ගලයන් සඳහා සංඥා භාෂාව සන්නිවේදන භාෂාව ලෙස පිළිගැනීම
- ආබාධ සහිත පුද්ගලයින්ගේ කලා සහ සංස්කෘතික සහභාගීත්වය පුළුල් කිරීමට අන්තර්කරණීය රංග ශාලා හා ක්‍රීඩා පිටි

# 3

# නවීන ජීවිතයක් පොහොසත් රටක්



# ප්‍රජාතාන්ත්‍රික ආර්ථිකයක් පොහොසත් රටක්

රටක ජනතාවගේ උසස් ජීවන තත්වය සහ සමාජ - සංස්කෘතික දියුණුව තීරණය වන්නේ එරට අනුගමනය කරන නිවැරදි ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග මතයි. නිදහසින් පසු මෙරට පාලකයින් අනුගමනය කළ විනාශකාරී ආර්ථික ප්‍රතිපත්ති හා දූෂිත දේශපාලන සංස්කෘතියේ ප්‍රතිඵල ලෙස අද වන විට අපට ඉතිරි කර ඇත්තේ කඩා වට්ටන ලද ආර්ථිකයක් සහ සෑම අතකින්ම බිඳවට්ටන ලද මිනිස් ජීවිත සහිත සමාජයකි.

සමස්ත ජාතියම ණය උගුලක හිරකරමින් 1990 දී රුපියල් මිලියන 310,779ක් වූ ආණ්ඩුවේ මුළු ණය ප්‍රමාණය 2023දී රුපියල් මිලියන 28,695,950 දක්වා වර්ධනය වී ඇත. 2015 සිට 2019 දක්වා කාලය තුළ පමණක් සමස්ත ණය වැඩිවීම රුපියල් මිලියන 13,031,543ක් වූ අතර, එය 74%ක වැඩිවීමකි. තවද 2021ට සාපේක්ෂව 2022දී 51.43%ක අසාමාන්‍ය ණය වර්ධනයක් සිදු වී ඇත. 2024.03.31 දිනට රජයේ මුළු ණය ප්‍රමාණය රුපියල් මිලියන 28,013,560ක් වූ අතර එය ඇමරිකානු ඩොලර් මිලියන 100,000කට අධිකය.

කෙසේ නමුත් ලබාගත් ණය ආර්ථික ප්‍රතිලාභ ගෙන දෙන ඵලදායී ව්‍යාපෘතිවල ආයෝජනය නොකිරීම හා අවභාවිතාව හේතුවෙන් ණය වර්ධනය වීමට සාපේක්ෂව ආර්ථිකය වර්ධනය වුයේ නැත. 2015 සිට 2019 දක්වා කාලය තුළ වාර්ෂික ආර්ථික වර්ධනය 5% සිට - 0.2% දක්වා කඩා වැටුණි. 2023දී එය - 2.3% ක් විය.

දුර්වල බදු පරිපාලනය, අකාර්යක්ෂමතාවය, දූෂණය, බදු වංචා, හිතවතුන්ට බදු සහන ලබාදීම හා බදු පැහැර හැරීම් හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආණ්ඩුවේ බදු ආදායම ශීඝ්‍ර ලෙස පහත වැටී ඇත. 2023 දෙසැම්බර් වන විට පැහැර හරින ලද මුළු බදු ප්‍රමාණය පමණක් රුපියල් මිලියන 1,100,000කට වැඩිය. ආණ්ඩුවේ ස්ථාවරය වී ඇත්තේ භාණ්ඩ හා සේවා සඳහා වන රටේ සමස්ත ඉල්ලුම හා ජනතාවගේ වියදම් කළ හැකි ආදායම පහළ යාමෙන් සිදු විය හැකි අහිතකර ප්‍රතිවිපාක නොසලකා හරිමින් සාමාන්‍ය ජනතාව මත අසාධාරණ ලෙස තව තවත් බදු පැනවීම, අත්‍යවශ්‍ය පොදු වියදම් කපා හැරීම හා මහජන දේපළ විකුණා දැමීමයි.



උද්ධමනය පාලනය කර ඇති බවට විවිධ තර්ක ඉරිදිපත් කළද යථාර්ථය වන්නේ භාණ්ඩ හා සේවාවන්ගේ මිල ජනතාවට දරා ගත නොහැකි ලෙස ඉහළ ගොස් තිබීමයි. මූලික අවශ්‍යතාවයන් ප්‍රමාණාත්මකව සපුරා ගැනීමට නොහැකි පරිදි ජනතාවගේ සැබෑ ආදායම පහළ වැටී ඇත. විනාශකාරී දේශපාලනයේ ප්‍රතිඵල ලෙස අද වන විට රටේ සමස්ත ජනගහනයෙන් 26% ක් පමණ දිළිඳු බවේ රේඛාවෙන් පහළට ඇද දමා ඇත.

අත්තනෝමතික විදේශීය සංචිත භාවිතය, දුර්වල විදේශ විනිමය අනුපාත කළමනාකරණය, රටේ ණය ශ්‍රේණිගත කිරීම් අඛණ්ඩ ලෙස පහත වැටීමෙන් ඇතිවූ විදේශ ණය ප්‍රතිමූල්‍යනය කිරීමේ නොහැකියාව, විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ නොහැකියාව, නිරතුරුව ඉහළ යන ආනයන වියදම හා වර්ධනය නොවන අපනයන ආදායම හේතුවෙන්, ආර්ථිකයේ බාහිර අංශය දිනෙන් දිනම දුර්වල වෙමින් පවතී. භාවිත කිරීමේ කොන්දේසිවලට යටත්ව චීන මහජන බැංකුවෙන් ලබාදී තිබූ ඩොලර් බිලියන 1.5ක් වූ හුවමාරු ණය පහසුකම් ඇතුළුව 2024 මැයි වන විට විදේශීය සංචිත ඩොලර් බිලියන 5.4ක් තිබුණද, එය ප්‍රධාන වශයෙන්ම නොගෙවූ ණය පොලී හා ණය වාරික, ආනයන සීමා කිරීම් හා විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් සිදු කළ ප්‍රේෂණවල ප්‍රතිඵලයක් මිස ආණ්ඩුව අනුගමනය කළ දූරදර්ශී ක්‍රියාවක ප්‍රතිඵලයක් නොවේ.

ආදායම් බෙදීයාමේ විෂමතාවයද වර්ධනය වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ පවුල් සංඛ්‍යාවෙන් පහළම සිටින 20%ට ජාතික ආදායමෙන් හිමිවන්නේ 4.6% පමණක් වන අතර ඉහළම සිටින පවුල් 20%ට ජාතික ආදායමෙන් 51.4%ක් භුක්ති විඳියි.

ජනතාවට නිදහසේ ආර්ථික කටයුතුවල නියැලීමට සාධාරණ අවස්ථා, සමාන මැදිහත්වීමක් යටතේ ආර්ථික තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධවීම හා සැමට ආර්ථික ප්‍රතිලාභවල සාධාරණ පංගුවක් ලැබීම සහතික කරන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය මූලික කර ගනිමින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් හා තාක්ෂණික සංවර්ධන මාර්ග සිතියමක් සමග එකිනෙක බද්ධ වූ නොසැලෙන නිෂ්පාදන ආර්ථිකයක් මගින් 2030 දී ඇ. ඩො. බිලියන 120ක තථ්‍ය ද.දේ. නි. (Real GDP) ඉලක්කයක් සහිතව තිරසාර ආර්ථික වෘද්ධියක් හා සංවර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා ප්‍රධාන මූලධර්ම දහයක් පදනම්ව ජාතික ජන බලවේගයේ ආර්ථික ප්‍රතිපත්ති රාමුව ගොඩනගා ඇත.

මෙම ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී රටේ සම්පත් සුලභතාවය හා ඒවා ලබාගත හැකි බව, පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල ප්‍රතිඵල, සමාජීයව ගොඩනැගී ඇති දැනුම, ජනතාවගේ ශිෂ්ටාචාරය, ජෛව විවිධත්වය, භාවිත කළ යුතු තාක්ෂණය, ගෝලීය වටිනාකම් දාමයන්ගේ ප්‍රවණතා, රටේ උපායමාර්ගික පිහිටීම හා පවත්වා ගත යුතු රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතාවල ස්වභාවය යන කරුණු මූලිකව සැලකිල්ලට භාජනය කරන ලදී.

# මූලධර්ම

- මනුෂ්‍යත්වයට ප්‍රමුඛත්වය
- ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය
- මහජන සහභාගිත්වය හා අන්තර් ගෘහිත සමාජයක්
- ආහාර සුරක්ෂිතතාවය
- සාධාරණ ආර්ථික ප්‍රතිලාභ
- තිරසර සම්පත් භාවිතය
- වාණිජකරණය නොවූ මහජන සේවා හා සමාජ ආරක්ෂණය
- ජාත්‍යන්තර සහයෝගීතාව සහ සාමූහිකත්වය
- ගෙවීම් නොලබන ජනතා ශ්‍රම දායකත්වය සුරැකුම් ආර්ථිකය ලෙස පිළිගැනීම
- ප්‍රගතිශීලී හා සාධාරණ බදුකරණය

# ක්‍රියාමාර්ග

## සාර්ව ආර්ථික ස්ථායීකරණය

### රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති

- ජාත්‍යන්තර ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශේෂ අංශයක් සහිතව බදු ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නව ඒකකයක් පිහිටුවීම
- බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම
- දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුහුණුව සහ ධාරිතා සංවර්ධනය කිරීම
- හිඟ බදු කඩිනමින් අය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- බදු අය කිරීමේ කාර්යක්ෂමතාව හා සාධාරණ බව තහවුරු කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය ඇතුළු අදාළ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් දේශීය අදායම් දෙපාර්තමේන්තුව සමග ජාලගත කිරීම
- රාජ්‍ය සේවා ලබා ගැනීම හා රජය සමග කටයුතු කිරීමට සෑම පුරවැසියෙකුටම නිශ්චිත ඩිජිටල් හඳුනා ගැනීමේ කේතයක් (Unique Digital

Identification code) ලබාදීම

- පුද්ගලයින් සඳහා වන වාර්ෂික බදු නිදහස් සීමාව රුපියල් ලක්ෂ 12 සිට ලක්ෂ 24දක්වා වැඩිකිරීමට සහ බදු කාණ්ඩ (Tax Brackets) හා බදු අනුපාත (Tax Rates) සාධාරණ ලෙස සංශෝධනය කිරීම
- බදු මූලධර්මවලට අනුකූලව බදු පදනම (Tax Base) පුළුල් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම
- යන්ත්‍රසූත්‍ර සඳහා ප්‍රාග්ධන වියදම්වලින් සමාගම් ආදායම් බදු සඳහා අඩු කළ හැකි ක්ෂය දීමනාව, 120% දක්වා වැඩි කිරීම මගින් නිෂ්පාදනය දිරිගැන්වීම
- වැට් (VAT) බදු එකතු කිරීම විධිමත් සහ කාර්යක්ෂම කිරීම සඳහා පොයින්ට් ඔෆ් සේල්ස් (POS) යන්ත්‍ර සහ ඩිජිටල් ඉන්වොයිසින් ක්‍රම හඳුන්වාදීම
- දේශීයව නිෂ්පාදනය කරන කිරි, බිත්තර ඇතුළු අත්‍යවශ්‍ය ආහාර, ළදරු කිරි, ඖෂධ, පාසල් පොත් හා උපකරණ, සඟරා, පුස්තකාල සේවා, කෘෂි උපකරණ, පොහොර, සූර්ය පැනල සහ උපාංග, පුනර්ජනනීය බලශක්ති ජනන යන්ත්‍ර, ආබාධ සහිත පුද්ගලයන් භාවිතා කරන වාහන උපකරණ පරිපථ, දේශීය නිෂ්පාදන මෘදුකාංග, තොරතුරු තාක්ෂණ සේවා, පර්යේෂණ හා සංවර්ධන සේවා සඳහා වැට් බද්ද 0% අනුපාතයට ගෙන ඒම
- වැට් බද්දට අදාළ භාණ්ඩ වර්ගීකරණය කොට ඒ ඒ කාණ්ඩය සඳහා වෙනස් බදු අනුපාත හඳුන්වා දීම
- ආදාන වැට් බද්ද (Input VAT) මත වන අපනයන සංවර්ධන බදු අපනයනකරුවන්ට කඩිනමින් ආපසු ලබාදීම
- දැනට ක්‍රියාත්මක අභිමත බදු විගණනය වෙනුවට අවදානම් පාදක බදු විගණනයට මාරු වීම
- බදු තක්සේරු කිරීම, බදු වාර්තා ගොනු කිරීම, බදුගෙවීම, හා අතිරික්ත බදු ආපසු ගෙවීම සඳහා ජංගම දුරකථන මඟින් ගෙවීමේ පහසුකම්ද සහිත මාර්ග ගත ක්‍රමවේදයක් හඳුන්වා දීම
- ආනයන හා අපනයන වෙළඳ පහසුකම් සැලසීමට අනෙකුත් රාජ්‍ය ආයතන සහ ශ්‍රී ලංකා රේගුව ඒකාබද්ධ කරමින් තනි සේවා කවුළුවක් පිහිටුවීම
- සාධාරණ ලෙස රේගු බදු ආදායම වැඩි කර ගැනීම සඳහා පවතින සංකීර්ණ තීරුබදු අනුපාත ව්‍යුහය සරල කිරීම
- අපනයන ඉපැයීම්වලට සාපේක්ෂව විදේශ ප්‍රේෂණ ගෙන්වා ගැනීම හා මෙහෙයුම් කාර්යක්ෂම කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවට බලය පැවරෙන පරිදි විදේශ විනිමය පනත සංශෝධනය කිරීම
- ආනයන හා අපනයනකරුවන්ට වඩාත් කාර්යක්ෂම හා අඩු පිරිවැය සේවාවන් ලබා දීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ කටයුතු විමධ්‍ය ගත කිරීම
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය ක්‍රමය යටතේ (TIEP) අමුද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර

ආනයනය සඳහා පහසුකම් සැලසීම

- ජාත්‍යන්තර ගනුදෙනු සහ හුවමාරු මිල (Transfer Pricing) මත සිදුවන බදු කාන්දුවීම්, බදු පැහැර හැරීම්, ඌන ඉන්වොයිසින් හා අධි ඉන්වොයිසින්, වැළැක්වීමට රටවල් අතර ස්වයංක්‍රීය තොරතුරු හුවමාරුව (AEoI) වැනි ක්‍රියාමාර්ග හඳුන්වා දීම
- ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව සහ අදාළ මාර්ගෝපදේශ අනුව ජාත්‍යන්තර ගනුදෙනු මත අවම ගෝලීය බද්දක් (Minimal global taxation) පැනවීම
- විද්‍යුත් ප්‍රසම්පාදනය ඇතුළත් ඩිජිටල් පාදක ආණ්ඩුකරණය සහ ශක්තිමත් රාජ්‍ය අධීක්ෂණ යාන්ත්‍රණයක් මගින් රාජ්‍ය මූල්‍ය කාර්යක්ෂමතාව, විනිවිදභාවය, යහපාලනය සහ වගවීම වැඩි දියුණු කිරීම හා අනවශ්‍ය රාජ්‍ය වියදම් කපා හැරීම

## මූල්‍ය ප්‍රතිපත්ති

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ආර්ථික කටයුතු යථාතත්වයට පත්කිරීම හා හිඟ ණය සඳහා සහන සැලසීමට නව සහන බැංකුවක් ස්ථාපිත කිරීම
- ව්‍යවසායකයින් සඳහා දිගුකාලීන මූල්‍යකරණය, නව ව්‍යාපාර ආරම්භ කිරීම සහ ව්‍යාපාර ප්‍රසාරණය කිරීම සඳහා නව ජාතික සංවර්ධන බැංකුවක් ස්ථාපිත කිරීම
- කුඩා පරිමාණයේ ගොවියන්, නිෂ්පාදකයින්, ව්‍යවසායකයින් සහ ආයෝජකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට සමුපකාර, සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු කාර්යක්ෂම ලෙස මෙහෙයවීම
- නීතිමය විධිවිධාන සහ මාර්ගෝපදේශ උල්ලංඝනය කරමින් ලබාදී ඇති ක්ෂුද්‍ර මූල්‍ය ණය පිළිබඳ සමාලෝචනය කොට අගතියට පත් පාර්ශ්වයන්ට සහන සැලසීම
- ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයන ආයතන ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කිරීම දිරි ගැන්වීම සහ එම කටයුතු අධීක්ෂණය විධිමත් කිරීම
- විදේශ විනිමය වෙළෙඳපොළ ඇතුළු මූල්‍ය වෙළඳපොළවල ස්ථාවරත්වය සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික ස්ථායී කිරීම
- බැංකු මුදල් සහ ඉතුරුම් නිෂ්පාදන ආර්ථික ක්‍රියාකාරකම්වල විධිමත්ව ආයෝජනය කිරීමට නව මූල්‍ය යෝජනා ක්‍රම හඳුන්වා දීම
- රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය විධිමත් කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) ශක්තිමත් කිරීම
- ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය බැංකු ප්‍රතිප්‍රාග්ධනීකරණය (Recapitalization) කිරීම

## බාහිර අංශය ස්ථාවර කිරීම

- විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් සඳහා නව විගමණික බැඳුම්කර (Expatriate Bonds) ඇතුළු ඉතුරුම් සහ ආයෝජන සැලසුම් හඳුන්වා දීම
- ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීමට නව සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම
- තිරසාර සංවර්ධන ඉලක්ක සහිත සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෝලීය හරිත හා නීල අරමුදල් වෙත ප්‍රවේශවීමට බැඳුම්කර නිකුත් කිරීම
- තොරතුරු තාක්ෂණ කර්මාන්තය හා සංචාරක කර්මාන්තය දියුණු කිරීම තුළින් විදේශ විනිමය සංචිත වර්ධනය කර ගැනීම
- ජාතික ප්‍රමුඛතා සහ සංවර්ධන ක්‍රමෝපායන් සමග ගැළපෙන යෝජිත හා දැනට අතර මැද නතරවී ඇති සෘජු විදේශ ආයෝජන (FDIs) කඩිනම් කිරීම
- අපනයන විවිධාංගීකරණය මඟින් විදේශ වෙළඳ පංගුව වැඩි කිරීම සඳහා පවත්නා වෙළඳ ගිවිසුම් නැවත සලකා බැලීම සහ නව ගිවිසුම්වලට එළඹීම
- සංචාරක කර්මාන්තයෙන් හා තොරතුරු තාක්ෂණ කර්මාන්තයෙන් විදේශ විනිමය ඉපයීම් වර්ධනයට කඩිනම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වැඩසටහන

- දුප්පත් හා අසරණභාවයට පත් කොට ඇති ජනතාව එම තත්වයෙන් මුදා ගැනීම සඳහා වඩාත් ශක්තිමත් හා නිවැරදි වැඩපිළිවෙළක අඩංගුව හා එය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග නැවත සාකච්ඡා කිරීම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරිපත් කර ඇති අදායම් පාදක වියදම් කළමනාකරණ (Revenue based fiscal consolidation) යෝජනා නැවත සමාලෝචනය කිරීම සඳහා කාර්යක්ෂම බදු පරිපාලනය හා ආණ්ඩුවේ වියදම් කළමනාකරණය පිළිබඳ නව යෝජනා ඉදිරිපත් කිරීම
- ණය තිරසර බව පවත්වා ගැනීම හා දරාගත හැකි මට්ටමක ණය පොලී තබා ගැනීම ඉලක්ක කරගනිමින්, අවශ්‍යතාවය අනුව ණය සමාලෝචන කටයුතුවලදී භාවිත කිරීම සඳහා විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් පිළියෙළ කිරීම (DSA )
- රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සහ ආණ්ඩුවේ වගවීම සහතික කිරීමට හා ණය අවභාවිතය සිදු කළ පුද්ගලයින්ට එරෙහි නීතිමය පියවර ගැනීම සඳහා ආණ්ඩු විසින් ලබා ගත් විදේශ ණය පිළිබඳ සවිස්තරාත්මක ණය විගණනයක් (Debt Audit) කඩිනමින් සිදුකිරීම
- රටේ සහ බැංකු පද්ධතියේ ණය ශ්‍රේණිගත කිරීම ඉහළ දමා ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය විනය වැඩි දියුණු කිරීම

## ආයෝජන ප්‍රවර්ධනය

- ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයද ඇතුළත්ව දැනට ක්‍රියාත්මක රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කරමින් බල ගන්වන ලද තනි ආයතනයක් ස්ථාපිත කිරීම
- ආයෝජන කැඳවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන්, ජාත්‍යන්තරව පිළිගත් මුලධර්මවලට හා ක්‍රමවේදයන්ට අනුකූලව පාරදෘශ්‍යභාවය හා සාධාරණ බව සහතික කරන, නීති පද්ධතියක් හඳුන්වාදීම
- ආයෝජන හා ව්‍යාපාර කටයුතු සම පසුබිමක් තුළ පහසුවෙන් කිරීමට නව ව්‍යාපාරවලට පිවිසීමේ සහ ස්ථාන සොයා ගැනීමේ පහසුව, ජලය හා විදුලිය ඇතුළු උපයෝගිතා පහසුවෙන් ලබා ගැනීම, ඉහළ නිපුණතාවයෙන් යුත් ශ්‍රම සුලබතාවය ඇති කිරීම, කාර්යක්ෂම මුල්‍ය සේවා, ජාත්‍යන්තර වෙළඳාමට පිවිසීම, සාධාරණ හා පාරදෘශ්‍ය බදු අයකිරීම, කාර්යක්ෂම ආරවුල් බේරුම්කරණය හා වෙළඳපොළ තරගකාරීත්වය තහවුරු කරන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සහිත පරිසරයක් නිර්මාණය කිරීම
- ඒකාබද්ධ යාන්ත්‍රණයක් යටතේ ව්‍යාපාර ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම්, සහතික කිරීම්, ඉඩම් භාවිතය සඳහා අවසර ලබා දීම, විදුලිය, ජලය, සන්නිවේදන සේවා ඇතුළු අනෙකුත් පහසුකම් සැපයීම සඳහා තනි කවුළුවක් ස්ථාපිත කිරීම
- ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ගෝලීය තරගකාරිත්ව දර්ශකයෙන් (Global Competitive Index) ශ්‍රී ලංකාව ඉහළට එසවීමට කටයුතු කිරීම
- නව ආයෝජන අවස්ථා සඳහා ප්‍රාග්ධන අරමුදල් (Venture Capital Funds) දිරිගැන්වීම
- ප්‍රාග්ධන වෙළඳපොළ කාර්යක්ෂම හා ඵලදායී ලෙස පවත්වා ගැනීම, ආයෝජකයින්ගේ විශ්වාසය තහවුරු කිරීම සහ නීති විරෝධී ගනුදෙනු සහ අල්ලස් නැවැත්වීම සඳහා රාජ්‍ය ආයතන පද්ධතිය ප්‍රතිව්‍යුහ ගත කිරීම
- උපායමාර්ගික වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන්හි නීතිවලට ප්‍රමුඛත්වය ලබා දෙමින් රාජ්‍ය, පෞද්ගලික හා මහජන හවුල් ව්‍යාපාර (PPPP) සඳහා දිගුකාලීන විදේශ ආයෝජන දිරිගැන්වීම
- විදේශගත ශ්‍රමිකයන්ට ඔවුන්ගේ ඉපැයීම් ආයෝජනය කිරීම සඳහා විශේෂ ප්‍රතිලාභ සහිත ආයෝජන ක්‍රම හඳුන්වා දීම
- ප්‍රාග්ධනය රැස්කිරීමට මූලික කොටස් නිකුත් කිරීම (IPO) සඳහා උචිත බදු දීමනා ලබාදීම
- සුළු හා මධ්‍ය පරිමාණ සමාගම් ලයිස්තු ගත කිරීම පහසුකරවීම, පහසු තොරතුරු වාර්තාකරණය, පාරදෘෂ්‍යභාවය සහ විධිමත් පාලනය සිදුවන කාර්යක්ෂම සහ දියුණු සුරැකුම් හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රසාරණය කිරීම හා වැඩි දියුණු කිරීම

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) මූලධර්මවලට අනුකූලව සාධාරණ සැලකීම, සාධාරණ වේතන, ආරක්ෂිත සේවා කොන්දේසි ඇතුළු කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- එකඟතා සහ සහයෝගීතා තුළින් කම්කරුවන් සවිබල ගැන්වෙන, නිෂ්පාදන ඵලදායීතාව වැඩිකරන හා එකිනෙක පාර්ශ්වයන්ට ප්‍රජාතන්ත්‍රවාදීව වගකීම් පැවරෙන සාමූහික මැදිහත්වීම් තුළින් කම්කරු සබඳතා වැඩිදියුණු කිරීම
- පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීම් මගින් කාර්මික ආරවුල් හා ගැටලු ප්‍රජාතන්ත්‍රවාදීව විසඳීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම

**රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසායන්** (SOEs)

- උපායමාර්ගික වැදගත්කම, ආර්ථික වර්ධනයේ විභවතාවය, නිෂ්පාදන ආර්ථිකය උත්තේජනය කිරීමේ හැකියාව, මූල්‍ය ස්ථාවරත්වයට ඇති බලපෑම සහ ජාතික ආරක්ෂාවට ඇති අදාළත්වය සලකා බලමින් එක් එක් ආයතනය සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග තීරණය කිරීම.
- විනිවිදභාවය සහතික කිරීම සඳහා SOEs හි මෙහෙයුම් පිළිබඳ සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමට මහජනතාවට පහසුකම් සැලසීම
- ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් සිදුවන ආර්ථික ප්‍රවණතා, විභවතා හා සංවර්ධනයන් තුළ නව අවස්ථා ගවේෂණය කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම

**දේශීය වෙළෙඳාම**

- වෙළඳපොළ තරගකාරීත්වය ඇති කිරීම, නියාමන ආයතන කාර්යක්ෂම ලෙස මෙහෙයවීම, වෙළඳපොළ කටයුතු සංවිධානය කිරීම හා රජයේ පංගුවක් නියෝජනය කිරීම තුළින් ජනතාවට ගුණාත්මක භාණ්ඩ හා සේවා, සාධාරණ මිලට අඛණ්ඩව සැපයීම තහවුරු කිරීම
- මහාපරිමාණ ආර්ථික හා හුවමාරු මධ්‍යස්ථාන දිස්ත්‍රික්ක මට්ටමින් ස්ථාපිත කිරීම
- භාණ්ඩ හා සේවා වෙළදාම අඛණ්ඩව, සාධාරණව සහ උසස් තත්වයෙන් පවත්වා ගැනීම, පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ වෙළඳාමට අදාළ තොරතුරුවල පාරදෘශ්‍යභාවය සහතික කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක් සහ මාර්ගගත තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම
- වෙළඳාම සහ බෙදාහැරීමේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා මූල්‍ය, බැංකු, ප්‍රවාහන, රක්ෂණ, සන්නිවේදන, ඇසුරුම්කරණය සහ ගබඩා කිරීම් වැනි උපකාරක සේවා කාර්යක්ෂමව ලබාගත හැකි සේවා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම
- නිෂ්පාදනය සහ පරිභෝජනය අතර ක්‍රියාකාරකම්වලදී වටිනාකම් නිර්මාණය නොවන අනවශ්‍ය මැදිහත්වීම් ඉවත් කිරීම සහ අතර මැදියන් සක්‍රීයව වටිනාකම් නිර්මාණය කරන්නන් බවට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීම

- වෙළඳපොළ පවතින තොරතුරු අසමමිතිය ඉවත් කිරීම සඳහා අවශ්‍ය නීති වෙනස් කිරීම සහ නව නීති හඳුන්වා දීම
- මැණික්, ස්වර්ණාභරණ, වටිනා ගල් වර්ග, ඇඟලුම්, හස්ත කර්මාන්ත ඇතුළු විභවයන් ඇති වෙනත් නිෂ්පාදන සඳහා විදේශීය ගැනුම්කරුවන් ඉලක්ක කර ගනිමින් වෙළඳපොළ ස්ථාන ස්ථාපිත කිරීම, වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ප්‍රජාව මුහුණ දෙන වෙළඳපොළට ප්‍රවිශ්ට වීම ඇතුළු වෙළඳාමට අදාළ ගැටලු විමර්ශනය කරමින් විසඳුම් ලබාදීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රිත්මක කිරීම
- අත්තනෝමතික ලෙස මිල ඉහළ දැමීම (Price Gouging) නැවැත්වීම සහ වෙළඳපොළ තුළ භාණ්ඩ හිඟයන් නිර්මාණය කිරීම වැළැක්වීම සහ වෙළඳපොළ ඒකාධිකාරිත්වය, කතිපයාධිකාරිත්වය හා කාර්ටල බිහිවීම වැළැක්වීම
- මධ්‍යගත තොරතුරු පද්ධතියක් මගින් රාජ්‍ය සේවා සැපයීමේ ගුණාත්මකභාවය සහතික කිරීමට, නියාමනය කිරීමට සහ පරිපාලනය කිරීමට ඒකාබද්ධ සුහුරු පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම

## විදේශ වෙළඳාම

- අපනයන භාණ්ඩ හා සේවා විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම සහ අවශ්‍ය යටිතල පහසුකම්
- අපනයන මූල්‍ය පහසුකම්, සහතික කිරීම් සේවා, රක්ෂණය, වෙළඳපළ හා භාණ්ඩ ඉල්ලුම පිළිබඳ ප්‍රවණතා, නව වෙළඳපළ සොයා ගැනීම්, නිෂ්පාදන සහ ගෝලීය වටිනාකම් දාමයන් පිළිබඳ තොරතුරු ලබා දෙමින් නිෂ්පාදකයින්ට හා අපනයනකරුවන්ට අවශ්‍ය පහසුකම් සැලසීම
- ඉන්දියාව, චීනය, උප සහරා අප්‍රිකාව, මැදපෙරදිග සහ යුරෝපය ඉලක්ක කර ගනිමින් සහ විශේෂයෙන් ගෝලීය සැපයුම් දාමයන් සහ අගය දාමයන් සඳහා භාණ්ඩ හා සේවා වෙළඳාම ප්‍රවර්ධනය කිරීම
- සමුද්‍රීය ආරක්ෂාව, ඉන්ධන, ආහාර ඇතුළු අනිකුත් නාවුක සේවා සපයන කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම
- අන්තර් නෞකාකරණය (Transshipment), අන්තර් ගොඩබෑම් (Transload), නැවෙන් නැවට භාණ්ඩ මාරු කිරීම ( Ship to Ship Cargo Transfer), හා තටාංග මාරුකිරීම් (Cross Docking) පහසුකම් සහිත කාර්යක්ෂම සේවා සපයන කලාපීය ලොජිස්ටික් කළමනාකරණ කේද්‍රස්ථානයක් සඳහා වරාය පහසුකම් දියුණු කිරීම
- බොර තෙල්, ඉන්ධන, ගෑස්, ඛනිජ නිෂ්පාදන හා කුළුබඩු ඇතුළු අනෙකුත් භාණ්ඩ වෙළඳාම සඳහා පිරිවැය අඩුකරන සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදෙන ජාත්‍යන්තර වෙළඳ කේන්ද්‍රස්ථානයක් බිහිකිරීම

- ශ්‍රී ලංකාව හරහා ගමනාගමනයේ යෙදෙන නැව්වල සේවය කරන නාවිකයින් සඳහා කාර්ය මණ්ඩල මාරුවීමේ  මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම
- නැව් හා ධීවර යාත්‍රා නිෂ්පාදනය හා අලුත්වැඩියාව සඳහා අවශ්‍ය තාක්ෂණ හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- සම්ප්‍රදායික නොවන සහ අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය සහ අපනයනය ප්‍රවර්ධනය කිරීම
- දේශීය නිෂ්පාදන ආරක්ෂා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම, නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමේ පහසුව, අත්‍යවශ්‍ය භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩවලට ප්‍රමුඛත්වය දීම සහ ආනයනය සඳහා තරගකාරී පිවිසීම යන කරුණු මුලික කොට ආනයන ප්‍රතිපත්ති සංශෝධනය කිරීම
- ප්‍රපාතන විරෝධී (Anti-Dumping) නීතිරීති ශක්තිමත් කිරීම සහ සාධාරණ වෙළෙඳාම (Fair Trading) පිළිබඳව නව නීති රීති හඳුන්වාදීම සහ පවතින නීති යාවත්කාලීන කිරීම
- ශ්‍රී ලංකාවේ සන්නාම අනන්‍යතාවයට සහ ප්‍රතිරූපයට හානි නොවන පරිදි අගය එකතු කළ ප්‍රතිඅපනයන හා අන්තරාල වෙළඳාම (Entrepot) වෙළඳ කටයුතු ප්‍රවර්ධනය කිරීම හා අවශ්‍ය පහසුකම් ලබාදීම
- තත්ව සහතික කිරීම සහ තත්ව පරීක්ෂණ මගින් ආනයන භාණ්ඩවල ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම



## ඉහළ ඵලදායීතාවක්

# ආහාර සුරක්ෂිත රටක්

මේ වනවිට ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය සඳහා කෘෂිකර්ම අංශයෙහි දායකත්වය 8.4%ක් වන අතර, කෘෂිකර්මාන්තයෙහි වන සේවා නියුක්තිය 27%ක් පමණ වේ. එමෙන්ම අපනයන ආදායමෙන් 15.3% පමණ සපයනු ලබන්නේද කෘෂිකාර්මික බෝගවලිනි. මේ අනුව කෘෂිකර්මය ශ්‍රී ලාංකේය ජන ජීවිතයෙහි වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

ශීඝ්‍ර ජනගහන වර්ධනයත් සමග සම්ප්‍රදායික තාක්ෂණයන් තුළින් පමණක්ම ජනතාවට අවශ්‍ය ආහාර ප්‍රමාණවත් තරමින් නිෂ්පාදනය කර ගැනීම අපහසු වූ හෙයින් නවීන තාක්ෂණික විධි සහ සොයා ගැනීම් සඳහා ශ්‍රී ලංකාවද යොමුවූ අතර එමගින් අපගේ ජනතාවට අවශ්‍ය සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ 24ක ඉලක්කය නිෂ්පාදනය කර ගැනීමට හැකිවුවත්, පසුගිය පාලන සමයන්හි ක්‍රියාත්මකවූ ඇතැම් අදූරදර්ශී ප්‍රතිපත්තීන් හේතුකොටගෙන මෙරට සහල් නිෂ්පාදනය අභියෝගයට ලක්විණි. එමෙන්ම පාරිභෝගික අවශ්‍යතාවලට සරිලන මෙරට නිපදවන සහල් වර්ග පවා අවශ්‍ය තරම් නිෂ්පාදනය කිරීමට නොහැකි වී තිබේ. වී ගොවියාට තම අස්වැන්නට සාධාරණ මිලක් නොලැබෙන අතර, සහල් පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට තම රුචිකත්වයට ගැලපෙන සහල් වර්ගයන් මිලදී ගැනීමට නොහැකිවී තිබේ.



ප්‍රමිතියෙන් උසස් එළවළු සහ පළතුරු නිෂ්පාදනය ඉහළ නැංවීම  අභියෝගයක් වී ඇති අතර රටේ සමස්ත එළවළු සහ පලතුරු නිෂ්පාදනයෙන්  30% පමණ පසු අස්වනු හානිවලට ලක්වේ. අනෙකුත් ක්ෂේත්‍ර  භෝග පිළිබඳව සලකා බලන විට ඒවා ආනයනය සඳහා පමණක් වර්ෂ 2022 දී ඇමරිකානු ඩොලර්  මිලියන 459 ක් පමණ වැයවී ඇත. එමෙන්ම දැනට විනිමය උපයන තේ, පොල්, රබර්, අපනයන කෘෂිභෝග සහ විසිතුරු භෝගයන්ගේද නිෂ්පාදන එලදාව පහළ ගොස් ඇත. පසුගිය රජයන් විසින් අනුගමනය කළ වැරදි කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග මෙන්ම නිවැරදි තාක්ෂණය භාවිත නොකිරීම ද මේ සඳහා බලපා තිබේ.

ඒ අනුව වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ගැටලු කිහිපයකටම මුහුණ දී ඇත. යැපුම් කෘෂිකර්මය, අවම යාන්ත්‍රීකරණය, වැඩි නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන සඳහා නිසි මිලක් නොලැබීම, කෘෂි නිෂ්පාදනවල ඉහළ මිළ මෙන්ම මිල උච්චාවචනය, දුර්වල ව්‍යාප්ති සේවය, ප්‍රමාණවත් නොවන අගය එකතු කිරීම්, සහ තාරුණ්‍යයෙහි අඩු සහභාගිත්වය  ඒ අතර ප්‍රධාන වේ. මෙකී තත්වයන් ගැඹුරින් සලකා බලා කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කර ඇති අතර, එය ක්‍රියාත්මක කිරීමෙන් කෘෂිකාර්මික ඉඩම් අක්කරයකින් වසරකට රුපියල් ලක්ෂ 30ක පමණ ආදායමක් ලබාගැනීමට අපේක්ෂා කෙරේ. ජාතික තේ නිෂ්පාදනය මෙ.ටො. මිලියන 400 ඉක්මවීමටත්, පොල් ගසකින් ලැබෙන වාර්ෂික අස්වැන්න ගෙඩි 80 දක්වා ඉහළ නැංවීමටත්, රබර් අස්වැන්න හෙක්ටයාරයකට වර්ෂයකට කි.ග්‍රෑම් 1300 දක්වා වැඩිකිරීමට ද අපේක්ෂා කෙරෙන අතර, හෙක්ටයාරයකින් මෙ.ටො. 06ක පමණ වී අස්වැන්නක් ලබා ගැනීම අපගේ  ඉලක්කයයි.

**ඒ අනුව වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ගැටලු කිහිපයකටම මුහුණ දී ඇත. යැපුම් කෘෂිකර්මය, අවම යාන්ත්‍රීකරණය, වැඩි නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන සඳහා නිසි මිලක් නොලැබීම, කෘෂි නිෂ්පාදනවල ඉහළ මිළ මෙන්ම මිල උච්චාවචනය, දුර්වල ව්‍යාප්ති සේවය, ප්‍රමාණවත් නොවන අගය එකතු කිරීම්, සහ තාරුණ්‍යයෙහි අඩු සහභාගිත්වය  ඒ අතර ප්‍රධාන වේ.**

# මූලධර්ම

- ජාතික ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය
- කෘෂිකාර්මික පද්ධතීන්හි ඉහළ නිෂ්පාදනය සහ ඵලදායීතාවය
- සවිමත් කෘෂි ව්‍යවසායකත්වය සහ ස්ථායී වෙළඳපොළ
- ප්‍රශස්ත ඉඩම් කළමනාකරණය
- නිවැරදි කෘෂි යෙදවුම් කළමනාකරණය
- පරිසර හිතකාමී මෙහෙයුම්
- කෘෂි නිෂ්පාදකයා සවිබල ගැන්වීම
- දේශගුණික අවදානම් කළමනාකරණය
- කෘෂි පර්යේෂණ, ව්‍යාප්ති සහ දැණුම් කළමනාකරණය
- මනා කෘෂි මෙහෙයුම් කළමනාකරණය සහ පාලනය

# ක්‍රියාමාර්ග

## ජාතික ආහාර සුරක්ෂිතතාව

- රටේ නිෂ්පාදනය කළ හැකි සියලුම ආහාර දේශීයව නිෂ්පාදනය සඳහා රාජ්‍ය අනුග්‍රහය
- අවම වශයෙන් මාස තුනකට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම
- රටේ පවතින ආහාර තොග පිළිබඳව දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම
- කෘෂි නිෂ්පාදන හා ආහාර බෙදාහැරීම සඳහා අවශ්‍යතාවය අනුව ශීතදාම කළමනාකරණ තාක්ෂණය යොදා ගත හැකි ප්‍රවාහන පද්ධතියක්
- ආනයනික බෝග සඳහා සුදුසු ආදේශක බෝග දේශීයව වගාකිරීම දිරිමත් කිරීම
- රාජ්‍ය - පුද්ගලික - ජනතා සහභාගිත්ව ව්‍යාපෘති ලෙස කෘෂි නිෂ්පාදන සඳහා ගබඩා හා ශීත ගබඩා, සැකසුම් ඒකක ස්ථාපිත කිරීම

## කෘෂිකාර්මික පද්ධතීන්හි ඉහළ නිෂ්පාදනය සහ ඵලදායීතාව

- නිවැරදි තොරතුරු සහිත තත්කාලීන ජාතික කෘෂිකර්ම දත්ත පද්ධතියක්
- ගොවි ජනතාව සඳහා විධිමත් කෘෂිරක්ෂණ ක්‍රමයක් සහ ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක්

- වන සතුන්ගෙන් වන වගා හානි අවම කිරීම උදෙසා විසඳුම් (උදා. නවීන තාක්ෂණික ක්‍රම, විදුලි වැට ප්‍රතිසංස්කරණය සහ නඩත්තුව, රක්ෂිත තුළ සතුන් සඳහා ආහාර සහ ජලය සුලබ කිරීම, අලි මංකඩ, අලි කළමනාකරණ ඒකක, ගහන සනත්ව පාලනය)
- වැව්, ඇලමාර්ග හා ගල්ඔය, රාජාංගණය, මින්නේරිය ආදී මහා වාරි මාර්ග පද්ධතීන් කාලානුරූපව ප්‍රතිසංස්කරණය
- වැසිජල සංරක්ෂණය සහ ක්ෂුද්‍ර ජලසම්පාදනය වැනි තාක්ෂණයන් භාවිතය දිරිමත් කිරීමට තාක්ෂණික සහ මූල්‍ය පහසුකම්
- වසර තුනක් තුළ තේ වගාවේ අස්වැන්න දෙගුණ කිරීම සඳහා තාක්ෂණික, මූල්‍ය සහ අනෙකුත් පහසුකම්

## සවිමත් කෘෂි ව්‍යවසායකත්වය සහ ස්ථායී වෙළඳපොළ

- නිෂ්පාදන බලවේග සංවිධානය කිරීම සහ වෙළඳපොළ බලවේග නියාමනය මගින් කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ මිලක්
- වසර පහක් තුළ කෘෂි ව්‍යවසායකයින් 50,000ක් බිහි කිරීම සඳහා මූල්‍ය පහසුකම් සහ මඟපෙන්වීම
- සංවිධිත ගොවි සංවිධානවල සහ පුද්ගලික අංශයේ දායකත්වයෙන් කෘෂි - කර්මාන්ත කලාප (Agro industrial zones)
- කෘෂිකර්මාන්තය පදනම් කරගත් සුලු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවස්ථා පුළුල් කිරීම
- ඉඩම් හිමිකාරිත්වය එලෙසම පවත්වා ගනිමින් කුඩා පරිමාණ වගා ඒකක ගොවි සමාගම්/සමුපකාර යටතේ මනා කෘෂි කළමනාකරණ පිළිවෙත් අනුගමනය කරනු ලබන මධ්‍ය හා විශාල පරිමාණ වගා ඒකක බවට පරිවර්තනය දිරිමත් කෙරේ
- සුළු හා මධ්‍ය පරිමාණ කෘෂි අපනයන නිෂ්පාදකයන් දිරිමත් කිරීම සඳහා තාක්ෂණික සහ මූල්‍ය පහසුකම් ලබාදීම සහ තානාපති සේවය මැදිහත්වීමෙන් වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම
- කෘෂිකර්මය හා බැඳුණු සංචාරක කර්මාන්තය දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම්
- ශ්‍රී ලංකා තේ සන්නාමය නැවත දීප්තිමත් කරමින් ඉහළ මිලක් ලැබෙන වෙළඳපොළ සොයා දීමට රාජ්‍ය මැදිහත්වීම
- අපනයන කෘෂි ගම්මාන 1000ක් ස්ථාපිත කිරීම
- අඩාල වී ඇති ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවට ශක්තිමත් ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයක්

## ප්‍රශස්ත ඉඩම් කළමනාකරණය

- නවීන තාක්ෂණය භාවිත කර නිවැරදි ඉඩම් පරිහරණය සඳහා කෘෂිකාර්මික දත්ත පද්ධතියක් සහිත ඩිජිටල් භූමි සිතියම්

- ඉඩම් ඵලදායීතාව වැඩි කිරීම සඳහා භෝග - සත්ව වගා පද්ධතීන් ලෙස ඒකාබද්ධ ගොවිතැන ප්‍රවර්ධනය
- ආන්තික සහ ඌන භාවිත ඉඩම් නව තාක්ෂණය භාවිත කරමින් කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා යොදවා ගැනේ
- පොල් වගාව ඇතුළු අනෙකුත් වාණිජ භෝග සඳහා භාවිත කරන සාරවත් ඉඩම් වෙනත් කටයුතු සඳහා භාවිතය සීමා කෙරේ

## නිවැරදි කෘෂි යෙදවුම් කළමනාකරණය

- ගොවීන්ට කෘෂි යන්ත්‍රෝපකරණ සහන පදනම මත ලබා ගැනීමට ගොවිජන සේවා බල ප්‍රදේශ මට්ටමින් කෘෂියන්ත්‍රෝපකරණ සැපයුම් මධ්‍යස්ථාන
- සාධාරණ මිලට පොහොර ඇතුළු කෘෂි යෙදවුම් ලබා දීම
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත්වලට අනුව රසායනික - කාබනික පොහොර ඇතුළු කෘෂි යෙදවුම් සඳහා සහනාධාර
- දේශීය ස්වභාවික අමුද්‍රව්‍ය සහ නිෂ්පාදිත අපද්‍රව්‍ය භාවිත කරමින් පරිසරයට හානි නොවන පරිදි කෘත්‍රිම පොහොර, කාබනික පොහොර සහ අනෙකුත් කෘෂිරසායන නිෂ්පාදනය
- වාණිජ මට්ටමින් බීජ හා රෝපණ ද්‍රව්‍යයන් වැඩි දියුණුකිරීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම සහ අලෙවි කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ දිරිමත් කිරීම
- කෘෂි නිෂ්පාදන සකස් කිරීමට හා ප්‍රවාහනයට අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය පහසුකම්

## පරිසර හිතකාමී මෙහෙයුම්

- ස්ථානීය පොහොර නිර්දේශ (Site Specific Recommendations) පදනම් කර ගනිමින් පොහොර යෙදීමට වගාකරුවන් දිරිමත් කිරීම
- සහතික කරන ලද කාබනික වගා භූමි ප්‍රමාණය වැඩි කිරීම
- ක්‍රමිකව ආහාර බෝග නිෂ්පාදන ඒකකයන් " යහපත් කෘෂිකාර්මික පිළිවෙත්" (Good Agricultural Practices) අනුගමනය කරනු ලබන ගොවිපළ බවට පත්කිරීම

## කෘෂි නිෂ්පාදකයා සවිබල ගැන්වීම

- ගොවීන් විසින් කළමනාකරණය කරනු ලබන සමුපකාර/ගොවි සමාගම් ප්‍රවර්ධනය
- තේ , රබර්, පොල් වැනි බහු වාර්ෂික භෝග වගාවන්හි අතුරුභෝග වගාව සහ භෝග විවිධාංගීකරණය සඳහා තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් පහසුකම්
- නිමි ද්‍රව්‍ය වශයෙන් අපනයනය කිරීම අරමුණු කොට ගනිමින් , අපනයන කෘෂි බෝග ආශ්‍රිත වටිනාකම එකතු කළ නිෂ්පාදන කර්මාන්ත ආරම්භ කිරීම

- රබර් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දැනට කිරි කැපීමට යොදා නොග න්නා රබර් ඉඩම් කිරි කැපීම සඳහා යොමු කරවීම සහ රබර් වගාවන් සඳහා යොදා ගැනෙන වැසි ආවරණ භාවිතය දිරිමත් කිරීම සඳහා මූල්‍ය පහසුකම්
- වැඩි දියුණු කළ ප්‍රභේද යොදා ගනිමින් හා ක්ෂුද්‍ර ජල සම්පාදනය යටතේ උක් වගාකිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් ලක්ෂ 10 ක් දක්වා පහසු ණය යෝජනා ක්‍රමයක්

## දේශගුණික අවදානම් කළමනාකරණය

- දේශගුණික විපර්යාසයන්ට අනුගත භෝග ප්‍රභේද, වගා හා වාරි තාක්ෂණික ක්‍රම සැලසුම් කිරීම, ජනනය කිරීම සහ යොදා ගැනීම
- කෘෂි පර්යේෂණ, ව්‍යාප්ති සහ දැනුම් කළමනාකරණය
- ව්‍යාප්ති කාරකයන් දැනුමින් සහ අවශ්‍ය සම්පත්වලින් සන්නද්ධ කිරීම මගින් ඔවුනට ඵලදායී ව්‍යාප්ති සේවාවක් ඉටුකිරීමට අවස්ථාව උදාකිරීම
- ගොවි පවුල් 350ට පමණ එක් කෘෂි ව්‍යාප්ති නිලධාරියෙකු බැගින් වන කාර්යක්ෂම කෘෂි ව්‍යාප්ති සේවයක්
- සේවා හා නිෂ්පාදන අංශවල වෘත්තීය පුහුණු කිරීම් මගින් සමෘද්ධි/ අස්වැසුමලාභීන් ඇතුළු ග්‍රාමීය ප්‍රජාවගේ දරිද්‍රතාවය අවම කිරීම
- කෘෂි ව්‍යාප්ති නිලධාරීන්ට නිෂ්පාදන ඉලක්ක පදනම් කරගත් දිරි දීමනා
- කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන ඉහළ නැංවීම
- කෘෂිකර්මාන්තය සමාජයීය පිළිගැනීමක් සහිත ආකර්ෂණීය වෘත්තියක් බවට පත්කිරීම සඳහා කෘෂිකර්මාන්තයෙහි නියැලෙන්නන්ට විධිමත් වෘත්තීය අධ්‍යාපන අවස්ථා

## මනා කෘෂි මෙහෙයුම් කළමනාකරණය සහ පාලනය

- කෘෂිකර්මය හා සම්බන්ධ සියලු රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශ සහ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් තීරණ ගැනීම සඳහා ජාතික කෘෂිකර්ම සංවර්ධන සභාවක්
- කෘෂිකර්මයට අදාළ සියලුම ව්‍යාපෘතීන් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් නියාමනය සහ අධීක්ෂණය
- සම්ප්‍රදායික නොවන ප්‍රදේශයන්හි වගා කළ හැකි පොල්, රබර්, කුරුඳු වැනි වාණිජ බෝග විධිමත්ව වගා කිරීම සඳහා වගාකරුවන් යොමු කිරීම
- කන්තලේ උක් කර්මාන්ත ශාලාව නැවත ආරම්භ කිරීම සහ උක් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම



# ගුණාත්මක පශු නිෂ්පාදනයක්
# ව්‍යවසායකත්ව ප්‍රවේශයක්

ප්‍රජාවට අත්‍යවශ්‍ය ප්‍රෝටීන මෙන්ම අනෙකුත් පෝෂ්‍ය පදාර්ථ සැපයීම සඳහා පශු සම්පත් ක්ෂේත්‍රය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. එමෙන්ම විවිධ ආනයනයන්ට විකල්ප ලෙස ආදේශ නිෂ්පාදනය හා අපනයන ආදායම් මගින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට මෙන්ම ජීවනෝපාය සංවර්ධනය සඳහාද මෙම කර්මාන්තය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරයි. පශු සම්පත් කර්මාන්තයේ පැවැත්මට අදාළ සාධක වන්නේ නිෂ්පාදන ධාරිතාව, පශු සම්පත් ගොවිපළවල් ගණන, නිෂ්පාදන අගය දාමයන්හි යටිතල පහසුකම්, පශු සම්පත් අංශයේ ශ්‍රම බලකාය සහ ප්‍රතිපත්ති සම්පාදකයින්, පරිපාලකයින් සහ පර්යේෂකයන් ඇතුළු  වෘත්තිකයන් හා අනෙකුත් තාක්ෂණික නොවන පාර්ශ්වකරුවන්ය.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ පශු සම්පත් නිෂ්පාදනය සහ ඵලදායිතාව අපේක්ෂිත මට්ටම් කරා ළඟා වී නොමැති අතර එම ක්ෂේත්‍ර ගැටලු ගණනාවකින් යුක්ත වේ. ගුණාත්මක සත්ව ආහාර සහ අභිජනන ද්‍රව්‍යවල උග්‍ර හිඟය, සත්ව රෝග බහුල වීම, නිෂ්පාදනය හා බැඳුණු සැපයුම් දාමයේ හා සේවාවන්හි දුර්වල සංසරණය, සදාචාර විරෝධී සහ අසමතුලිත වෙළඳපළ, විධිමත් අගය දාම සංවර්ධනයන් හා නිසි පශු සම්පත් ව්‍යාප්ති වැඩසටහන් නොමැති වීම, ප්‍රමාණවත් නොවන පශු වෛද්‍ය සේවා, සත්ව අභිජනන ක්‍රියාකාරකම්වල නිසි කළමනාකරණයක් නොමැතිකම, පර්යේෂණ මැදිහත්වීම් අවම වීම, ණය සහ රක්ෂණ පහසුකම්හි දුබලතාවය පාර්ශ්වකරුවන්ගේ ප්‍රගමනය සඳහා දිරිදීම් හා මඟපෙන්වීම් අවම වීම මෙන්ම  නිෂ්පාදන ඵලදායිතාවන්හි දුර්වලතා ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටලු වේ.

දේශගුණ සුහුරු තත්වයන් යටතේ පවතින විභවයන් කාර්යක්ෂම කළමනාකරණය කරමින් උපාය මාර්ගික ප්‍රවේශයන් හා ක්‍රියාකාරකම් සාධනය මගින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයක් අත්පත් කර ගැනීම ජාතික ජන බලවේගයේ අභිලාෂය වේ.

**දේශගුණ සුහුරු තත්වයන් යටතේ පවතින විභවයන් කාර්යක්ෂම කළමනාකරණය කරමින් උපායමාර්ගික ප්‍රවේශයන් හා ක්‍රියාකාරකම් සාධනය මගින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයක් අත්පත් කර ගැනීම ජාතික ජන බලවේගයේ අභිලාෂය වේ.**

# මූලධර්ම

- ගුණාත්මක සහ සෞඛ්‍යාරක්ෂිත සත්ව නිෂ්පාදනය
- සාධාරණ මිල හා ස්ථායී වෙළඳපොළ
- ආයෝජන දිරිගැන්වීම
- පශු සම්පත් ව්‍යවසායකත්වය සඳහා තරුණ හා කාන්තා සහභාගිත්වය
- පශු සම්පත් සංවර්ධනය සඳහා රාජ්‍ය, මහජන සහ පෞද්ගලික හවුල්කාරිත්වය
- පාර්ශවකරුවන්ගේ උසස් ජීවන තත්වය

# ක්‍රියාමාර්ග

## පොදු ක්‍රියාකාරකම්

- ගොවිපළ නව්‍යකරණයෙන් උපරිම නිෂ්පාදන ධාරිතාවක්
- ක්ෂේත්‍රයේ සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහා ගොවිපළ හිමියන් ඍජුව සම්බන්ධ වන පශු සම්පත් සංවර්ධන සමිති
- සත්ව පෝෂණ, අභිජනන හා සෞඛ්‍ය අංශයන්හි විශේෂ මෙහෙයුම් ඒකක
- බහුලව පවතින සත්ව රෝග මැඩපැවැත්වීම සඳහා ජාතික වැඩපිළිවෙළක්
- මිනිසාට සතුන්ගෙන් බෝවන රෝග පාලනය කිරීම සඳහා මෙන්ම සත්ව නිෂ්පාදන ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම උදෙසා පශු මහජන සෞඛ්‍ය අංශයක්
- පශු සම්පත් ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු පුළුල් කෙරේ
- පශු පර්යේෂණ ආයතනය සහ පශු විමර්ශන මධ්‍යස්ථාන ජාලය නව්‍යකරණය

## කිරිගව ක්ෂේත්‍රය

- ගොවිපළවල් යාන්ත්‍රීකරණයෙන් සුළු පරිමාණ ගොවි ඒකක උපරිම ආර්ථික වාසි ලබන මධ්‍ය මට්ටමේ වාණිජ ඒකක බවට පරිවර්තනය
- කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා මහා පරිමාණ ගොවිපළ පද්ධතියක්
- අඩු ආදායම්ලාභී කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා කිරි නිෂ්පාදන ගොවිපළ 7500ක්
- තරුණ ව්‍යවසාය සවිබල ගැන්වීමට කිරි නිෂ්පාදන ගොවිපළ 7500ක්

- දැනට සිදුකරන කෘත්‍රිම සිංචන සංඛ්‍යාව දෙගුණ කිරීම, උසස් ආරයේ පට්ටි ගවයින් හා ගව ශුක්‍ර ආනයනය ඇතුළු විවිධ තාක්ෂණික මෙන්ම කළමනාකාර මෙහෙයුම් මගින් කිරි නිෂ්පාදනයට අවශ්‍ය දෙනුන් සංඛ්‍යාව වැඩි කිරීම
- ප්‍රාදේශීය පශු වෛද්‍ය කොට්ඨාස මූලිකත්වයෙන් ගොවිපළ පද්ධති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
- ප්‍රධාන වසංගත රෝග මුලිනුපුටා දැමීම සඳහා ප්‍රශස්ත එන්නත් කරන වැඩසටහන්
- ලියාපදිංචි කිරි ගොවිපළ සතුන් සඳහා සෞඛ්‍ය රක්ෂණාවරණයක්

## කිරි හා යෙදවුම් අලෙවිකරණය

- පැස්චරීකරණය කළ හා නැවුම් දියර කිරි බෙදා හැරීම සඳහා පුළුල් ප්‍රාදේශීය අලෙවි මධ්‍යස්ථාන ජාලයක්
- ප්‍රමිතිය හා ගුණාත්මකභාවය අනුව කිරි ගොවියාට ගෙවීම් කිරීමේ ක්‍රමවේදයක්
- දියර කිරි පරිභෝජනය දිරිමත් කිරීමේ වැඩසටහන්

## කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය

- සාධාරණ මිලකට බිත්තර සහ කුකුළු මස් ලබා දීම සඳහා සත්ව ආහාර ඇතුළු අනෙකුත් නිෂ්පාදන අමුද්‍රව්‍යය සඳහා බදු සහන
- බිත්තර සහ කුකුළු මස් නිෂ්පාදන අපනයන ක්‍රියාදාමය ශක්තිමත් කිරීමේ පියවර
- අඩු ආදායම්ලාභී කාන්තාවන් සවිබල ගැන්වීමේ අරමුණෙන් සුළු පරිමාණ කුකුළු ගොවිපළ 5000ක්



# තිරසර කළමනාකරණයක්
# ගුණාත්මක මත්ස්‍ය සම්පතක්

මානව පෝෂණයේ ප්‍රධාන අංගයක් ලෙස ප්‍රෝටීන අවශ්‍යතාවය හඳුනාගත හැකි අතර, මසුන් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන වඩාත් ගුණාත්මක මෙන්ම ඉහළ සෞඛ්‍යාරක්ෂිත බවකින් යුත් ප්‍රෝටීන් ප්‍රභවයක් ලෙස හඳුනාගෙන ඇත. එබැවින් රටට අවශ්‍ය මත්ස්‍ය අවශ්‍යවතාවය සපුරාලීමට ධීවර කර්මාන්තය හා ජලජීවි වගාව සවිබලගැන්වීම ජාතික අවශ්‍යතාවයකි. දළ දේශීය නිෂ්පාදනය, ආහාර සුරක්ෂිතතාවය, රැකියා උත්පාදනය, ජනතාවගේ සමාජ ආර්ථික තත්වය ඉහළ නැංවීම හා විදේශ විනිමය ඉපැයීම වැනි අංශ සඳහා ද ධීවර කර්මාන්තය, ජලජීවී වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්ත ඍජුවම දායක කර ගත හැක.

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය කරදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය හා ජලජීවී ධීවර කර්මාන්තය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ සාගර කලාපය  සතුව වර්ග කිලෝමීටර 517,000ක අනන්‍ය ආර්ථික කලාපයක් පවතී. එමෙන්ම වර්ග කිලෝමීටර් 21500ක දේශීය ජල තීරයකින්ද වර්ග කිලෝමීටර් 1580ක කලපු හා ගං මෝයවලින් ද වර්ග කිලෝමීටර් 5200 ක ජලාශවලින්ද සමන්විත වේ.

**නිසි විද්‍යාත්මක ක්‍රමවේද හා ප්‍රායෝගික උපක්‍රම තුළින් ධීවර කර්මාන්තය තිරසාර හා පරිසර හිතකාමී ලෙස සංවර්ධනය හා කළමනාකරණය කිරීමත්, ඒ තුළින් මත්ස්‍ය නිෂ්පාදන සුලභ කිරීම හා පාරිභෝගිකයාට සාධාරණ මිලකට ලබාගත හැකි තත්වයට පත් කිරීමත්, කර්මාන්තයේ නියැලෙන්නන්ගේ ජීවන තත්වය උසස් කිරීමත් මෙම ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු වේ.**

ලංකාවේ මේ වන විට කරදිය ධීවර කර්මාන්තයෙහි 225,000 හා මිරිදිය ධීවර කර්මාන්තයෙහි  90,650ක් පමණ වූ පිරිසක් ක්‍රියාකාරීව ධීවර කර්මාන්තයෙහි නියැලෙති. මෙරට මත්ස්‍ය හා මත්ස්‍ය ආශ්‍රිත නිෂ්පාදන දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය වර්ෂ 2000 දී 2.7% වූ අතර, මේ වන විට ක්‍රමයෙන් අඩුවී එය 1.2%ක මට්ටමට පැමිණ ඇත. 2017 වසර පමණ විට අපගේ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වසරකට කිලෝ ග්‍රෑම් 17.2ක් වූ අතර, මේ වන වීට ක්‍රමිකව කිලෝ ග්‍රෑම් 11.07 දක්වා පහළ අගයකට පැමිණ ඇත. මෙම ප්‍රණතාවය ජනතාවගේ, විශේෂයෙන්ම ළමුන් සහ ගැබිණි මවුවරුන්ගේ සෞඛ්‍ය තත්වයට අහිතකර ලෙස බලපා ඇත.

වර්තමානයේ දී ධීවර කරමාන්තය හා ජලජීවී වගාව ගැටලු රාශියකට මුහුණ දෙමින් සිටී. එම ගැටලු අතරින් ඉන්ධන ඇතුළු යෙදවුම් සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම, දියුණු තාක්ෂණය හා කාර්යක්ෂම ක්‍රමවේද හඳුන්වා දීමට රාජ්‍ය මැදිහත් වීම අවම වීම, විදේශීය යාත්‍රා මගින් සිදුකරන නීති විරෝධී ධීවර කටයුතු, යල් පැනගිය නීති පද්ධතිය හා ක්‍රමවේද, තිරසාර හා පරිසර හිතකාමී ක්‍රමවේද භාවිතය සඳහා දිරිගැන්වීම් අවම වීම ප්‍රධාන වේ. නිසි විද්‍යාත්මක ක්‍රමවේද හා ප්‍රායෝගික උපක්‍රම තුළින් ධීවර කර්මාන්තය තිරසාර හා පරිසර හිතකාමී ලෙස සංවර්ධනය හා කළමනාකරණය කිරීමත්, ඒ තුළින් මත්ස්‍ය නිෂ්පාදන සුලභ කිරීම හා පාරිභෝගිකයාට සාධාරණ මිලකට ලබාගත හැකි තත්වයට පත් කිරීමත්, කර්මාන්තයේ නියැලෙන්නන්ගේ ජීවන තත්වය උසස් කිරීමත් මෙම ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු වේ.



# මූලධර්ම

- මත්ස්‍ය ආහාර සුරක්ෂිතතාව
- සහභාගීත්ව ප්‍රවේශය හා තිරසාර කළමනාකරණය
- අන්තර්ජාතික ගිවිසුම් හා සම්මතයන්ට අනුකූල සවිමත් නීතිමය රාමුවක්
- ප්‍රමිතකරණය සහ දිරිගැන්වීම් මගින් ආරක්ෂිත සහ තිරසාර භාවිතාවන්
- පරිසර දූෂණය වැළැක්වීම හා සමුද්‍රීය ආරක්ෂාව
- මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන සඳහා සාධාරණ වෙළඳපොළ ප්‍රවේශයන්
- ධීවර ප්‍රජාවගේ උසස් ජීවන තත්වය හා සමාජ ආරක්ෂණය
- වෘත්තීය ධීවර ප්‍රජාවක්

# ක්‍රියාමාර්ග

## තිරසාර සංවර්ධනය හා කළමනාකරණය

- ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු තොරතුරු රැස් කිරීම, ගබඩා කිරීම විශ්ලේෂණය හා බෙදා හැරීම සඳහා තත්‍යකාලීන (real time) දත්ත පද්ධතියක්
- ක්ෂේත්‍රයට අදාළ අවසර ලබා ගැනීම්, ලියාපදිංචි කිරීම් සහ බලපත්‍ර ලබා ගැනීම් සඳහා කාර්යක්ෂම මාර්ගගත ක්‍රමවේදයක්
- ධීවර සහ ජලජීවී කටයුතු කළමණාකරණයට උපදේශන සභාවක්
- කර්මාන්තය අධෛර්මත් කරන නීති, රෙගුලාසි හා ක්‍රමවේද ජාත්‍යන්තර සම්මුතීන්, ගිවිසුම් සහ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය
- සාගර මත්ස්‍ය සම්පතෙහි තොග තක්සේරුව, කරදිය සහ මිරිදිය ජලජ පද්ධතිවල උපරිම ධාරිතාවයන් තක්සේරු කිරීම සහ එම තක්සේරු මත පදනම්ව කර්මාන්තය සංවර්ධනය
- මත්ස්‍ය අභිජනන ප්‍රදේශ හඳුනා ගැනීම, ඔවුන්ගේ ගහන වර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම සහ තර්ජනයට ලක් වී ඇති ජලජ විශේෂයන්ගේ අභිජනන ස්ථාන හඳුනා ගැනීම හා සංරක්ෂණය
- තත්වයෙන් උසස් පරිසර හිතකාමී සහ ආරක්ෂිත නිෂ්පාදනයන් සඳහා ධීවර ප්‍රජාව දිරිගැන්වීම
- පුනර්ජනනීය සහ දෙමුහුන් බලශක්ති භාවිතය සහ නිෂ්පාදන අලෙවිකරණ

සඳහා මූල්‍ය හා තාක්ෂණික පහසුකම්

- නීතිවිරෝධී ධීවර කටයුතු අධෛර්යමත් කිරීම, සමුද්‍රීය අනතුරු සහ දූෂණයන් අවම කිරීම සහ හදිසි ප්‍රතිචාර හා සමුද්‍රීය විපත් අවම කිරීම සඳහා යාන්ත්‍රණයන්
- ධීවර පර්යේෂණ සංවර්ධන සහ වෙළඳපොළ ක්‍රියාකාරීත්වයන් ප්‍රවර්ධනය සඳහා අරමුදලක්

## කරදිය ධීවර කර්මාන්තය

- විවිධ උෂ්ණත්ව මට්ටම් සහ ගැඹුරු පරාසයන් තුළ සිටින මත්ස්‍ය සම්පත නෙළාගැනීම සඳහා ධීවර කාර්මිකයන්ට තාක්ෂණික සහාය
- මසුන් ඇල්ලීම හා බෝවීම පහසු කිරීමට මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම් (FAD) සහ කෘතිම වාසභූමි වැනි ක්‍රමවේද පුළුල් කිරීම
- ධීවර තොටුපළ හා මාදැල් වරායන් ඇතුළු සම්ප්‍රදායික ධීවර බිම් සඳහා වන අයිතිය සහ ප්‍රවේශයන් තහවුරු කිරීම සහ ඒවායේ යටිතළ පහසුකම් වැඩි දියුණු කිරීම
- දැනට දැඩි පසු බෑමකට ලක්ව ඇති සමුද්‍රීය ධීවර කටයුතු යථාවත් කිරීම සඳහා, මූල්‍ය සහ තාක්ෂණික සහය ලබාදීම
- අඩාලවී ඇති ධීවර කර්මාන්තය නගා සිටුවා, නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට ධීවර ප්‍රජාවට ඉන්ධන සහනාධාරයක්
- යාත්‍රා නිරීක්ෂණ සහ හඳුනාගැනීමේ පද්ධති, ඉලෙක්ට්‍රොනික සටහන් පොත්, ඩ්‍රෝන සහ චන්ද්‍රිකා තාක්ෂණය මගින් මත්ස්‍ය බිම් හඳුනා ගැනීම්, මව් යාත්‍රා සහ දෙමුහුම් යාත්‍රා හඳුන්වා දීම, ස්මාර්ට් අලෙවිකරණ වැනි පරිසර හිතකාමී, නව්‍ය සහ ඵලදායී ධීවර තාක්ෂණයන් හඳුන්වා දීම
- විදේශීය ධීවර යාත්‍රා මගින් සිදු කරන අනවසර ධීවර කටයුතු වළක්වාලීමට සහ වෙනත් රටවල මුහුදු කලාප වෙත ධීවර යාත්‍රා ඇතුළු වීම වැළැක්වීම සඳහා GPS මත පදනම් අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක්
- හදිසි ආපදා තත්වයන්හිදී ධීවර කාර්ය මණ්ඩල සහ යාත්‍රා වෙනත් විදේශීය මුහුදු සීමාවන්හිදී මුහුණ දෙන ගැටලුවලදී කාර්යක්ෂම සහ ක්‍රමවත් රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම්

## කරදිය හා කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදන සංවර්ධනය

- ඉහළ වෙළඳපොළ වටිනාකමින් යුත් මුහුදු කූඩැල්ලා, කකුළුවා, මෝදා, බෙල්ලා, ඉස්සා, පොකිරිස්සා, සහ ජලජ පැළෑටි වැනි ජීවීන් වගා කිරීමට සහ බෝ කිරීමට අවශ්‍ය නව තාක්ෂණය
- කරදිය/කිවුල් දිය ජලජීවී වගාවට යෝග්‍ය නව වගාබිම් සහ සුදුසු ජීවී

විශේෂ හඳුනාගෙන පරිසර හිතකාමී ජලජීවී වගාව

- ඉස්සන් ගොවිපොළ සඳහා ප්‍රමිතිකරණ ක්‍රියාවලීන් මගින් විදෙස් වෙළඳපොළ තුළ වැඩි මිලක් සහ වැඩි පංගුවක්
- තාක්ෂණික ඇතුළු රාජ්‍ය පහසුකම් සැපයීමෙන් වාර්ෂික ඉස්සන් නිෂ්පාදනය ටොන් 25000 දක්වා ඉහළට
- ඉස්සන් කර්මාන්තයේ රෝග හඳුනාගැනීමට, වළක්වා ගැනීමට සහ පාලනයට අවශ්‍ය විධිමත් වැඩපිළිවෙක්
- ඉහළ ඉල්ලුමක් සහිත සහ ඌන උපයෝගී මුහුදු පැලෑටි වගාව ව්‍යාප්ත කිරීමට, නිෂ්පාදන විවිධාංගීකරණයට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට සහ වෙළඳපොළ හඳුන්වා දීමට අවශ්‍ය මැදිහත්වීම්
- මුහුදු පැළෑටි සහ ජලජ අමුද්‍රව්‍ය යොදාගෙන සිදුකරන ගෘහාශ්‍රිත නිෂ්පාදන දිරිමත් කරමින් කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම

## මිරිදිය ධීවර හා ජලජීවී වගාව

- දියුණු කළමනාකරණ සැලසුමකට අනුව මිරිදිය වැව් ආශ්‍රිත ජලජීවී වගාව, මත්ස්‍ය පැටවුන් ඇති කිරීම සහ අභිජනන මධ්‍යස්ථාන නිසි ලෙස සම්බන්ධ කරමින් මිරිදිය ධීවර මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම
- නිත්‍ය ජලාශ, කාලීන ජලාශ, වතු ජලාශ සහ පොකුණු තුළ විවිධ ජලජීවී වගා ක්‍රමවේදයන් සඳහා අවශ්‍ය මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමට නිසි වැඩපිළිවෙළක්
- දේශීය හෝ සුදුසු නව විශේෂ සහ අභිජනන ක්‍රම හඳුන්වා දීම සහ අභිජනන මධ්‍යස්ථානයන්හි මානව සම්පත්, තාක්ෂණික හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- යෝග්‍ය නිත්‍ය ජලාශ, කාලීන හා වතු ජලාශවල අවශ්‍ය පරිදි නිසි ධාරිතාවයකින් මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම
- තෝරාගත් නිත්‍ය ජලාශ ආශ්‍රිතව කූඩු තුළ ආහාරය සඳහා මසුන් වගාව
- වාණිජමය මිරිදිය මසුන් වගාකරන නවීන තාක්ෂණය සහිත මහාපරිමාණ ගොවිපළ පිහිටුවීමට ව්‍යවසායකයන් දිරිමත් කිරීමට මූල්‍ය සහාය

## විසිතුරු මත්ස්‍ය හා විසිතුරු ජලජ පැළෑටි කර්මාන්තය

- 2028 වන විට සුරතල් මසුන් සහ විසිතුරු ජලජ පැලෑටි අපනයන ආදායම 25% කින් ඉහළ නැංවීම ඉලක්ක කරගත් ශ්‍රී ලාංකේය සන්නාමයක්
- විසිතුරු මත්ස්‍ය වගාව දිරිමත් කිරීම සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහාය
- විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා අවම මිල තීරණය

කිරීමේ පාරදෘශ්‍ය යාන්ත්‍රණයක්

- මත්ස්‍ය ලෙඩ රෝග, වසංගත හඳුනා ගැනීම හා ඒවා වළක්වා ගැනීමට සහ ස්ථානීය පරීක්ෂාවන් සිදු කරගැනීමට ප්‍රාදේශීය පශු සම්පත් සහ විද්‍යාගාර මධ්‍යස්ථාන සහ විද්‍යාගාර වැනි ආයතන ඒකාබද්ධ වැඩසටහන්
- අපනයන දිරිමත් කිරීම සඳහා ප්‍රාදේශීය එකතු කිරීමේ මධ්‍යස්ථාන
- පටක රෝපණය, හරිතාගාර, සිරස් වගාව, නිර්පාංශු වගාව වැනි විසිතුරු ජලජ පැළෑටි නිෂ්පාදන ක්‍රම සඳහා තාක්ෂණික සහ මූල්‍ය පහසුකම්
- වාර්ෂිකව ජාත්‍යන්තර මට්ටමේ විසිතුරු මත්ස්‍ය හා පළැටි ප්‍රදර්ශන
- පරිසරය ආරක්ෂා වන පරිදි මිය ගිය ශාක, මුල්, පාෂාණ කොටස් වැනි අජීවී ද්‍රව්‍ය යොදා විසිතුරු ජලජ උපාංග නිෂ්පාදනයටත්, දේශීය විසිතුරු මසුන් නව තාක්ෂණික ක්‍රම ඔස්සේ අභිජනනයටත් අවශ්‍ය පහසුකම්
- කිමිදුම් ක්‍රම මගින් විසිතුරු මසුන් එකතු කරන කාර්මිකයන් සඳහා කිමිදුම් ආම්පන්න භාවිතය, තිරසාර අස්වනු නෙළීමේ ක්‍රම, පසු අස්වනු හානිය අවම කිරීම සහ ප්‍රථමාධාර වැනි දැනුම් පද්ධති හා විකල්ප ජීවනෝපාය ලෙස මසුන් අභිජනන මධ්‍යස්ථාන ඇති කිරීමත් සංචාරක කිමිදුම් මගපෙන්වීම වැනි අවස්ථා සඳහා ප්‍රවේශ වීමටත් අවශ්‍ය පහසුකම්

## ධීවර සමාජ සුභසාධනය

- ධීවර ප්‍රජාව, ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සහ කර්මාන්තයට භාවිත කරන උපකරණ සහ යෙදවුම් සඳහා ශක්තිමත් රක්ෂණ ක්‍රමවේදයක්
- කිමිදුම්කරුවන් මුහුණ දෙන රුධිරයේ නයිට්‍රජන් බුබුළු දැමීම (බෙන්ඩ්ස් රෝගය) සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථාන
- දැනට අක්‍රීය වී ඇති ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නැවත ක්‍රියාත්මක කෙරේ
- තරුණ ධීවර ප්‍රජාවට වෘත්තීය ධීවර සහ නාවික ක්ෂේත්‍රය ඉලක්ක කරගත් පුහුණුව සහ තාක්ෂණික මග පෙන්වීම්
- ක්ෂේත්‍රයේ වෘත්තිකයින් බිහිකිරීම සඳහා සාගර විශ්වවිද්‍යාලයේ/පීඨවල හා කාර්මික විද්‍යාලවල පුළුල් දායකත්වය
- ධීවර ප්‍රජාවගේ සෞඛ්‍යය, නිවාස, ළමා හා වැඩිහිටි පුරවැසියන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ සංස්කෘතිකාංග වැනි අවශ්‍යතා සපුරාලීම සඳහා පුළුල් පහසුකම්
- ධීවර ගම්මාන හා ධීවර වරායන් ආශ්‍රිතව ප්‍රජා මූලික සංවිධාන ලෙස ධීවර සමුපකාර සමිති සහ ධීවර බැංකු

- ධීවර කාර්මිකයින්/ ජලජීවී වගාකරුවන් වෘත්තීය මට්ටමට රැගෙන ඒම හා මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමේ වැඩසටහන්
- ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා තාක්ෂණික උපදේශන සේවා, විදේශීය චාරිකා හා පුහුණු වැඩසටහන් සඳහා විධිමත් ක්‍රමවේදයක්
- ධීවර කාන්තාවන් සහ අනෙකුත් අවදානමට ලක්විය හැකි පවුල් සාමාජිකයන් සඳහා ජීවනෝපාය සංවර්ධනය සහ තාක්ෂණික කුසලතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන්

## යෙදවුම් නිෂ්පාදනය ප්‍රවර්ධනය

- ධීවර ක්ෂේත්‍රයේ භාවිත යෙදවුම්වන ජීවී - අජීවී ආහාර, යාත්‍රා සහ දැල් ආම්පන්න, ජල ජීවී වගාවන් සඳහා අවශ්‍ය කුඩු උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය සඳහා පහසුකම්
- කර්මාන්තයට අදාල යෙදවුම් ප්‍රමාණවත් ලෙස රට තුළ නිෂ්පාදනය කරන තෙක් ආනයනික යෙදවුම් සඳහා බදු සහන

## පසු අස්වනු කළමනාකරණය හා අගය එකතු කිරීමේ නිෂ්පාදන

- පසු අස්වනු හානිය අවම වන ලෙස මසුන් ඇල්ලීම, හැසිරවීම, ගබඩාකිරීම සහ අළෙවිය සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සැපයීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ දැනුවත් කිරීම්
- ඉවතලන මත්ස්‍ය කොටස් භාවිත කර මාළු කුඩු, මත්ස්‍ය ආහාර, දියර පොහොර හා වෙනත් නිෂ්පාදන ප්‍රවර්ධනය
- ගුණාත්මක මත්ස්‍ය නිෂ්පාදන විධිමත්ව බෙදාහැරීම මගින් පාරිභෝගිකයාට එම නිෂ්පාදන සාධාරණ මිලකට ලබාගැනීමට අවස්ථාව
- ධීවර යාත්‍රා නවීකරණය, ප්‍රමිතියෙන් යුත් අයිස් නිෂ්පාදනය, පරිවරණය කළ බහාළුම් භාවිතය, ඔන්ලයින් අලෙවිකරණ ක්‍රමවේදයක් ඇති කිරීම වැනි අකෘති ඔස්සේ පසු අස්වනු හානිය අවම කිරීම

## අපනයන විභවතාවය නැංවීම හා විදේශ විනිමය ඉපයීම

- ඉදිරියට විවෘත වන නව විදේශ වෙළඳපොළ හඳුනා ගැනීම මගින් නිෂ්පාදන අපනයනය සඳහා කටයුතු කිරීම
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, තානාපති කාර්යාල ඇතුළු අදාළ ආයතන සමග එක්ව අපනයන දිරිමත් කිරීම හා වෙළඳ ප්‍රවර්ධනය
- දේශීය වශයෙන් තත්වයෙන් උසස් නිෂ්පාදන දිරිගන්වා, ආනයනය අවම කර විදේශ විනිමය ඉතිරි කිරීම

- ඉහළ අපනයන විභවයන් ඇති නිෂ්පාදන අංශ සඳහා ආයෝජනය කිරීමට විදේශීය ආයෝජකයන් පෙළඹවීම
- මත්ස්‍ය නිෂ්පාදන අපනයනයට ඇති බාධා ඉවත් කිරීම සඳහා කාර්යක්ෂම හා කඩිනම් ක්‍රමවේදයක්
- ධීවර වරාය ආශ්‍රිතව මූල්‍යමය ඉපයීම් ඉහළ නැංවීම හා ධීවර වරාය සංවර්ධනය
- ධීවර වරායන් ආශ්‍රිතව යාත්‍රා රැඳවීමට සේවා පදනම් කරගත් කලාප වෙන් කිරීම
- ධීවර වරාය ආශ්‍රිතව ඉන්ධන ගබඩා කිරීම හා ඉන්ධන නිකුත් කිරීමේ ගැටලු විසඳීමට පියවර
- සියලුම ප්‍රධාන ධීවර වරායන් ජාත්‍යන්තර සම්මතවලට අනුකූලව ප්‍රමුඛතා පදනමකින් නවීකරණය
- උතුරු හා නැගෙනහිර පළාත් ආශ්‍රිතව එහි ජනතාව ඉලක්ක කොට ගත් බහුදින ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා වරාය පුළුල් කිරීම හා පහසුකම් වැඩි දියුණු කිරීම
- හරිත වරාය සංකල්පය මූලික කරගත් ධීවර වරායන් සංවර්ධනය හා කළමනාකරණ ක්‍රමවේද

## නීල ආර්ථිකය

- නීල ආර්ථික ප්‍රවේශයක් මගින් ජීවී සහ අජීවී සාගර සම්පත් තිරසාර භාවිතය හා නිස්සාරණය සඳහා නව සමුද්‍රීය කර්මාන්ත පිහිටුවීම ප්‍රවර්ධනය
- නීල කාබන් මූල්‍ය ක්ෂේත්‍රයට පිවිසීම සඳහා ධීවර කර්මාන්තය, ජලජීවී වගා ක්ෂේත්‍රය හා ජලජ සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝගී කරගැනීම



# ඩිජිටල් රාජ්‍යකරණයක්

# ජාත්‍යන්තර හවුල්කාරීත්වයක්

ශ්‍රී ලංකාවේ උගත් සහ පුහුණු කළ හැකි වෘත්තිකයන්ගෙන් සමන්විත උසස් මානව සම්පතක් පවතී. ආසියා, යුරෝපා, මැද පෙරදිග සහ අප්‍රිකා රටවලට සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස රටෙහි උපාය මාර්ගික පිහිටීම සැලකිය හැක.

ගෝලීය තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ විකාශනය වන අවශ්‍යතා සමඟ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයන් ගැලපීම මන්දගාමීව සිදුවන අතර, එය කුසලතා පරතරයකට මග පාදා ඇත. එපමණක් නොව, පර්යේෂණ සහ සංවර්ධන (R&D) හා නව තාක්ෂණ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා පවතින ආයෝජන අවස්ථා ඉතා සීමිතය. අධික බලශක්ති පිරිවැය හා බලශක්ති සැපයුමේ ඇති අවිනිශ්චිත බව, ප්‍රමාණවත් නොවන අන්තර්ජාල සම්බන්ධතාව සහ පොදු ප්‍රවාහන ගැටලු ඇතුළු දුර්වල යටිතල පහසුකම් , අස්ථාවර රාජ්‍ය ප්‍රතිපත්ති හා අර්ථික තත්වය  කර්මාන්තයේ දියුණුව තව තවත් අඩාල කරයි.

2024 දී ඩොලර් බිලියන 9,039ක් වන සහ 2028 වන විට 11.0% වාර්ෂික වර්ධන වේගයක් අපේක්ෂිත ගෝලීය තොරතුරු තාක්ෂණ වෙළඳපොළ වේගවත් ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කර්මාන්තයට සැලකිය යුතු අවස්ථා  සලසයි. කෘත්‍රිම බුද්ධිය (AI), දත්ත විශ්ලේෂණ, අන්තර්ජාලයේ දේවල් (IoT) සහ සයිබර් ආරක්ෂාව (cyber security) වැනි නැගී එන තාක්ෂණික වර්ධනයන් නවෝත්පාදනයට මග පාදයි. නිදහස් සේවා (freelancer) සහ දුරස්ථ වැඩ (remote working) ශ්‍රී ලාංකේය තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ට ගෝලීය ගනුදෙනුකරුවන් සමඟ සහයෝයෙන් කටයුතු කිරීමට නව අවස්ථා සලසා දෙයි.



වර්තමාන ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය වෘත්තිකයන් 85,000 ක් පමණ සේවය කරන වාර්ෂිකව ඇමරිකානු ඩොලර් බිලියන 1.2 ක් පමණක් විදේශ විනිමය උපයන තත්වයකට සීමාවී ඇත. ශ්‍රී ලංකාව ඉහළ වටිනාකමක් ඇති තොරතුරු තාක්ෂණ නිෂ්පාදන සහ විසඳුම්වල ගෝලීය ප්‍රමුඛයකු බවට පත් කිරීම සහ සෘජු විදේශ ආයෝජන (FDIs ) සහ ගෝලීය සහයෝගිතා ආකර්ෂණය කර ගැනීමට හිතකර මධ්‍යස්ථානයක් බවට පත්කිරීම අපගේ අරමුණයි. 2030 වන විට තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වාර්ෂික ආදායම ඩොලර් බිලියන 5 දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම නවෝත්පාදන සහ උසස් ඩිජිටල් තාක්ෂණය උපයෝගී කර ගනිමින් තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම හා ඩිජිටල්කරණය හරහා කාර්යක්ෂම මහජන සේවාවන්  සපයා සියලු පුරවැසියන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම ද අපේක්ෂාවයි. ඒ ඔස්සේ තාක්ෂණය මගින් මෙහෙයවන දැනුම මත පදනම් වූ සමාජයක් ගොඩ නැගිය හැක.


# මූලධර්ම

- නවෝත්පාදනය මත පදනම් වූ අඛණ්ඩ වර්ධනය
- ඩිජිටල් රාජ්‍යකරණය
- ලංකා වෙළඳ නාමය නැවත සන්නාමකරණය
- ඩිජිටල් ආර්ථිකයේ ප්‍රතිලාභ
- උසස් තාක්ෂණයන්, හොඳම භාවිතයන් සහ නව වෙළඳපළ වෙත ප්‍රවේශ වීම සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන්
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල යටිතල පහසුකම්

# ක්‍රියාමාර්ග

- ශ්‍රී ලංකාව ඉහළ වටිනාකමක් ඇති තොරතුරු තාක්ෂණ නිෂ්පාදන සහ විසඳුම් සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ගෝලීය අලෙවිකරණ ව්‍යාපාරයක් දියත් කිරීම
- පරිගණක ඇතුළු තොරතුරු තාක්ෂණයට අදාළ උපකරණ, දේශීය වශයෙන් නිපදවන ලද මෘදුකාංග හා සේවා ශුන්‍ය වැට් අනුපාතයට යටත් කිරීම
- විදේශ සේවාලාභීන් වෙත තොරතුරු තාක්ෂණ කර්මාන්තය සක්‍රීයව ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විදේශ දූත සේවය යොදා ගැනීම සහ එක් එක් දූත සේවාවන් සඳහා නිශ්චිත ඉලක්ක ලබාදීම
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ දේශීය නව්‍යකරණයට සහ ව්‍යවසායකත්වය දිරි ගැන්වීම සඳහා නව ව්‍යාපාර ආරම්භක සහ පර්යේෂණ හා සංවර්ධන අරමුදලක් ස්ථාපිත කිරීම
- පුරවැසියන්ට විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් බිහිකිරීම උදෙසා ප්‍රධාන රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සෘජු විදේශ ආයෝජන (FDIs), ආකර්ෂණය කර ගැනීම, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, දත්ත පෞද්ගලිකත්වය, කම්කරු නීති හා බංකොලොත්භාවය ප්‍රකාශ කිරීම ආදිය සඳහා වන නව නීති පද්ධතියක් හඳුන්වා දීම

- සදාචාරාත්මක AI භාවිතය, දත්ත රහස්‍යභාවය සහ විවිධ රාජ්‍ය අංශවල AI තාක්ෂණයන් ඒකාබද්ධ කිරීම සඳහා සහ ඕනෑම භාෂාවකින් රාජ්‍ය සේවා ලබා ගැනීමට හැකි වන පරිදි නව ජාතික AI ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම
- 2030 වන විට තොරතුරු තාක්ෂණ ශ්‍රම බලකාය 200,000 දක්වා ඉහළ නැංවීම සඳහා පුහුණු සහ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විදේශීය විශේෂඥ සහය ලබාගනිමින් ක්ෂේත්‍රයේ ඉංජිනේරුවන් පුහුණු කිරීම
- ශ්‍රී ලංකාව තොරතුරු තාක්ෂණ ආයෝජන සහ වෘත්තීය අවස්ථා ආකර්ෂණීය ගමනාන්තයක් බවට පත්කිරීම උදෙසා එම සමාගම්වල සහයෝගීතා ව්‍යාපෘති සඳහා බදු සහන, ප්‍රදාන සහ වෙනත් දිරිගැන්වීම් ලබාදීම
- ගෝලීය වශයෙන් පිළිගත් සමාගම් නිර්මාණය කරමින් නවෝත්පාදන සහ ව්‍යවසායකත්වයේ තිරසාර ආයෝජන මගින් තොරතුරු තාක්ෂණ යුනිකෝන් සංවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවට උසස් තාක්ෂණයන් සහ හොඳම භාවිතයන් ගෙන ඒම සඳහා ගෝලීය තොරතුරු තාක්ෂණ සමාගම් සහ පර්යේෂණ ආයතන සමඟ හවුල්කාරිත්වයන් ගොඩනඟා ගැනීම
- කලාපීය වර්ධනය සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා බස්නාහිර, උතුරු, නැගෙනහිර සහ දකුණු පළාත්වල පර්යේෂණ සහ සංවර්ධන (R&D) මධ්‍යස්ථාන සහ තොරතුරු තාක්ෂණ උද්‍යාන ස්ථාපිත කිරීම
- බස්නාහිර, උතුර, දකුණ සහ නැගෙනහිර පළාත්වල ප්‍රධාන විශ්වවිද්‍යාල 4ක නවීන තාක්ෂණයන් සහ දක්ෂ කාර්ය මණ්ඩලයකින් යුත් තොරතුරු තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගීම
- අධිවේගී අන්තර්ජාලය, දත්ත මධ්‍යස්ථාන, සාධාරණ මිළකට අඛණ්ඩ බලශක්ති සැපයුම, පොදු ප්‍රවාහනය සහ ස්මාර්ට් නගර මුල පිරීම් ඇතුළුව, අඛණ්ඩ කර්මාන්ත වර්ධනයට සහ තරගකාරීත්වයට සහාය වීම සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම
- උසස් ඩිජිටල් තාක්ෂණය සහ ස්වයංක්‍රීයකරණය සමඟ කර්මාන්ත 4.0/5.0 දක්වා පරිවර්තනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය දිරිමත් කිරීම



# පර්යේෂණ හා සංවර්ධන ප්‍රවේශයක්

# විදුහුරු සමාජයක්

විද්‍යාව සහ තාක්ෂණය සමග එකට බැඳුණු පර්යේෂණ සහ සංවර්ධන (Research and Development- R&D) ක්‍රියාදාමය, අගය එකතු කළ (value added) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය රටේ ආර්ථිකය නගා සිටුවන අතර, සමස්ත මානව සහ සමාජයීය ප්‍රවර්ධනයටද උර දෙයි. ශ්‍රී ලංකාව R&D සඳහා වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.12%ක් පමණ ඉතා අඩු ප්‍රමාණයක් වෙන් කරන අතර, ශ්‍රී ලංකාවට සමාන භූ - දේශපාලන විභවයන් සහිත රටවල් වන මැලේසියාව 1%ක්, තායිලන්තය 1.2%ක් සහ වියට්නාමය 0.42% වියදම් කරන අතර, දකුණු කොරියාව 4.6%ක්, ජපානය 3.6% ක්, ඇමරිකාව 3.5% සහ චීනය 3%ක් ලෙස වෙන් කරමින් ශීඝ්‍රයෙන් දියුණු වූ රාජ්‍ය බවට පත්ව ඇත. ශ්‍රී ලංකාව තුළ සිදුකරන සීමිත පර්යේෂණ වුවද ආර්ථික හා සමාජීය සංවර්ධනයට නිසි පරිදි දායක කර ගෙන නොමැත.

ශ්‍රී ලංකාව ඖෂධීය වටිනාකමක් ඇති ඉහළ ජෛව විවිධත්වයක් (biodiversity) සහිත රටටම ආවේණික (endemic) ශාඛ (flora) සහ සත්ව (fauna) විශේෂ, භූ සම්පත්, රට වටා මුහුද සහ රට තුළ විශාල මිරිදිය සම්පත, සමතුලිත පස සහ නිවර්තන කාලගුණය, අවුරුද්ද පුරා ඇති සූර්ය ශක්තිය, සුළං බලය, නොයෙකුත් විභවයන් ඇති ගංගා සහ වැව් අමුණු ආදී නොයෙකුත් ස්වභාවික සම්පත් රාශියකින් සමන්විත වේ. මේ සියල්ලම R&D තුළින් අඩු පිරිවැයක් ඇති, වැඩි ලාභ ලබා ගත හැකි, අගය එක් කළ භාණ්ඩ සහ සේවාවන් නිපදවිය හැකි ක්ෂේත්‍ර වන අතර  ඒවාට ජාත්‍යන්තර වෙළඳපොළේ සුවිශාල විභවයක්ද (market potential) ඇත.

රට තුළ  නවෝත්පාදකයින් ගම් මට්ටමින් පවා බිහි වුවද, ඔවුන්ගේ අදහස් හා නිපැයුම් නිසි ලෙස උකහා ගැනීමේ යාන්ත්‍රණයක් හෝ ඔවුනට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමක් සිදු වූයේ ද අවම මට්ටමිනි. මෙම මානව සම්පතට නිවහල් ලෙස සිතන්නට අවශ්‍ය පරිසරය සාදා දීම, ඔවුනගේ නව අදහස් පර්යේෂණ සහ ගවේෂණ තුළින් මතු කරවා ගැනීම සඳහා රාජ්‍ය සහ පුද්ගලික අංශවල නිසි දායකත්වය නිසි දැක්මක් තුළ කාර්යක්ෂම ලෙස සැකසූ යාන්ත්‍රණයක් හරහා ලබා දීම තුළින්, ශ්‍රී ලංකාව නවෝත්පාදන මධ්‍යස්ථානයක් (Innovation center) බවට අනාගතයේ පත් කර ගත හැක.



# මූලධර්ම

- නිෂ්පාදන ආර්ථිකයට පර්යේෂණ සහ සංවර්ධනවල ඍජු දායකත්වය
- පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිලාභ සාධාරණ ලෙස මහජනතාවට බෙදා හැරීම
- පර්යේෂණ අංශවල ස්වාධීනත්වය, අධීක්ෂණය සහ නියාමනය
- විනිවිදභාවය, කාර්යක්ෂමතාවය, සාධාරණත්වය, විවිධත්වය සහ ඇතුළත් කිරීම (equity-diversity-inclusion)
- පාරදෘශ සහ අපක්ෂපාතී තෝරාගැනීම හා සාධාරණ අවස්ථා
- ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් ආචාර ධර්ම, පිළිවෙත්, සහ අදාළ ගිවිසුම්වලට අනුකූල පර්යේෂණ
- නව්‍ය නිෂ්පාදන සහ සේවා ආරක්ෂා කිරීම සහ නව නිපැයුම්කරුවන්ට නිසි අගැයුම
- පර්යේෂණ සඳහා රාජ්‍ය, පෞද්ගලික සහ මහජන හවුල්කාරීත්වය

# ක්‍රියාමාර්ග

## කෘෂිකර්ම, ධීවර, පශු සම්පත්, සහ ආහාර සුරක්ෂිතතා

- සම්පත් හඳුනා ගැනීම සහ ප්‍රශස්ත භාවිතය, කෘෂි යටිතල පහසුකම් දියුණු කිරීම සහ තිරසර අලෙවිකරණ උපායමාර්ගික විසඳුම් හඳුනා ගැනීමට සමාජ - ආර්ථික පර්යේෂණ
- භෝග දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන ලෙස සැකසීම, ප්‍රධාන භෝගවල තිරසාර බව සහ ආර්ථික ශක්‍යතාව වැඩිදියුණු කිරීම, ආර්ථික වාසි උපරිම කිරීමට ආහාර කල් තබා ගැනීම හා අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය කිරීම
- විසිතුරු ජලජ සම්පත් හා විසිතුරු උද්‍යාන භෝග, සහ නිකේතන වෙළඳපොළක් ලෙස කාබනික කෘෂිකර්මාන්තය මගින් තිරසාර ආදායම් උත්පාදනය, සහ ජාත්‍යන්තර වෙළඳපොළවලදී තරගකාරිත්වය හා තිරසාරභාවය සහතික කරගැනීමට පිළියම් සඳහා පර්යේෂණ
- ඉහළ අස්වැන්නක් ලබා ගැනීම පිණිස ගෘහස්ථ භෝග, අපනයන බෝග, සහ පශු සම්පත් ආදී අංශවල නව පර්යේෂණ

- භෝග විවිධාංගීකරණය, උසස් කළමනාකරණ පිළිවෙත්, දේශීය - නවීන තාක්ෂණ ඒකාබද්ධ උපායන් (ජෛව ආරක්ෂාව තහවුරු කරන ලද ජාන ඉංජිනේරු විද්‍යාව ද ඇතුළත්ව), කාර්යක්ෂම කෘෂිකාර්මික යෙදවුම් (ජලය, කාබනික හා අකාබනික පොහොර, සහ අනෙකුත් කෘෂි රසායන වැනි), සහ සුදුසු තැන්වල හරිතාගාර හා සිරස් ගොවිතැන් ක්‍රම  පිළිබඳ පර්යේෂණ
- ඉහළ ඵලදායීතාවක් සහිත සතුන් අභිජනනය, උසස් තත්වයේ ආහාර නිෂ්පාදනය, අඩුවියදම් විකල්ප නිවාස හා ඒවායේ කළමනාකරණය විමර්ශනය කිරීම, සහ කුඩා හා මධ්‍යම පරිමාණයේ ගොවිපළ සඳහා සුදුසු ඉඩම් භාවිතයෙන් පශු සම්පත් නිෂ්පාදනය අනුගත කොට දියුණු කිරීම සඳහා පර්යේෂණ
- ඉහළ අස්වැන්නක් සහිත ආතතියට ඔරොත්තු දෙන භෝග හා ආහාර වර්ග හඳුනාගැනීම (climate smart agriculture), දේශීය බෝග කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණුව, පහසුව හා පිරිවැය අඩු බීජ සහ රෝපණ ද්‍රව්‍යය නිෂ්පාදනය, හා විවිධ කෘෂි පරිසර පද්ධතිවලට සුදුසු භෝග ඒකාබද්ධ කිරීම මඟින් නිෂ්පාදන කාර්යක්ෂමතාව හා ඉඩම් ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පර්යේෂණ
- අලෙවිකරණය, නව වෙළඳපොළ සහ ඒ පිළිබඳව පුරෝකථනය, සමාජ සුභසාධනය, ව්‍යාප්ති සේවා හා අවශ්‍යතාවලට අදාළ පර්යේෂණ
- මසුන් බහුල ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා පවතින ක්‍රමවේදවල නිරවද්‍යතාව වැඩි කිරීම, සූර්ය බලය, LNG සහිත යාත්‍රා, විශාල නෞකා ලබා දීම සහ ගබඩා පහසුකම් ඇති කිරීම, යාත්‍රා සහ පන්න ක්‍රම නවීකරණය සිදු කිරීම
- සාගර මත්ස්‍ය සම්පතේ ගහනයන් තක්සේරුව, අනාවැකි ආකෘති නිර්මාණය අඛන්ඩව සිදු කිරීමත් මිරිදිය සහ කිවුල් දිය ජලජ පද්ධතිවල ධාරිතාවයන් නිවැරදි ලෙස ගණනය කිරීම සඳහා පර්යේෂණ

### සෞඛ්‍ය, අධ්‍යාපන සහ විද්‍යා පර්යේෂණ

- ඩෙංගු, වකුගඩු (CKD), බෝවන රෝග, සහ ශ්‍රී ලංකාවට අදාළ වෙනත් විශේෂ සෞඛ්‍ය ගැටලු විසඳීම සඳහා ජාන විද්‍යාව, ජෛව රසායනය, නැනෝ තාක්ෂණය, පරිවෘත්තීය, ප්‍රෝටියෝමික්ස්, සහ කෘත්‍රිම බුද්ධිය (AI) වැනි නවීන විද්‍යාත්මක ක්‍රම
- පර්යේෂණ සහ සංවර්ධන මගින්  රටට අවශ්‍ය ඖෂධ දේශීයව නිෂ්පාදනය
- දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා දේශීයව ලබා ගත හැකි ආහාර අතිරේක නිපදවීම
- පිළිකා, දියවැඩියාව, හෘදයාබාධ වැනි රෝග කල්තියා හඳුනා ගැනීමට නවීන තාක්ෂණික පරීක්ෂණ

- දීප ව්‍යාප්ත පර්යේෂණ සහ සමීක්ෂණ මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මක තත්වය හා සම්පත් විෂමතා හඳුනාගෙන, එම දත්ත පදනම් කරගත් විසඳුම් ලබාදීම
- පාසැල් අධ්‍යාපනය තුළ විමර්ශන පදනම් කරගත් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම
- ගුරු පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය සඳහා නව්‍ය, කෘතිම බුද්ධියෙන් (AI) සමන්විත යෙදුම් සහ අතථ්‍ය පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම
- රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වයෙන් උසස් අධ්‍යාපන ආයතනවල පර්යේෂණ හා සංවර්ධන ඒකක පුළුල් කිරීම
- දේශීය වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත R&D නිසි පරිදි සිදු කිරීම සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම
- ඖෂධීය ශාක වගාව දිරිමත් කිරීම, පටක රෝපණ සහ ජාන ඉංජිනේරු මධ්‍යස්ථාන සහ රසායනාගාර ස්ථාපිත කිරීම මගින් දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ අවශ්‍යතාවන් සපුරාලන උසස් තත්වයේ දේශීය ඖෂධ, පෝෂක ඖෂධ (nutraceuticals), ආහාර අතිරේක (food supplements), රූපලාවන්‍යය සහ සුවඳ විලවුන් වර්ග වැනි අගය එක් කළ භාණ්ඩ පිළිබඳ පර්යේෂණ හා නිෂ්පාදනය කිරීම
- නැනෝ තාක්ෂණය මත පදනම් වූ පර්යේෂණ මගින් සූර්ය කෝෂ තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික උපකරණ, ඖෂධ, බලශක්ති කාර්යක්ෂම නව නිපැයුම්, පාරිසරික ප්‍රතිකර්ම සංරචක සහ අනාගත මෝටර් රථ සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය සඳහා අමතර කොටස් නිෂ්පාදන ප්‍රවර්ධනය

## තොරතුරු තාක්ෂණ, සන්නිවේදන, ඉංජිනේරු, බලශක්ති, සමුද්‍රීය, ප්‍රවාහන, සංචාරක සහ වෙනත් කර්මාන්ත

- ශ්‍රී ලාංකේය ජනවාර්ගික කණ්ඩායම් අතර භාෂා බාධක මගහරවා ගැනීම සඳහා රජයේ ආයතනවල සහ පොදු ස්ථානවල කෘත්‍රිම බුද්ධිය (AI) මගින් මෙහෙයවනු ලබන සන්නිවේදන සහ භාෂා පද්ධති ස්ථාපිත කිරීම සඳහා පර්යේෂණ
- ගංවතුර, ලැව්ගිනි සහ නායයෑම් සඳහා පූර්ව සහ සක්‍රීය (Proactive and real-time alerts systems) අනතුරු ඇඟවීම් සඳහා ක්‍රියාකාරී ආපදා කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම
- රථවාහන ප්‍රමාදයන් අවම කිරීම සහ ආරක්ෂිත මගී සේවා වැඩිදියුණු කිරීම අරමුණු කරගත් කාර්යක්ෂම සහ ඵලදායී ප්‍රවාහන කළමනාකරණ පද්ධති ගොඩනැගීම සඳහා පර්යේෂණ
- වායු දූෂණය අවම කිරීම, වාහන විමෝචනය පාලනය කිරීම සහ

ප්‍රධාන නගරවල වායු දූෂණ අධීක්ෂණ උපකරණ පිළිබඳ පර්යේෂණ

- සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට, නාස්තිය අවම කිරීමට ස්මාර්ට් මිනුම් පද්ධති (Smart Meters ) භාවිතා කිරීම. උදාහරණ: විදුලි මීටර් , වාහන නැවැත්වීමේ පද්ධති මීටර් , ජල මීටර පිහිටුවීම සඳහා පද්ධති පර්යේෂණ පැවැත්වීම සහ සංවර්ධනය කිරීම
- නිවැරදිව කාලගුණික අනාවැකි ප්‍රකාශ කිරීමට සහ බලශක්ති අවශ්‍යතාවයන් ගණනය කිරීමට හැකි යන්ත්‍ර සහ චන්ද්‍රිකා දත්ත භාවිතා කිරීම තුළින් ජල විදුලිය, සුළං සහ සූර්ය බලශක්ති සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම.
- ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය බැහැර වීම අවම කිරීමටත්, ප්‍රතිචක්‍රීයකරණයටත් අවශ්‍ය විසඳුම් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සනීපාරක්ෂක කසළ රඳවන වැඩිදියුණු කිරීම
- නව්‍ය අඩු වියදම් තාක්ෂණයන් සහ වහල මත සූර්ය පැනල සහ ජාල ඒකාබද්ධ කිරීමේ උපාංග සඳහා දේශීය නිෂ්පාදන හැකියාවන් සඳහා R&D සඳහා ආයෝජනය කිරීම
- පස්, වැලි, ගල්, ගඩොල්, තාර සහ අනෙකුත් දේශීය ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා ශ්‍රී ලාංකීය තත්වයන්ට අදාළව දේශීය ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සඳහා R&D යෙදීමෙන් ඉදිකිරීම් පිරිවැය අවම කිරීම සහ සම්පත් නාස්තිය අවම කිරීම, තිරසාර ඉංජිනේරු භාවිතයන් ප්‍රවර්ධනය කිරීම
- ගොඩනැගිලි කර්මාන්තය සඳහා මුහුදු වැලි කාර්යක්ෂම ලෙස භාවිත කිරීම පිළිබඳව පර්යේෂණ
- පොසිල ඉන්ධන මත යැපීම අඩු කිරීමට සහ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සපුරාලීම සඳහා අක්වෙරළ සුළං ව්‍යාපෘති, සූර්ය, සහ හයිඩ්‍රජන් බලශක්ති සංවර්ධනය කිරීම
- තෝරාගත් ප්‍රධාන දිස්ත්‍රික්කවල නියමු තාක්ෂණ සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම
- කාර්මික, කාර්යාලීය, වෛද්‍ය උපකරණ සහ පාරිභෝජන ද්‍රව්‍ය සංවර්ධනය සඳහා දේශීය තාක්ෂණික විශේෂඥතාව සහ නවෝත්පාදන භාවිත කිරීම
- තේ, රබර්, පොල්, වී, වැනි කෘෂි නිෂ්පාදනවල ඵලදායීතාව වැඩි කිරීමටත්, ශ්‍රමිකයාගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් අවශ්‍ය දේශීය තාක්ෂණික විසඳුම් සංවර්ධනය
- වැඩිහිටි ප්‍රජාවගේ දෛනික ජීවිතයත් ආබාධිත ප්‍රජාව ශ්‍රම බලකායට දායක කර ගැනීමටත් අවශ්‍ය දේශීය තාක්ෂණික මෙවලම් සංවර්ධනය
- අතරමැදි තාක්ෂණික විසඳුම් ඉදිරිපත් කරමින් කුඩා කර්මාන්ත දක්වා දියුණු කළ හැකි අවශ්‍ය නිපුණතා සහ විශේෂඥතාව ඇති ග්‍රාමීය

ව්‍යවසායකයින් හඳුනාගැනීම සඳහා ඵලදායි ප්‍රවේශයන් විමර්ශනය කිරීම සඳහා විශාල දත්ත, යන්ත්‍ර ඉගෙනීම, AI, ප්‍රජා ජාලකරණය සහ සමාජ මාධ්‍ය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති කාර්ය සාධක බලකායක් පිහිටුවීම

- හදිසි ආපදා ප්‍රතිචාර සහ සූදානම් වීමට ප්‍රමුඛත්වය දීම ඇතුළුව සමුද්‍රීය වසමෙහි ධාරිතා හිඩැස් සොයා ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම
- R&D මගින් අගය එකතු කළ සේවාවන් සහ ස්වභාවික සම්පත් උපයෝගී කරගෙන තිරසාර ලෙස සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය


## පරිසර, ඉඩම්, ජල, වායු සහ ඛනිජ සම්පත්

- දිනෙන් දින උග්‍රවන මිනිස් සහ සත්ව ගැටුම් අවම කිරීම සඳහා වඩාත් උචිත ක්‍රමවේදයන් නියමු ව්‍යාපෘතියකින් පසුව ක්‍රියාත්මක කිරීම
- ඉඩම් පරිහරණ ජාතික සැලැස්මට අනුකූලව ජලපෝෂක, වෘක්ෂලතා, ජෛව විවිධත්ව උණුසුම් ස්ථාන ආදිය සිතියම්ගත කිරීම
- කෘෂිකාර්මික, සාගර සහ මිරිදිය සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරමින් පසු අස්වනු හානිය අවම කිරීමටත්, නිෂ්පාදන විවිධාංගීකරණයට අවශ්‍ය තාක්ෂණය හඳුන්වා දීම
- සමුද්‍ර හා ජලජ සම්පත් උපයෝගී කරගනිමින් ඖෂධ, රූපලාවණ්‍යය, පෝෂණ අතිරේක වැනි නව ඉහළ වෙළඳපොළ අගයක් සහිත නිෂ්පාදන සඳහා පර්යේෂණ සිදු කිරීම
- ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් නිසි ලෙස කළමනාකරණය කරමින්, ඉල්මනයිට් මගින් ටයිටේනියම් ඩයොක්සයිඩ්, බෙරුවල මොනසයිට්වලින් දුර්ලභ ඛණිජ නිෂ්පාදනය සහ සේරුවිල යපස් නිධිය මගින් තඹ සහ රත්‍රන් නිෂ්පාදනය වැනි නව විභවතාවයන් අධ්‍යයනය කොට ක්‍රියාත්මක කිරීම
- වෙරළ ඛාදනය අවම කරමින් කඩොලාන සහ වෙරළ බඩ පරිසර පද්ධති ආරක්ෂා කිරීමට නවීන ඉංජිනේරු තාක්ෂණය උපයෝගී කර ගනිමින් අවශ්‍ය පියවර ගැනීම

## මානව සංවර්ධන, කලා, ඉතිහාස, සංස්කෘති සහ අතීත උරුම අධ්‍යයන

- R&D සහ දත්ත මත පදනම් වූ , නායකත්ව, සහයෝගීතා සහ සන්නිවේදන කුසලතා සංවර්ධනය කිරීම උදෙසා උපාධි පාඨමාලාවල වෙනස්කම් සිදුකිරීම
- සමාජ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම උදෙසා සාමාජීය නවෝත්පාදන, සාමාජීය වශයෙන් ඵලදායී නව දැනුම, කලාත්මක නිර්මාණ හා දාර්ශනික අදහස් ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන වැඩසටහන්, R&D මත පදනම්ව සංවර්ධනය කිරීම

- ගෘහස්ථ රොබෝ වැඩසටහන් පිළිබඳ R&D පැවැත්වීම සහ මානවරූපී රොබෝ නිෂ්පාදන පර්යේෂණ සිදුකිරීම
- නවීන විද්‍යුත් ආධාරක උපාංග, ඖෂධ මතක් කිරීමේ පද්ධති, කාර්යක්ෂම බෙදාහරින්නන් සහ ටෙලිහෙල්ත් පද්ධති සංවර්ධනය කිරීමෙන් විශ්‍රාමික හෝ වැඩිහිටි පරම්පරාවට සහාය වීම සහ දෘශ්‍ය සහ සන්නිවේදන ආධාරක දියුණු කිරීම
- ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් විවිධ දේශගුණික තත්වයන්ට ඔරොත්තු දෙන සංගීත භාණ්ඩ, නර්තන ඇඳුම් ආදිය නිෂ්පාදනය කිරීම සඳහා නිසි පර්යේෂණ සහ සංවර්ධන සිදු කිරීම
- සංගීතය, ගායනය, නැටුම්, නාට්‍ය, ඔපෙරා සහ සිනමාව වැනි ප්‍රාසාංගික කලාවන්ට R&D මගින් නවීන තාක්ෂණයන් ඇතුළත් කිරීම
- කාර්යක්ෂම ලේඛනාගාර පද්ධතියක් සහ පොදු වාර්තා කළමනාකරණයක් ස්ථාපිත කිරීම සඳහා AI ඇතුළු නව තාක්ෂණය භාවිතය ශක්තිමත් කිරීම මගින් ජාතික ලේඛනාගාරයේ ධාරිතාව වැඩි කිරීම
- අතීත උරුමයන්, ඇදහිලි, විශ්වාස, සංස්කෘතීන් සහ ජීවන රටා විස්තර කර ඇති පැරණි පුස්කොළ පොත් ආදිය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සහ අතීත තාක්ෂණික දියුණුව සහ භාවිතයන් හඳුනා ගැනීම සඳහා ජාතික මට්ටමින් පර්යේෂණ පැවැත්වීම
- සම්මත විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යය ඇතුළු සන්නිවේදන මූලාශ්‍ර සඳහා සුදුසු අන්තර්ගත විශ්ලේෂණය, සමීක්ෂණ, නාභිගත කණ්ඩායම් අත්හදා බැලීම් සහ සහභාගිවන්නන්ගේ නිරීක්ෂණ සිදු කිරීම සහ සන්නිවේදන කාර්යක්ෂමතාවයේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම



# නව්‍ය සංචාරක කර්මාන්තයක්
# ආකර්ෂණීය ගමනාන්තයක්

සංචාරක කර්මාන්තය යනු ගෝලීය අවශ්‍යතා සපුරන වේදිකාවක් වන අතර, එමගින් සත්කාරක රටවල් වෙත ආර්ථික සමාජ - සංස්කෘතික සහ පාරිසරික ප්‍රතිලාභ ගෙන ඒමට හැකි වේ. සංචාරක කර්මාන්තයේ සම්පත් ප්‍රධාන කොටස් හතරක් ලෙස හඳුනාගත හැක. එනම් ස්වභාවික, සංස්කෘතික, මානව සහ ප්‍රාග්ධන සම්පත් යනුවෙනි. මෙම සම්පත් ඵලදායී ලෙස ඒකාබද්ධ කර සැලසුම් කිරීම මගින් දියුණු සංචාරක කර්මාන්තයක් ගොඩනගා ගත හැකි වේ.

සංචාරක පැමිණීම් මිලියන 2.3ක් ඇ,ඩො,බිලියන 4.3ක් සහ දළ දේශීය නිෂ්පාදිතයේ දායකත්වය 4.9% ක් ලබා ගනිමින් ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය 2018 වසරේ මෙතෙක් හොඳම කාර්ය සාධනය ප්‍රදර්ශනය කර ඇත. ඒ අනුව සංචාරක ව්‍යාපාරයේ පදනම් වර්ෂය 2018 ලෙස සලකා ජාතික ජන බලවේගය සිය අනාගත සංචාරක ඉලක්ක හඳුනාගෙන තිබේ. ඒ අනුව සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ තීරණාත්මක ආර්ථික ක්ෂේත්‍රයක් ලෙසත් රටේ ප්‍රධාන විදේශ විනිමය ඉපයීමේ කර්මාන්තයක් ලෙසත් සලකා එය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කෙරේ. ඒ අනුව අපගේ දැක්ම වනුයේ, සංචාරක කර්මාන්තයේ තිරසාර බවත් පාර්ශ්වකරුවන්ගේ උසස් ජීවන තත්වයත්, ආර්ථික වර්ධනයට ඉහළ දායකත්වයක් සහතික කරන අතරම සංචාරකයින්ට ඉහළ තෘප්තිමත් සහ අව්‍යාජ අත්දැකීම් ලබා දීම සඳහා ප්‍රමුඛතා කර්මාන්තයක් ලෙස ගෝලීය සන්දර්භය තුළ ශ්‍රී ලංකාව ඉහළ ඉල්ලුමක් ඇති ගමනාන්තයක් බවට පත් කිරීමයි.



# මූලධර්ම

- දූරදර්ශී නායකත්වය, උපායමාර්ගික පාලනය සහ සාකල්‍ය ආර්ථික වර්ධනය
- ස්වභාවික හා සංස්කෘතික සම්පත් තිරසාර භාවිතය
- සංචාරක කර්මාන්තය සඳහා මානව සම්පත් සංවර්ධනය
- නව්‍ය සංචාරක නිෂ්පාදන සංවර්ධනය සහ ප්‍රමිතිකරණය
- උපායමාර්ගික ගමනාන්ත අලෙවිකරණය

# ක්‍රියාමාර්ග

## දූරදර්ශී නායකත්වය, උපායමාර්ගික පාලනය සහ සාකල්‍ය ආර්ථික වර්ධනය

- සංචාරක කටයුතු සම්බන්ධීකරණය සහ කළමනාකරණය සඳහා වගකිව යුතු ප්‍රධාන ආයතනය ලෙස ජාතික සංචාරක කොමිෂන් සභාව (NTC) පිහිටුවීම
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සංචාරක ප්‍රතිපත්ති සම්පාදන කවුන්සිලය (TPFC) ස්ථාපනය කිරීම
- සංචාරක සංවර්ධන සහ ප්‍රවර්ධනය සඳහා තනි ආයතනයක් ලෙස ඒකාබද්ධකොට ශ්‍රී ලංකා සංචරණ අධිකාරිය පිහිටුවීම
- ආර්ථික වර්ධනයේ ප්‍රධාන කර්මාන්තයක් ලෙස සංචාරක ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නව සංචාරක පනතක්
- ශක්‍යතා අධ්‍යයන පදනම් කරගනිමින් නව සංචාරක ගමනාන්ත ස්ථාපිත කර අදාළ පාර්ශවකරුවන්ට පහසුකම්
- සංචාරක කර්මාන්තයේ සිදුවන අපරාධ සහ නීති විරෝධී ක්‍රියා වැළක්වීම සඳහා තොරතුරු තාක්ෂණ සන්නිවේදන පද්ධතියක්
- ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණෙන ප්‍රධාන රටවල් සමඟ කාර්යක්ෂම හා ඍජු ගුවන් සම්බන්ධතා
- සංචාරක කර්මාන්තය රටේ විදේශ විනිමය ඉපැයීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා එම කර්මාන්තයට අඛණ්ඩ බලශක්ති සැපයුම

- සංචාරක කර්මාන්තය සඳහා වැඩි දායකත්වයක් සපයන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යවසායකයන්ගේ (MSME) සේවා ප්‍රමිතීන් ඉහළ නංවාලීම සඳහා අවශ්‍ය දිරිමත් කිරීම් සහ පහසුකම්
- සංචාරක සේවාවන්හි සියලු අංශවල ගුණාත්මක තත්වය වර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතිකරණ වැඩපිළිවෙළක්
- සංචාරක කර්මාන්තයේ අවිධිමත් සේවා සපයන්නන් විධිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම්
- දේශීය සංචාරක ව්‍යාපාරය රට තුළ ප්‍රමුඛ හා විකල්ප සංචාරක ප්‍රවාහයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා, පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිමත් කිරීම
- සංචාරක අංශයේ සංවර්ධනය සඳහා විධිමත් ජාත්‍යන්තර හවුල්කාරිත්වයන්, පරිත්‍යාගශීලී නියෝජිතායතන සහ රාජ්‍ය නොවන සංවිධානවල තාක්ෂණික සහ මූල්‍ය ආධාර ප්‍රමුඛතා සහ අවශ්‍යතා පදනමින් ඵලදායී ලෙස භාවිත කිරීම
- නවෝත්පාදන සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා වාර්ෂික ජාතික සංචාරක සම්මාන උළෙලක්

## සම්පත් තිරසාර භාවිතය

- ස්වභාවික සම්පත් ආශ්‍රිතව සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා සංචාරක සම්පත් උපයෝගිතා සැලැස්මක්
- ඩිජිටල් තාක්ෂණය සමගින් අනාගත සංචාරක ආයෝජන සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ හා රාජ්‍ය මැදිහත්වීමෙන් සංචාරක අංශයේ ඉඩම් පරිහරණ ක්‍රමවේදයක් සහිත වූ ඉඩම් බැංකුවක්
- සංචාරක කටයුතු හේතුවෙන් විශාල තර්ජනයකට ලක්ව ඇති හඳුනා ගනු ලබන සංචාරක ආකර්ෂණ ස්ථාන සඳහා රඳවා තබා ගැනීමේ ධාරිතාවන් (Carrying Capacity) විද්‍යාත්මකව හඳුනා ගනිමින් එම ස්ථාන ආරක්ෂා කර ගැනීමට වැඩපිළිවෙළක් සකස් කිරීම

## සංචාරක කටයුතු සඳහා මානව සම්පත් සංවර්ධනය

- සංචාරක හා සත්කාරක අංශය සඳහා ජාතික මානව සම්පත් සංවර්ධන සැලැස්මක්
- සංචාරක ව්‍යාපාරයේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු සහ අධ්‍යාපන ආයතන සඳහා සංචාරක පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයක්
- දේශීය සංචාරක කර්මාන්තයට මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළේ ඇති ශ්‍රම ඉල්ලුම සැපිරීමට ශ්‍රී ලාංකිකයින්ට කඩිනම් පුහුණුව
- සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත උපාධි පිරිනමන සියලුම විශ්වවිද්‍යාල රටේ සංචාරක කර්මාන්තයේ විවිධ ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ කිරීමට පහසුකම් සැලසීම

- උපාධිධාරීන්ට සංචාරක ව්‍යාපාරය තුළ අවස්ථා සැලසීම සඳහා ප්‍රායෝගික පුහුණුව
- සංචාරක ක්ෂේත්‍රයේ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්වල විෂයමාලා යාවත්කාලීන කිරීම
- ක්ෂුද්‍ර ව්‍යවසායකයින් ඉලක්ක කරගත් පුහුණු කිරීම, අධ්‍යාපන සහ පහසුකම් සැලසීම සඳහා සුවිශේෂී සංචාරක පුහුණුව
- පුද්ගලික අංශයේ, රාජ්‍ය අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සියලුම පුද්ගලයින් හා සංචාරක සේවා සපයන්නන් සහ අදාළ වෘත්තිකයන් හා සේවකයින් සඳහා ඔවුන්ගේ අනාගතය සංචාරක කර්මාන්තයේ සුරක්ෂිත කිරීම සඳහා විශේෂ සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක්
- අධ්‍යයන, වෘත්තීය ආයතන හා විශ්වවිද්‍යාලවල සියලුම සිසුන්ට සහ විද්වතුන්ට සංචාරක ව්‍යාපාරයේ ව්‍යවහාරික පර්යේෂණවල නියැලීමට හැකිවන පරිදි පුද්ගලික - රාජ්‍ය හවුල්කාරිත්වයක් (PPP) ලෙස ජාතික සංචාරක පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කෙරේ

## නවෝත්පාදන සංචාරක නිෂ්පාදන සංවර්ධනය සහ ප්‍රමිතිකරණය

- රට වටා ගමනාන්තවල දැනට පවතින සංචාරක යටිතල පහසුකම් සහ නවීකරණය කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක්
- සංචාරක නිෂ්පාදන සංවර්ධනය සඳහා වෙනම අංශයක් ස්ථාපිත කිරීම
- අඩු පැමිණීමක් සහිත සංචාරක කාලසීමාවේදී එම හිඩැස් පිරවීම සඳහා සුවිශේෂී ප්‍රවර්ධන වැඩසටහන් තෝරාගත් වෙළඳපොළවල් සඳහා ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාව, MICE (Meetings, Incentives, Conferences, Exhibitions) සහ ක්‍රීඩා සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම
- Cruise Ship Tourism ආකර්ෂණය කර ගැනීමට සහ ඒවාට පහසුකම් සැපයීමට රාජ්‍ය හා පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් වැඩපිළිවෙළක් සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම්
- ආබාධ සහිත සංචාරකයින් ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීම සඳහා සහ අවශ්‍ය මානව සම්පත් සංවර්ධනයට වැඩපිළිවෙළක්

## උපායමාර්ගික ගමනාන්ත අලෙවිකරණය

- දැනට පවතින ගමනාන්ත අලෙවිකරණ ක්‍රියාකාරකම් සමාලෝචනයට ලක්කරනු ලබන අතර ඒවා නැවත සැලසුම් කර විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම
- විදේශ අමාත්‍යාංශය, ජාතික ගුවන් සේවා සහ සංචාරක රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධන කටයුතු සඳහා දීර්ඝකාලීන ගෝලීය අලෙවිකරණ ව්‍යාපාරයක්

සංවර්ධනය කිරීම

- ප්‍රධාන පිවිසුම් ස්ථානවල සහ විදේශයන්හි ප්‍රධාන සංචාරක වෙළඳපොළවල ආකර්ෂණීය සහ දෘශ්‍ය ප්‍රවර්ධන මාදිලි නිර්මාණය කිරීම
- ගමනාන්තයන් ඇතුළු සංචාරක කටයුතු පිළිබඳ සියලුම සංචාරක තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා ඩිජිටල් ප්‍රවේශයන්
- සංචාරක හිතකාමී, හරිත ගමනාන්තයක් ලෙස සංචාරකයින්ගේ සංජානනය තෘප්තිමත් කිරීම සඳහා වැඩපිළිවෙළක්
- නිදහස් ස්වාධීන සංචාරකයින් (FITs) සහ ගුවන් තොටුපලේ සංක්‍රමණික (Transit) මගීන් සඳහා විශේෂ පහසුකම් සහිත අලෙවිකරණ ව්‍යාපාරයක්
- විද්‍යාත්මක පර්යේෂණ සොයාගැනීම් මත පදනම්ව නැගී එන සහ නව වෙළඳපළ කේන්ද්‍රකර ගනිමින් විශේෂ අලෙවිකරණ ව්‍යාපාර දියත් කෙරේ
- විදේශ සේවය සහ තානාපති කාර්යාල ශ්‍රී ලංකාවේ ගමනාන්ත අලෙවිකරණ වැඩසටහන් සඳහා ඵලදායී සහ කාර්යක්ෂම ලෙස යොදාගැනීම



# ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයක්

# ජීවධරණී ප්‍රවේශයක්

ආර්ථික සංවර්ධන විෂයයෙහි ශ්‍රී ලංකාවට වඩා අඩු හෝ සමාන විභවතාවයක් පැවති රටවල් සිය දළ දේශීය නිෂ්පාදිතයන් අඛණ්ඩව වර්ධනය කර ගනිමින් ලෝක භාණ්ඩ හා සේවා වෙළඳපොළේ සැළකිය යුතු පංගුවක් අත්පත් කර ගැනීමට සමත්ව ඇත. උදාහරණ ලෙස 2023 වර්ෂයේ බංග්ලාදේශයේ, වියට්නාමයේ සහ දකුණු කොරියාවේ දළ දේශීය නිෂ්පාදනය පිළිවෙළින් ඩොලර් බිලියන 460ක්, 409ක් සහ 1700ක තරම් ඉහළ අගයක් ගනී. එනමුත් එම වර්ෂයේ ලංකාවේ එම අගය ඩොලර් බිලියන 84ක පමණ පහළ අගයකි. අනෙක් අතට එම රටවල් පිළිවෙළින් ඩොලර් බිලියන 59ක්, 384ක් සහ 808ක අපනයන අදායමක් උපයන විට 2023දී අපේ රටේ භාණ්ඩ අපනයන ආදායම ඩොලර් බිලියන 11.9කට පමණ සීමාවී පවතී. නිෂ්පාදන හැකියාව වැඩිදියුණු කර ගැනීමට නිසි සැලසුමක් නොමැති වීමත්, ලොව වේගයෙන් දියුණු වූ තාක්ෂණය හරහා ඵලදායීතා වර්ධනයක් අත්පත් කරගැනීමට නොහැකි වීමත් නිසා වර්තමානයේ ශ්‍රී ලංකාව භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ අර්බුදයකට මුහුණ දී සිටී.

ශ්‍රී ලංකාව මේ වන විට මුහුණ දී ඇති ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට දේශිය නිෂ්පාදනය ශක්තිමත් කරගනිමින් අපනයන ප්‍රමුඛ නිෂ්පාදන ආර්ථිකයක් වෙත යොමු විය යුතුව ඇත. එහිදී ලංකාවේ පිහිටීම, මානව සම්පත සහ ස්වභාවික සම්පත් උපයෝගී කර ගනිමින් දිගුකාලීන කර්මාන්ත සංවර්ධන සැලැස්මක් හා එය ක්‍රියාත්මක කිරීමට කැපවුන දේශපාලනික නායකත්වයක් අත්‍යවශ්‍යය. බිඳ වැටී ඇති දේශීය නිෂ්පාදන කර්මාන්ත නැවත පණ ගැන්වීම, අපනයන කර්මාන්ත තරගකාරී කිරීම, සේවා කර්මාන්ත ප්‍රවර්ධනය, නව විභවයන් හරහා ලෝක වෙළඳපළ අත්පත් කර ගැනීම, ජාතික සැලැස්මකට අනුව ඍජු විදේශ ආයෝජන කැඳවීම, නව අයෝජන සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය, අඩු පිරිවැය යටිතල පහසුකම් සහ යෙදවුම් සැපයීම මෙම ප්‍රතිපත්ති රාමුවේ මූලික අරමුණු වේ.



# මූලධර්ම

- ජාතික ප්‍රතිපත්ති රාමුවක් මගින් කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය ආයතනික, ප්‍රාග්ධන, තාක්ෂණ සහ වෙළඳපළ සහයෝගය සැපයීමේ ප්‍රවේශය
- නව දේශීය හා විදේශීය ආයෝජන හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය
- පිරිවැය අවම බලශක්තිය, ප්‍රවාහනය, විදුලිසංදේශ, මූල්‍යකරණය හා අනෙකුත් යටිතල පහසුකම් සම්පාදනය
- සැපයුම් ජාලයන්හි වෙළඳපොළ කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය
- දේශීය කර්මාන්ත ශක්තිමක් කරමින් විදේශ විනිමය අභිමුඛ සේවා කර්මාන්ත ප්‍රවර්ධනය
- පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිඵල මත භාණ්ඩ හා සේවා විවිධාංගීකරණය
- තිරසර පරිසර හිතකාමී ප්‍රවේශය

# ක්‍රියාමාර්ග

**ජාතික සැලසුම්කරණය හා රාජ්‍ය මැදිහත්වීම**

- ජාතික කර්මාන්ත සැලසුම් බුද්ධි මණ්ඩලයක් ස්ථාපිත කිරීම (National Industrial Think Tank) සහ සැලසුම් කිරීම
- එක් එක් කර්මාන්තවල ජාතික වැදගත්කම මත ඒවා දියුණු කිරීම සඳහා ඍජු මැදිහත්වීම, තිරසාරත්වය හා නියාමනය සඳහා පහසුකම් සැලසීම

**බදු, නීතිය සහ ඵලදායීතා වර්ධනය**

- එක් එක් අංශයට ආවේණික වූ විශේෂිත අවදානම්, පුළුල් අරමුණු සහ රජය විසින් සකස් කර ඇති ප්‍රමුඛතා මත පදනම්ව විවිධ කාර්මික වර්ගීකරණයන් සඳහා වන බදුකරණ ව්‍යුහයන්
- ජාතික අවශ්‍යතා වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග හේතුවෙන් සිදුවන අලාභ අවම කිරීමට අයෝජන ආරක්ෂණ නීති ශක්තිමත් කිරීම
- වෙළෙඳපොළ බලවේගවල අනිසි බලපෑම්වලින් සුළුපරිමාණ නිෂ්පාදකයන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය නීති සම්පාදනය
- වාණිජමය සම්බන්ධ නඩු සහ බේරුම්කරණය වේගවත් කිරීම සඳහා ආරවුල් විසඳීමේ පනත ශක්තිමත් කිරීම
- ඵලදායීතාව, ගුණාත්මකභාවය සහ පිරිවැය අරමුණු සපුරාලීම සහතික කිරීම සඳහා පුළුල් තාක්ෂණික සහය ක්‍රියාවලියක්

- පවතින නීතිය සාධාරණව සහ කාර්යක්ෂමව ඉටු කිරීම මඟින් ව්‍යාපාරවලට ආරක්ෂාවත්, ව්‍යාපාර කරගෙන යාම සඳහා අවශ්‍ය සම බිමක්

## ජාත්‍යන්තර හා දේශීය වෙළඳපොළ පුළුල් කිරීම් සහ කාර්යක්ෂමතාවය

- දේශීය වෙළඳපොළ කාර්යක්ෂමතාවය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නීතිමය වෙනස්කම් සිදු කිරීම
- රාජ්‍යතාන්ත්‍රික සේවාවන් මගින් ජාත්‍යන්තර වෙළඳපළ අවස්ථා පුළුල් කිරීම හා නිශ්චිත නිර්ණායකයන් මත වෙළඳපොළ අත්පත් කරගැනීමට කටයුතු මෙහෙයවීම
- පවතින නිදහස් වෙළෙඳ ගිවිසුම් යාවත්කාලීන කිරීම හා නව නිදහස් වෙළඳ ගිවිසුම්වලට ප්‍රවේශවීම
- වරාය, ගුවන් තොටුපළ සහ වරාය නගර සැපයුම් දාම කේන්ද්‍රස්ථාන ලෙස වැඩිදියුණු කරමින් කර්මාන්තවලට විදේශ වෙළෙඳපොළට ප්‍රවිශ්ට වීමට පහසුකම්
- ආරම්භක ව්‍යාපාර සඳහා වෙළඳ සහතික ලබාදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ නව අපනයන කර්මාන්ත සඳහා සහතිකකරණයට අවශ්‍ය පහසුකම් පුළුල් කිරීම
- අවශ්‍ය මූල්‍ය සේවා, ණය පහසුකම් හා අපනයන ඒකාබද්ධ කිරීමේ (Export Consolidation) සේවා මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයන්ට (MSMEs) සහාය වීම
- ඩිජිටල් තාක්ෂණයන් සහ ඊ - වාණිජ වේදිකා භාවිතා කිරීමෙන් ජාත්‍යතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

## කර්මාන්තපුර සහ යටිතල පහසුකම්

- උපයෝගී කර නොගත් සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පවතින කර්මාන්ත පුර සංවර්ධනය කිරීම
- හඳුනාගත් විභවයන්ට අනුකූලව නව කාර්මික කලාප බිහිකරන අතර, මෙම කලාපවල නවෝත්පාදන සහ කාර්මික විවිධාංගීකරණයට අනුබල දීම
- ධීවර කෘෂි සහ සංචාරක කර්මාන්තවලට අවශ්‍ය යටිතල පහසුකම් ඒ ඒ ප්‍රද්ශවල දියුණු කිරීම

## ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත

- ජාතික සහ ප්‍රදේශීය මට්ටමින් ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා අනුගත ඒකාබද්ධ සහය ලබා දීම සඳහා කැපවූ අංශයක් ස්ථාපිත කිරීම සහ ව්‍යාපාරික අවශ්‍යතා කාර්යක්ෂමව ලබාදීම සඳහා තනි කවුළු සහාය ලබා දීම (Single Window)

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මූල්‍ය ආධාර සැපයීම සඳහා සංවර්ධන බැංකුවක් මගින් මූල්‍ය ක්ෂේත්‍රය හරහා ශක්‍යතා ඇගයීම් මත රුපියල් මිලියන 10 දක්වා ඇපකර රහිත ණය යෝජනා ක්‍රමයක් (Based on Feasibility and Credit Score)
- සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුද ඇතුළත් සමුපකාර බැංකුකරණය ශක්තිමත් කර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ මූල්‍ය අවශ්‍යතා සම්පාදනය කිරීම
- සහයෝගීතාවයේ සාමූහික බලය වැඩිදියුණු කිරීම, ශක්තිමත් කිරීම සඳහා නව සමුපකාර ව්‍යාපාර ආකෘති ප්‍රවර්ධනය
- වෙළඳපොළ වෙත ළඟා වීමට Start up තෝරා ගැනීමට සහාය වීම සඳහා Startup incubator වැඩසටහන ස්ථාපිත කිරීම, එම ව්‍යාපාර සඳහා බදු සහන
- ප්‍රධාන වශයෙන් කෘෂි කර්මාන්තය පදනම් කරගත් අගය එකතු කළ කර්මාන්ත, ඛනිජ මත පදනම් වූ කර්මාන්ත, ඇසුරුම් කර්මාන්ත, විදුලිබල හා බලශක්තිය, අපනයන කේන්ද්‍රී නිෂ්පාදන, සමුද්‍රීය සේවා, ගුවන් යානා නඩත්තු කිරීම සහ සේවා සැපයීම, විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ සහ තොරතුරු තාක්ෂණ ආශ්‍රිත සේවා, ඉදිකිරීම් සහ ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම
- මත්ස්‍ය වගාව, තාක්ෂණයෙන් මඟ පෙන්වන මසුන් ඇල්ලීම, ධීවර උපකරණ හා යාත්‍රා නිෂ්පාදනය, නිෂ්පාදන කල්තබා ගැනීම, ඇසුරුම්කරණය, දේශීය විදේශීය වෙළඳපොළ හා කර්මාන්තයේ යෙදෙන ප්‍රජාවේ සමාජ හා ආර්ථික ගැටලු සැලකිල්ලට ගනිමින් ධීවර කර්මාන්තය දියුණු කිරීමට ජාලගත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
- ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු පාර්ශව එක්ව කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් ශ්‍රී ලංකාව ස්වයංපෝෂණය කිරීම ඉලක්ක කරගත් වැඩපිළිවෙළක් සකස්කොට ක්‍රියාත්මක කිරීම
- සම්පත් සුලබතාවය හා ලබා ගත හැකි බව, වෙළඳපොළ අවස්ථා සහ වර්ධනය වීමේ හැකියාව මත පදනම්ව ඒ ඒ දිස්ත්‍රික්ක සංවර්ධන සැලැස්ම යටතේ දිස්ත්‍රික්කයට/ප්‍රදේශයට අවේණික නිෂ්පාදන, ප්‍රවර්ධනය කිරීම
- කෘෂිකර්මන්තය, කර්මාන්ත, සේවා නිෂ්පාදනය හා දේශීය පරිභෝජනය සඳහා අවශ්‍ය උපකරණ, මෙවලම් සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම
- දැනට පවතින තෙල් පර්යන්ත ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු ත්‍රිකුණාමලයේ ජාත්‍යන්තර තෙල් සම්ප්‍රේෂණ සහ ගබඩා කිරීමේ පර්යන්තයක් ඉදිකිරීම
- දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා සපුගස්කන්ද තෙල් පිරිපහදුව

නවීකරණය කිරීම සහ පිරිපහදු කළ තෙල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමාණාත්මක විදේශීය වෙළඳපොළ කොටසක් අත්පත් කර ගැනීම

- විශේෂයෙන් ආසියානු කලාපයේ ගුවන් සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා ගුවන් යානා සේවා සහ නඩත්තු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම

## සම්ප්‍රදායික ශිල්ප හා  හස්ත කර්මාන්ත

- මෙම කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා පිහිටුවා ඇති ආයතන පද්ධතිය පොදු අරමුණක් උදෙසා කාර්යක්ෂමව මෙහෙයවීම
- වඩුකර්මාන්තය ඇතුළු අනෙකුත් සම්ප්‍රදායික කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සුලභ කිරීම හා තෝරාගත් යෙදවුම් වගා කිරීමට වැඩපිළිවෙළක්
- මොරටුව ඇතුළු සියලුම වඩු කාර්මික ජනතාව මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන යන සියල්ල ඒකාබද්ධ කොට පෞද්ගලික අංශය සමග ක්‍රියාකාරී මෙහෙයුම් කමිටුවක්
- ලියාපදිංචි ශිල්පීන්ට අවශ්‍යකරන තාක්ෂණික මෙවලම් බදු සහන
- සමුපකාර ක්‍රමය යටතේ නිෂ්පාදකයන් සංවිධානය කිරීම සහ ශක්තිමත් කිරීම
- අපනයන ක්‍රියාවලියේදී සිදුවන පිරිවැය අවම කර ගැනීමට අපනයන ක්‍රියාකාරකම් ජාලගත පද්ධතියක් මගින් ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙළක්
- ශිල්පීන් හා ශිල්පය ආරක්ෂා කර ගැනීම සඳහා ආරක්ෂණ දැළක් ඇතුළු ජාතික වැඩපිළිවෙළක්

## තිරසාර සංවර්ධනයට අවශ්‍ය වන මැදිහත්වීම

- තිරසාරත්වය කරා අර්ථවත් ප්‍රගතියක් ලබා ගැනීමට සහ ගෝලීය වෙළෙඳපොළේ විකාශනය වන ඉල්ලීම් වන සාධාරණ වෙළෙඳාම (Fair Trade) ශ්‍රම ප්‍රමිතීන් හා විනිවිධභාවය  (Transparency) සපුරාලීම සඳහා කර්මාන්තවලට සහය වීම හා ඒ පිළිබඳ ජාතික වැඩපිළිවළක්
- පාරිසරික තිරසාර බව සහතික කිරීම සහ දේශගුණික විපර්යාස ආමන්ත්‍රණය කිරීම කාර්මික අංශයේ දිගුකාලීන ශක්‍යතාව සඳහා අත්‍යවශ්‍ය අරමුණුවලට ළඟාවීමට පුළුල් වැඩපිළිවෙළක්

## ඩිජිටල්කරණය සහ තාක්ෂණික භාවිතය

- හතරවෙනි කාර්මික විප්ලවයේ ප්‍රතිලාභ වේගයෙන් අත්පත් කර ගැනීමටත් පස්වෙනි කාර්මික විප්ලවය සඳහා අපේ කර්මාන්ත සූදානම් කිරීමට දර්ශකයක් (Industry 4.0/5.0 Maturity Index)
- අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාව, දත්ත මධ්‍යස්ථාන සහ සයිබර් ආරක්ෂණ පද්ධති ඇතුළුව ශක්තිමත් ඩිජිටල් යටිතල පහසුකම් ගොඩනැගීමට රාජ්‍ය හා පුද්ගලික ආයෝජන
- යටිතල ව්‍යුහය IoT, AI, cloud computing සහ දත්ත විශ්ලේෂණ වැනි උසස් තාක්ෂණයන් සඳහා පදනම සැකසීම
- ශ්‍රී ලංකාවේ කාර්මික ව්‍යවසායන් අතර කර්මාන්ත 4.0 තාක්ෂණයන් අනුගමනය කිරීම දිරිමත් කිරීම සහ සහාය වීම
- ව්‍යාපාරවලට ඔවුන්ගේ මෙහෙයුම්වලට ඩිජිටල් තාක්ෂණ ඒකාබද්ධ කිරීමට උපකාර කිරීම සඳහා දිරිගැන්වීම් හා තාක්ෂණික සහාය සැපයීම
- ශ්‍රම බලකායේ ඩිජිටල් සාක්ෂරතාවය සහ තාක්ෂණික කුසලතා වැඩි දියුණු කිරීම සඳහා නිපුණතා සහ නැවත පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා ආයෝජනය
- කර්මාන්තය, ශාස්ත්‍රීය, පර්යේෂණ ආයතන සහ ආරම්භකයින් අතර සහයෝගීතාවයට සහාය වන ඩිජිටල් නවෝත්පාදන පරිසර පද්ධතියක් (Start up Eco System)
- දැනුම බෙදාගැනීම, තාක්ෂණ හුවමාරුව සහ ව්‍යවසායකත්වය සඳහා පහසුකම් සැලසීම සඳහා නවෝත්පාදන මධ්‍යස්ථාන, තාක්ෂණ උද්‍යාන සහ ඉන්කියුබේටර් ස්ථාපිත කිරීම
- නවෝත්පාදන දිරිමත් කරන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ දත්ත පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කරන ආධාරක නියාමන රාමුවක්
- පූර්ව නිශ්චිත ප්‍රමිතික සහ ඉලක්කවලට ළඟාවීමට, ඩිජිටල් පරිවර්තන ප්‍රයත්නවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා යාන්ත්‍රණ
- කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් සේවාවක් සමඟින් කර්මාන්තයට සහාය වන තනි කවුළු (Single Window) රාජ්‍ය වේදිකාව E Governance Initiative හරහා ක්‍රියාත්මක කිරීම

## ව්‍යාපාර කිරීමේ පහසුව ප්‍රවර්ධනය හා ව්‍යවසායකත්වය

- නව්‍ය සංවර්ධන බැංකු, ව්‍යාපාර ප්‍රවර්ධන අරමුදල් සහ ක්ෂුද්‍ර මූල්‍ය මූලාරම්භයන් මගින් මූල්‍යකරණයට ප්‍රවේශ වීමට පහසුකම් (Venture Capital and Investments)

- වෘත්තීය පුහුණුව සහ පාසල් අධ්‍යාපන ක්‍රම මගින් ව්‍යවසායක අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම හා ඩිජිටල් Freelancing පිළිගත් වෘතියක් ලෙස ස්ථාපිත කර අවශ්‍ය පහසුකම් සැලසීම
- ඩිජිටල් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම, ව්‍යාපාර ක්‍රියාවලීන්හි තාක්ෂණය භාවිතා කිරීම ප්‍රවර්ධනය
- වෙළඳ ගිවිසුම්, අපනයන ප්‍රවර්ධන මුලපිරීම් සහ ජාලකරණය හරහා දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට පහසුකම්
- ඉන්කියුබේටර්, ඇක්සලරේටර්, සම - වැඩ කරන අවකාශයන් සහ ජාලකරණය ඇතුළුව ව්‍යවසායකත්වය සඳහා ආධාරක පරිසර පද්ධතියක් (Incubators, Accelerator Program, Co Working Spaces and Networking)



# තිරසර සම්පත් භාවිතයක්
# උපරිම ප්‍රතිලාභ ජනනයක්

ගොඩබිමින් වර්ග කිලෝමීටර් 65,610ක් වන ශ්‍රී ලංකාව විවිධ ඛණිජ සම්පත්වලින් ගහන රටකි. එක්සත් ජාතීන්ගේ සාගර නීතියට අනුව ඉදිරියේදී නෛතිකව හිමිවීමට නියමිත සාගර කලාපය ද ඇතුළත්ව ගොඩබිම මෙන් ආසන්න වශයෙන් විසි ගුණයක් වන මහද්වීපික තටකයද, සාගර ඛණිජ සම්පත්වලින් හෙබි ප්‍රදේශයකි. ගොඩබිම තුළ විපරීත පාෂාණ නිර්මාණයේදී පසු කාලීනව විවිධ භූ කාරක ක්‍රියාවලි හේතුවෙන් නිර්මාණය වු මිණිරන්, මයිකා, ඇපටයිට්, හුණුගල් සහ ඩොලමයිට් , ඛනිජ වැලි, ධමනි තිරුවාන හා සිලිකා වැලි, ෆෙල්ස්පාර්, සර්පන්ටයින්, ලැටරයිට්, විවිධ මැටි වර්ග සහ මැණික් ආදී ඛණිජ නිධි පිහිටා ඇත. 1980 දශකය දක්වා ඛණිජ සම්පත් ගවේෂණයෙන් සොයා ගනු ලැබූ ඛණිජ සම්පත්වලින් ඛණිජ වැලි, සිමෙන්ති, පොස්පේට් (ඇපටයිට්), සෙරමික්, වීදුරු සහ උළු ආදී රාජ්‍ය කර්මාන්ත බිහිවු නමුත් අද වන විට එම කර්මාන්ත බොහොමයක් වසා දමා හෝ විකුණා ඇත. එතැන් සිට බොහෝ ඛණිජ අගය එකතු කිරීමෙන් තොරවම අමුද්‍රව්‍ය ලෙසම අපනයනය කෙරේ.

ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිටම මැණික්වලින් ගහන රටක්

**මිනිරන්, ඇපටයිට්, කැල්සියම් කාබනේට් අඩංගු හුණුගල්, කැල්සයිට් හා ඩොලමයිට්ද, ඛණිජ වැලි හා ධමනි තිරුවාන හා සිලිකා වැලි ආශ්‍රිතව ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් දිය හැකි කර්මාන්ත ආරම්භ කිරීමේ හැකියාවක් පවතී.**

ලෙස ප්‍රසිද්ධියක් උසුලයි. මැණික් කර්මාන්තය පිළිබඳ අතීත හා නවීන තාක්ෂණය පිළිබඳ දැනුම ඇති පිරිස් සිටීමත්, මේ වන විට විශ්වවිද්‍යාල මට්ටමේ උපාධි පාඨමාලා පැවතීමත්, ලංකාවේ පිහිටීමත් භාවිත කොට ලෝක මැණික් වෙළඳපොළෙහි සැලකිය යුතු පංගුවක් අත්පත් කර ගනිමින් ලංකාව ලෝක මැණික් වෙළඳාමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්කර ගැනීමට විශාල විභවයක් පවතී. නමුත් මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳාමෙන් වාර්ෂිකව ලංකාවට උපයා ගත හැකිව ඇත්තේ ඇ.ඩො.මි 250 ක් පමණි. ලෝක වෙළඳපොළේ සැලකිය යුතු පංගුවක් අත්පත් කර ගනිමින් සැලකියයුතු විදේශ විනිමය ප්‍රමාණයක් ඉපයීමේ මට්ටමකට මෙම කර්මාන්තය ගෙනයාමට නොහැකිව ඇත්තේ මෙම කර්මාන්තයට නිසි රාජ්‍ය අනුග්‍රහය නොමැති වීම, නීති රීති යාවත්කාලීන නොවීම, දේශපාලන මැදිහත්වීම නිසා සිදුවන අල්ලස හා දූෂණය, බලධාරීන්ට ක්ෂේත්‍රය පිළිබඳ නිසි දැනුමක් නොමැති වීම, නිසි රසායනාගාර පහසුකම් සහ ක්‍රමවත් තක්සේරු ක්‍රමවේදයක් නොමැති වීම යනාදී ගැටලු හේතුවෙනි.

මිනිරන්, ඇපටයිට්, කැල්සියම් කාබනේට් අඩංගු හුනුගල්, කැල්සයිට් හා ඩොලමයිට්ද, ඛණිජ වැලි හා ධමනි තිරුවාන හා සිලිකා වැලි ආශ්‍රිතව ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් දිය හැකි කර්මාන්ත ආරම්භ කිරීමේ හැකියාවක් පවතී. දැනට සොයාගෙන ඇති අනෙකුත් කුඩා ලෝහමය ඛණිජ නිධි මෙන්ම යකඩ හා තඹ අඩංගු ලෝහමය ඛණිජ නිධි ආශ්‍රයෙන් අගය එකතු කිරීමේ නිෂ්පාදන කර්මාන්ත ආරම්භ කළ හැක. එමෙන්ම ගොඩබිම හා සාගර පතුලේ විධිමත් ඛණිජ සම්පත් ගවේෂණයක් සිදු කර එම ඛණිජ නිධි හා එහි ඇති වටිනා විරළ අංශු මාත්‍ර මූලද්‍රව්‍ය (REE) ද විදේශ විනිමය ඉපයීමට යොදාගත හැක.



# මූලධර්ම

- විද්‍යාත්මක ගවේෂණය
- තිරසාර කැණීම් සහ භාවිතය
- ප්‍රශස්ථ උපයෝජනය
- දේශීය හා ගෝලීය වෙළඳපොළ උපරිම ප්‍රතිලාභ

# ක්‍රියාමාර්ග

පහත ඛනිජ ආශ්‍රිත කර්මාන්ත නිෂ්පාදන හැකියාව සහ වෙළඳපොළ පුරෝකථනය කිරීම ආදිය පිළිබඳ නිසි ශක්‍යතා අධ්‍යයන සිදු කිරීමෙන් පසු පහත සඳහන් කර්මාන්ත ක්‍රමානුකූලව ආරම්භ කිරීම

- දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කොට රට තුළ හා සාගර පතුළ තුළ ඇති ඛණිජ නිධි හා විරළ අංශු මාත්‍ර මූලද්‍රව්‍යය ගවේෂණය
- ඛනිජ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ අධ්‍යයනකොට නිර්දේශ ඉදිරිපත් කිරීම, වෙළඳපොළ පුරෝකථනය කිරීම ආදිය සඳහා විශේෂඥ ඒකකයක්
- දේශීය වෙළඳපොළ අවශ්‍යතාවය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කොට ගුණාත්මක තත්වයේ ලුණු නිෂ්පාදනය පුළුල් කිරීම
- ලුණු නිස්සාරණයේ අතුරු නිෂ්පාදන කර්මාන්ත ආරම්භ කිරීමට අවශ්‍ය තාක්ෂණික හා යටිතල පහසුකම්
- ශ්‍රී ලංකාවේ ඇති සර්පන්ටීන් නිධි උපයෝගී කර නිකල් සල්පේට් හා මැග්නිසියම් ආශ්‍රිත නිෂ්පාදන
- කෘෂිකර්මාන්තයේ කෙටිකාලීන භෝග සඳහා වඩාත්ම යොග්‍යය සිංගල් සුපර් පොස්පේට් (SSP) නිපදවීමට සහ මධ්‍ය කාලීන භෝග සඳහා පොස්පේට් පොහොර නිෂ්පාදනය සඳහා කර්මාන්ත
- කෘෂිකර්මාන්ත සඳහා යොදා ගැනෙන ඩොලමයිට් පොහොර ප්‍රමිතියෙන් යුතුව නිපදවීම
- දේශීය වෙළඳපොළ ඉලක්ක කොට අවසාදිත හුනුගල් ඇති ප්‍රදේශ පදනම්ව නව සිමෙන්ති නිෂ්පාදනාගාරයක්
- ඖෂධ, කඩදාසි, රෙදිපිළි ඇතුළු අනෙකුත් කර්මාන්ත සඳහා අවශ්‍ය ගුණාත්මක තත්වයේ අවක්ෂේපිත කැල්සියම් කාබනේට් නිෂ්පාදනය
- ඛනිජ වැලි පිරිපහදුවේදී වඩාත් පිරිසිදු ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන් ආදිය නිස්සාරණය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණය හඳුන්වාදීම

- ඉල්මනයිට් සහ රූටයිල් අමුද්‍රව්‍ය ලෙසට අපනයනය වෙනුවට ටයිටේනියම් ඔක්සයිඩ් (Tio2) නිපදවීමේ කාර්මාන්ත ශාලාවක්
- ඛණිජ වැලි නිස්සාරණයේදී ලැබෙන සර්කොන් පෝසිලෙන් භාණ්ඩ ඔපදැමීම සඳහා  අවශ්‍ය  වන ආකාරයට පිරිසිදු කරන කර්මාන්ත
- ජාත්‍යන්තර නීතිවලට අනුකූලව හා අදාළ ආයතනවල සහය ඇතිව මොනසයිට් වැලිවලින් තෝරියම්, ලැන්තනම් හා සිරියම් වෙන්කිරීමේ කර්මාන්ත ශාලා

## ගාර්නට් වැලි ආශ්‍රිත අගය එකතු කිරීමේ කර්මාන්ත

- ධමනි තිරුවාන හා සිලිකා වැලිවල ඌණ උපයෝගිතාවන් අවම කර ඒ ආශ්‍රිත නව කර්මාන්ත
- මිනිරන්වල කාබන් ප්‍රතිශතය 99.9% දක්වා ඉහළ දැමීම සඳහා පර්යේෂණ  සිදුකොට ඒ ආශ්‍රිත කර්මාන්ත
- මිනිරන්වලින් නිමි භාණ්ඩ නිෂ්පාදනය දිරිගැන්වීම
- අධි කාර්යක්ෂම බැටරි, යකඩ, සිමෙන්ති, ටයර් ආදී නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ දැමීමට ග්‍රැෆීන් යොදාගැනීමේ කර්මාන්ත
- දේශීය අමුද්‍රව්‍ය, යොදාගනිමින් අධි තාක්ෂණික උපකරණ සඳහා අවශ්‍ය සෙරමික් හා පොසිලේන් උපාංග  සැකසීමේ නිෂ්පාදන දිරිගැන්වීම
- මයිකා පෙල්ස්පා වැනි ඛණිජ නිධි අශ්‍රිතව කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය
- කුඩා, මධ්‍ය හා මහා පරිමාණ කැණීම් සඳහා රාජ්‍ය භාගය අය කරනු ලබන රේඛීය ක්‍රමවේදය වෙනුවට ලෝක වෙළඳපොළේ ඛනිජ මිල, කැණීම් කරනු ලබන ප්‍රමාණය හා ඒ සඳහා යන වියදම සලකා රාජ්‍ය භාගය තීරණය කිරීමේ ක්‍රමවේදයක්
- කර්මාන්ත සඳහා උපයෝගීවන සල්ෆියුරික් අම්ල නිෂ්පාදන ආරම්භ කිරීම

## මැණික් හා ස්වර්ණාභරණ

- මැණික් නිධි හඳුනා ගැනීම සඳහා නවීන තාක්ෂණය
- මැණික්වල අගය එකතු කිරීමේ නව තාක්ෂණික සහාය
- ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳපොළක්
- රත්නපුර නගරය ආශ්‍රිතව ජාත්‍යන්තර මැණික් මධ්‍යස්ථානයක්
- පතල් කර්මාන්තයේ හා මැණික් ව්‍යාපාරයේ තිරසර සංවර්ධනය ඉලක්ක කර මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත සඳහා අත්‍යවශ්‍ය යාවත්කාලීන සංශෝධනයන්
- ජාත්‍යන්තර මට්ටමේ මැණික් පර්යේෂණ රසායනාගාර

- මැණික් කර්මාන්තයේ යෙදෙන සියලුම පාර්ශ්වකරුවන් විධිමත්ව ලියාපදිංචි කිරීම හා යාවත්කාලීන දත්ත පද්ධතියක්
- මැණික් පතල් සේවකයන්ගේ ආරක්ෂාව සඳහා ප්‍රමිතීන්
- ජාත්‍යන්තර මැණික් මිල හා ප්‍රමිතීන් පිළිබඳ තොරතුරු දේශීය පතල්කරුවන්ට ලබාදීමේ ක්‍රමවේදයක්
- මැණික් කර්මාන්තයේ යෙදෙන ශ්‍රමිකයන්ගේ ජීවන තත්වය නගාසිටුවීම සඳහා 'මැණික් කර්මාන්ත සේවක සුරක්ෂා අධිකාරිය' පිහිටු වීම
- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සමග සබැඳි රාජ්‍ය ආයතන සියල්ල එකිනෙක නෛතික ලෙස සහ ඩිජිටල් ලෙස සම්බන්ධීකරණය
- මැණික් කර්මාන්තයේ නියැලෙන ශ්‍රමිකයන් මුහුණ දෙන පතල් අනතුරු හේතුවෙන් සිදුවන පූර්ණ ශරීර අකර්මණ්‍ය වීමකදී සහ මරණයකදී සාධාරණ වන්දි මුදලක් ලබාදෙන ක්‍රමයක්
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන ශ්‍රමිකයන් සඳහා දැනට පවතින අරමුදල රාජ්‍ය මැදිහත්වීම යටතේ ක්‍රමවත් කරමින් විශ්‍රාම දීමනාවක් සහිත සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක්
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය හා සම්බන්ධ ක්ෂේත්‍රයන්ට අදාළ අධ්‍යාපන හා වෘත්තිය පාඨමාලාවන් හඳුන්වා දීම සහ එකී පාඨමාලා හැදෑරීම සඳහා පහසුකම්
- සම්ප්‍රදායික මැණික් පතල් කර්මාන්තය සුරක්ෂිත කරමින් මැණික් කර්මාන්තය යාන්ත්‍රීකරණය කිරීම
- දැනට පවත්නා බදු ව්‍යුහය කර්මාන්තය වර්ධනයට බාධාවක් වන බැවින් එය සමාලෝචනය කොට කර්මාන්ත වර්ධනයට හිතකර බදු ක්‍රමයක් හඳුන්වාදීම



# 9

# සුරක්ෂිත බලශක්ති කේන්ද්‍රයක් තිරසර විනිමය ප්‍රභවයක්

ලෝක බලශක්ති ක්ෂේත්‍රය, නිරතුරුව වෙනස් වන පාරිභෝගික අවශ්‍යතා සහ නියාමන රාමු තුළ අනුවර්තනය වෙමින්, තිරසරභාවය සහ නවෝත්පාදනය පෙරදැරි කරගත් පරිවර්තනීය යුගයක් පසුකරමින් පවතී. හරිතාගාර වායු විමෝචනය අඩුකිරීමේ ගෝලීය ඉලක්කත්, ජනන පිරිවැය අඩු කිරීමේ අවශ්‍යතාවයත් නිසා සූර්ය බලය, සුළං බලය, ශක්ති ගබඩා පද්ධති වැනි නවීන බලශක්ති උපක්‍රම ශීඝ්‍ර වර්ධනයක් අත් කරගනිමින් පවතී. තවද හරිත හයිඩ්‍රජන් සහ කුඩා ප්‍රමාණයේ න්‍යෂ්ටික බලාගාර වැනි අහිතකර විමෝචන අවම තාක්ෂණයන්ද ඉදිරියට පැමිණෙමින් තිබේ. බැටරි නිෂ්පාදන පිරිවැය වේගයෙන් අඩුවීමත් සමග ගෝලීය ප්‍රවාහන ක්ෂේත්‍රය වේගයෙන් විද්‍යුත්කරණය වෙමින් පවතී. බලශක්ති පරිභෝජනය සමස්තයක් වශයෙන් විද්‍යුත්කරණය කිරීම ශුන්‍ය විමෝචන ඉලක්ක අත්පත් කර ගැනීමේ උපායමාර්ගයකි.

ගෝලීය බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා පොසිල ඉන්ධන තවදුරටත් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන අතර, එම ඉන්ධන භාවිතයේදී පරිසරයට සිදුවන හානිය අවම කිරීම බල කෙරෙන ගෝලීය කතිකාවතක් නිර්මාණය වී ඇත.

**අනාගත පරම්පරාවන් සඳහා අපගේ පරිසරය ආරක්ෂා කරන අතරම ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳපොළේ සැලකිය යුතු පංගුවක් අත්පත් කරගන්නා මෙහෙයුම උදෙසා, බලශක්තිය දායක කරගැනීමටද  ජාතික ජන බලවේගය අපේක්ෂා කරයි.**

හූ දේශපාලනික ගැටුම් සහ මතභේද තුළ, බලශක්ති සුරක්ෂිතතාව වෙනුවෙන් උපායමාර්ගික බලශක්ති මිශ්‍රණයක් පවත්වා ගැනීමද ඉතා වැදගත් වේ. මෙහිදී පුනර්ජනනීය බලශක්තියට සංක්‍රමණය වීමේ අතරමැදි ප්‍රභවයක් ලෙස ස්වභාවික වායු පිළිබඳ ඉහළ අවධානයක් යොමු වී ඇත. ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) සඳහා වන යටිතල පහසුකම් මෙන්ම නව ස්වභාවික වායු සම්පත් ගවේෂණ සහ නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර ආයෝජනද පුළුල් වෙමින් පවතී.

ගෝලීය ප්‍රවණතාවන් මෙසේ තිබියෙදී, කලාපයේ විදුලි මිල අධික රටවල් අතර ශ්‍රී ලංකාව ඉහළින්ම සිටියි. දශක ගණනක් පුරා සිදු කළ වැරදි ආර්ථික කළමනාකරණය නිසා රට වැටී ඇති ආර්ථික ආගාධයෙන් ගොඩගැනීම සඳහා නිෂ්පාදන ආර්ථිකයක් වෙත පිවිසීමට ඇති ප්‍රධාන බාධකයක් වන්නේ මෙම දැරිය නොහැකි බලශක්ති පිරිවැයයි. විදුලි මිල ඉහළ අගයක පැවතීමට බලපාන ප්‍රධාන සාධකය වන්නේ අධික ලෙස ඛණිජ තෙල් මත යැපීම නිසා ජනන වියදම ඉතා ඉහළ අගයක පැවතීමයි. පැවති රජයන් විසින් අඩු වියදම් බලාගාරවලට නිසි කාලයේ ආයෝජනය කිරීම වෙනුවට තාවකාලික විසඳුම් ලෙස අධික මිලැති ඩීසල් වැනි බලාගාර ඉදිකිරීම මෙයට හේතු වී තිබේ.

ශක්ති ජනන මිශ්‍රණය උපායමාර්ගික ලෙස ක්‍රමයෙන් ඛනිජ තෙල් මත යැපීමෙන් අඩුකොට, පුනර්ජනනීය ප්‍රභව මගින් හරිත ආර්ථිකයකට ගෙන යාම  සහ මූලික ගැටලුවලට විසඳුම් ඉදිරිපත් කරන අතර, මෙරට බලශක්ති පද්ධතිය තරගකාරී, පාරදෘශ්‍ය, පාරිභෝගිකයන් සවිබල ගැන්වූ, නවීන තාක්ෂණයෙන් සන්නද්ධ ක්ෂේත්‍රයක් බවට පත් කිරීම ජාතික ජන බලවේගයේ අරමුණයි. අනාගත පරම්පරාවන් සඳහා අපගේ පරිසරය ආරක්ෂා කරන අතරම ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳපොළේ සැලකිය යුතු පංගුවත් අත්පත් කරගන්නා මෙහෙයුම උදෙසා, බලශක්තිය දායක කරගැනීමටද ජාතික ජන බලවේගය අපේක්ෂා කරයි.



# මූලධර්ම

- බලශක්ති සැපයුම අත්‍යාවශ්‍ය ජාතික සේවාවක්
- තිරසාර හා සුරක්ෂිත බලශක්ති සැපයුම සහ පරිභෝජනය
- බලශක්ති ආර්ථිකයක් තුළින් විදේශ විනිමය

# ක්‍රියාමාර්ග

- ශ්‍රී ලංකාව කලාපයේ අවම විදුලි මිල සහිත රටක් බවට පත් කිරීම සඳහා තරගකාරි ප්‍රසම්පාදන හා මිල කැඳවීම් ක්‍රියාවලිය සක්‍රීය කර, තෙල් මත පදනම් වූ විදුලි ජනනය අඩු මිලැති සූර්ය හා සුළං ප්‍රමුඛ පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු කිරීම
- විදුලි ගාස්තු අයක්‍රමය, ඛනිජ තෙල් හා ගෑස් සඳහා මිල සූත්‍රය, හා මිල සංශෝධන ක්‍රියාවලිය වඩා සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයකට යාවත්කාලීන කිරීම
- බලශක්ති ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක සංකීර්ණ හා අතරමැදි බදු රාශියක් වෙනුවට සරල බදු ක්‍රමයක් හඳුන්වාදීම
- සූර්ය බලය මගින් මෙගාවොට් දෙදාහක් (2,000MW) ක්‍රමිකව ජාතික පද්ධතියට එක්කර ගැනීම
- නව ව්‍යාපාර ආකෘති, අයක්‍රම හා තරගකාරීත්වය තුළින් වහල මත සවි කරන සූර්ය බල පද්ධති හා පාරිභෝගිකයින්ට හිමි ගෘහස්ථ ශක්ති ගබඩා පද්ධති ප්‍රචලිත කිරීම
- සමුපකාර මූලධර්ම මත පදනම් වූ ප්‍රජා බලශක්ති ඒකක ලෙස ජාලගත කුඩා පද්ධති (microgrids) පිහිටුවීම
- සුහුරු ජාලය (smart grid) තුළින් සුනිත්‍ය බලශක්තිය විදුලිබල පද්ධතියට එක් කිරීම සහ සුහුරු ජාලය මගින් පද්ධති පාලනය සඳහා පාරිභෝගිකයාටද (demand response) අවස්ථා ලබා දීම
- සුළං බල විභවය දේශීය හා විදේශීය විදුලිබල වෙළෙඳපොළට නිසි තරගකාරී ආයෝජන ගෙන ඒම
- හරිත හයිඩ්‍රජන් ආර්ථිකයට එකතු කරගැනීමට දේශීය විශ්වවිද්‍යාල හා කර්මාන්ත ක්ෂේත්‍රයේ විද්වතුන් ප්‍රමුඛ කරගත් රජයේ නියෝජිත ආයතනයක් පිහිටුවීම සහ දැනට ලෝකයේ හරිත හයිඩ්‍රජන් තාක්ෂණයෙන් ඉදිරියෙන් සිටින ආයතන සමගින් එක්වී නියමු ව්‍යාපෘතීන් ආරම්භ කිරීම

- සූර්ය බලයෙන් ජලය පොම්ප කොට ගබඩා කරන බලාගාර සහ බැටරි පද්ධති මෙන්ම දෙමුහුන් පද්ධති (hybrid systems) පිහිටුවීමට අදාළ ශක්‍යතා අධ්‍යයන කඩිනම් කිරීම සහ නිසි ආයෝජන කැඳවා ගැනීමට අවශ්‍ය ව්‍යාපාර ආකෘතීන් හඳුන්වා දීම
- දැනට පවතින සහ කටයුතු අරඹා ඇති මෙගාවොට් එක් දහස් පන්සියයක (1,500MW) තාප විදුලි බලාගාර ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාර බවට පරිවර්තනය කිරීම
- ප්‍රතිලාභ බලශක්ති ක්ෂේත්‍රය තුළ නැවත ආයෝජනය කිරීම දිරිමත් වෙන පරිදි හා විදුලි පාරිභෝගිකයන්ට අවාසි නොවන ලෙස කුඩා ජලවිදුලි බලාගාර ගිවිසුම් අලුත් කිරීම
- ජල විදුලිබලාගාර ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශවල වන ආවරණය වැඩි කිරීම
- දියුණුවෙමින් පවතින කුඩා න්‍යෂ්ටික බලාගාර තාක්ෂණය (SMR Technology) ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට සහ අදාළ මානව සහ භෞතික සම්පත් සංවර්ධනය කිරීමට එම තාක්ෂණයේ ප්‍රමුඛ රටවල් සහ ආයතන සමග අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම
- සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීම හෝ නව පිරිපහදුවක් ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන කටයුතු කඩිනම් කිරීම
- පිරිපහදු අතුරුඵල අමුද්‍රව්‍ය ලෙස භාවිත කරමින් වෙනත් කර්මාන්ත හා රසායනික නිෂ්පාදනවලට යෙදවීම හා ඉහළ නිපුණතා ඇති විදේශ රැකියා අවස්ථා සඳහා මානව සම්පත් පුහුණු මධ්‍යස්ථානයක් ඇති කිරීමට පිරිපහදුව දායක කරගැනීම
- ත්‍රිකුණාමලයේ ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් මෙතෙක් එළඹ ඇති ගිවිසුම් නැවත සලකා බලන අතර තෙල් සංස්ථාව සතු ටැංකි විසිහතර (24) සහ හවුල් සමාගම සතු ටැංකි හැට එක (61) සඳහා ජාතික ආර්ථිකයට වාසිදායක ව්‍යාපාර ආකෘතියක් සැකසීම
- අඛණ්ඩ සැපයුමක් සහතික කෙරෙන පරිදි ඉන්ධන ගබඩා හා බෙදාහැරීම් දුම්රිය පද්ධතිය නවීකරණය කිරීම
- දැනට අබලන්ව පවතින කොළඹ වරාය හා කොළොන්නාව පර්යන්තය අතර නළ පද්ධතිය ඛනිජ තෙල් නිෂ්පාදන වෙන්වෙන්ව ගොඩබෑමට හා පැටවීමට හැකිවන පරිදි පෙට්‍රෝලියම් පර්යන්ත සමාගමේ (CPSTL) ආයෝජනයක් ලෙස නවීකරණය කිරීම
- මන්නාරම් සහ කාවේරි ද්‍රෝණියේ දැනට සිදුකෙරී ඇති ගවේෂණවලින් හඳුනාගෙන ඇති ස්වභාවික වායු ඇතුළු ඛනිජ ඉන්ධන සම්පත උකහා ගැනීමට අදාළ කැණීම් හා නව ගවේෂණ ගිවිසුම්වලට කඩිනමින් එළඹීමට කටයුතු කිරීම

- ඉන්ධන තොග සහ ජලාශවල ජල මට්ටම් පිළිබඳ පූර්ව ඇගයීම් හා අවදානම් කළමනාකරණය සඳහා වන නවීන තාක්ෂණ මෙවලම් භාවිතයෙන් ලබා ගන්නා තොරතුරු භාවිතා කර බලශක්තිය සැපයීම අඛණ්ඩව පවත්වාගෙන යාමට පියවර ගැනීම
- 2050 වසර වන විට ශුන්‍ය විමෝචන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට ශ්‍රී ලංකාවේ කැපවීම තහවුරු කරමින් දැනට එළැඹී ඇති දුර්වල කෙටිකාලීන පාරිසරික ඉලක්ක පිළිබඳ වගන්ති යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම
- විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය තුළ අනිවාර්යයෙන් සිදුවිය යුතු ප්‍රතිව්‍යුහගත කිරීම්, අදාළ පාර්ශ්වකරුවන් සහ මහජන මත විමසීම් මත සහ විශේෂඥ නිර්දේශ මත සිදුකිරීම
- දීර්ඝ කාලීන බලශක්ති සැපයුම් සැලසුමකට අනුව ජනන සහ සම්ප්‍රේෂණ ව්‍යාපෘති සඳහා රාජ්‍ය, පෞද්ගලික හා ගෝලීය ආයෝජන කැඳවා ගැනීමට, පහසුකම් සැලසීමට, අවදානම් කළමනාකරණයට සහ ප්‍රගතිය සමාලෝචනය කිරීමට විශේෂ කාර්යංශයක්
- විදුලිබල පද්ධතියේ සිදුවන තාක්ෂණික හානි සහ ආයතන කළමනාකරණ මට්ටමින් සිදුවන පාඩු අවම කර ගැනීමට මහජන උපයෝගීතා කොමිසම මගින් අවශ්‍ය පියවර ගැනීම
- මාසික විදුලි පරිභෝජනය ඒකක 60ට අඩු ගෘහස්ථ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා නව විදුලි සබඳතා ලබා ගැනීමට හෝ විසන්ධි කළ සබඳතා යළි ලබා ගැනීමට වැයවන මූලික පිරිවැය එකවර ගෙවීම වෙනුවට කොටස් වශයෙන් ගෙවීම සඳහා මාසිකව බිල්පතට එකතු කිරීම
- රජයේ පාසැල්, රෝහල් හා ආගමික ස්ථාන සඳහා සූර්යබල පද්ධති සහිතව බලශක්ති සංරක්ෂණය දිරිමත් කෙරෙන ක්‍රමවේදයක්
- ඛනිජතෙල් මත යැපෙන ප්‍රවාහන පද්ධතිය පිරිසිදු හා හරිත බලශක්තිය වෙත ක්‍රමානුකූලව පරිවර්තනය කිරීමට පියවර
- විද්‍යුත් රථවාහන ආරෝපණය සඳහා දිවයින පුරා බැටරි ආරෝපණ මධ්‍යස්ථාන ජාලයක් පිහිටුවීම
- ගෝලීය පර්යේෂණ සහ වෙළෙඳපොළ දත්ත මත පදනම්ව බලශක්තියට අදාළ ආයෝජන, වෙළෙඳාම, අනාගත ප්‍රවණතා හා දිශානතීන් පිළිබඳව උපදෙස් ලබාදීම සඳහා කාර්යංශයක් පිහිටුවීම
- ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සහ බලශක්ති ජාත්‍යන්තර වෙළඳාම් කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් (Energy Trading Hub) ලංකාව තුළ ස්ථාපිත කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම

- බලශක්ති ප්‍රසම්පාදනය පාරදෘශ්‍ය තරගකාරී ටෙන්ඩර් කැඳවීම සඳහා නවීන ඩිජිටල් තාක්ෂණය සහිත කාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රමවේදයක්
- ඉන්ධන ආනයනය, විදුලි ජනනය, බලාගාර ඇතුළු සැපයුම්කරුවන්ට නොපමාව ගෙවීම් කිරීම, සමාජ ආරක්ෂණ වැඩසටහන්වලට අදාළ සහන පාරිභෝගිකයින්ට ඍජුවම ලබාදීම, දිරි ගැන්වීමේ වැඩසටහන්වල ප්‍රතිලාභ පාරිභෝගිකයින්ට ලබාදීම ආදී බලශක්ති ක්ෂේත්‍රයේ සියලු ගනුදෙනු බැංකු පද්ධතිය හා සම්බන්ධ කළ ඩිජිටල් වේදිකාවක් මගින් සිදු කිරීම
- කර්මාන්තවල හා වාණිජ ආයතනවල බලශක්ති සංරක්ෂණය කරමින් ජාතික ආර්ථිකයට සාධනීයව දක්වන දායකත්වය දිරිමත් කිරීම
- විශාල වශයෙන් බලශක්තිය පරිභෝජනය කරන කාර්මික හා වාණිජ පාරිභෝගිකයින්ගේ බලශක්ති විගණනය අනිවාර්ය කිරීම සහ කාර්මික උපකරණවල සහ නව ගොඩනැගිලිවල බලශක්ති සංරක්ෂණ පිරිවිතරයන් නිර්දේශ කිරීම
- අවම හරිතාගාර වායු විමෝචනයක් සහිතව අපනයනය සඳහා නිෂ්පාදන කරන දේශීය කර්මාන්ත සඳහා පුනර්ජනනීය බලශක්ති සහතික නිකුත් කිරීම
- විදුලිබල මණ්ඩලය සහ තෙල් පිරිපහදුව සතු පුහුණු කිරීමේ අංශ, විශ්වවිද්‍යාල සහ කාර්මික විද්‍යාල අනුබද්ධව බලශක්ති ක්ෂේත්‍රයේ ඉහළ අදායම් ලැබෙන දේශීය හා විදේශීය රැකියා සඳහා කාර්මික පුහුණු වැඩසටහන්
- පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී උසස් අධ්‍යාපන ආයතන, බලශක්ති ක්ෂේත්‍රයේ කර්මාන්ත සහ උපයෝගීතා ආයතන අතර ඵලදායී සහයෝගිතාවන් ගොඩනැගීම
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලට ආයෝජන කැඳවීමේදී දේශීය සමාගම්වලටද අවස්ථාව ලැබෙන පරිදි කටයුතු කිරීම
- දේශීය සමාගම් ජාත්‍යන්තර හවුල්කරුවන් සමග එක්වී ක්ෂේත්‍රයට අවශ්‍ය ප්‍රාග්ධනය සහ තාක්ෂණය ආකර්ෂණය කරගැනීම දිරිමත් කිරීම
- දේශීය සමාගම්වලට ජාත්‍යන්තර වෙළඳපොළේ ගනුදෙනු කිරීමට රාජ්‍යතාන්ත්‍රික සහයෝගය ලබා දීම




# මහජන ප්‍රවාහන සේවාවක්

# කාර්යක්ෂම ගමනාන්තයක්

අවිධිමත් සහ අකාර්යක්ෂම ප්‍රවාහනය රටේ සාතිශය බහුතර ජනතාවකගේ ජීවිත කාලයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අපතේ හැර ඇත. අධික තදබදය, වැඩි කාලයක් මහ මග ගත කිරීමට සිදුවීම, රාත්‍රී කාලයේ ප්‍රවාහන සේවා ක්‍රියාත්මක නොවීම, මාර්ග අනතුරු සහ පොදු සේවාවන්හිදී කාන්තාවන් සහ ළමයින් මුහුණ දෙන ලිංගික සහ අනෙකුත් හිංසනයන් මගී ප්‍රවාහනයේදී දක්නට ලැබෙන සුලභ සිදුවීම්ය. වාර්ෂිකව මාර්ග අනතුරු 30,000ක් පමණ වාර්තා වීම ප්‍රවාහන ක්ෂේත්‍රයේ අනාරක්ෂිතභාවය සහ එහි තීව්‍රතාව පසක් කර දෙයි. ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ දුම්රිය සේවයේ දායකත්වය 5%ක පමණ ඉතා පහළ අගයක් දක්වා බිඳ වැටී ඇත. බස් මගී සේවාවෙන් ලංකා ගමනාගමන මණ්ඩලයේ පංගුව 14%කට අඩුවී ඇත. පොදු ප්‍රවාහනය බිඳවැටීම හේතුකොට ගෙන ජනතාවගෙන් 55%ක් පමණ පෞද්ගලික රථ වාහන මගින් ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර ගැනීමට යොමු වී ඇති අතර, ඔවුන්ට තම ආදායමෙන් විශාල කොටසක් ප්‍රවාහනය වෙනුවෙන් වැය කිරීමට සිදුව ඇත. එමගින් අධික මාර්ග තදබදයක්ද නිර්මාණය කර ඇත.

රටේ සමස්ත මාර්ග ජාලය වන කි.මී. 119,382න් කි.මී. 88,200ක්ම අයත් වනුයේ පළාත්පාලන ආයතනවලට වන අතර බොහොමයක් ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රදේශවල මාර්ග නිසි නඩත්තුවක් නොමැති බැවින් අබලන් තත්වයට පත්වී තිබේ. ඉන්ධන ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් පිටතට ඇදී යන අතර, රටේ දහනය කරන ඉන්ධනවලින් 65%ක් පමණම වැය වන්නේ ප්‍රවාහන ක්ෂේත්‍රටයි. ඒ ඔස්සේ සමස්ත වායු දූෂණයෙන් හරි අඩකට දායකත්වය සපයයි. එමෙන්ම අනාරක්ෂිත ප්‍රවාහනයේදී එළවළු සහ පලතුරු 30%ක් පමණ අපතේ යයි.

මෙම තත්වයට විසඳුම් ලෙස පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් දක්වා ක්‍රමිකව පරිවර්තනය වීමේ දැක්මක් සහිත කාර්යක්ෂම, විශ්වසනීය, ආරක්ෂාකාරී සහ ගෞරවාන්විත ජනතාවාදී ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීම ජාතික ජන බලවේගයේ අපේක්ෂාවයි. ඒ අනුව ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවයන්ගෙන් 70%ක් වසර පහකදී පොදු ප්‍රවාහන සේවා මගින් සැපයීම ඉලක්කයයි.



## මූලධර්ම

- ප්‍රවාහනය මහජන සේවාවක්
- පරිසර හිතකාමී හා තිරසර ප්‍රවාහන සේවාවක්
- ආරක්ෂිත සහ කාර්යක්ෂම ප්‍රවාහන සේවයක්
- මගී සංයුතියෙහි විවිධත්වය
- ප්‍රවාහන මාධ්‍ය අතර අන්තර් සම්බන්ධීකරණය

## ක්‍රියාමාර්ග

### දුම්රිය සේවය

- අබලන් තත්වයේ පවතින දුම්රිය මාර්ග නවීකරණය කර, විධිමත් නඩත්තු වැඩපිළිවෙළක් හඳුන්වා දී නවීන තාක්ෂණයෙන් යුත් ස්වයංක්‍රීය සංඥා පද්ධති ස්ථාපනය
- අවශ්‍යතා පදනමින් ක්‍රමානුකූලව ප්‍රධාන දුම්රිය මාර්ග මංතීරු දෙකේ මාර්ග ලෙසටත්, ප්‍රධාන නගර ආශ්‍රිතව මංතීරු තුනේ මාර්ග ලෙසත් වැඩිදියුණු කිරීම
- ප්‍රමුඛතා පදනමින් ක්‍රමානුකූලව දැනට දුම්රිය මාර්ග ජාලය මගින් ආවරණය නොවන ප්‍රදේශ දක්වා දුම්රිය මාර්ග දීර්ඝ කර සෑම ප්‍රධාන නගරයකටම දුම්රිය සේවා සැපයීම
- දුම්රිය මැදිරි වැඩිපුර යෙදවීම හා දුම්රිය ගමන් වාර වැඩිකිරීමෙන් උදෑසන සිට මධ්‍යම රාත්‍රිය දක්වා කාර්යක්ෂම දුම්රිය සේවාවක්
- ක්‍රමානුකූලව දුම්රිය පද්ධතිය විදුලිබලයෙන් ක්‍රියාත්මක කෙරෙන දුම්රිය දක්වා වැඩි දියුණු කිරීම
- නිෂ්පාදන අමුද්‍රව්‍යද, පාරිභෝගික භාණ්ඩ මෙන්ම ගොවි සහ ධීවර නිෂ්පාදනද ආරක්ෂාකාරීව ප්‍රවාහනය සඳහා දුම්රිය සේවය කාර්යක්ෂම ලෙස භාවිත කිරීම
- මගී ජනතාව භාවිත කරන පුද්ගලික වාහන නවතා තැබීම සඳහා දුම්රියපොළ ආසන්නයේ නැවතුම් පහසුකම්
- තදාසන්න ප්‍රදේශවල පොදු ප්‍රවාහනය ශක්තිමත් කිරීම සඳහා වන Monorail හා Light Railway Transport වැනි ක්‍රමවේදයන් දුම්රිය හා බස්රිය සේවා වැඩිදියුණු කිරීමේ යෝජනාවන්ට ප්‍රමුඛතාවය දෙමින් ක්‍රමානුකූලව හඳුන්වාදීම

### බස් මගී සේවාව

- මගී ගමනාගමනය සඳහාම නිෂ්පාදිත හා පහසුකම් සහිත බස්රථ හඳුන්වා දී එම බස් රථ මිලදී ගැනීම සඳහා පහසු මූල්‍ය යෝජනා ක්‍රමයක්

- ප්‍රධාන මාර්ගවල හා වර්තමානයේ මගී බස් ප්‍රවාහනය බිඳ වැටී තිබෙන අර්ධ නාගරික හා ග්‍රාමීය මාර්ගවල මෙන්ම රාත්‍රී කාලයේ ප්‍රවාහනයද විධිමත් කරමින් ශක්තිමත් බස් මගී සේවාවක්
- නවීන ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් බස් රථවලින් ලැබෙන සියලු ආදායම් සාධාරණ ලෙස බස් හිමියන් අතර බෙදීයන පරිදි නිර්ණය කරනු ලබන පොදු ප්‍රවාහන කලාප සඳහා ක්‍රමානුකූලව රාජ්‍ය සහ පෞද්ගලික බස් සේවා ඒකාබද්ධ කරමින් ස්ථාපනය කෙරෙන පොකුරු බස් සමාගම්
- සියලු බස් රථවල ඩිජිටල් වේදිකාවක් ඔස්සේ පෙරගෙවුම් කාඩ්පත් මගින් ගෙවීම් කරන පොස් (pos) ටිකට් යන්ත්‍ර
- තදාසන්න ප්‍රදේශවල බස් මංතීරු වෙන්කිරීම හා ක්‍රමානුකූලව මගී ප්‍රවාහනයට ප්‍රමුඛතාවය ලබාදෙන Bus Rapid Transit (BRT) ක්‍රම
- ක්‍රමානුකූලව පොදු ප්‍රවාහනය සඳහා විදුලි බලයෙන් ක්‍රියාත්මක කෙරෙන බස් රථ භාවිතය
- මගියාට ගෞරවනීය ලෙස කිසිදු ආකාරයක හිංසනයකින් තොරව බස් රථයේ ගමන් කළ හැකි පසුබිමක් නිර්මාණය කිරීමට අවශ්‍ය ආකල්පමය වෙනසක් සඳහා මගීන් සහ සේවකයින් දැනුවත් කිරීම සහ පුහුණු කිරීම
- මගී ජනතාව භාවිත කරන පුද්ගලික වාහන නවතා තැබීම සඳහා බස් නැවතුම් ආසන්නයේ වාහන නැවතුම් පහසුකම්

## විධිමත් සහ අනිවාර්ය කාලසටහන් ක්‍රමයක්

- දුම්රිය සේවය සඳහා මෙන්ම බස් මගී සේවය සඳහාද අනිවාර්ය කාලසටහන් ක්‍රමයක්
- උදෑසන සිට මධ්‍යම රාත්‍රිය දක්වාම කාලසටහනකට අනුව ක්‍රියාත්මකවන අනිවාර්ය පොදු ප්‍රවාහන සේවය
- ඩිජිටල්කරණය කළ කාලසටහන් අන්තර්ජාලයේ ස්ථාපනය කෙරෙන අතර දුම්රිය හා බස් නැවතුම්පොළවල ධාවන කාලසටහන් ප්‍රදර්ශනය කර එම කාලසටහන්වලට අනුවම ධාවනය
- මගී ජනතාවට මාර්ගගත ක්‍රමයට දුරගමන් සේවාවන්හිදී කල් ඇතිව ආසන වෙන් කරගැනීමට අවස්ථා

## මගී හුවමාරු නගර (Transit Cities)

- තදාසන්න ප්‍රදේශවලට දුර පළාත්වලින් පැමිණෙන මගීන්ට බස් නැවතුම්පොළ සහ දුම්රිය නැවතුම්පොළ එකම ස්ථානයක පිහිටි මගී හුවමාරු නගර
- හුවමාරු නගරවල සිට ප්‍රධාන නගර වෙත කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවා

- නුවරඑළිය නගරවල ආරක්ෂා සහිත මෝටර් රථ ගාල් සහ අනෙකුත් පොදු පහසුකම්

## ග්‍රාමීය ප්‍රවාහනය

- දැනට පොදු ප්‍රවාහන සේවා නොමැති ග්‍රාමීය ප්‍රදේශවලට පොදු බස් සේවාවන්
- ග්‍රාමීය මාර්ගවල බස් සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාමට, අවශ්‍ය අවස්ථාවලදී විශේෂ දිරිගැන්වීම්
- ග්‍රාමීය ජනතාවගේ නිෂ්පාදන ආරක්ෂාකාරීව ප්‍රවාහනය සඳහා සුදුසු තාක්ෂණය සහිත භාණ්ඩ ප්‍රවාහන සේවාවන්

## මාර්ග

- කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු ග්‍රාමීය හා වතු ආශ්‍රිත මාර්ග හඳුනාගෙන ප්‍රමුඛතා ලේඛනයක් සකසා එම ප්‍රමුඛතා ලේඛනය අනුව මාර්ග ප්‍රතිසංස්කරණය කර තිරසාරව නඩත්තු කිරීම
- මධ්‍යම රජයේ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ නඩත්තු වන අධිවේගී මාර්ග (E) මහාමාර්ග (A,B) සහ පළාත් මාර්ග (C,D) සියල්ලම කාලානුරූපව (Periodically) නිසිපරිදි නඩත්තු කර පවත්වාගෙන යෑම
- දැනට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර අතහැර දමා තිබෙන මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත සිට මීරිගම දක්වා වූ ඉතිරි කොටස මතුවී තිබෙන ගැටලු නිරාකරණය කර වැඩ අවසන් කිරීම

## පාපැදි භාවිතය දිරිමත් කිරීම

- මාර්ග තදබදය ඇති ප්‍රධාන නගර තුළ හා ප්‍රධාන නගර අවට ප්‍රදේශවල සිට එම ප්‍රධාන නගර දක්වා ආරක්ෂාකාරී පාපැදි මංතීරු ඉදි කිරීම
- අලුතින් ඉදිකරනු ලබන මාර්ගවල හැකි සෑම අවස්ථාවකදීම පාපැදි භාවිතයට හිතකර යටිතල පහසුකම්
- ප්‍රධාන දුම්රිය ස්ථාන, ප්‍රධාන බස් නැවතුම් හා ආයතන ඇතුළු පොදු ස්ථානවල පාපැදි නැවතුම් පහසුකම්

## පදික මංතීරු

- ප්‍රධාන නගරවල මාර්ග දෙපස පදික මංතීරු ඉදි කිරීම
- මාර්ගය දෙපස පදිකයින්ට සෙවණ ලබාදෙන වන රෝපණය

## භාණ්ඩ හා මගී ප්‍රවාහනය සඳහා ජල මාර්ග භාවිතය

- ජල මාර්ග ප්‍රවාහනය පර්යේෂණ සහ ප්‍රවර්ධනය සඳහා තාක්ෂණික ඒකකයක්
- ශක්‍යතා අධ්‍යනවලින් හඳුනාගනු ලබන ජල මාර්ගවල මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා

## කාන්තා වැඩිහිටි හා ආබාධ සහිත මගීන්ගේ ආරක්ෂාව සහ යටිතල පහසුකම්

- කාන්තාවන්ගේ, වැඩිහිටි සහ ආබාධ සහිත ප්‍රජාවගේ සුවිශේෂී ප්‍රවාහන අවශ්‍යතා පිළිබඳව ප්‍රජාව තුළ ආකල්පමය සංවර්ධනයක්
- ප්‍රවාහන සේවාවන්හිදී කාන්තාවන් මුහුණදෙන හිංසන සහ ගැටලු ක්ෂණිකව දැනුවත් කිරීමට යෙදවුම් මෘදුකාංගයක් සහ ඒ වෙනුවෙන් ක්‍රියාත්මකවන විශේෂ ඒකකයක්
- දුම්රිය සහ බස් රථවල ආබාධ සහිත ප්‍රජාවට සහ වැඩිහිටි පුද්ගලයින්ට විශේෂ ප්‍රවේශ පහසුකම්
- දුම්රිය ස්ථාන සහ බස් නැවතුම්පොළවල් ආබාධ සහිත සහ වැඩිහිටි ප්‍රජාවට පහසු වන පරිදි නවීකරණය
- පොදු ප්‍රවාහන රථවල වැඩිහිටි සහ ආබාධ සහිත ප්‍රජාවට ප්‍රමුඛතාවය ලබාදෙන ආසන වෙන්කිරීම අනිවාර්යය කිරීම

## මාර්ග අනතුරු අවම කිරීම

- මාර්ග අනතුරු කෙරෙහි බලපාන යටිතල පහසුකම් වැඩිදියුණු කර, සියලුම රියදුරන් සහ ධාවකයින් (Drivers and Riders) විනයානුකූල ධාවනයට යොමු කරමින් මාර්ග නීති පිළිපැදීම අනිවාර්ය කිරීම
- රියදුරු බලපත් ලබාදීමේ සහ බලපත් අලුත් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම

## පැරා-සංක්‍රමණ මෙහෙයුම් (Para-transit operations)

- ත්‍රීරෝද රථ සේවාව සහ කාර්ය මණ්ඩල, පාසැල් ළමුන් ප්‍රවාහනයද ඇතුළත් අනෙකුත් කුලී රථ සේවාවන් විධිමත් කර ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් බවට පත්කිරීම
- පැරා - සංක්‍රමණ ප්‍රවාහන සේවා සඳහා ඩිජිටල් ජංගම දුරකථන යෙදවුමක්

## මගීන් සහ ප්‍රතිලාභීන් සංවිධානය

- රජය විසින් මගී සංවිධාන අදාළ ක්ෂේත්‍රයේ මගී නියෝජිතයින් ලෙස පිළිගනිමින් ඔවුන් තීරණ ගැනීමේ පාර්ශ්වකරුවන් ලෙස සහභාගි කර ගැනීම
- ප්‍රවාහන යටිතල පහසුකම් (මාර්ග,පාලම් ආදිය) සැකසීමේ දී හා නඩත්තු කටයුතු සිදුකිරීමේදී අදාළ ප්‍රදේශයේ ජනතාව එම ක්‍රියාකාරකම් ඇගයීමේ සහ විගණන කටයුතු සඳහා සක්‍රීයව සහභාගි කර ගැනීම

# තිරසර සමුද්‍ර සම්පතක්

## ගෝලීය සමුද්‍ර ව්‍යාපාරයෙන් පංගුවක්

ශ්‍රී ලංකාව, ලෝකයේ නැගෙනහිර සහ බටහිර යා කෙරෙන ප්‍රධාන මුහුදු මාර්ග මුණගැසෙන උපායමාර්ගික සන්ධිස්ථානයක ස්ථානගත වී තිබීම හේතුකොට ගෙන, ගෝලීය නාවික ක්ෂේත්‍රයේ විශාල භූමිකාවක් නිරූපණය කරනු ලබයි. අපේ රට අසළින් යාත්‍රා කරන නෞකා මගින් නැව් භාණ්ඩ ටොන් ලක්ෂ ගණනක් වාර්ෂිකව ප්‍රවාහනය කෙරේ. කොළඹ වරාය, මෙම නාවික ගමනාගමනය හැසිරවීම සඳහා උචිතම ස්ථානයක පිහිටා තිබෙන අතර, දකුණේ පිහිටි වරායක් වන හම්බන්තොට, ක්‍රියාත්මක වන්නේ එහි ධාරිතාවයට වඩා බොහෝ අඩු මට්ටමකිනි. මේ අනුව යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම සහ තරගකාරීව සේවා සැපයීම මගින්, ශ්‍රී ලංකාවට ගෝලීය සමුද්‍ර ව්‍යාපාරයේ සැලකිය යුතු කොටසක් ආකර්ෂණය කර ගනිමින් කොළඹ සහ හම්බන්තොට ලෝකයේ විශාලම නෞකා මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව පවතී. කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය වැනි ප්‍රධාන වරායන්, රටේ වෙළඳාම හා ආර්ථික වර්ධනය සඳහා විශාල දායකත්වයක් දක්වන අතර, රටේ වෙළඳපොළෙහි විශාල පරාසයක් කෙරෙහි බලපෑම් කරයි.

ශ්‍රී ලංකාවේ නාවිකයින් ඔවුන්ගේ විශිෂ්ටත්වය, දක්ෂතාව සහ කාර්යසාධනය පිළිබඳ ලෝකයේ ප්‍රසිද්ධියක් උසුලන අතර, ඔවුන් අපගේ නාවික ක්ෂේත්‍රයේ ප්‍රධානතම සම්පතකි. ශ්‍රී ලාංකේය වෘත්තීය නාවුකයින් සංඛ්‍යාව වර්ධනය කිරීම මගින්, විදේශ විනිමය ඉපැයීම් වැඩි කිරීමට මෙන්ම රටේ තරුණ තරුණියන්ට ඉහළ ප්‍රතිලාභ සහිත රැකියා අවස්ථා නිර්මාණය කිරීමට සැලකිය යුතු විභවයක් තිබේ. අප ඉදිරිපත් කරන මෙම ප්‍රතිපත්ති රාමුව ගෝලීය නාවුක ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයට ශ්‍රී ලංකාව ගෙන ඒම සඳහා, වරාය, නාවික සමාගම්, සහ විශේෂඥයින් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන්ගේ දායකත්වය, කර්මාන්තයේ වර්ධනයට සහ සංවර්ධනයට සමතුලිත ප්‍රවේශයක් සහතික කරයි. ඒ අනුව උපායමාර්ගික ලෙස අපේ රට ඉන්දියන් සාගරයේ පිහිටීම, සැපයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ලෝක මට්ටමේ සමුද්‍ර ශ්‍රම බලකායක් ගොඩනැගීම තුළින් ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධාන නාවික මධ්‍යස්ථානයක් බවට පත් කිරීම අපගේ අපේක්ෂාවයි.



# මූලධර්ම

- සමුද්‍ර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා ඒකාබද්ධ සාගර පාලනය
- සමුද්‍රීය පරිසරය සහ සම්පත්වල රැකවරණ සහ වගවීම
- පොදු සමුද්‍ර සම්පත් වෙත ප්‍රවේශ වීම හෝ ඒවා පුද්ගලික ලාභය සඳහා භාවිත කිරීම පරිශීලක ගෙවීම් මත
- සමුද්‍ර පාලනය සහ පරිපාලන තීරණ ගැනීමේදී පූර්වාරක්ෂාව ප්‍රවේශය
- සාගර සහ වෙරළබඩ ප්‍රදේශ සහ ඒවායේ සම්පත් සැලසුම් කිරීම, භාවිතය සහ සංරක්ෂණය කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වය
- සමුද්‍ර සම්පත්හි ප්‍රතිලාභ සාධාරණ ලෙස ජනතාව වෙත බෙදී යාම

# ක්‍රියාමාර්ග

## නාවිකයින් පුහුණුව

- ප්‍රාථමික සහ වෘත්තීය නාවික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම පුළුල් කිරීම
- වෘත්තීය නිපුණතා වැඩිදියුණු කිරීම සහ අදාළ සහතික ලබා ගැනීම පහසු කිරීම
- ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ (IMO) අවශ්‍යතාවය සැපිරීම සඳහා අවශ වන විෂය නිර්දේශයන් සමාලෝචනය සහ සංශෝධනය කිරීම සඳහා ව්‍යුහගත ක්‍රියාවලියක්
- අමාත්‍යාංශ විභාග අංශය තත්ව කළමනාකරණ පද්ධතියට (QMS) අනුකූළ ලෙස කටයුතු කිරීම සහතික කිරීම සඳහා තෙවන පාර්ශ්වීය ඇගයීම් කමිටුවක් පත් කිරීම
- කාර්මික පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම
- ජාත්‍යන්තර වෙළඳපොලේ නව වෘත්තීය අවස්ථා සඳහා ප්‍රවේශය පුළුල් කිරීම
- නාවික සුභසාධනය සහ ආචාරධර්ම සුරැකීම සහ වැඩිදියුණු කිරීම

## වරාය යටිතල පහසුකම් සහ අනෙකුත් සේවා

- වරාය ව්‍යාප්තිය, නඩත්තු, දත්ත ගබඩා, නිෂ්පාදන ක්‍රියාවලීන්, ජාතික නැව්, යටිතල පහසුකම්, අංගනය සහ ක්‍රියාකාරිත්වයන් පුළුල් කිරීම
- නාවික කාර්මික සේවා සහ නඩත්තු, මෙහෙයුම්, නියෝජිතයන්, සැපයුම් ජාලය, විශේෂ කාර්මික සේවා, බැංකු, නැව් ප්‍රතිචක්‍රීකරණය සහ නැව් සඳහා සේවා සැපයීම ආදිය වැඩිදියුණු කිරීම

- සංචාරක ක්ෂේත්‍රය සමග නාවුක ක්ෂේත්‍රය ඒකාබද්ධ කිරීම

## නාවුක නීති, පාරිසරික ආරක්ෂණය සහ පරිපාලනය

- නෞකා ලියාපදිංචිය සම්බන්ධයෙන් පවතින නීති සමාලෝචනය හා සංශෝධනය
- ඵලදායී සහ සුපරීක්ෂාකාරී වරාය පාලන පරීක්ෂණ (PSC) පද්ධතියක්
- ඉලක්ක පදනම් කරගත් විනිවිද පෙනෙන PSC සේවාවක්
- නාවික දූෂණය වැළැක්වීමේ ජාත්‍යන්තර සම්මුතිය (MARPOL) සහ අනෙකුත් පාරිසරික ආරක්ෂණ නීති ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාව තුළ නාවික  ආරක්ෂණය පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීම



# ආරක්ෂක දත්ත පද්ධතියක්

# සන්නිවේදන තාක්ෂණ විප්ලවයක්

ගෝලීය විදුලි සංදේශ ක්ෂේත්‍රය නව තාක්ෂණයන් සහ ව්‍යාපාරික ආකෘතීන් සමඟින් විශාල පරිවර්තනයකට භාජනය වෙමින් පවතී. පස්වන පරම්පරාවේ (5G) රැහැන් රහිත සන්නිවේදනය, වලාකුළු පරිගණකකරණය, විමධ්‍යගත ටෙලිකොම් ජාල, අථත්‍ය ජාල සේවා සහ කෘත්‍රිම බුද්ධිය (AI) පාරිභෝගිකයින් සඳහා නව්‍ය සේවාවන් ලබා දෙයි. ගෝලීය ප්‍රවණතාවයන් එසේ තිබියෙදී එම වේගයෙන්ම විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව්‍ය තාක්ෂණය අත්පත් කරගැනීමට ශ්‍රී ලංකාව අසමත් වී සිටී. එමෙන්ම විදුලි සංදේශ සේවාවන්හි අධික මිල ගෘහස්ථ පාරිභොගිකයන්ට මෙන්ම එම සේවාවන් යෙදුම් ලෙස පවතින කර්මාන්තවලටද අහිතකර ලෙස බලපා ඇත.

මෙම ප්‍රතිපත්ති රාමුවෙන්  රැහැන් ගත සන්නිවේදන කර්මාන්තය, රැහැන් රහිත සන්නිවේදන කර්මාන්තය, විකාශන කර්මාන්තය, සිනමාව සහ විනෝදාස්වාද ආදී සන්නිවේදන ක්ෂේත්‍රයේ සියලු වපසරියන් ආවරණය වන ජාතික ජන බලවේගයේ විදුලි සංදේශ ප්‍රතිපත්ති රාමුව නව්‍ය තාක්ෂණය ඉක්මනින් අත්කරගන්නා, ආරක්ෂිත, පරිශීලක මිත්‍රශීලී සහ සාධාරණ මිලැති තිරසාර විදුලි සංදේශ ක්ෂේත්‍රයක් යෝජනා කෙරේ.



# මූලධර්ම

- සියලු පුරවැසියන් සඳහා සන්නිවේදන සම්බන්ධතා
- තොරතුරු සහ දත්ත වෙත පහසු ප්‍රවේශය
- සාධාරණ මිල
- ජාතික සහ පුද්ගලික දත්ත ආරක්ෂාව
- සයිබර් ආරක්ෂාව සහ දත්ත පෞද්ගලිකත්වය
- හරිත යටිතල පහසුකම්

# ක්‍රියාමාර්ග

## රැහැන් ගත සන්නිවේදනය

- යටිතල පහසුකම් සහ දුරකථන ග්‍රාහක අංකය, සේවා සපයන ආයතන අතරෙහි හුවමාරු කරගත හැකි වන පරිදී ජාතික උපායමාර්යකට අනුකූලව ජාතික සන්නිවේදන ජාලය ගොඩනැංවීම සහ අන්තර්ග්‍රහණය
- සේවා සපයන්නාගේ සිට ග්‍රාකයා දක්වා වූ access networkහි සියලුම වගකීම් සහ මෙහෙයුම් කටයුතු ප්‍රාදේශීය පරිපාලන ඒකක වෙතින්
- මහජනතාවට අන්තර්ජාලය වෙත ප්‍රවේශ විය හැකි පොදු ප්‍රවේශතා ලක්ෂ්‍ය ගණන වැඩිකිරීම
- විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ ජාලය සමග එක්ව ජාතික රැහැන් පද්ධතියක් (Centralized backbone network) ඉදිකිරීම සහ ග්‍රාමීය ප්‍රදේශ සඳහා සන්නිවේදන පහසුකම් පුළුල් කිරීම
- මහජන දත්ත පද්ධතිය සමග (CIVIC registration) දුරකථන සමාගම්හි ග්‍රාහක දත්ත පද්ධතිය එක්කිරීම
- E- Government පද්ධතියක් සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සැපයීම සහ සියල්ල මධ්‍යගත පද්ධතියකට ගොනු කිරීම (Centralized the centralized database cloud solution, CIVIC registration for E-Government system)

## රැහැන් රහිත සන්නිවේදනය

- 5G, LTE+ වැනි සංඛ්‍යාත පරාසයේ කාර්යක්ෂමතාවයන් ඇති තාක්ෂණයන් සඳහා ප්‍රමුඛතාවය
- 3G සහ CDMA වැනි තාක්ෂණයන් භාවිතයෙන් ක්‍රමානුකූලව ඉවත්වී 2G සේවා හදිසි සේවාවන් සඳහා භාවිතය

## ආරක්ෂණ සංඛ්‍යාත පරාසයන් (GUARD-BANDS)

- සේවා සපයන සමාගම්වලට ලබාදී ඇති සංඛ්‍යාත පරාසයන් නැවත සංශෝධනය කිරීම සහ සන්තතික සංඛ්‍යාත පරාසයක් සැපයීම මෙන්ම සංඛ්‍යාත පරාසයෙහි ආරක්ෂණ සංඛ්‍යාත පරාසයන් (GUARD-BANDS) අවම කිරීම

## Public Wi-Fi සහ රැහැන් ගත සම්බන්ධතා ප්‍රවර්ධනය

- පාසල්, විශ්වවිද්‍යාල, පුස්තකාල අධ්‍යාපන ආයතන, උද්‍යාන රාජ්‍ය කාර්යාල ඇතුළු මහජනයා ගැවසෙන ස්ථානයන්හි public Wi-Fi ස්ථාපිත කරන අතර සාධාරණ මිලකට අන්තර්ජාලය වෙත ප්‍රවේශ වීම සහ සියලුම අත්‍යාවශ්‍ය සේවාවන් සහිත IOT යෙදුම් වෙත නොමිලේ ප්‍රවේශය

## විද්‍යුත් සන්නිවේදන කර්මාන්තය සඳහා වන පොදු ක්‍රියාමාර්ග

- විද්‍යුත් සන්නිවේදන සේවා සපයන්නන්ට තම විද්‍යුත් සන්නිවේදන ජාලා වෙත සියලුම මහජනතාවට ප්‍රවේශ වීමට ඇති හැකියාව තහවුරු කළ යුතු බවට ඉලක්ක
- හදිසි සේවා, රජයේ සේවා, මහජන ආරක්ෂණ සේවා සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය වැනි අත්‍යාවශ්‍ය සේවාවන් වෙත ප්‍රවේශය නොමිලේ
- ග්‍රාමීය ප්‍රදේශ, සීමිත ආවරණ ඇති ප්‍රදේශ සහ පොදු ස්ථාන සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
- අධ්‍යාපන වැඩසටහන් සහිත IOT යෙදුම්, මාර්ගගත අධ්‍යාපන වැඩසටහන් සහ වෙනත් අධ්‍යාපනික උපකරණ සඳහා (Documents, E-library) සෑම පුරවැසියෙකුටම නොමිලේ ප්‍රවේශය
- සෑම ක්ෂේත්‍රයක් සඳහාම IOT යෙදුම් ප්‍රවර්ධනය කිරීම සඳහා වන යටිතල පහසුකම්
- යටිතල පහසුකම් සමාගම් අතර හුවමාරුව සහ බෙදා හැරීම, සන්නිවේදන ප්‍රමිතීන් සහ සන්නිවේදන ගාස්තු නිර්ණය කිරීමට නියාමන යාන්ත්‍රණයක්

## විකාශන කර්මාන්තය

- විකාශන ජාලාවන් අංකිතකරණයට (converted into digital) ලක් කිරීම සහ ඒ සඳහා වන නවතම තාක්ෂණයන් අවශෝෂණය කර ගැනීම, ඒ හා බැඳී පවතින්නා වූ අනෙකුත් සේවාවන්ද මහජනතාවට ලබා දීම
- සන්නිවේදන කොමිෂන් සභාව (CRC-SL) යටතේ විකාශන කර්මාන්තය සඳහා නියාමන ආයතනයක්
- එක් ආයතනයක/සමාගමක අනුබද්ධ සමාගම් ආකෘතිය යටතේ ඒ ඒ නාලිකාවන්හි අනන්‍යතාවයන් රැකෙන පරිදි රජය සතු ගුවන්විදුලි හා රූපවාහිනී ආයතන ඒකාබද්ධ කිරීම

- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ (CH-01) ජාතික නාලිකාව, නේත්‍රා (CH-02) නාලිකාව සේවය මහජන සේවා විකාශනයන් (Public Services Broadcast (PSB) Domain) ලෙස ක්‍රියාත්මක කිරීම සහ Channel EYE (CH-03) වාණිජ වසමක් ලෙස ක්‍රියා කිරීම
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය සහ දෙමළ සේවය මහජන සේවා විකාශනයන් (Public Services Broadcast (PSB) Domain) ලෙස ක්‍රියාත්මක කරන අතර, අනෙකුත් නාලිකා වාණිජ නාලිකා ලෙස පවත්වා ගැනීම
- වාර්ෂික අයවැය මඟින් එක් එක් අමාත්‍යාංශ සඳහා වෙන්කරනු ලබන මාධ්‍ය අයවැය  මහජන සේවා විකාශනයන්  (Public Services Broadcast (PSB) ) ලෙස ක්‍රියාත්මක ආයතනයන්ට ලබාදීම
- තොරතුරු රසාස්වාදය සහ අධ්‍යාපනික අන්තර්ගත වැඩසටහන් විකාශනය කිරීමට අදාළ තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- අධ්‍යාපනික සේවා සඳහා කාර්යක්ෂම මාධ්‍ය ලෙස භූමිෂ්ඨ රූපවාහිනිය ජාලය (Terrestrial TV Network) හඳුනා ගැනීම සහ එය සැපිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
- මෙම කලාපය තුළ ක්‍රීඩා, විනෝදාස්වාද, සහ සංචාරක කර්මාන්තය සමඟ බැඳුණු ජාත්‍යන්තර උත්සව, ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවල බාහිර විකාශන ආවරණය සහ සම්ප්‍රේෂණය සිදුකරන බාහිර විකාශන ඉංජිනේරු ආයතනයක් ලෙස ජාත්‍යන්තර බාහිර විකාශන කර්මාන්තයේ තරගකාරී ලෙස කටයුතු කිරීම

## සිනමා සහ විනෝදාස්වාද කර්මාන්තය

- ඩිජිටල් සිනමා ප්‍රක්ෂේපණයේ අවම ප්‍රමිතිය 2K ලෙස ක්‍රියාත්මක කිරීම
- සිනමාව විනෝදාස්වාදය සහ නව මාධ්‍ය (Cinema, Entertainment Digital and New media) යන කර්මාන්තවලට අදාළ නියාමන ආයතනයක්
- නවීන තාක්ෂණයෙන් පිරිපුන් චිත්‍රාගාර, පසු නිෂ්පාදන ආයතන ඉදිකිරීම සහ අනෙකුත් තාක්ෂණික අංශයන් සහ නව උපකරණ ආනයනය කිරීම සඳහා ආයෝජනය කිරීමට පෞද්ගලික අංශය දිරිමත් කිරීම සහ බදු සහන සහ දිරිගැන්වීම් ලබා දීම
- විදේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා පහසුකම් සේවා කර්මාන්තය සඳහා නව නියාමනයන් මෙන්ම ලියාපදිංචියේ සිට අනෙකුත් කාර්යන් සම්බන්ධීකරණය සහ මධ්‍යගතකරණය සඳහා වන කාර්යංශයක්
- OTT සහ VOD සේවා වැනි IOT යෙදවුම් සහ විනෝදාස්වාද කර්මාන්තය සහ නව මාධ්‍ය (Digital and New media) සඳහා ආයෝජන දිරිමත් කිරීම



# ඵලදායී කළමනාකරණයක්

# ඒකාබද්ධ පරිභරණ සැලසුමක්

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණය වන හෙක්ටයාර් මිලියන 6.6න් 82%ක් එනම් හෙක්ටයාර් මිලියන 5.4ක් රජයට අයත් වන අතර, ඉතිරි 18%ක ප්‍රමාණය එනම් හෙක්ටයාර් මිලියන 1.2ක ප්‍රමාණය පුද්ගලික ඉඩම් ලෙස පවතී. රජයේ ඉඩම් ලෙස පවතින හෙක්ටයාර් මිලියන 5.4න් 32%ක ප්‍රමාණය, එනම් හෙක්ටයාර් මිලියන 1.7ක් වනාන්තර ලෙස පවතී. පරිපාලනයේ සහ කළමනාකරණයේ පහසුව සඳහා ඉඩම් යොදා ගන්නා ආකාරය අනුව ඒවා කෘෂිකාර්මික, වාණිජ සහ නේවාසික ලෙස වර්ගීකරණය කොට ඇත.

ඉඩම් සම්පත් පාලනය කිරීම සඳහා යටත්විජිත පාලන සමයේ පැනවූ විවිධ ආඥා පනත් සහ රෙගුලාසි මගින් ශ්‍රී ලංකාවේ ඉඩම් කළමනාකරණ පද්ධතියට සුවිශේෂී බලපෑම් ඇති කර ඇත. නිදහසින් පසුව පැවති ආණ්ඩු විසින් රටේ සහ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් මෙම නීති විද්‍යාත්මක සංශෝධනයකට ලක් කිරීම සඳහා විශේෂ උත්සාහයක් නොගත් අතර, පටු පරමාර්ථ සඳහා ඇති කරන ලද ඇතැම් ඉඩම් ප්‍රතිසංස්කරණ සහ ඉඩම් බෙදාදීමේ ප්‍රතිපත්ති සමාජයීය සහ ආර්ථික අසමානතාවයන් වර්ධනයට මඟ පාදා ඇත. ඉඩම්වල අයිතිය පිළිබඳ පවතින ගැටලු දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳී පවතින අතර, එය විවිධ සමාජීය ගැටලුවලටද හේතුවී තිබේ.

**ඉඩම් ප්‍රතිසංස්කරණ සහ ඉඩම් බෙදාදීමේ ප්‍රතිපත්ති සමාජයීය සහ ආර්ථීක අසමානතාවයන් වර්ධනයට මඟ පාදා ඇත.ඉඩම්වල අයිතිය පිළිබඳ පවතින ගැටලු දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳී පවතින අතර, එය විවිධ සමාජීය ගැටලුවලටද හේතුවී තිබේ.**

# මූලධර්ම

- ප්‍රශස්ත ඉඩම් පරිශීලනය
- සංවේදී ප්‍රදේශයන්හි ආරක්ෂාව
- කාර්යක්ෂම හා ඵලදායී ඉඩම් පරිපාලනය සහ කළමනාකරණය

# ක්‍රියාමාර්ග

## ඉඩම් පරිශීලනය

- ඵලදායී පරිපාලනයකට සහ කළමනාකරණයකට මඟ පාදන ඉඩම් පිළිබඳ නව නීති රාමුවක් සහ නව ඉඩම් පනතක්
- ජාතික ඉඩම් පරිහරණ සැලස්මක්
- ඉඩම් කළමනාකරණය සම්බන්ධීකරණයට සහ පාලනයට ජාතික ඉඩම් සභාවක් (National Land Council)
- යාවත්කාලීන රාජ්‍ය ඉඩම් ලේඛනයක් (Inventory)
- ඉලෙක්ට්‍රෝනික ඉඩම් ලියාපදිංචි කිරීමේ පද්ධතියක් සහ ඉඩම් වාර්තා ඩිජිටල්කරණය
- ඉඩම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය විධිමත් සහ කාර්යක්ෂම කිරීම
- ඉඩම් සම්බන්ධ ගැටලු කඩිනමින් සහ සාධාරණව විසඳීම සඳහා අර්ධ අධිකරණ (Quasi-Judicial) ආයතන පද්ධතියක්
- විද්‍යාත්මක සහ තාක්ෂණික ක්‍රමවේද මගින් ඉඩම් පරිහරණ සහ සංවර්ධන අනුමත කිරීම් සරල සහ කාර්යක්ෂම කිරීම

## සංවේදී ප්‍රදේශයන්හි ඉඩම්වල ආරක්ෂාව

- පාරිසරික හා ඓතිහාසික සංවේදී ප්‍රදේශ සංරක්ෂණයට සහ ආරක්ෂා කිරීමට පියවර

## ඉඩම් ලියාපදිංචිය

- දීර්ඝ කාලයක් තිස්සේ පදිංචි ජනතාවට එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සහතික කෙරෙන ඔප්පු
- සියලුම පළාත් පාලන ආයතන සහ ඉඩම් කළමනාකරණ ආයතන සම්බන්ධ කර ඒකාබද්ධ ඉඩම් හා යටිතල පහසුකම් තොරතුරු පද්ධතියක් (ILII)
- කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුත් වගවීමක් සහිත ඉඩම් සම්බන්ධ කාර්යක්ෂම මහජන සේවාවන්

**ඉඩම් පරිහරණ කළමනාකරණය**

- ඒකාබද්ධ ඉඩම් පරිහරණ සිතියමක්
- ඉඩම් පරිහරණ සැලසුම් කිරීම තුළින් ආපදා අවම කිරීම, දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ යාන්ත්‍රණයක්
- ජාතික ඉඩම් පරිහරණ සැලසුම් ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්
- අවකාශීය දත්ත විශ්ලේෂණය මත පදනම් වූ ඉඩම් උචිතභාවය (land suitability) පිළිබඳ සිතියමක්

**මැනුම් සහ සිතියම්කරණය** (Surveying and Mapping)

- ඉඩම් මැනීම සහ සිතියම් ගත කිරීමේ පාලන ජාලය පුළුල් කර නවීන තාක්ෂණය යොදා ගනිමින් ඉඩම් මැනීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම
- මුළු රටම ආවරණය වන පරිදි LiDAR මැනීම් හෝ සුදුසු තාක්ෂණයන් යොදා ගෙන අත්‍යාවශ්‍ය නිරවද්‍ය සිරස් දත්ත (elevation) ලබා ගැනීම
- සියලුම ඉඩම් මැනුම් ජාතික ජාලයකට සම්බන්ධ කිරීම මගින් ඉඩම් මැනුම්වල වාටි මුට්ටු රහිතව (Seamless integration) ඒකාබද්ධතාවයක් සහ සම්බන්ධතාවයක් ඇති කිරීම
- නවක මැනුම් උපාධිධාරීන්ගේ උපරිම සේවය ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක්
- සංවර්ධන ව්‍යාපෘතිවලට අවශ්‍ය නිරවද්‍ය සහ කාලීන අවකාශීය මිණුම් දත්ත ප්‍රමුඛතා පදනමින් රැස්කිරීම හා ගබඩා කිරීම
- භූ තොරතුරු නිෂ්පාදනයට අවශ්‍ය අවකාශීය දත්ත යාවත්කාලීන කිරීම සඳහා නවීන තාක්ෂණය භාවිත කර විශ්වාසනීය සහ නිවැරදි දත්ත මූලාශ්‍රයන් සැපයීම
- පුළුල් දත්ත කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා ජාතික අවකාශිත දත්ත සමෝධාන (National Spatial Data Integration) ප්‍රඥප්තියක්



# විද්‍යාත්මක ඉදිකිරීම් ක්ෂේත්‍රයක්
# ගුණාත්මක සේවා නියුක්තියක්

රටේ ආර්ථික සංවර්ධනය පිළිබිඹු කරන ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනය සහ පැවැත්ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතන විසින් එම ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සහ ව්‍යාපෘති සඳහා සිදුකරන ආයෝජන මත රඳා පවතී. 2022 ආර්ථික පසුබෑමට පෙර, ඉදිකිරීම් කර්මාන්තය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට 7%ක දායකත්වයක් ලබා දුන් අතර මිලියනයකට අධික ප්‍රමාණයකට සෘජු හා වක්‍ර රැකියා සපයනු ලැබීය. නමුත් හැකිළීමට භාජනය වූ ආර්ථිකය හේතුවෙන් හා කර්මාන්තයට යොමු වන ආයෝජන නොමැතිකම නිසා මෙම කර්මාන්තය වර්තමානයේ අර්බුදයට පත්වී ඇත.

මේ වනවිට ක්ෂේත්‍රයේ බහුතරයක් ඉදිකිරීම්කරුවන් සහ උපදේශකයින් පෞද්ගලික අංශය නියෝජනය කරන අතර, රජය සතු ඉදිකිරීම් ආයතන දේශපාලන ඇඟිලි ගැසීම් සහ අකාර්යක්ෂම පාලනය යටතේ අඩු කාර්යසාධනයක් පෙන්නුම් කරමින් සිටියි.

**මේ වනවිට ක්ෂේත්‍රයේ බහුතරයක් ඉදිකිරීම්කරුවන් සහ උපදේශකයින් පෞද්ගලික අංශය නියෝජනය කරන අතර, රජය සතු ඉදිකිරීම් ආයතන දේශපාලන ඇඟිලි ගැසීම් සහ අකාර්යක්ෂම පාලනය යටතේ අඩු කාර්යසාධනයක් පෙන්නුම් කරමින් සිටියි.**

ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පවතින අඩුපාඩු, අකාර්යක්ෂමතාවය, දුර්වල ව්‍යාපෘති කළමනාකරණ භාවිතයන්, දේශපාලන මැදිහත්වීම්, දූෂණය සහ නිසි මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව දියත් කරන ව්‍යාපෘති කර්මාන්තයේ ස්ථාවරත්වයට සැලකිය යුතු අභියෝග එල්ල කර තිබේ. මෙම ගැටලු ඉදිකිරීම් ව්‍යාපෘතිවල කාර්යසාධනය අඩාල කරන අතර, ප්‍රමාදයන්, පිරිවැය ඉක්මවා යාම සහ ප්‍රමිතියෙන් අඩු නිර්මිත එහි අවසාන ප්‍රතිඵලය වී තිබේ. එමෙන්ම යල් පැන ගිය සැලසුම් ක්‍රම සහ ප්‍රමිතීන්, නවීන ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයන් භාවිතා නොකිරීම සහ පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය කර්මාන්තයට අහිතකර ලෙස බලපායි. මෙම ක්ෂේත්‍රයේ රැකියා සුරක්ෂිතභාවය සහ සේවක සුබසාධනය සතුටුදායක තත්වයක නොපවතී.

පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ආයෝජන අවම වීම හේතුවෙන් නව ලාභදායී අමුද්‍රව්‍ය සහ තාක්ෂණයන්හි නවෝත්පාදන සිදු නොවීම නිසා ක්ෂේත්‍රය ජාත්‍යන්තර තලයේ අත්කරගෙන තිබෙන්නේ ඉතා කුඩා පංගුවකි. තවද බුද්ධි ගලනය පුහුණු සේවක ඌණතාවයට හේතු වී ඇති අතර, ක්ෂේත්‍රයේ එදිනෙදා ක්‍රියාකාරීත්වයට සහ දියුණුවට බාධා පමුණුවා ඇත.

පසුගිය ආණ්ඩු විසින් ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා විශාල වශයෙන් ආයෝජනය කළේ දේශීය බැංකු, ද්වීපාර්ශවික සහ බහුපාර්ශ්වික ණය මුදල් වන අතර එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම රටේ ණය අර්බුදයට ප්‍රධාන දායකත්වයක් සපයා තිබේ.

# මූලධර්ම


- නිර්මාණශීලී ඉදිකිරීම් ක්ෂේත්‍රයක්
- විනිවිදභාවයෙන් යුතු සාධාරණ ප්‍රසම්පාදනය
- ඉදිකිරීම් අංශය අධීක්ෂණය, සහාය සහ නියාමනය
- ව්‍යවසායකයින් අතර සාධාරණ තරගකාරීත්වය හා සම ප්‍රවේශය
- නවීන වාස්තු විද්‍යාත්මක දැනුම මත පදනම් වූ රැකියා සුරක්ෂිතභාවය, සාධාරණ වේතනය, නිපුණතා සංවර්ධනය සඳහා අවස්ථා සහිත ගුණාත්මක සේවා නියුක්තියක්

# ක්‍රියාමාර්ග

- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සිදුකිරීම
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියලුම පාර්ශ්වකරුවන් සඳහා පුළුල් ආචාරධර්ම පද්ධතියක්
- රට තුළ ඇති සියලුම ඉදිකිරීම් පුහුණු ආයතන සම්බන්ධීකරණය හා ඉදිකිරීම් තාක්ෂණික අධ්‍යාපනය නියාමනය
- ඉදිකිරීම් ඇපකර අරමුදල (Construction Guarantee Fund- CGF) මගින් ජාත්‍යන්තර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ආයතනය (CIDA) පිළිගන්නා සමාගම් වෙත මූල්‍ය ඇපකර
- ඉදිකිරීම් ආරවුල් විසඳීම කඩිනම් කිරීම සඳහා වූ බේරුම්කරණ මධ්‍යස්ථානයක් සහ බේරුම්කරුවන්ගේ සංචිතයක්
- ජාතික සංවර්ධන සැලසුම්වලට අනුකූලව ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රමුඛතාවය නිර්දේශ කිරීම
- දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම
- කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉලෙක්ට්‍රෝනික ලංසු තැබීමේ ක්‍රමය අදියර වශයෙන් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම
- නිශ්චිත කොන්දේසි යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට ජාත්‍යන්තර සමාගම් සහභාගි කර ගැනීමෙන් දේශීය කර්මාන්තකරුවන් ආරක්ෂා කිරීම
- රාජ්‍ය ආයතනවල සමාන ප්‍රසම්පාදන පටිපාටීන් පිළිපැදීම සහතික කිරීම
- ඇස්තමේන්තු කිරීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් පිළිබඳව රජයේ සහ පෞද්ගලික අංශයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය පුහුණු කිරීම

- ඉදිකිරීම් ශිල්ප ප්‍රජාවගේ සමාජ පිළිගැනීම හා ශිල්ප ප්‍රගුණත්වය නිර්ණය කර සහතික කරන හැඳුනුම්පතක් සෑම ඉදිකිරීම් ශ්‍රම ශිල්පියෙකුටම
- ලියාපදිංචි ඉදිකිරීම් ශ්‍රමික ශිල්පීන් සඳහා දීර්ඝ කාලීන රක්ෂණ ක්‍රමයක් සහ විශ්‍රාමික ප්‍රතිලාභ
- නවීන ව්‍යාපෘති කළමනාකරණය සහ කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍රයේ විශේෂඥතාව ඉහළ නැංවීම
- ජාතික ආපදා තත්ත්වයන් කළමනාකරණය සහ ශ්‍රම බලකාය පුහුණු කිරීමේදී රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ආයතනවල සහභාගිත්වය සහතික කිරීම
- නව්‍ය තාක්ෂණයන් සහ ප්‍රශස්ත අමුද්‍රව්‍ය හඳුන්වාදීම සඳහා ඉදිකිරීම් කර්මාන්තයට විශේෂිත පර්යේෂණ සහ සංවර්ධන අංශයක්
- ගෝලීය වර්ධනයන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කර්මාන්තය නවීකරණය කිරීම සඳහා සැලසුම් මාර්ගෝපදේශ, සහ පිරිවිතර සකස් කර යාවත්කාලීන කිරීම
- ජාත්‍යන්තර ඉදිකිරීම් ව්‍යාපෘතිවලට දේශීය කර්මාන්තකරුවන්ට ප්‍රවේශ වීමට රාජ්‍ය අනුග්‍රහය
- පාරිසරික බලපෑම් පිළිබඳ ගැඹුරු තක්සේරුවක් සමග සියලු ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා පාරිසරික වගවීම අනිවාර්ය කිරීම

# 4 අභිමානවත් ජීවිතයක් නොසැලෙන රටක්





# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්

# ශ්‍රී ලාංකේය ජාතික සාමාග්‍රියක්

නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු ලබන අතර එය මහජනතාව වෙත ඉදිරිපත් කර, සංවාදයකින් අනතුරුව අවශ්‍ය වෙනස්කම් සිදුකොට ජනමත විචාරණයක්ද සමග සම්මත කර ගනු ඇත.

- සමාජ හා ආර්ථික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියට අනුකූළ අයිතීන් මූලික අයිතිවාසිකම් ලෙස පිළිගනිමින් බලාත්මක කිරීම
- ළමා, කාන්තා සහ ආබාධ සහිත ප්‍රජාවගේ අයිතිවාසිකම් පිළිබඳ ආණ්ඩුක්‍රම නීතිය ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට අනුකූළ වන ලෙස පුළුල් කිරීම
- රැකියා සඳහා රට තුළ සහ රටින් පිටත සංක්‍රමණික පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම
- ජාතිකත්වයන් අතර අසමගිය සහ ආගමික වෛරය ඇති නොකරන, ස්ත්‍රී පුරුෂභාවය හෝ වෙනත් කරුණු මත වෙනස් කොට නොසැලකීම යන කොන්දේසිවලට යටත්ව භාෂණයේ නිදහස තහවුරු කිරීම
- විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම හා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙක් පත්කිරීම
- නව පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම
- ජනාධිපති නිල නිවාස එකකට පමණක් සීමා කිරීම
- විශ්‍රාමික ජනාධිපතිවරුන්ට හා ඔවුන්ගේ කලත්‍රයන්ට දී ඇති විශ්‍රාම වැටුප්, විශේෂ දීමනා හා වරප්‍රසාද අහෝසි කිරීම
- විද්‍යාත්මකව වෙන්කරන ලද අමාත්‍යාංශ 25කට ඇමතිවරුන් 25ක් සහ අනුරූපී නියෝජ්‍ය ඇමතිවරු පත් කිරීම සහ රාජ්‍ය ඇමති ධුර අහෝසි කිරීම
- සෑම අමාත්‍යාංශයකටම විෂය පිළිබඳ විශේෂඥයන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩල පිහිටුවීම
- සිය වගකීම ඉටු නොකරන්නේ නම් හා දූෂණයේ යෙදෙන්නේ නම් මහජන නියෝජිතයා ආපසු කැඳවීමේ බලය ඡන්දදායකයාට ලැබෙන විධිවිධාන
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පුද්ගලික කාර්යමණ්ඩලය සඳහා පවුලේ ඥාතීන් බඳවා නොගැනීම වැනි දේ අඩංගු ආචාරධාර්මික පද්ධතියක් හඳුන්වා දීම
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සැසිවාරයට සහභාගී වීම වෙනුවෙන් ගෙවන දීමනා අහෝසි කිරීම
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වසර 05කින් පසුව ලබාදෙන විශ්‍රාම වැටුප අහෝසි කිරීම
- මන්ත්‍රීවරුන්ගේ තීරුබදු රහිත වාහන බලපත්‍ර ක්‍රමය ඉවතට
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ධුර කාලය තුළදී එක් වාහනයක් පමණක් ලබාදීම



# කාර්යක්ෂම රාජ්‍ය සේවයක්

# කුසලතා කේන්ද්‍රීය වෘත්තීයභාවයක්

ශ්‍රී ලංකාවෙහි රාජ්‍ය සේවය, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා මැදිහත්වන ප්‍රධාන මෙවලමයි. මිලියන 1.4ක් පමණ තරම් බලකායකින් යුත් ශ්‍රී ලාංකේය රාජ්‍ය සේවය අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ සිට කාර්යාල කාර්ය සහායක නිලධාරී දක්වා විහිදුන, විවිධ වෘත්තිකයන්ගෙන් සහ නිලධාරීන්ගෙන් සමන්විත වන අතර, එය නඩත්තු කිරීම සඳහා රාජ්‍ය ආදායමෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වැයවේ. රාජ්‍ය සේවය විවිධ අධ්‍යාපන, වෘත්තීය සහ වෙනත් කුසලතාවලින් සපිරි  නිලධාරීන්ගෙන් සමන්විත වුවද, වර්තමානයේ එය මහජන අභිලාශය ඉටු කිරීමට අසමත් වූ, මහජන විශ්වාසය බිඳී ගිය අකාර්යක්ෂම සේවයක් බවට පත්ව තිබේ.

රාජ්‍ය සේවයෙහි අකාර්යක්ෂමතාවය සහ ඊටම බැඳුන අල්ලස, දූෂණය, වංචාව සහ රාජ්‍ය දේපළ අයථා පරිහරණය  පාලක පංතියේ සහ පාලන ක්‍රමයේ අනිවාර්ය ප්‍රතිඵලයක් මිස, රාජ්‍ය සේවකයන් විසින් තම අභිලාශය මත අත්පත් කර දුන් විනාශයක් නොවේ. දේශපාලන වුවමනාවන් මත සිදුකරනු ලබන පත්වීම්, විනාශකාරී දේශපාලන තීරණ ගැනීම සඳහා රාජ්‍ය සේවකයන් මෙහෙයවීම්, පාලකයන්ගේ මහා පරිමාණ වංචා සහ දූෂණවලට නිලධාරීන් යොදවා ගැනීම් වැනි මැදිහත්වීම් හේතුකොට ගෙන රාජ්‍ය සේවයේ දරුණු පිරිහීමකට හේතුවී ඇති අතර, එමගින් මහජනතාව තුළ රාජ්‍ය සේවය පිළිබඳ විශ්වාසය බිඳවැටීමට පදනම සැකසී තිබේ.

මෙම තත්වයෙන් රාජ්‍ය සේවය මුදාගෙන මහජන විශ්වාසය තහවුරු වන අදූෂිත සේවාවක් බවට පරිවර්තනය කොට මහජන අභිලාශය ඉටු වන, තෘප්තිමත් රාජ්‍ය සේවයක් දක්වා රැගෙන යාම අපගේ අරමුණයි.

**රාජ්‍ය සේවය විවිධ අධ්‍යාපන, වෘත්තීය සහ වෙනත් කුසලතාවලින් සපිරි නිලධාරීන්ගෙන් සමන්විත වුවද, වර්තමානයේ එය මහජන අභිලාශය ඉටු කිරීමට අසමත් වූ, මහජන විශ්වාසය බිඳී ගිය අකාර්යක්ෂම සේවයක් බවට පත්ව තිබේ.**


# මූලධර්ම

- විනිවිදභාවය සහ වගවීම
- කුසලතා මත පත්වීම් සහ උසස්වීම් සඳහා කුසලතා
- කාර්යක්ෂමතාව සහ විධිමත් ක්‍රියාවලි
- සදාචාරාත්මක හැසිරීම සහ අඛණ්ඩතාව
- තාක්ෂණය අනුගමනය කිරීම
- ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය
- සහයෝගිතාවය
- මහජන සහභාගීත්වය, දැනුවත් කිරීම සහ නිපුණතාවය
- කිසිවකු අත් නොහැරීම
- වෙනස්කොට නොසැලකීම

# ක්‍රියාමාර්ග

- සේවා ව්‍යවස්ථාවන්හි ඇති ගැටලු නිරාකරණය කරමින් ඒවා සංශෝධනය කිරීම
- බිම් මට්ටමේ සිට හඳුනාගත් සමාජ සහ ආර්ථික ගැටලු හා අවශ්‍යතාවයන්, ජාතික සංවර්ධන වැඩපිළිවෙළ මත පදනම්ව ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සැකසීම
- රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතනයන්හි විෂය පථයන් නිසි ලෙස හඳුනා ගනිමින් තාර්කික පදනමක් මත ඒවා නව අමාත්‍යාංශ වෙත අනුයුක්ත කර, සමාජ - ආර්ථික ඉලක්කයන් අත්පත් කරගැනීමේ ඉහළ කාර්යක්ෂමතාවයක් පවත්වා ගැනීම සඳහා එම ආයතන අතර සිරස් සහ තිරස් සබඳතාවයන් ගොඩනැගීම
- අවශ්‍යතාවය අනුව නව ආයතන බිහි කිරීම සහ සමාන විෂය පථයන් සහ ක්‍රියාකාරකම් ඇති ආයතනයන් ක්‍රමානුකූලව ඒකාබද්ධ කිරීම සහ අනවශ්‍ය ආයතන අහෝසි කිරීම
- ඩිජිටල්කරණය, කාර්ය සාධන කළමනාකරණය, සහ පුරවැසි නියැලීම යන සංකල්පයන් සැලකිල්ලට ගනිමින් වත්මන් රාජ්‍ය කළමනාකරණය නව රාජ්‍ය කළමනාකරණ ක්‍රම දක්වා පරිවර්තනය කිරීම

- රාජ්‍ය සේවාවෙහි කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා ජනප්‍රියව භාවිත කරන සේවක කප්පාදුව වෙනුවට, නව සමාජ ආර්ථික ඉලක්කයන් ළඟා කරගැනීමේ අරමුණ සහිතව සේවකයින් ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් සහ සුදුසුකම් ඇතුළු අනෙකුත් තොරතුරු හඳුනාගැනීමට කඩිනම් සංගණනයක් පැවැත්වීම
- දෙපාර්තමේන්තු සහ ඒවායේ කාර්යමණ්ඩල, ලබාදී ඇති ඉලක්ක සපුරාලන බව සහතික කිරීමේ අරමුණින් කාර්යසාධන කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වාදීම
- ජනතාවට ලබා දිය යුතු හඳුනාගත් සේවාවන් රාශියක් 'එකම වහලක් යටින්' සංකල්පය මත, ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් ඉටුකර දීමට හැකිවන පරිදි සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් තුළ පහසුකම් ඇති කිරීම
- තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සක්‍රීය සහ නිෂ්ක්‍රීය ක්‍රම දෙකෙහිම සිදුවන මහජන මුදල් නාස්තිය තුරන් කරමින් රාජ්‍ය සේවාව කාර්යක්ෂමව, විනීතව සහ දූෂණයෙන් තොරව සැපයීම පිළිබඳ නිලධාරීන් ඇගයීමට ලක්කිරීම සඳහා මහජනතා ප්‍රතිචාර ලබාගැනීමේ ක්‍රමවේද
- රාජ්‍ය සම්පත් නිසි පරිදි හා කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය වත්කම් ලේඛනයක් (asset registry) පවත්වාගෙන යාම
- රාජ්‍ය සම්පත් භාවිතයේදී සිදුවන නාස්තිය නැති කිරීම සඳහා රාජ්‍ය ආයතනයන් දිරිගන්වමින් ඒවා මැනීම සඳහා දර්ශක හඳුන්වාදීම
- ප්‍රසම්පාදන, මූල්‍ය, විගණන, ක්‍රමසම්පාදන, පරිපාලන ඇතුළු රාජ්‍ය සේවාවන්හි අභ්‍යන්තර කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ඩිජිටල් මෙවලම්
- රාජ්‍ය සේවයෙහි සියලු සේවා ගණයයන්ට සහ විවිධ සේවාවන් වෙත නිලධාරීන් බඳවා ගැනීම සහ උසස් වීම් ලබාදීම නිශ්චිත කාල රාමුවකට අනුව සිදු කිරීමට අවශ්‍ය විධිවිධාන
- රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී සහය දැක්වීමට සහ ක්‍රියාත්මක කිරීමට නිලධාරීන් සතුව තිබිය යුතු හැකියාවන් වර්ධනය කිරීමටත්, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ කටයුතු කිරීමටත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි (SLIDA) ශක්‍යතාවය ඉහළ දමමින් ප්‍රතිව්‍යුහගත කිරීම



# නීතිය මත පාලනයක්

# සමප්‍රවේශී අධිකරණ පද්ධතියක්

අධිකරණය මගින් ස්වාධීනව හා කාර්යක්ෂමව යුක්තිය පසිඳලීම මෙන්ම මහජනයාට ඒ ක්‍රියාවලිය පිළිබඳව ඇති විශ්වාසයත් නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමෙහිලා අතිශය වැදගත් වේ. නමුත් අද ලංකාවේ මෙම ක්‍රියාවලිය අධික මිල සහිත, මහජනතාවගෙන් ඈත් වූ සහ ජනතා විශ්වාස පළුදු වූවකි. ස්වාධීන, කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුත් හා මහජනතාවට දැරියහැකි අධිකරණ පද්ධතියක් ඇති කිරීමෙන් ඒ පිළිබඳව බිඳීගිය ජනතා විශ්වාසය නැවත ගොඩනගා ගැනීමට ජාතික ජන බලවේගය අපේක්ෂා කරයි.

## මූලධර්ම

- සාධාරණව හා සමානව නීතියේ රැකවරණය
- විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව
- ස්වාධීනත්වය හා ජනතා විශ්වාසය

**මූල්‍ය අවභාවිතාවන්, අල්ලස්, කොමිස් වැනි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම අරමුණු කරගනිමින් නීතිරීති සම්පාදනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම**

## ක්‍රියාමාර්ග

### අධිකරණය

- නීති විශේෂඥ කමිටුවක් මගින් පවතින නීති සමලෝචනය කොට අවශ්‍ය නීති යාවත්කාලීන කිරීම
- අධිකරණ ක්‍රියාවලියට නවීන තාක්ෂණය හඳුන්වාදීමට පියවර ගැනීම සහ විනිශ්චයකාරවරුන්ට හා කාර්ය මණ්ඩලයට ඒ සම්බන්ධ නිසි පුහුණුව ලබාදීම ආදිය තුළින් අධිකරණ ක්‍රියාවලිය වඩා සුමට හා කාර්යක්ෂම කිරීම
- සුහුරු අධිකරණ ශාලා (Smart Court House) ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ අධිකරණ වාර්තා මෘදු පිටපත් (Soft copies) පවත්වාගෙන යාම
- ඉහළ හා පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ට සහාය වීමට පර්යේෂණ නිලධාරීන් පත් කිරීම
- දකුණු ආසියානු කලාපයේ ජාත්‍යන්තර වාණිජ ගනුදෙනු පදනම් කරගෙන හටගන්නා ගැටලු බේරුම්කරණය සහ

සමථකරණය කිරීම සඳහා ජාත්‍යන්තර බේරුම්කරණ සහ සමථකරණ මධ්‍යස්ථානයක්

- අපරාධමය නීතිය හා බැඳුණු නඩු භාණ්ඩ ආරක්ෂිතව ගබඩා කර තබා ගැනීම සඳහා යටිතල පහසුකම් දියුණු කිරීම
- දීර්ඝ කාලයක් තිස්සේ රඳවා තබගන්නා අපරාධමය නීතිය හා බැඳුණු නඩු භාණ්ඩ ඒවායේ වටිනාකම් ක්ෂයවීමට පෙර සුදුසු බැඳුම්කර මත අදාළ පාර්ශ්ව වෙත මුදාහැරීම හෝ රාජසන්තක කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම
- ඇප නීතියේ හා ඇප දීමේ ක්‍රියාවලියේ ඇති ගැටලු සොයා බලා ඇප නීතිය යාවත්කාලීන කිරීම
- රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තු ශාඛා පළාත්බදව පිහිටුවීම

## අල්ලස් හා දූෂණ

- සොරාගත් වත්කම් නැවත අයකරගැනීමට අදාළව සොරකම් කරන ලද වත්කම් ප්‍රතිෂ්ඨාපනය (STAR) සහ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳව එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) ආදී ජාත්‍යන්තර ආයතනවල තාක්ෂණික සහ උපදේශන සේවාවන් ලබා ගැනීමට රාජ්‍ය වත්කම් ප්‍රතිෂ්ඨාපන ආයතනයක් පිහිටුවීම
- 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 34 වැනි වගන්තිය අනුව සොරාගත් වත්කම් නැවත අයකර ගැනීම සම්බන්ධීකරණය හා දූෂණය වැළැක්වීම සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීමේ බලධරයා වන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සම්පූර්ණ බලය පැවරීම සහ අවශ්‍ය පහසුකම් ලබා දීම
- මූල්‍ය අපරාධ, අල්ලස් හා දූෂණ චෝදනා නඩු කාර්යක්ෂම කිරීම සඳහා ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ලක් පත් කිරීම
- සෑම දිස්ත්‍රික්කයකම දූෂණ විරෝධී කොමිසමේ කාර්යාලයක් පිහිටුවීම
- දූෂණ විරෝධී කොමිසම වෙත ලැබෙන පැමිණිලි මාස හයක් ඇතුළත විමර්ශනය කිරීම හෝ එසේ නොකරන ලද පැමිණිලි පිළිබඳ වාර්තාවක් සෑම මාස හයකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- රාජ්‍ය මූල්‍ය දූෂණ චෝදනාවලට ලක්වූවන්ට රැකවරණ ලබාදෙන්නන්ද අදාළ වැරැද්දට සම්බන්ධ අයවලුන් ලෙස සලකා නීතිය ඉදිරියට ගෙන ඒම සඳහා අවශ්‍ය නීති සකස් කිරීම
- මූල්‍ය අවභාවිතාවන්, අල්ලස්, කොමිස් වැනි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම අරමුණු කරගනිමින් නීතිරීති සම්පාදනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස

සලකා කටයුතු කිරීම

- දූෂණ, වංචා, අල්ලස් වැනි දෑ පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමට හා ඒවාට එරෙහිව මහජනතාව බලගැන්වීමේ ව්‍යාපාරයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ස්ථාපිත කිරීම
- අල්ලස් කොමිසම හා නීතිපති මගින් ඉල්ලා අස්කර ගන්නා ලද නඩු නැවත සමාලෝචනයකට ලක්කර සුදුසු නඩුකර නැවත පැවරීමට කටයුතු කිරීම

## නීතිපති දෙපාර්තුමේන්තුව

- රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල (Directorate of public prosecution) පිහිටුවීම
- නඩු පැවරීමේදී නීතිපති දෙපාර්තුමේන්තුව මගින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය (Prosecution guidelines) ලේඛන ගත කිරීම
- විමර්ශන ක්‍රියාවලියෙන් පසු නීතිපති දෙපාර්තතුමේන්තුව විසින් නඩු නොපැවරීමට කටයුතු කරන්නේ නම් ඊට හේතු අතෘප්තියට පත් පාර්ශ්ව වෙත දැනුම් දීම
- නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව අගතියට පත්වන පාර්ශවයට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට විශේෂ පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරකු පත්කිරීම
- ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකු යටතේ නීතිපති දෙපාර්තමේන්තුවේ පළාත්බද කාර්යාල පිහිටුවීම



# මහජන ආරක්ෂාව සුරකින මිත්‍රශීලී සේවයක්

රටේ නීතිය සහ සාමය පවත්වා ගෙන යාමේදී මහජනතාවට වඩාත් සමීප ආයතනයක් ලෙස පොලීසිය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වන ආකාරය පිළිබිඹු වන වැදගත් සාධකයක් වන්නේ පොලීසියේ ස්වාධීන හා කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයයි. නමුත් වර්තමානයේ ශ්‍රී ලංකා පොලීසිය පිළිබඳව ඇති පොදු මහජන මතය වන්නේ දේශපාලන හෝ වෙනත් සමාජ සම්බන්ධතාවයක් හෝ මූල්‍ය ප්‍රදානයක් නොමැතිව සේවය ලබාගැනීමට නොහැකි ආයතනයක් ලෙසයි. අනෙක් අතින් ඇතැම් පොලිස් නිලධාරීන්ද දේශපාලන අත පෙවීම්වලට ගොදුරු වීම් හා නිසි අගැයීමට ලක් නොවීම නිසා නිරතුරු පීඩාවන්ට ගොදුරු වේ. පොලිස් සේවය ස්වාධීන, කාර්යක්ෂම, මිත්‍රශීලී හා මහජනයාට සමීප සේවාවක් බවට පත්කිරීම ජාතික ජන බලවේගයේ අපේක්ෂාවයි.

**ඇතැම් පොලිස් නිලධාරීන්ද දේශපාලන අත පෙවීම්වලට ගොදුරු වීම් හා නිසි අගැයීමට ලක් නොවීම නිසා නිරතුරු පීඩාවන්ට ගොදුරු වේ. පොලිස් සේවය ස්වාධීන, කාර්යක්ෂම, මිත්‍රශීලී හා මහජනයාට සමීප සේවාවක් බවට පත්කිරීම ජාතික ජන බලවේගයේ අපේක්ෂාවයි.**

# මූලධර්ම

- ස්වාධීනත්වය
- කාර්යක්ෂම සහ මිත්‍රශීලී සේවාව
- වෘත්තීමය නිපුණතාවය

# ක්‍රියාමාර්ග

- පොලීසිය මහජනතාව සමග සමීප සම්බන්ධතාවක් ඇතිකිරීම සඳහා විධිමත් 'පොලිස් මහජන සබඳතා කමිටු'
- සැකකරුවෙකු පොලිස් අත්අඩංගුවට ගෙන පැය 24ක් තුළ ඒ පිළිබඳ සැකකරුගේ භාරකරුවන්ට හෝ ළඟම ඥාතීන්ට දැනුම් දීම
- පොලිස් ස්ථානයකින් අපරාධකරුවෙකු යම් කාරණයක් සඳහා පිටතට රැගෙන යන්නේ නම් එම සැකකරුවන්ගේ ජීවිතය ආරක්ෂා වන ආකාරයේ විධිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීම හා ඒ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාට දැනුම් දීම
- සියලු පැමිණිලි පරිගණක ගත කිරීම සහ පොලිස් වාර්තා විද්‍යුත් තැපෑලෙන් ලබා දීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම්
- පොලීසියට ලැබෙන සියලු පැමිණිලි ඉක්මනින් විමර්ශනය කර අවසන් කිරීම සහ එසේ කළ නොහැකි ලිපිගොනු පිළිබඳව පොලිස් කොමිසමට වාර්තා කිරීම
- අපරාධ විමර්ශනය සඳහා විද්‍යාත්මක පුහුණුව, නව තාක්ෂණික මෙවලම් සහ තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගැනීම
- පොලිස් සේවයේ සියලු පත්වීම්, උසස්වීම්, ස්ථාන මාරු දේශපාලනීකරණයෙන් තොරව සිදු කිරීම සඳහා පොලිස් කොමිසමට බලය ලබාදීම
- පොලිස් කොස්තාපල් ධුරයේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක දක්වා කරනු ලබන උසස් කිරීම් සම්බන්ධයෙන් වන විධිමත් උසස් කිරීම් කාර්ය පටිපාටියක් ක්‍රියාත්මක කිරීම

- පොලිස් සැරයන් සිට සහකාර පොලිස් අධිකාරී දක්වා කෙරෙන උසස් කිරීම් නිර්දේශපාලනිකව, කුසලතා හා කාර්ය සාධනය මත පමණක් සිදු කිරීම
- පොලිස් සේවාව වෘත්තීමය පොලිස් සේවාවක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාදීම, අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය, පොලිස් මහජන සම්බන්ධතාවයන්, උපදේශනය, මනෝ විද්‍යාව වැනි ක්ෂේත්‍ර පිළිබඳව උපාධි පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථා සැලසීම
- දක්ෂ පොලිස් නිලධාරීන් ඇගයීමට ලක්කොට ත්‍යාග හා සහතිකපත් ලබාදීම හා ඔවුන්ට විදේශ පුහුණුව ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- නිවසක හිමිකමක් නොමැති පොලිස් නිලධාරීන්ට නිවාස ලබාදීමේ වැඩසටහනක්
- පොලිස් සේවයේ වැටුප් හා දීමනා අනෙකුත් රාජ්‍ය සේවකයන්ට සමානුපාතිකව ඉහළ දැමීම
- අල්ලස, දූෂණය හා  වංචාවෙන් තොර පොලිස් සේවයක් සඳහා විශේෂ විමර්ශන ඒකකය වඩාත් ශක්තිමත් කිරීම

## යුක්තිය ඉටු කිරීම

- 2024.04.17 දින ජාතික ජන බලවේගය විසින් ප්‍රකාශයට පත්කළ ප්‍රතිඥාව අනුව, පාස්කු ඉරු දින ප්‍රහාරයේ වින්දිතයින් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරූ නඩු තීන්දුවලින් වරදකරුවන් වූ දේශපාලනඥයන් හා රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව අපරාධ නීතිය යටතේ නඩු පැවරීම
- 2019.04.21 වන පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරය සම්බන්ධව ජනාධිපති කොමිෂන් සභා නිර්දේශවලට අනුව අදාළ දේශපාලනඥයන් සහ නිලධාරීන්ට එරෙහිව කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම
- කාලයක් තිස්සේ නොවිසඳුණු ජනමාධ්‍යවේදීන්ගේ, ක්‍රීඩකයන්ගේ දේශපාලන ඝාතන සහ පැහැර ගැනීම් විමර්ශන කඩිනමින් අවසන් කොට අපරාධකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම
- දේශපාලන බලපෑම් මත තර්ජනයට ලක්ව රට හැරගිය මාධ්‍යවේදීන්, ආරක්ෂක අංශ නිලධාරීන් ඇතුළු අනෙකුත් පුද්ගලයන්ට යුක්තිය ඉටු කිරීම



# මනුෂ්‍යත්ව පාදක බන්ධනාගාරයක්

## යුක්තිගරුක රැඳවුම් දිවියක්

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ පුනරුත්ථාපනය තුළින් සිරකරුවන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමයි. එහෙත් පසුගිය කාලයේ විවිධ බන්ධනාගාරවල සිරකරුවන් ඝාතනය කිරීම් සහ අමානුෂික ලෙස හිංසා කිරීම් පිළිබඳ සිදුවීම් වාර්තා වීමෙන් පෙනී යන්නේ සිරගත කරනු ලබන පුද්ගලයින් විවිධ අතවරවලට මුහුණ දෙන බවයි. එමෙන්ම ඇතැම් දේශපාලන සබඳතා තිබෙන බලවත් පුද්ගලයින් සිරගත කරනු ලැබූවද ඔවුන් සුවිශේෂී වරප්‍රසාද භුක්ති විඳින බවටද මතයක් සමාජ ගතවී තිබේ. 'සිරකරුවෝද මනුෂ්‍යයෝය' යන්න වර්තමානය වන විට හුදෙක් තේමා පාඨයකට පමණක් සීමා වෙමින් පවතින අතර, තදබදය සහ සිරකරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් නොමැතිවීම බන්ධනාගාර මුහුණ දෙන බරපතළ ගැටලු වේ. බන්ධනාගාරය සිරකරුවන් ප්‍රතිශෝධන කරන ස්ථානයකට වඩා ඔවුන්ට දඬුවම් දීම අරමුණ කරගත් ස්ථානයක් බවට පත්වී ඇත. බන්ධනාගාර තුළ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් සහ පාතාල ක්‍රියාකාරකම් නිසා වර්තමානය වන විට ඒවා අපරාධ ඉගෙනුම් මධ්‍යස්ථාන බවට පත්වී යහපත් කල් ක්‍රියාවෙන් සිර ජීවිතය ගෙවන පිරිස්වලට බාධා පමුණුවා ඇත.

නීති කටයුතු අවසන් වීමට දීර්ඝ කාලයක් ගතවීම නිසා රිමාන්ඩ් සිරකරු ගහනය වැඩිවීම බන්ධනාගාර තදබදයට ප්‍රධාන හේතුවකි. 2022 වසරේ රිමාන්ඩ් සිරකරුවන් 108,250ක් සහ වරදකරුවන් කරන ලද සිරකරුවන් 30,331ක්ද ලෙස සමස්ත සිරකරුවන් 138,581ක් සිරගත ජීවිත ගතකරන ලදී. පිරිමි පුද්ගලයින් කාන්තාවන්ට වඩා සිරගත වීමේ ඉහළ නැඹුරුතාවයක් පෙන්වන අතර 2022 වර්ෂයේ සමස්ත සිරකරුවන් අතුරින් කාන්තාවන්ගේ ප්‍රතිශතය 3.23%කි. වරදකරුවන් කරන ලද සිරකරුවන්ගෙන් 19,094ක් හෙවත් 62.95%ක්ම මත්ද්‍රව්‍ය චෝදනාවලට වරදකරුවන් වූ අයයි. එමෙන්ම වරදකරුවන් වූ සිරකරුවන් ගෙන් 92%ක්ම අ.පො.ස. සාමාන්‍යපෙළ හෝ ඊට අඩු අධ්‍යාපනයක් ලැබූ අය වන අතර, 62%ක් වයස අවු. 40ට අඩු වයසේ පසු වූහ. පුද්ගලයින් වැරදි කිරීමට නොපෙළඹෙන සමාජ පරිසරයක් නිර්මාණය කිරීම ජාතික ජන බලවේගයේ අපේක්ෂාව වුවද, කුමන හෝ හේතුවක් නිසා සිරදඬුවම් විඳින පුද්ගලයින්ගේ සුභසාධනය රජයේ වගකීමක් ලෙස අපි සලකමු.

**පුද්ගලයින් වැරදි කිරීමට නොපෙළඹෙන සමාජ පරිසරයක් නිර්මාණය කිරීම ජාතික ජන බලවේග යේ අපේක්ෂාව වුවද, කුමන හෝ හේතුවක් නිසා සිරදඬුවම් විඳින පුද්ගලයින්ගේ සුභසාධනය රජයේ වගකීමක් ලෙස අපි සලකමු.**

# මූලධර්ම

- භාරකාරත්වය සහ රැකවරණය
- පුනරුත්ථාපනය සහ සමාජගත කිරීම

# ක්‍රියාමාර්ග

- බන්ධනාගාර තුළ සිදුවන සියලුම ආකාරයේ හිංසනයන් වැළැක්වීම
- රැඳවියන්ගේ ස්වභාවය, මානසික මට්ටම් ආදිය පිළිබඳ පූර්ණ විශ්ලේෂණයක් කොට ඒ අනුව රැඳවියන් කාණ්ඩ ගත කොට රඳවා තැබීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි බන්ධනාගාරවල ඉඩ පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් පුළුල් කිරීම
- රැඳවියන්ට ලබාදෙන ආහාරවල ගුණාත්මකභාවය සහතික කිරීම
- සුළු වැරදිවලට දඬුවම් ලබන පුද්ගලයින් බන්ධනාගාර ගත නොකොට ප්‍රජා වැඩසටහන් සඳහා යොමු කිරීම
- රැඳවියන් ප්‍රතිශෝධනය කිරීම සඳහා වෘත්තීය උපදේශන සේවයක්
- රැඳවියන්ගේ ශාරීරික සෞඛ්‍යය පවත්වාගෙන යාම සඳහා විධිමත් අභ්‍යාස වැඩසටහන්
- දීර්ඝ කාලීනව සිරදඬුවම් විඳින සිරකරුවන් විවිධ නිෂ්පාදන හා සේවා සඳහා යොදා ගැනීමේ වැඩසටහන්
- යහපත් කල් ක්‍රියාවෙන් යුත් සිරකරුවන් එළිමහන් සිරකඳවුරුවල රඳවා තැබීම හා බලපත්‍ර යටතේ නිවෙස් වෙත යාම සඳහා වූ ක්‍රමවේදය විධිමත් කිරීම
- සෑම බන්ධනාගාරයකම අධ්‍යාපනික හා වෘත්තිය පුහුණු පාඨමාලා
- රිමාන්ඩ් සිරකරුවන් ලෙස දීර්ඝකාලීනව රඳවා තැබීම වැළැක්වෙන පරිදි අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
- කාන්තා රැඳවියන්ගේ සුබසාධනය කෙරෙහි විශේෂ අවධානය යොමු කර, ඔවුන්ට බන්ධනාගාර තුළ සිදු කෙරෙන සියලු හිංසනයන් වැළැක්වීම
- කාන්තා රැඳවියන් සමඟ බන්ධනාගාරවල සිටින ඔවුන්ගේ දරුවන් සඳහා අධ්‍යාපන, සෞඛ්‍ය සහ අනෙකුත් සේවා පුළුල් කිරීම



# මතින් තොර රටක්
# නිරෝගී පුරවැසි දිවියක්

වර්තමානය වන විට මත්ද්‍රව්‍ය භාවිතය ශීඝ්‍ර ලෙස ඉහළ යෑම හේතුවෙන් එය සමාජ ව්‍යසනයක් බවට පත්වී ඇත. පවුල තුළ මෙන්ම සමාජය තුළද බරපතළ ගැටලු රාශියක් නිර්මාණය කිරීමට මත්ද්‍රව්‍ය භාවිතය හේතු වී ඇත. පාසල් දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි කර ගැනීමේ ප්‍රවණතාව ඉහළ ගොස් ඇත. මත්ද්‍රව්‍ය රට තුළට ගෙන ඒම සහ බෙදාහැරීම පාලනය කිරීමට වත්මන් පාලනය අසමත් වී ඇති අතර මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් බන්ධනාගාර ගත කිරීමෙන් පමණක් මෙම උවදුර වළක්වා ගැනීමට හැකියාවක් නැත. වර්තමානය වනවිට මත්ද්‍රව්‍ය භාවිතය සමාජ ඛේදවාචකයක් නිර්මාණය කිරීමට හේතුවී ඇති අතර 2022 වසරේ පුද්ගලයන් 152,979ක් මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබ තිබුණි. එහෙත් මේ අතරින් පුනරුත්ථාපන වැඩසටහන් සඳහා යොමු කර තිබුණේ පුද්ගලයින් 1930ක් පමණි. බන්ධනාගාර ගතවන වැරදිකරුවන් අතරින් 60%ක් පමණ පුද්ගලයින් බන්ධනාගාර ගත වන්නේ මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙනි. වර්තමානය වන විට දේශපාලනික හා වෙනත් බලවේගවල ආරක්ෂාව යටතේ ශ්‍රී ලංකාව, කලාපයේ මත්ද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානයක් බවට පත්වී ඇති අතර එය සංවිධානාත්මක අපරාධ වර්ධනය වීමට බලපා ඇත. එබැවින් ජාතික ජන බලවේගය මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.



# ක්‍රියාමාර්ග

- රට තුළ මත්ද්‍රව්‍ය හා පාතාලය මැඩපැවැත්වීම සඳහා ඒකාබද්ධ මෙහෙයුමක්
- මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වෙනම ම කාර්යාංශයක් ස්ථාපිත කිරීම
- මත්ද්‍රව්‍ය රට තුළට පැමිණීම වැළැක්වීම සඳහා නාවුක, ගුවන් මාර්ග පරීක්ෂා කිරීම් පහසුකම් වර්ධනය කිරීම, නවීන උපකරණ ලබාදීම හා නිලධාරීන් පුහුණු කිරීම
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුවන් පුනරුත්තාපනය කිරීමේ වැඩසටහන් විධිමත් කර මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඔවුන් මුදා ගැනීම
- මත්ද්‍රව්‍ය වැරදිවලට දඬුවම් දැඩි කිරීම, නඩු කඩිනමින් විසඳීම සඳහා පියවර ගැනීම
- පාසැල් දරුවන් දැනුවත් කිරීම සඳහා අඛණ්ඩ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ කාර්යයන් පුළුල් කර ජනතාව මත්ද්‍රව්‍ය මර්දනය සඳහා සම්බන්ධ කරගැනීමට නිරීක්ෂණ කමිටු පිහිටුවීම
- මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර ප්‍රතිඵල පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම



# උදාර රාජ්‍යතාන්ත්‍රිකත්වයක්

# ස්වෛරී රාජ්‍යයක්

ඉන්දියානු සාගරයේ සහ බෙංගාල බොක්ක මධ්‍යයේ ශ්‍රී ලංකාවේ මූලෝපායික පිහිටීමේ වැදගත්කම පිළිබඳ ඓතිහාසික සාක්ෂි ගණනාවක් ඇත. ශ්‍රී ලංකාව බෙංගාල බොක්ක හරහා සහ අග්නිදිග ආසියාව සමඟ ජවසම්පන්න වෙළඳ සබඳතා පවත්වා ඇති බව තහවුරු කිරීමට පුරාවිද්‍යාත්මක සාධක ප්‍රමාණවත් තරම් පවතී. ලෝකයේ නැගෙනහිර සහ බටහිර යා කරන ඉන්දියානු සාගරයේ කාර්ය බහුලම මුහුදු මංතීරුවලින් එකක් ආසන්නයේ ශ්‍රී ලංකාවේ භූ උපායමාර්ගික පිහිටීම ආශිර්වාදයකි.

සංවර්ධනය වෙමින් පවතින ආසියාව ජනගහනය අතින් ලොව විශාලතම කලාපය වේ. ලෝක දළ දේශීය නිෂ්පාදිතයේ මෙම කලාපයේ කොටස 30.5% දක්වා ළඟා වනු ඇති අතර, 2025 වන විට ආසියාව අත්‍යාවශ්‍යයෙන්ම මධ්‍යම ආදායම් ලබන කලාපයක් වනු ඇත. කලාපයේ අනෙකුත් රටවල් සමඟ අන්‍යෝන්‍ය සබඳතා වර්ධනයට මෙන්ම ජාතික ආරක්ෂාව සඳහා විදේශ ප්‍රතිපත්තිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඕනෑම රාජ්‍යයක විදේශ ප්‍රතිපත්ති තෝරාගැනීමට බලපාන සාධක වන්නේ භූගෝලීය පිහිටීම, ජනගහනය, ඉතිහාසය, ආර්ථික සම්පත්, දෘෂ්ටිවාදය, රජයේ කාර්යක්ෂමතාව, රාජ්‍යතාන්ත්‍රිකත්වයේ ගුණාත්මකභාවය, අර්බුද සහ ක්ෂණික සිදුවීම්, තාක්ෂණික දියුණුව, ජාත්‍යන්තර නීතිය සහ ආයතන යනාදියයි.

**ඕනෑම රාජ්‍යයක විදේශ ප්‍රතිපත්ති තෝරාගැනීමට බලපාන සාධක වන්නේ භූගෝලීය පිහිටීම, ජනගහනය, ඉතිහාසය, ආර්ථික සම්පත්, දෘෂ්ටිවාදය, රජයේ කාර්යක්ෂමතාව, රාජ්‍යතාන්ත්‍රිකත්වයේ ගුණාත්මකභාවය, අර්බුද සහ ක්ෂණික සිදුවීම්, තාක්ෂණික දියුණුව, ජාත්‍යන්තර නීතිය සහ ආයතන යනාදියයි.**

කෙසේ වෙතත්, මෑත අතීතයේදී ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිවලට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ශ්‍රී ලාංකිකයන්ගේ යහපතට වඩා පාලක පක්ෂවල පැවත්ම සහ බාහිර සාධකවල බලපෑම්ය.

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම මෙන්ම දීර්ඝ කාලයක් අපි ආයෝජනය කර ඇති රාජ්‍යතාන්ත්‍රික හා සංස්කෘතික වත්කම් අපගේ සාර්ථකත්වයේ මුල්ගල බවට පත්වනු ඇත. ශ්‍රී ලංකාව අනෙකුත් දකුණු ආසියාතික රටවලට වඩා අධ්‍යාපන මට්ටම, සෞඛ්‍ය මට්ටම, කාන්තා අධ්‍යාපනය යනාදී මානව සංවර්ධන දර්ශකවලින් සංසන්දනාත්මකව ඉහළ අගයක් පෙන්නුම් කරන අතර ජනතාවගේ සාපේක්ෂ ධනාත්මක සංස්කෘතික වර්ධනය ආර්ථික හා විදේශීය ප්‍රතිපත්ති ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා හිතකර සාධක වනු ඇත.

අතීතයේ සමහර බුද්ධිමත් නිවැරදි ක්‍රියා තුළින් උපයාගත් වැදගත් රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමක් ශ්‍රී ලංකාව සතුව ඇත. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාව ලෝකයේ පීඩිත සහ යටත්විජිත ජාතීන්ගේ සාම්ප්‍රදායික මිතුරෙකු වී ඇති අතර ශ්‍රී ලංකාව සැමවිටම ඔවුන්ගේ ස්වාධීනත්වයට සහාය දක්වයි.

එම රටවල්වලින් බොහොමයක් දැන් ස්වාධීන පමණක් නොව ප්‍රධාන කලාපීය බලවතුන් බවටද පත්ව ඇත. ඉතිහාසයේ විවිධ අවස්ථාවල ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රශ්නවලදී සාමය, ජාතීන්ගේ ස්වෛරීභාවය ප්‍රවර්ධනය කරමින් නිවැරදි විදේශ ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කර ඇත. ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු කිසිදු ජාත්‍යන්තර යුද්ධයකට සහාය ලබා දී නැත. ශ්‍රී ලංකාව එහි ප්‍රතිපත්තිමය ස්ථාවර සඳහා බොහෝ ජාතීන් අතර හොඳ නමක් ඇත. රටේ නව අභියෝග ජය ගැනීම සඳහා මෙම අගනා රාජ්‍යතාන්ත්‍රික වත්කම් යොදා ගත යුතුය. “ජාත්‍යන්තර සම්මුතිය ගොඩනඟන්නෙකු” ලෙස ශ්‍රී ලංකාවට අතීතයේ වැදගත්කමක් හිමි වී තිබිණි. 1970 ගණන්වල නොබැඳි ව්‍යාපාරයේ (NAM) භාරකාරත්වය, 1980 ගණන්වල සාගර නීතිය සහ 1995 න්‍යෂ්ටික ආයුධ සීමාකිරීම සම්මුතීන් (NPT) ඒ පිළිබඳ උදාහරණ වේ. ශ්‍රී ලංකාවේ ගිලිහී ගිය මෙම “ජාත්‍යන්තර සම්මුතිය ගොඩනඟන්නෙකු” ලෙස වූ වටිනාකම නැවත අත්පත් කර ගැනිම සඳහා අපගේ විදේශ ප්‍රතිපත්තිය උපයෝගී කරගත යුතුය.

# මූලධර්ම

- එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට, එහි ප්‍රධාන සම්මුතීන්ට සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුකූල වීම
- ජාත්‍යන්තර හා කලාපීය සාමය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය
- ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව පිළිබඳ අන්‍යෝන්‍ය ගෞරවය, ආක්‍රමණශීලී නොවන බව, රාජ්‍යවල සමානාත්මතාවය, අන්‍යෝන්‍ය වර්ධනය සහ අන්‍යෝන්‍ය ගෞරවය හා එකිනෙකාගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීම මත ගොඩනැගෙන සාමකාමී සහජීවනය
- ගෝලීය ගැටලු කළමනාකරණය සහ විසඳීමේ උසස් රාජ්‍යතාන්ත්‍රිකභාවය
- රාජ්‍යයෙන් රාජ්‍යයට සහ ජනතාවගෙන් ජනතාවට රාජ්‍යතාන්ත්‍රිකභාවය මගින් කලාපීය සහ ගෝලීය ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය

# ක්‍රියාමාර්ග

## විදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්යභාරය සහ කාර්යයන්

- උපායමාර්ගික ප්‍රමුඛතා, ඉලක්ක සහ විදේශයන්හි ශ්‍රී ලංකා නියෝජිතයින්ගේ අපේක්ෂිත හැසිරීම් විස්තර කෙරෙන හා පැහැදිලි මාර්ගෝපදේශ සහිත විස්තීරණ විදේශ ප්‍රතිපත්ති ලේඛනයක් සකස් කිරීම
- විස්තීර්ණ විශ්ලේෂණයකින් පසු නව විදේශ ප්‍රතිපත්ති හා අරමුණු සපුරාලීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය අභ්‍යන්තර ප්‍රතිව්‍යුහගත කිරීම
- අවධානය සහ මනා සම්බන්ධීකරණය තුළින් ශ්‍රී ලංකා විදේශ සේවයට (SLFS) මඟපෙන්වීම
- ශ්‍රී ලංකාව සිය දූත මණ්ඩල විවෘත කළ යුතු ආර්ථික වශයෙන් වර්ධනය වෙමින් පවතින හා නැගී එන රටවල් සහිත කලාප ඇගයීමට ලක් කිරීම

## තානාපති සේවය

- ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සහ නිවැරදි කාර්ය මණ්ඩල ප්‍රමාණය සමාලෝචනය කිරීම
- වෙළඳාම වැඩිදියුණු කිරීම, සංචාරක ප්‍රවර්ධනය, වෘත්තීය සහ වෘත්තීය පුහුණුව සහ රැකියා අවස්ථා යනාදිය සමඟ සමපාත වන එක් එක් තානාපති කාර්යාල සඳහා කාර්ය සාධන දර්ශක හඳුන්වා දීම

- විදේශ සේවය සඳහා වෘත්තීය විශිෂ්ටත්වය, සදාචාරාත්මක හැසිරීමේ ඉහළම ප්‍රමිතීන් සහ රාජ්‍යතාන්ත්‍රික විචක්ෂණ බුද්ධිය සහිත සුදුසුකම් ලත් නිලධාරීන් පත් කිරීම
- වෘත්තීය විශිෂ්ටත්වය, සදාචාරාත්මක හැසිරීමේ ඉහළම ප්‍රමිතීන් සහ කුසලතා පදනම මත සුදුසුකම් ලත් නිලධාරීන් විදේශ සේවය සඳහා පත් කිරීම
- ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් ලෙස ප්‍රත්‍යක්ෂ වාර්තා සහිත වෘත්තීය රාජ්‍යතාන්ත්‍රිකයින් පත් කිරීම

## ආයතනික ප්‍රතිසංස්කරණ හා මධ්‍යගත අධීක්ෂණය

- ශ්‍රී ලංකාවේ සමස්ත විදේශ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව මූලිකත්වය ගැනීමට තානාපති කාර්යාල බල ගැන්වීම සහ නිරන්තර අධීක්ෂණය තුළින් වගවීම සහතික කිරීම
- වඩාත් කාර්යක්ෂම කිරීමට සහ පුරවැසියාගේ සහ රාජ්‍යයේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාවලින් සරල කිරීම සහ විධිමත් කිරීම
- මානව සම්පත් සහ භෞතික වත්කම් පිළිබඳ දත්ත පද්ධතියක් ඇති කිරීම
- රාජ්‍යතාන්ත්‍රික පුහුණු කිරීම් ආයතනය සහ ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය (LKI) ප්‍රතිව්‍යුහගත කිරීම සහ ශක්තිමත් කිරීම
- ජාතික විදේශ ප්‍රතිපත්ති අරමුණු සමඟ රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ගේ ක්‍රියාවන් පෙළගැස්වීම, තක්සේරු කිරීම සඳහා නිරන්තර සමාලෝචන පැවැත්වීම
- විදේශ අමාත්‍යාංශයට දූත මණ්ඩල ක්‍රියාකාරකම්, අභියෝග සහ ජයග්‍රහණ පිළිබඳව නිතිපතා යාවත්කාලීන කිරීමට අවශ්‍ය වන ප්‍රමිතිගත වාර්තාකරණ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම

## රාජ්‍යතාන්ත්‍රික පුහුණුව සහ ධාරිතා වර්ධනය

- සාකච්ඡා සහ සංසන්දි කතිකා (Negotiations) කුසලතා, සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ ජාත්‍යන්තර නීතිය කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා පුළුල් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විවිධ කලාපවල දූත මණ්ඩල මුහුණ දෙන විශේෂිත අභියෝගවලට විසඳුම් සෙවීමට පුහුණු සැසි පැවැත්වීම
- රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා අඛණ්ඩ ඉගෙනීම සහ වෘත්තීය සංවර්ධනය

## රාජ්‍යතාන්ත්‍රික ප්‍රොටෝකෝල සහ ආචාරධර්ම සංශෝධනය කිරීම

- අවංකභාවය, වෘත්තීයභාවය සහ වගවීම අවධාරණය කරමින් රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා පැහැදිලි ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම
- ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවා කාර්යක්ෂමතාව
- සේවා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් සපයන ඊ - සේවා වැඩි කිරීම
- ජනහිතකාමී ආකල්පයකින් ශ්‍රී ලාංකේය ඩයස්පෝරාවට සපයනු ලබන සේවාවන්හි ගුණාත්මක බව ඉහළ නැංවීම
- ජාතික ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වෙමින් විදේශිකයන් ශ්‍රී ලංකාවට පැමිණීම දිරිමත් කිරීමට ඔවුන්ට කාර්යක්ෂමව ලෙස සේවා සැපයීම හා ඒ සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය අරමුදල්, තාක්ෂණය සහ තාක්ෂණික දැනුම ලබා දීම

## දේශපාලන රාජ්‍යතාන්ත්‍රිකත්වය

- G20 රටවල්, BRICS+ රටවල්, ASEAN රටවල්, දකුණු ආසියාතික, මැදපෙරදිග සහ අප්‍රිකානු මහාද්වීපය සමඟ රාජ්‍යතාන්ත්‍රික, ආර්ථික සහ සංස්කෘතික සබඳතා ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ප්‍රමුඛත්වය දීම
- සියලුම රාජ්‍යයන් සඳහා ඔවුන්ගේ ප්‍රමාණය සහ සංවර්ධන තත්වය නොසලකා ගෝලීය තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට ඇති අයිතිය පිළිගැනීම
- දකුණු ආසියාවේ සහ ඒ අවට ආරක්ෂිත සහ සාමකාමී පරිසරයක් පවත්වාගෙන යාම සහතික කිරීම
- කලාපීය ආර්ථික කොමිෂන් සභා ඇතුළු එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි අනුබද්ධ ආයතන හරහා බහුපාර්ශ්විකත්වයට සහාය වීම
- නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය, මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යය සහ දේශගුණික යුක්තිය වැනි සාරධර්ම තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම

## ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වය

- ජාත්‍යන්තර ආර්ථිකය සමඟ සම්බන්ධ වීම සහ ආර්ථික ධනය සහ ආරක්ෂාව සැපයීම සඳහා දේශීය ආර්ථිකය ස්ථානගත කිරීම
- ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා ප්‍රාග්ධනය සහ තාක්ෂණ හුවමාරුව ලබා ගැනීමේ අරමුණින් ඍජු විදේශ ආයෝජන (FDI) ලබා ගැනීමට විදේශීය හවුල්කරුවන් සමඟ කටයුතු කිරීම
- ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට වෙළඳ, සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා ජාත්‍යන්තර

හවුල්කරුවන් සහ මිතුරන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම

- ජාතික ආර්ථික රාමුව තුළ ධනාත්මක ආර්ථික කළමනාකරණයක් අනුගමනය කරමින් අනෙකුත් රටවල් සමඟ ආර්ථික සහයෝගීතාව පුළුල් කිරීමට දේශීය වෙළෙඳපොළ විවෘත කිරීම
- විදේශීය සහ දේශීය පෞද්ගලික අංශයේ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරිම සඳහා ව්‍යාපාරික ක්‍රියා පටිපාටි විධිමත් කිරීම, යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් සඳහා මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ මානව නිපුණතා වර්ධනය කිරීම ඇතුළත් නවීන සහ විස්තීර්ණ ආයෝජන නීතියක් සම්පාදනය කිරීම
- අපනයන වැඩි කිරීම අරමුණින් ගෝලීය නිෂ්පාදන ජාලයන් වෙත ශ්‍රී ලංකාව සම්බන්ධ කිරීමට නව වෙළඳ ගිවිසුම් හා අනෙකුත් වෙළඳපළ වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම
- තිරසාර බලශක්ති ව්‍යාපෘති සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්තියේ ප්‍රමුඛයෙක් ලෙස ස්ථානගත කිරීම

## ජාතික ආරක්ෂාව

- එක් එක් සිදුවීම් අනුව ජාත්‍යන්තර ගැටලු සම්බන්ධයෙන් ස්වාධීන ස්ථාවරයක් පවත්වා ගැනීම සහ කිසිදු හමුදා සන්ධානයකට සම්බන්ධ නොවීම හෝ බලපෑමට යටත් නොවීම
- ශ්‍රී ලංකාව තුළ කිසිදු අභ්‍යන්තර ක්‍රියාකාරකමක් සඳහා විදේශීය හමුදා බලකායකට අවසර නොදීම
- ත්‍රස්තවාදය, බෙදුම්වාදය, අන්තවාදය, මුහුදු කොල්ලකෑම් සහ වෙනත් සම්ප්‍රදායික නොවන ආරක්ෂක තර්ජනවලට එරෙහිව සටන් කිරීම සඳහා අග්නිදිග ආසියාතික සහ ආසියාන් සංවිධාන සමඟ සම්බන්ධ වීම ශක්තිමත් කිරීම
- ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට සහ ආර්ථික අවශ්‍යතාවලට බාධාවක් නොවන පරිදි විදේශීය ආයෝජන ආකර්ෂණය කර කළමනාකරණය කිරීම
- ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියට දැඩි ලෙස අනුගත වන අතරම, සයිබර් ආරක්ෂණ යටිතල පහසුකම් සහ උපායමාර්ග වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගිතාව ලබා ගැනීම

## සමුද්‍ර රාජ්‍යතාන්ත්‍රිකභාවය

- ජාත්‍යන්තර නීතිය අනුව සියලුම රටවල් මුහුදු සහ ගුවන් ප්‍රවේශ භුක්ති විඳින ලෝකයක් ආරක්ෂා කිරීමට ක්‍රියා කිරීම
- එක්සත් ජාතීන්ගේ සාගර නීතිය මත පදනම්ව ආරක්ෂිත, ස්ථාවර, ආරක්ෂිත සමුද්‍රීය වසමක්, නිදහස් හා විවෘත මුහුදු මංතීරු සුරක්ෂිත කිරීම

- මුහුදු කොල්ලකෑම් වළක්වන මුර සංචාර, පරිසර දූෂණය පාලනය, සමුද්‍ර පරිසර පද්ධතිය සහ ජෛව විවිධත්ව සංරක්ෂණය, සමුද්‍ර ගවේෂණය, සමුද්‍රීය ආරක්ෂාව සහ ඔරොත්තු දෙන හා විශ්වාසදායක සැපයුම් දාම පිළිබඳ ආරක්ෂක සැපයුම්කරුවෙකු සහ ඉන්දියානු සාගරය සමඟ සමුද්‍ර දේශසීමා බෙදා ගන්නා රටවල් සමඟ සමීපව කටයුතු කරන පළමු ප්‍රතිචාරකයා බවට පත්වීම

## සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය

- විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සංස්කෘතික සබඳතා පිළිබඳ අධ්‍යක්ෂ කාර්යංශයක් පිහිටුවීම
- සංස්කෘතික හුවමාරුව වැඩිදියුණු කිරීම, විදේශයන්හි ශ්‍රී ලාංකේය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම - සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලාංකේය කලාකරුවන්ට සහාය වීම සහ ගෝලීය සංස්කෘතික උත්සවවලට සහභාගී වීම මගින් මෘදු බලය ගොඩනැගීම සහ අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කිරීම
- අනෙකුත් රටවල් සමඟ ශක්තිමත් සබඳතා ඇති කර ගැනීමට පදනමක් ලෙස ක්‍රීඩා හුවමාරු වැනි ක්‍රීඩා රාජ්‍යතාන්ත්‍රිකභාවය උපයෝගී කර ගැනීම
- විශාල ශ්‍රී ලාංකේය ඩයස්පෝරාවක් සිටින රටවල් සහ අපට සැලකිය යුතු සංචාරකයින් ගලා එන රටවල් සමඟ නිශ්චිත සංස්කෘතික ප්‍රවර්ධන සති/මාස ආරම්භ කිරීම
- රටේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම මිනිසුන් අතර මිත්‍රත්වය ගොඩනැගීම සඳහා ඒත්තු ගැන්වීම, ආකර්ෂණය සහ සංස්කෘතික හුවමාරුව සඳහා ආගමික රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම

## විද්‍යා හා පර්යේෂණ රාජ්‍යතාන්ත්‍රිකභාවය

- ශ්‍රී ලංකාව තුළ රසායනාගාර, පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීමට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයින්ගේ ඍජු මැදිහත්වීම ඇතිව ගෝලීය විද්‍යා ප්‍රජාව ආකර්ෂණය කර ගැනීම
- ශ්‍රී ලංකාව විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රය වැදගත් කලාපීය මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට විද්‍යාඥයින් සහ විශිෂ්ට පර්යේෂකයින් සඳහා පුරවැසිභාවය ලබාදීමට සලකා බැලීම
- විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, කලා සහ ගණිතය යන STEAM සංයෝජනය ප්‍රවර්ධනය කිරීම මගින් මානව ප්‍රාග්ධනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට විදේශීය සහය ලබා ගැනීම
- ආසියාවේ ඩිජිටල් ද්වාරය ලෙස ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමට ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ සමාගම් දිරිමත් කිරීම
- UNESCAP වැනි බහුපාර්ශ්වික නියෝජිතායතන සඳහා වෙන් වූ නියෝජිතයන් පත් කිරීම

## පාර්ලිමේන්තු රාජ්‍යතාන්ත්‍රිකභාවය

- පාර්ලිමේන්තු මිත්‍රත්ව සංසද, කථානායක ඇතුළු අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ ඒකාබද්ධ වැඩසටහන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය සහාය වීම
- විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් කලාපීය සහ ගෝලීය පාර්ලිමේන්තු සංසද භාවිත කරමින් රටට උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අවශ්‍ය සියලු පහසුකම් සැලසීම

## මානුෂීය රාජ්‍යතාන්ත්‍රිකභාවය

- ජාත්‍යන්තර ආධාර වැඩසටහන් සහ ආපදා සහන මෙහෙයුම් සඳහා සහභාගී වීමෙන් ගෝලීය මානුෂීය ප්‍රයත්නයන්හිදී ශ්‍රී ලංකාවේ කාර්යභාරය වැඩිදියුණු කිරීම
- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් මානුෂීය අර්බුදවලට ඉක්මන් ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකාව තුළ ධාරිතාව ගොඩනැගීම
- වෙනත් ජාතීන්ට අයත් මිනිසුන්ගේ සැබෑ දුක්ගැනවිලිවලට සහාය වීම සඳහා ත්‍රිවිධ හමුදාවට සහ පොලීසියට එක්සත් ජාතීන්ගේ සාම සාධක හා සාමය බලාත්මක කිරීමේ අවස්ථා ලබා ගැනීම

## නීති ප්‍රතිසංස්කරණ

- විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික දායකත්වය ලබා ගැනීම පහසුවන පරිදි ද්විත්ව පුරවැසි නීති සහ ආගමන නීති ප්‍රතිසංස්කරණය කිරීම
- සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS) යටතේ නඩු පැවරීමට අදාළ නීති හඳුන්වාදීම
- ද්විපාර්ශ්වික සහ කලාපීය නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) මගින් විදේශීය වෙළඳපොළවල අපගේ වාණිජ අවශ්‍යතා ඉදිරියට ගෙන යාම සඳහා වෙළඳ නීති ශක්තිමත් කිරීම
- කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වයන් (RCEP) ද්විපාර්ශ්විකව හෝ බහුපාර්ශ්විකව ස්ථාපිත කිරීම
- ස්ථාවරත්වය සහ සෞභාග්‍යකයට අනුබල දෙන ජාත්‍යන්තර නීති ප්‍රවර්ධනය කිරීම

## ඩයස්පෝරා මැදිහත්වීම

- විදේශ රටවල සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ සුබසාධනය සඳහා දැනට පවතින මානව හා මූල්‍ය සම්පත් වඩා හොඳින් සම්බන්ධීකරණය කරමින් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත කිරීම
- විදේශ රැකියාවල නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ට තමන් පදිංචි රටෙහි සිට ඡන්දය භාවිත කිරීමට පහසුකම් සැලසීම

- ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලාංකික ඩයස්පෝරාව සම්බන්ධ කර ගැනීම සඳහා ව්‍යුහගත වැඩසටහන් හඳුන්වාදීම
- සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාවක් සිටින සෑම රටකම ශ්‍රී ලාංකේය ඩයස්පෝරාව සමඟ කටයුතු කිරීමට තානාපති කාර්යාල හා ඒකාබද්ධ වූ උපදේශක මණ්ඩල පිහිටුවීම
- විදේශයන්හි ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා සොයා බැලීම සඳහා සම්මානිත කොන්සල්වරුන් ලෙස NRSL පත් කිරීම
- ඒ ඒ රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ට උප්පැන්න සහතික ඇතුළු වෙනත් සහතික සහ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම කාර්යක්ෂම කිරීම
- විදේශගත ශ්‍රී ලාංකිකයන් ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීමට පෙළඹවීම සඳහා ද්විත්ව පුරවැසි ගාස්තු සංශෝධනය කිරීම
- ශ්‍රී ලංකා ගිණුම් වෙත විදේශ මුදල් ප්‍රේෂණය කිරීමේදී ඇතිවන ඉහළ සේවා ගාස්තු වැනි ගැටලු සම්බන්ධයෙන් විසඳුම් ලබා දීම

## වත්මන් විදේශ ප්‍රතිපත්ති ස්ථාවරයන්

- ඉන්දියාව ඇතුළු කලාපයේ ආරක්ෂාවට තර්ජනයක් හෝ අවදානමක් ඇති කිරීමට ශ්‍රී ලංකාවේ ගොඩබිම, මුහුද සහ ගුවන් අවකාශයන් භාවිතා කිරීමට කිසිදු රටකට හෝ ආයතනයකට ඉඩ නොදීම
- නිදහස් ස්වෛරී පලස්තීන රාජ්‍යයක් පිහිටුවීම සඳහා එක්සත් ජාතීන් විසින් සම්මත කරගත් ද්වි රාජ්‍ය විසඳුමට සහාය දීම
- ඉන්දියන් සාගරයේ විදේශීය හමුදා කඳවුරු සහ ඒ හා සමාන හමුදා ගිවිසුම් මගින් මිලිටරිකරණ මුලපිරීම්වලට ශ්‍රී ලංකාව ස්ථිර ප්‍රතිපත්තියක් ලෙස විරුද්ධ වීම



# උසස් ජාතික ආරක්ෂාවක්

# සුරක්ෂිත රාජ්‍යයක්

ජාතික ආරක්ෂාව යනු පුරවැසියාගේ සුරක්ෂිතභාවය, දේශයේ භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවය සඳහා බාහිර සහ අභ්‍යන්තර වශයෙන්ද ස්වාභාවික සහ මිනිස් ක්‍රියාකාරකම් මගින්ද එල්ල විය හැකි ඕනෑම අභියෝගයකට මුහුණ දෙමින් රටෙහි ආරක්ෂක හමුදාවන් විසින් සපයන ආරක්ෂක විධි විධානවල සිට භූ දේශපාලනික සහ භූ උපායමාර්ග මගින් එම අභියෝගයන් කළමනාකරණය කොට ජයග්‍රහණය කිරීමේ යාන්ත්‍රණයයි. ජාතික ආරක්ෂාව සහතික කිරීම සඳහා නොබැඳි හා සමතුලිත රාජ්‍යතාන්ත්‍රිකභාවය, මානව හිමිකම්වලට ගරුකරන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය, විවිධත්වය පිළිගත් සමානාත්මතාවය සහ සහජීවනය මෙන්ම පුරවැසියාගේ සහ රාජ්‍යයේ ආරක්ෂාව සඳහා කැප වූ වෘත්තිමය හමුදාවද අත්‍යාවශ්‍ය සාධක වේ.

රාජ්‍යයේ අභ්‍යන්තර ආරක්ෂාව සහතික කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව, පොලිසිය, වෙරළාරක්ෂක, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ රේගුව වැනි නීතිය ක්‍රියාත්මක කරන ආයතන මෙන්ම බුද්ධි සේවා සහ සිවිල් ආරක්ෂක සේවා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම ආරක්ෂක අංශවල ශක්තිමත්භාවය සහ විනිවිදභාවය පිළිබිඹු වනුයේද, එය රදා පවතිනුයේද ජාතික අවශ්‍යතා ප්‍රවර්ධනය සහ ජාතික බලය එනම් ජාතික අභිලාෂයන් ඉටුකරලීමට හැකියාව ඇති, ඒ සඳහා කැපවීමෙන් කටයුතු කරන, විනිවිදභාවයෙන් හෙබි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළිනි. ජාතික බලයේ සංරචක ලෙස දේශපාලන නායකත්වය, ආර්ථීක, භූගෝලීය හා පරිසර පැවැත්ම, ජනතා මතවාදය සහ ආරක්ෂක හමුදාව හැඳින්විය හැක. නොබැඳි හා සමබර රාජ්‍යතාන්ත්‍රික ප්‍රතිපත්ති, ගෝලීය හා කලාපීය භූ දේශපාලන සහ ආරක්ෂක සමතුලිතභාවය අවබෝධය මත ගොඩනැගෙන උපායමාර්ගික විදේශ ප්‍රතිපත්ති මෙන්ම ආර්ථීක ස්වාධීනත්වයද ගෝලීය හා කලාපීය වශයෙන් ජාතික ආරක්ෂාවට එල්ලවිය හැකි තර්ජනයන් අවම කිරීමට බලපාන සාධක වේ.

**නොබැඳි හා සමබර රාජ්‍යතාන්ත්‍රික ප්‍රතිපත්ති, ගෝලීය හා කලාපීය භූ දේශපාලන සහ ආරක්ෂක සමතුලිතභාවය අවබෝධය මත ගොඩනැගෙන උපායමාර්ගික විදේශ ප්‍රතිපත්ති මෙන්ම ආර්ථික ස්වාධීනත්වයද ගෝලීය හා කලාපීය වශයෙන් ජාතික ආරක්ෂාවට එල්ලවිය හැකි තර්ජනයන් අවම කිරීමට බලපාන සාධක වේ.**

# මූලධර්ම

- පුරවැසි ආරක්ෂාව
- ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව
- අභ්‍යන්තර ආරක්ෂාව සහ ජාතික සංහිඳියාව
- සමුද්‍රීය වසම සහ ගුවන් තලය ආරක්ෂාව
- ජාතික ආරක්ෂාව පිළිබඳ වගවීම සහ වගකීම
- ජාතික සම්පත්වල ආරක්ෂාව
- බලශක්ති ආරක්ෂාව
- ජාතික ආරක්ෂාව සඳහා රාජ්‍ය බුද්ධි සේවා දායකත්වය
- විධිමත් ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධනය

# ක්‍රියාමාර්ග

- නීතියේ ආධිපත්‍යය මත ප්‍රජාතන්ත්‍රවාදය, පුරවැසි අයිතිවාසිකම් හා මානව හිමිකම් ආරක්ෂා කරමින් ජාතිකත්වයන් අතර සංහිඳියාව සමගිය සහ සහජීවනය පවත්වාගෙන යාහැකි යහපත් ආණ්ඩුකරණ මූලර්ධම අනුගමනය
- කලාපයේ සුරක්ෂිතභාවය සහ සාමකාමී සහජීවනය සහතික කිරීම, ආරක්ෂිත ජාත්‍යන්තර සබඳතා තුළින් ජාතික ආරක්ෂාව ශක්තිමත්ව ගොඩනගා ගැනීම
- රටේ භෞමික අඛණ්ඩතාව සහ ස්වෛරීභාවය සම්මුතියකින් තොරව සහතික කිරීම
- ජාතික ආරක්ෂාව සඳහා වගකීම සහ වගවීම සහතික කරමින් ජාතික ආරක්ෂක කවුන්සිලය ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම
- ජාතික ආරක්ෂාව පිළිබඳ අදාළ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත ජාතික ආරක්ෂක උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කිරීම
- ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා ඒවා මෙහෙයවිය හැකි නිසි නායකත්වයන් යටතේ ජාතික ආරක්ෂාවට අදාළ දියුණු හා තාක්ෂණික දැනුම සහ ආරක්ෂක පරිසරයන් පිළිබඳ මනා පුහුණුව සමඟ දැනුම සහ හැකියාවන් සහිත වෘත්තීය හමුදාවන් ලෙස ප්‍රතිෂ්ඨාපනය කිරීම
- පිළිගත් හමුදාමය ක්‍රමවේදයන්ට අනුකූලව සහ කුසලතා, වෘත්තීමය දක්ෂතාවයන්, නොකිලිටි වෘත්තීමය ඉතිහාසය මත පමණක් පදනම්ව උසස් තනතුරුවලට පත්කිරීම සහ උසස්වීම් ලබා දීම සහ හමුදාවන්වලට අදාළ

විශේෂ සහ විදේශ පුහුණුවීම් සඳහා තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රමවේදයන් විධිමත් කිරීම

- සංකීර්ණ හා වේගයෙන් වෙනස් වන අභියෝගවලට මුහුණ දීම සඳහා නවීන හා තාක්ෂණික දැනුම සහ සංවර්ධනය සමග ආරක්ෂක අංශ කාලානුරූපව යාවත්කාලීන කිරීම සඳහා ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන ව්‍යුහය විධිමත් කිරීම
- විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සමග ජාතික ආරක්ෂාව පිළිබඳ දැනුම ඒකාබද්ධ කිරීමෙන් ආරක්ෂක අංශයේ විශිෂ්ටත්වය ඉහළ නැංවීම
- ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ ගෞරවය හා අභිමානය ආරක්ෂා වන පරිදි හා හදිසි ජාතික අවශ්‍යතාවයන්හිදී පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව හැර හමුදාවන්ට අදාළ නොවන කිසිම සිවිල් කටයුත්තකට ඔවුන් අනුයුක්ත නොකිරීම
- ජාතික ආරක්ෂක අරමුණු සහ යහපාලනය සාක්ෂාත් කර ගැනීම උදෙසා රටේ අනාගත සමෘද්ධිය, අභිවෘද්ධිය, සමාජ ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව වෙනුවෙන් කාර්යය ඉටුකිරීමේහිලා වගකීම සහ වගවීම සහතික කරන නිසි ක්‍රමවේදයක් සමග විශ්වාසනීය හා කාර්යක්ෂම ඒකාබද්ධ බුද්ධි යාන්ත්‍රණයක් පිහිටුවීම
- ජාතික තොරතුරු පද්ධතිවල පවතින ආරක්ෂක ප්‍රතිපත්තිය කාර්යක්ෂම හා ඵලදායී ලෙස වැඩිදියුණු කිරීම සහ එම වගකිවයුතු ආයතන සවිබලගැන්වීම - මෙහිදී ඵලදායී ජාතික තොරතුරු පද්ධතියක් සඳහා සයිබර් ආරක්ෂණ තර්ජන හඳුනාගෙන ශක්තිමත්, ජවසම්පන්න, හොඳින් ජාලගත ආරක්ෂිත තොරතුරු ආරක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කෙරේ.
- නීතිය ක්‍රියාත්මක කරන ආයතන (පොලිසිය, රේගුව, බන්ධනාගාර) සම්පූර්ණයෙන් වගවීම සහතික කරමින් රාජ්‍ය බුද්ධි සේවයේ ඵලදායී ඒකාබද්ධතාවයකින් අධීක්ෂණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කර විධිමත් කිරීම
- ආර්ථික ස්ථාවරත්වය සඳහා උපායමාර්ගික ආරක්ෂක පරිසරයක් සහ ස්ථිර පදනමක් නිර්මාණය කිරීම
- දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම
- ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා උපායමාර්ගික සහ ජාතික සම්පත් උපයෝජනය සහ සංරක්ෂණය කිරීමට වගවන හා වගකියන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
- ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයේ (EEZ) ආරක්ෂාව සහ ස්ථාවරත්වය සහතික කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදාව හා වෙරළාරක්ෂක බළකාය තාක්ෂණිකව යාවත්කාලීන කර අදාළ නීති

මගින් බලගැන්වීම

- මුහුදේ ස්ථාවර පරිසරයක් ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම, ජාත්‍යන්තර අපරාධ, සමුද්‍රීය කර්මාන්තයේ දියුණුව, සංවර්ධනයේ ආරක්ෂාවේ තර්ජනවලට එරෙහිව සමුද්‍රීය නීතිය ක්‍රියාත්මක කිරීමේ සුරක්ෂිත සමුද්‍රීය අධිකරණ බලය සහතික කිරීම
- එක්සත් ජාතීන්ගේ මුහුදු සම්මුතිය යටතේ ජාත්‍යන්තර සමුද්‍රීය මායිම් ඵලදායී ලෙස පාලනය කිරීම සඳහා කලාපීය සහයෝගීතාවයෙන් යුත් ඒකාබද්ධ කළමනාකරණ යාන්ත්‍රණයක් හඳුන්වාදීම
- සෞඛ්‍ය සහ ආර්ථික බලපෑම් අවම කිරීම, කාර්මික හා පාරිසරික දූෂණ, ස්වාභාවික විපත්, ගිනි ගැනීම් සහ නියඟ ආදියෙන් සිදුවන බලපෑම් හඳුනාගෙන ප්‍රතිචාර දැක්වීමෙන් පුරවැසියන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා ආපදා කළමනාකරණ ව්‍යුහය විධිමත් කිරීම
- කලාපීය සහයෝගීතාවයෙන් ගුවන්, මුහුද සහ ගොඩබිම් ස්වාධීනත්වය පිළිබඳ නිරපේක්ෂ පාලනයක් ඇති කර ගනිමින් සමුද්‍රීය වසම් දැනුවත් කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම
- සමුද්‍ර බල ප්‍රදේශය තුළ ගුවන් කලාපය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ පියාසර තොරතුරු කලාපය සහ සෙවීම් සහ මුදා ගැනීමේ කලාපය ඒකාබද්ධ කර විධිමත් කිරීම
- ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගුවන් හමුදාවේ තාක්ෂණික දියුණුව සහ නාවික හා ගුවන් සේවා සමඟ විචක්ෂණශීලීව ඒකාබද්ධ කිරීම සහ කලාපීය ආරක්ෂාව තහවුරු කිරීමට සහාය වීම
- තම මාතෘ භූමිය වෙනුවෙන් විවිධ කැප කිරීම් කරන ලද විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, මියගිය, අතුරුදහන්, ආබාධිත සහ සේවය කරන රණවිරුවන් ගෞරවයෙන් හා අභිමානයෙන් යුතුව ජීවිතයක් ගත කිරීම සහතික කිරීම
- ත්‍රිවිධ හමුදා සේවය හැරගිය සෙබළුන්ගේ සාධාරණ සහ මානුෂීය කරුණු ගැන සලකා බලා නිදහස් කොට ගෞරවනීය හා වැඩදායී පුරවැසියන් ලෙස ජීවත්වීමට ඔවුන් සවිබලගැන්වීම
- විශ්‍රාමික ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයින්ගෙන් බහුතරයක් පුද්ගලික ආරක්ෂක ක්ෂේත්‍රයේ සේවය කරන බැවින් පුද්ගලික ආරක්ෂක සේවාවන් වඩා වෘත්තීය බව සහ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා කර්මාන්තය නියාමනය කිරීම



# ශ්‍රී ලාංකේය ජාතියක්
# විශ්වීය පුරවැසියෙක්

ශ්‍රී ලංකාව සිංහල, දෙමල, මුස්ලිම්, බර්ගර් සහ මැලේ ආදී විවිධ ජාතිකත්වයන් සහ බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කිතුණු කතෝලික ආදී විවිධ ආගම් අදහන ජනතාවක් සිටින රටකි. එම විවිධත්වය නිසාම ස්වභාවයෙන්ම පවතින බහු සංස්කෘතිය තුළ එකිනෙකාගේ පැවත්ම පිළිගනිමින් හා ඒවාට ගරු කරමින් ජීවත්වීම රටේ යහපැවැත්මටත් සමාජයීය එකමුතුකමටත් අත්‍යාවශ්‍යය. එහෙත් ඉතිහාසය තුළ අපිට ලැබුණ විවිධ අවස්ථාවන් ප්‍රයෝජනයට ගනිමින් ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීමට රටක් ලෙස අපි අසමත් වීමු. බලය ලබාගැනීමේත් බලය පවත්වාගෙන යාමේත් පටු අවස්ථාවාදී දේශපාලන වුවමනාවන් වෙනුවෙන් ජාතිකත්ව හා ආගමික ජනකොටස් අතර අන්‍යෝන්‍ය සැකය හා අවිශ්වාසය අසමගිය ඇති කිරීමේ ප්‍රතිඵල ලෙස වසර 30ක ඛේදනීය යුද්ධයකට මුහුණ දෙන්නට අපිට සිදුවිය. එම යුද්ධයේ ශෝකාලාපයන් හා දුක්ඛිත ප්‍රතිඵල තවමත් ශ්‍රී ලාංකේය සමාජයේ ශේෂව පවතී. ජාතිකත්වය, භාෂාව, ආගම, කුලය, ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත නොබෙදුණු එම විවිධත්වයන්ගේ අනන්‍යතාවයන්ට ගරුකරමින් හා ඒවායේ පැවත්ම හා ආරක්ෂාව සහතික කරමින් ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීම උදෙසා ජාතික සමගිය ඇතිකිරීමට ජාතික ජන බලවේගය කැපවී සිටී.



# මූලධර්ම

- සියලු ජාතිකත්වයන්ගේ දේශපාලන හවුල්කාරිත්වය
- ජාතිකත්වය, භාෂාව, ආගම, කුලය හෝ ලිංගිකත්වය මුල් කරගෙන කිසිදු පුරවැසියකු/ජන කොටසක් නින්දාවට, පීඩාවට, අපහසුතාවයට හෝ අසාධාරණයට ලක් නොවීම
- සියලු ජාතිකත්වයන් හා ආගමික කණ්ඩායම්වල ආරක්ෂාව අන්‍යෝන්‍ය අවබෝධය විශ්වාසය සහ අයිතිවාසිකම්
- ජාතිවාදී, කුලවාදී හා ආගමික මතවාද ආදියෙන් නොබෙදුණු සහජීවනයෙන් සහ සංහිඳියාවෙන් යුත් ශ්‍රී ලාංකේය ජාතියක්


# ක්‍රියාමාර්ග

- 2015-2019 කාලය තුළ නව ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවක් සම්පාදනය කිරීමට අනුගමනය කළ ක්‍රියාදාමය කඩිනමින් අවසන් කොට සමානාත්මතාව හා ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම්ව එක රටක් තුළ සියලු ජනතාව පාලනයට සම්බන්ධ විය හැකි වන ලෙස සෑම පළාත් පාලන ආයතනයකටම, දිස්ත්‍රික්කයකටම සහ පළාතකටම දේශපාලනමය හා පරිපාලනමය වශයෙන් බලය බෙදා හැරෙන, ආණ්ඩුකරණය සඳහා සියලු ජාතිකත්වයන්ගේ දේශපාලන හවුල්කාරිත්වය සහතික කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම
- දැනට දින නියමයක් නොමැතිව කල්තබා ඇති පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ වසරක් ඇතුළත පවත්වා ජනතාවට පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව සැලැසීම
- වෙනස්කොට සැලකීමට එරෙහි නෛතික බලතල සහිත කොමිෂන් සභාවක් (Commission Against Discrimination) ස්ථාපිත කිරීම
- උතුරු නැගෙනහිර ඇතුළු අනෙකුත් ප්‍රදේශවල පසුගිය කාලයේ සිදු වූ දේශපාලන ඝාතන, අතුරුදහන්වීම් සහ පැහැර ගැනීම් පිළිබඳව විමර්ශනය කොට යුක්තිය ඉටුකිරීම
- ජාතිවාදය හා ආගමික අන්තවාදය හේතුකොට ගෙන සිදු වී ඇති ප්‍රචණ්ඩ ක්‍රියා විමර්ශනය කිරීමට සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමේ ක්‍රියාකාරිත්වය පුළුල් කිරීම
- අන්තර් ආගමික ගැටලු නිරාකරණයට සියලු ආගමික ප්‍රධානීන්ගෙන් හා ආගමික උගතුන්ගෙන් සමන්විත අන්තර් ආගමික සභාවක් පිහිටුවීම
- ලෝක ආගම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ජාතික හා ආගමික සමගිය සඳහා වන සංස්කෘතික වැඩසටහන් හා ක්‍රියාකාරකම් ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කිරීම
- දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම හා ඔවුන් නිදහසේ සමාජ ගතවීම සහතික කිරීම
- ප්‍රතිත්‍රස්ත පනත ඇතුළු සියලු මර්දනකාරී අණපනත් අහෝසි කර සියලු ජනතාවගේ නිදහස සහතික කිරීම
- උතුරු නැගෙනහිර ඇතුළු රටේ සියලුම ප්‍රදේශවල ජනතාවගේ සිවිල් නිදහස තහවුරු කෙරෙන ආකාරයට සිවිල් පරිපාලනය විධිමත් කිරීම
- අධ්‍යාපනික හා රැකියා අවස්ථා දේශපාලන බලපෑම්වලින් තොරව සියලු ජාතිකත්වයනට සාධාරණය ඉටුවන පරිදි සුදුසුකම් අනුව ලබාදීම
- සහන සහ රැකවරණය අවශ්‍ය යුද - වැන්දඹුවන්, අනාථ පුද්ගලයින්, ආබාධ සහිත ප්‍රජාව හා මානසික පීඩනයට ලක් වූවන් සඳහා සහන සැලසීම
- ඉඩම් හා වාසස්ථාන පිළිබඳ ජාතික කොමිසමක් මගින් පවතින ගැටලු නිරාකරණය කිරීම
- ජන සංයුතිය වෙනස් කිරීමේ අරමුණින් කෙරෙන ජනපදකරණය නැවැත්වීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි සංශෝධනය යටතේ පිළිගත් ජාතික භාෂා ප්‍රතිපත්තිය අවශ්‍ය සම්පත් හා තාක්ෂණික පහසුකම් ලබා දී ක්‍රියාත්මක කිරීම
- සියලු පුරවැසියනට තම භාෂාවෙන් සේවා ලබා ගැනීමට හැකි වන පරිදි ජාතික භාෂා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- දෙමළ හා මුස්ලිම් ජනතාව වැඩි වශයෙන් ජීවත්වෙන උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල හා කඳුකර ප්‍රදේශවල පවතින පොලිස් ස්ථාන, රජයේ කාර්යාල වැනි සිවිල් සේවාවල දෙමළ භාෂාවෙන් කටයුතු කළ හැකි නිලධාරීන්, සේවකයන් හා භාෂා පරිවර්තකයන් ලබාදීම
- 2023.10.15 දිනැතිව ජාතික ජන බලවේගය ප්‍රකාශයට පත්කළ හැටන් ප්‍රකාශනයේ සඳහන් පරිදි, කඳුකර දෙමළ ජනතාවගේ අනන්‍යතාවය සහ අයිතීන් පිළිගනිමින් ඔවුන්ගේ ඉඩම්, නිවාස, අධ්‍යාපන, සෞඛ්‍යය ආදී පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගැනීම
- කඳුකර දෙමළ ප්‍රජාවගේ වැටුප් ජීවන වියදමට සරිලන සේ ඉහළ දැමීම
- උතුරු නැගෙනහිර ඇතුළු අනෙකුත් ප්‍රදේශවල ධීවර කටයුතුවලට විදේශීය ධීවරයන්ගෙන් එල්ල වී ඇති අභියෝග රාජ්‍යතාන්ත්‍රිකව විසඳා, අවශ්‍ය යටිතල පහසුකම් හා අලෙවි පහසුකම් සඳහා ඉඩ ප්‍රස්ථා ඇති කිරීම

# රට අනුරට

“අප නිදහසෙන් පසු ශ්‍රී ලාංකේය ජාතියක් ලෙස එක ධජයක් යටතට ගෙන ඒමට මෙතෙක් කල් රට පාලනය කළ ප්‍රභූ පාලක පංතියට හැකි වූයේ නැත. ඒ වෙනුවට ඔවුන් සිදු කළේ තම බලය පවත්වාගෙන යාම වෙනුවෙන් ඒ ඒ ජාතිකත්වයන්ට බෙදුණු කණ්ඩායම් ලෙස ඔවුන් අතර ගැටුම් උග්‍ර කරමින් පවත්වා ගෙන යාමයි. අපගේ ප්‍රතිපත්ති මේ වෙනුවෙන් සිදු කළ යුතු සංකල්පීය, ද්‍රව්‍යාත්මක, ව්‍යුහාත්මක හා ක්‍රියාකාරී මැදිහත්වීම් ගණනාවක් හඳුනා ගනී. සියලු ජාතිකත්වයන්ට ශ්‍රී ලාංකේය ජාතිය ලෙස පොදු අනාගතයක් පරිකල්පනය කිරීමේ ඉඩකඩ අප විසින් සකස් කරනු ඇත. නිෂ්පාදන ආර්ථිකයක් සැලසුම් කිරීමේ සිට ප්‍රතිලාභ බෙදීයාම දක්වා වූ ක්‍රියාවලියේදී සියලු ජාතිකත්වයන් එහි කොටස්කරුවන් කර ගැනීම අපේ අදිටනයි.”



464/20, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.
දුරකතන : 0112785612 ෆැක්ස් : 0112786050
www.akd.lk